# 2022 | වාර්ෂික වාර්තාව





ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

# එතෙර සවියට මෙතෙර අත්වැල

## පටුන


| | |
|---|---|
| මූල්‍ය සහ මෙහෙයුම් සාරාංශ | 2 |
| වාර්තාව පිළිබඳව හැඳින්වීම | 3 |
| අප ගැන | 4-12 |
| සභාපතිතුමාගේ පණිවිඩය | 13 |
| කළමනාකරණ ව්‍යුහය | 14 |
| කාර්යසාධන සමාලෝචනය | 17-60 |
| වී.සේ.නි.කා අනුබද්ධ ආයතනය | 60 |
| පාලන ව්‍යුහය | 64 |
| මූල්‍ය ප්‍රකාශන | 71 |
| විගණකාධිපති වාර්තාව | 155 |
| විගණකාධිපති වාර්තාව පිළිබඳ සභාපතිතුමාගේ නිරීක්ෂණ | 171 |

# මූල්‍ය සහ මෙහෙයුම් සාරාංශ

විදේශ රැකියා සඳහා ලියාපදිංචිවීම්

| | |
|---|---|
| | 311,056 |
| පිරිමි | 186,965 |
| ගැහැණු | 124,091 |

සමස්ත ලියාපදිංචි වීම්

| | |
|---|---|
| වෘත්තිකයින් | 14,307 |
| මධ්‍යම මට්ටම | 8,130 |
| පුහුණු | 92,836 |
| ලිපිකරු හා ආශ්‍රිත | 12,124 |
| ගෘහස්ථ ගෘහ සේවක සහකාරී | 74,007 |
| වෙනත් | 4,133 |
| අඩු පුහුණු | 105,509 |

ප්‍රධාන වශයෙන් ශ්‍රම ඉල්ලුම සහිත රටවල් — කුවේට්, කටාර්, සවුදි අරාබිය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ ආදායම් — රු. මිලියන 11,470

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ වියදම — රු. මිලියන 3,680

සේවක ප්‍රේෂණ

| | |
|---|---|
| රු. මිලියන | 1,252,504 |
| ඇ. ඩොලර් | 3,789.5 |

සේවක සුභසාධන අරමුදල් වියදම් — රු. මිලියන 1,517

# වාර්තාව පිළිබඳව හැඳින්වීම

---

විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ 2022 වර්ෂයට අදාල වාර්ෂික වාර්තාව කාර්යාංශය සහ ඊට අනුබද්ධ ආයතනයේ 2022 ජනවාරි 01 සිට 2022 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ ඒකාබද්ධ මූල්‍ය සහ මෙහෙයුම් කාර්ය සාධනය ඉදිරිපත් කරයි.

මෙම වාර්තාව කාර්යාංශයේ මෙහෙයුම් ඒකකවල කාර්ය සාධනය, කළමනාකාරිත්වය, පාලන පරිචයන් සහ මූල්‍ය සමාලෝචන පිළිබිඹු කරයි.

ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති (SLFRS / LKAS), රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ, 1971 අංක 28 දරන මූල්‍ය පනත සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මඟින් නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ හොඳම පරිචය සංග්‍රහයට අනුකූලව මූල්‍ය තොරතුරු සකස් කර ඉදිරිපත් කර ඇත. මූල්‍ය ප්‍රකාශන විගණන වාර්තා සමඟ මෙහිදී ප්‍රකාශයට පත් කර ඇත.

මෙම වාර්තාවේ අඩංගු තොරතුරු අදාල කළමනාකරණ නිලධාරින්, විගණකාධිපති විසින් නිරවද්‍යතාවය තහවුරු කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ අදාළ අවස්ථාවලදී සාමාන්‍යාධිකාරී, සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමාලෝචන කර ඇත.

# අප ගැන

---

## ශ්‍රී ලංකාව තුළ විදේශ රැකියා කර්මාන්තයේ පාලනය හා නියාමනය සඳහා පුර්ණ අධිකාරී බලය අප සතු වේ.

### දැක්ම

එතෙර වෙළඳපොළ සඳහා නිපුණතාවයෙන් පිරි මිනිස් සම්පත සැපයීමේ ලොව හොඳම තේරීම බවට ශ්‍රී ලංකාව පත්වීම

### මෙහෙවර

දේශීය ආර්ථිකයට දායකවෙමින් හා සියලුම පාර්ශවකරුවන්ගේ යහපත සුරක්ෂිත කරමින්, ජනතාවට තම කුසලතාවන්ගෙන් එතෙර රැකියා වෙළඳපොළෙහි යහපත් ප්‍රතිලාභ ලැබිය හැකි කාර්යක්ෂම හා සමානත්වයෙන් යුතු මාර්ගයන් බිහි කිරීම

### තත්ත්ව ප්‍රතිපත්තිය

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යංශය එහි සේවාවන්හි ගුණාත්මකභාවය අඛණ්ඩව ඉහළ නංවමින් පාරිභෝගික තෘප්තිය අතික්‍රමණය කිරීම පිණිස කාර්යක්ෂම හා ඵලදායී සේවා සැපයීම සඳහා කැපවී සිටී.

# ප්‍රධාන අරමුණු

- විදේශ රැකියා කාර්මාන්තය නියාමනය කිරීම හා ඊට අවශ්‍ය සහය ලබා දීම
- ශ්‍රී ලංකාවෙන් පිටත රැකියාවල නිරත ශ්‍රී ලාංකිකයින් සහ මෙරට සිටින ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ සුභසාධනය හා සුරක්ෂිතතාව සහතික කිරීමේ විධිවිධාන අනුගමනය කිරීම
- ශ්‍රී ලාංකිකයින් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත රැකියා අවස්ථා පුළුල් කිරීම් හා ඒවා ප්‍රවර්ධනය කිරීම්

*වි.සේ.නි.කා ISO 9001:2008 තත්ත්ව සහතිකය 2012 වර්ෂයේදී ලබා ගත් අතර තත්ත්ව කළමනාකරණ පද්ධතිය ISO 9001:2015 දක්වා ඉහළ නංවා ඇත.*

# අපගේ ව්‍යුහය

## කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය

2022.07.22 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදන අංක . 2289/43

## ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය


1985 අංක 21 දරන පාර්ලිමේන්තු පනත සහ 1994 අංක 04 සහ 2009 අංක 56 දරන පනත් සංශෝධන

## ශ්‍රී ලංකා විදේශ රැකියා එජන්සිය

1996 වසරේ දී ස්ථාපිත කර ඇති අතර වි.සේ.නි.කා පූර්ණ අනුබද්ධිත ආයතනයකි

# අපගේ දේශීය හා ගෝලීය ජාලය

ප්‍රධාන කාර්යාලය: අංක 234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල




විගමණික සම්පත් මධ්‍යස්ථාන:

1.මතුගම
2.තංගල්ල
3.හාලි ඇල
4.රත්නපුර
5.අම්පාර
6.කුරුණෑගල
7.නුවර
8.වවුනියාව
9.අනුරාධපුර





පුහුණු මධ්‍යස්ථාන:

1.කුරුණෑගල (වහර)
2.පන්නිපිටිය

ප්‍රදේශීය දිස්ත්‍රික් පුහුණු මධ්‍යස්ථාන

1. යාපනය 2. මඩකලපුව 3. හලාවත 4. දඹුල්ල 5. ගාල්ල 6. පොලොන්නරුව 7. ත්‍රිකුණාමලය

## විදේශයන්හි ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාලවල පිහිටි රැකියා සහ සුභසාධන අංශ




| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 | ඕමානය | 5 | ඊශ්‍රායලය | 9 | අබුඩාබි | 13 | මැලේසියාව |
| 2 | ඩුබායි | 6 | ජෝර්දානය | 10 | රියාද් | 14 | සිංගප්පුරුව |
| 3 | කුවේටය | 7 | බහරේන් | 11 | ජෙඩා | 15 | දකුණු කොරියාව |
| 4 | ලෙබනන් | 8 | කටාර් | 12 | මාලදිවයින | | |

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ විදේශ දූත මණ්ඩල පරිපාලන හා විදේශ සම්බන්ධතා අංශය මඟින් රටවල් 13ක විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල පිහිටුවා ඇති කම්කරු හා සුභසාධන අංශ 15ක, එනම් අබුඩාබි, බහරේන්, ඩුබායි, ඊශ්‍රායලය, ජෝර්දානය, ජෙඩා, කුවේට්, ලෙබනන්, මැලේසියා, මාලදිවයින, ඕමානය, කටාර්, රියාද් සහ දකුණු කොරියාවෙහි, මෙහෙයුම් කටයුතු අදාල දූත මණ්ඩල ප්‍රධානීන් හරහා සංම්බන්ධීකරණය සහ විගමනික ශ්‍රමිකයන්ට සේවාවන් සැපයීම සිදු කරනු ලැබේ.

**2022 වර්ෂයේදී මෙම අංශය විසින් සිදු කරනු ලැබූ ක්‍රියාකාරකම් කිහිපයක් පහත දැක්වේ**


1. ශ්‍රමිකයින් ලබාගන්නා රටවල් / ශ්‍රමිකයන් යවන රටවල් සමඟ බඳවාගැනීම් සම්බන්ධ ද්විපාර්ශවික ගිවිසුම් / අවබෝධතා ගිවිසුම් ක්‍රියාත්මක කිරීම
2. ශ්‍රී ලංකවේ සහ එතෙර විදේශ රැකියා ක්ෂේත්‍රයේ බඳවාගැනීම් සිදු කරන්නන් නියාමනය කිරීම
3. එතෙර පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල හරහා විදේශ රැකියා සඳහා විදේශ ගත වීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා කාර්යාංශයේ විගමනික ශ්‍රමිකයින් ලියාපදිංචි කිරීම සඳහා යාන්ත්‍රණ ක්‍රියාත්මක කිරීම

4. ශ්‍රමිකයින් ලබාගන්නා රටවල අදාල බලධාරින් සමඟ විගමනික ශ්‍රමිකයින්ගේ දුක්ගැනවිලි/ආරවුල් නිරාකරණය කිරීම සහ ඊට අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම සඳහා කාර්යක්ෂම සම්බන්ධතා ඇති කර ගැනීම
5. විගමනික ශ්‍රමිකයින් වෙත වේලාවට සේවය සැපයීම / දුක්ගැනවිලි සහ ආරවුල් සඳහා මනෝ සමාජීය උපදේශන ලබා දීම සඳහා එතෙර පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල කම්කරු සහ සුභසාධන අංශයන්හි අවශ්‍යතා හඳුනා ගැනීම සහ ශක්තිමත් කිරීම
6. විගමනික ශ්‍රමිකයින් සඳහා හදිසි සුභසාධන සේවා සහ සහයෝගයන් සඳහා එතෙර ශ්‍රී ලාංකිකයින්ගේ සංගම් සහ රාජ්‍ය නොවන සංවිධානවල සහාය ලබා ගැනීමට රේඛීය අමාත්‍යාංශය, විදේශ කටයුතු අමාත්‍යාංශය සහ එතෙර පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල සමඟ සම්බන්ධීකරණය
7. හදිසි අවස්ථාවලදී විගමනික ශ්‍රමිකයින් මෙරටට නැවත ගෙන්වා ගැනීම සඳහා හදිසි සැලසුම් සකස් කිරීම සහ කාලානුරූපව හදිසි සැලසුම් යාවත්කාලීන කිරීම සඳහා අදාල ශ්‍රී ලංකා දූත මණ්ඩල ප්‍රධානීන් සඳහා අවශ්‍ය සහය ලබා දීම
8. ශ්‍රමිකයින් ලබා ගන්නා රටවල් සමඟ ඇති කරගන්නා ලද ද්විපාර්ශ්වික ගිවිසුම්/අවබෝධතා ගිවිසුම්වලට සහ රැකියා ගිවිසුම්වලට සමාජ ආරක්ෂණය සහ සේවා ප්‍රතිලාභ ලබා ගැනීම සම්බන්ධ වගන්ති ඇතුලත් කර ගැනීම සඳහා රේඛීය අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණය
9. ශ්‍රමිකයින් ලබා ගන්නා රටවල්වල අදාල බලධාරින් වෙත විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා විගමනික ශ්‍රමිකයින් වෙනුවෙන් රක්ෂණාවරණ ක්‍රියාත්මක කිරීම, විශේෂයෙන්ම කාන්තා ගෘහ පාලන සහයිකාවන් සඳහා, යෝජනා ඉදිරිපත් කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණය
10. එතෙර පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල කම්කරු හා සුභසාධන අංශවල නිළධාරින් ඇතුළු කාර්යාංශ නිලධාරින්ට සහ බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතනවල නිලධාරින් සඳහා ලිංගික සහ ස්ත්‍රී පුරුෂභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය (Sexual and Gender Based Violence) පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම
11. පරිපාලනය, මානව සම්පත්, කළමනාකරණය/සංවර්ධනය සහ අදාල ක්‍රියාකරකම්

**පවත්වන ලද සම්මන්ත්‍රණ/රැස්වීම් සහ වැඩසටහන්**

| විස්තරය | සංඛ්‍යාව | පිරිවැය රු. (මී.) |
|---|---|---|
| **සම්මන්ත්‍රණ** | **10** | **0.03** |
| ලිබියානු තානාපති කාර්යාලයේ කම්කරු නිලධාරි(Labour Attaché') සමඟ රැස්වීම- 2022.01.11 සභාපතිතුමාගේ කාර්යාලය, වි.සේ.නි.කා | | |
| ජර්මානියාවේ ගරු තානාපතිතුමා සමඟ රැස්වීම - 2022.01.25 විදේශ කටයුතු අමාත්‍යාංශය | | |
| කුවේට්හි සිටින ගරු කොන්සල්තුමා සමඟ රැස්වීම - 2022.02.02 සභාපතිතුමාගේ කාර්යාලය, වි.සේ.නි.කා | | |
| රොමේනියාවේ ගරු තානාපතිතුමා සමඟ රැස්වීම 2022.02.23 සභාපතිතුමාගේ කාර්යාලය, වි.සේ.නි.කා | | |
| ශ්‍රී ලංකාවේ සිටින එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ගරු තානාපතිතුමා සමඟ සුහද හමුව 2022.03.10 සභාපතිතුමාගේ කාර්යාලය, වි.සේ.නි.කා | | |
| ඕමානයේ වාණිජ මණ්ඩලයේ නියෝජිත පිරිස සමඟ රැස්වීම - 2022.03.07 විදේශ කටයුතු අමාත්‍යාංශය | | |
| සංක්‍රමණය පිළිබඳ ජාත්‍යන්තර රැස්වීමේ පළමු සැසිය - 2022.02.28 සිට 2022.03.02 (මාර්ග ගත ත්‍රමය ඔස්සේ) | | |
| සංක්‍රමණය පිළිබඳ ජාත්‍යන්තර රැස්වීමේ දෙවන සැසිය – 2022.10.24 සිට 2022.10.25 (මාර්ග ගත ත්‍රමය ඔස්සේ) | | |
| සංක්‍රමණය පිළිබඳ විද්‍යුත් පාඨමාලාව 2022.09.05 සිට 2022.09.08(මාර්ග ගත ත්‍රමය ඔස්සේ) | | |
| අබුඩාබි සංවාදයේ ජ්‍යෙෂ්ඨ නිළධාරින්ගේ රැස්වීම 2022.10.18 සිට 2022.10.19(මාර්ග ගත ත්‍රමය ඔස්සේ) | | |

| | |
|---|---|
| **එතෙර පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල හරහා විදේශ රැකියා නියෝජිතායතන / සමාගම් ලියාපදිංචි කිරීම සහ ලියාපදිංචිය අලුත් කිරීම** | |
| **විදේශ රැකියා නියෝජිතායතන / සමාගම් ලියාපදිංචි කිරීම්** | 1034 |
| **විදේශ රැකියා නියෝජිතායතන / සමාගම් ලියාපදිංචිය අලුත් කිරම්** | 1687 |
| **එතෙර පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල හරහා විගමනික ශ්‍රමිකයින් කාර්යාංශයේ ලියාපදිංචි කිරීම සහ ලියාපදිංචිය අලුත් කිරීම** | |
| **විගමනික ශ්‍රමිකයින් කාර්යාංශයේ ලියාපදිංචි කිරීම** | 3320 |
| **විගමනික ශ්‍රමිකයින්ගේ කාර්යාංශ ලියාපදිංචිය අලුත් කිරීම** | 6329 |
| දූත මණ්ඩල හරහා විගමනික ශ්‍රමිකයින්ගේ දුක්ගැනවිලිවලට අදාල පැමිණිලි | |
| ලැබුණු පැමිණිලි සංඛ්‍යාව | 195 |
| විසඳූ පැමිණිලි සංඛ්‍යාව | 120 |







රුමේනියාවේ ගරු තානාපතිතුමාගේ හමුව

සිංගප්පුරු දූත පිරිස් සමඟ හමුව














රටවල්වල අතරමං වූ ශ්‍රී ලාංකික විගමනික ශ්‍රමිකයින් ආපසු ගෙන්වා ගැනීමට සහ මියගිය විගමනික ශ්‍රමිකයින්ගේ මෘත දේහ ගෙන්වා ගැනීම සඳහා සහය වීම සහ මියගිය විගමනික ශ්‍රමිකයින් වෙනුවෙන් රු. 40,000 ක මුදලක් අවමංගල්‍ය කටයුතු සඳහා පවුලේ සමාජිකයින් වෙත ලබා දීම එතෙර පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල මඟින් සිදු කිරීම.

| මාසය | ගෙන්වා ගන්නා ලද පුද්ගලයින් සංඛ්‍යාව | ප්‍රදානය කරනු ලැබූ අවමංගල්‍ය වියදම් භරහා ප්‍රතිලාභ ලැබූ පුද්ගලයින් සංඛ්‍යාව | පිරිවැය (රු.මි) |
|---|---|---|---|
| ජනවාරි | 49 | 17 | 0.68 |
| පෙබරවාරි | 244 | 16 | 0.76 |
| මාර්තු | 493 | 18 | 0.72 |
| අප්‍රේල් | 79 | 14 | 0.56 |
| මැයි | 11 | 16 | 0.63 |
| ජුනි | 142 | 19 | 0.92 |
| ජුලි | 105 | 15 | 0.60 |
| අගොස්තු | 27 | 15 | 0.60 |
| සැප්තැම්බර් | 21 | 24 | 0.96 |
| ඔක්තෝම්බර් | 40 | 20 | 0.80 |
| නොවැම්බර් | 11 | 36 | 1.44 |
| දෙසැම්බර් | 60 | 07 | 0.28 |
| මුළු සංඛ්‍යාව | 1282 | 217 | 8.95 |


නිල විදෙස් සංචාරය - සෞදි අරාබිය

**දූත පිරිස් යැවීම සහ දූත පිරිස් ගෙන්වා ගැනීම**

| විස්තරය | 2020 | | 2021 | | 2022 | |
|---|---|---|---|---|---|---|
| | දූත පිරිස් සංඛ්‍යාව | දූත පිරිස්හි නියෝජිතයින් සංඛ්‍යාව | දූත පිරිස් සංඛ්‍යාව | දූත පිරිස්හි නියෝජිතයින් සංඛ්‍යාව | දූත පිරිස් සංඛ්‍යාව | දූත පිරිස්හි නියෝජිතයින් සංඛ්‍යාව |
| දූත පිරිස් ගෙන්වා ගැනීම | 1 | 6 | 2 | 8 | 07 | 116 |
| දූත පිරිස් යැවීම | 4 | 6 | 27 | 56 | 07 | 40 |




- විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල කම්කරු සහ සුභසාධන අංශ 15 වම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් හඳුන්වා දෙන ලදී
- විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල කම්කරු සහ සුභසාධන අංශ වෙත නිලධාරීන් බඳවා ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව බඳවා ගැනීම් පරිපාටියක් සකස් කිරීම
- සුරක්ෂා නිවාසවල සිටින විගමනික ශ්‍රමිකයින්ගේ ගැටලු කඩිනමින් විසඳා ගැනීම උදෙසා සුරක්ෂා නිවාසවල සිටින විගමනික ශ්‍රමිකයින් සමඟ Zoom තාක්ෂණය හරහා සාකච්ඡා කිරීමට විශේෂ වැඩසටහනක් පවත්වන ලදී

# සභාපතිතුමාගේ පණිවිඩය



ශ්‍රී ලංකාව තුළ පැවති ආර්ථික හා දේශපාලනික අස්ථාවරත්වය යටතේ වුවද 2022 වසර ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට (වී.සේ.නි.කා) කැපී පෙනෙන වසරක් විය.

කාර්යාංශය 2022 වර්ෂයේදී 311,000ක වාර්තාගත ලියාපදිංචි කිරීම් සහ රු. බිලියන 11.4ක වාර්තාගත ආදායමක් වාර්තා කරන ලද අතර වසර තුළ ආදායම 2021 වර්ෂයට වඩා 276%ක වැඩි වීමක් ලෙස වාර්තාගත විය. මීට අමතරව, බදුවලට පෙර ලාභය බිලියන 7.7ක් ලෙස වාර්තාගත වූ අතර එය 2021 වර්ෂයට වඩා 1,131% වැඩිවීමකි.

රටතුළ පැවැති ඉන්ධන හිඟය සහ අඛණ්ඩ විදුලි කප්පාදු වැනි අතිශය දුෂ්කර තත්ත්වයන් යටතේ මෙම සියලු ජයග්‍රහණ අත්කර ගැනීමට හැකි වුයේ කාර්ය මණ්ඩලයේ සහ කළමනාකාරිත්වයේ කැපවීම මතයි. තවද, රේඛීය අමාත්‍යාංශයෙන් කාර්යාංශය වෙත ලැබුණු දැවැන්ත සහයෝගය සහ විෂය භාර අමාත්‍යවරයාගේ නොපසුබට උත්සහය මෙම සුවිශේෂී සාර්ථකත්වය මහඟු පිටු වහලක් විය.

කාර්යාංශය විසින් නිත්‍යානුකූල මාර්ග ඔස්සේ මුදල් ප්‍රේෂණය කරන විගමනික ශ්‍රමිකයින්ගට ප්‍රතිලාභ රාශියක් හඳුන්වා දුන් අතර එහි ප්‍රතිඵලයක් ලෙස වාර්තාගත ලෙස අඩු මට්ටමක පැවැති විදේශ විනිමය 2022 වර්ෂයේ 4 වන කාර්තුවන වන විට ක්‍රමයෙන් වැඩි වීම ආරම්භ විය.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2022 වර්ෂයේදී වත්මන් තත්ත්වයන්ට සරිලන පරිදි පවතින ක්‍රියාදාමයන් සඳහා අවශ්‍ය බොහෝ වැඩිදියුණු කිරීම් සිදු කරන ලදී. මෙයට, පුහුණුව පිළිබඳ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන කිහිපයක් සමඟ අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම, ජපානය සහ කොරියාව වැනි රටවල් සමඟ සබඳතා ශක්තිමත් කිරීම, විගමනික ශ්‍රමිකයින්ගේ ආරක්ෂාව ඉහළ නැංවීම සඳහා බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතන සඳහා බලපත්‍ර ලබා දීමේ සහ බලපත්‍ර අලුත් කිරීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සහ රැකියා නියෝජිතායතන සහ අයදුම්කරුවන් සඳහා පහසු ලෙස ගෙවීම් සිදු කිරීම සඳහා මාර්ගගත ක්‍රමය ඔස්සේ ගෙවීම් සිදු කිරීම හඳුන්වා දීමට පියවර ගැනීම වැනි දැඇතුළත් විය.

2023 වර්ෂය හා ඉන් ඔබ්බට ශ්‍රී ලාංකිකයන්ට සහ රටට යහපත් අනාගතයක් උදාකරදීම සඳහා ආර්ථික වර්ධනයට දායක වීම, සුරක්ෂිත විදේශ රැකියා තුළින් පවුල්වල අදායම් ඉහළ නැංවීමට පහසුකම් සැලසීම, විදේශ රැකියා කර්මාන්තය අර්ථවත් ලෙස ප්‍රවර්ධනය කිරීම, විගමනික ශ්‍රමිකයින්ගේ පවුල්වල යහපැවැත්ම සහ සුභසාධනය වැඩි දියුණු කිරීම ආදී ඉලක්ක සියල්ල 2022 වර්ෂයේදිසාක්ෂාත් කරගන්නා ලදී.

**මහේන්ද්‍ර කුමාරසිංහ**
**සභාපති**

# කළමනාකරණ ව්‍යුහය

## අධ්‍යක්ෂක මණ්ඩලය

1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය පනතේ 05 වන වගන්ති ප්‍රකාරව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩලය පත් කරනු ලබන අතර අධ්‍යක්ෂ මණ්ඩලය පහත සමාජිකයින්ගෙන් සමන්විත වේ.

01 සාමාජිකයකු – මුදල් අමාත්‍යාංශයෙන්

01 සාමාජිකයකු - විදේශ කටයුතු අමාත්‍යාංශයෙන්

01 සාමාජිකයකු – කාන්තා කටයුතු අමාත්‍යාංශයෙන්

සාමාජිකයින් 04 දෙනෙකු – බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතනවලින්

සාමාජිකයින් 04 දෙනෙකු – විදේශ රැකියා විෂය භාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන අයවලුන්ගෙන්

2022 දෙසැම්බර් 31 න් අවසන් වසර තුළ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අධ්‍යක්ෂවරුන් ලෙස නිලය දැරූ පුද්ගලයන්ගේ නම් පහත දැක්වේ.

| අධ්‍යක්ෂකවරයාගේ නම | තනතුර |
|---|---|
| 01. මහේන්ද්‍ර කුමාරසිංහ මහතා | - සභාපති |
| 02. ඒ.ඒ.එම්. හිල්මි මහතා | - අධ්‍යක්ෂක |
| 03. ජේ.එම්.එස්.ඩී. රත්නායක මිය | - අධ්‍යක්ෂක |
| 04. වන්දන විරසේන මහතා | - අධ්‍යක්ෂක |
| 05. නිල්මිනි හේරත් මිය | - අධ්‍යක්ෂක |
| 06. සමින්ද ජයසේකර මහතා | - අධ්‍යක්ෂක |
| 07. ජෙෆ් ගුණවර්ධන මහතා | - අධ්‍යක්ෂක |
| 08. ඩබ්ලිව්.එස්. හේමන්ත සපුමොහොට්ටි මහතා | - අධ්‍යක්ෂක |
| 09. එම්.එෆ්.එම්. අර්ෂාඩ් මහතා | - අධ්‍යක්ෂක |
| 10. ඒ.එල්.එම්. හසාම් මහතා | - අධ්‍යක්ෂක |
| 11. එම්.ආර්.එම්. ෆස්ලි මහතා | - අධ්‍යක්ෂක |

## ජ්‍යෂ්ඨ කළමනාකරීත්වය

1. මහේන්ද්‍ර කුමාරසිංහ මහතා - සභාපති


2. ඩී.ඩී.පී. සේනානායක මහතා - සාමාන්‍යාධිකාරි

3. එම්.එම්. දේශප්‍රිය මහතා - අතිරේක සාමාන්‍යාධිකාරි (දේශීය කටයුතු)
4. ඒ.පී.කේ. ලියන්වල මහතා - අතිරේක සාමාන්‍යාධිකාරි (ආයතනික කටයුතු)
5. එම්.ආර්.සී.බී. ඒකනායක මහතා - අතිරේක සාමාන්‍යාධිකාරි (ජාත්‍යන්තර කටයුතු)

6. ටී. හෙට්ටිආරච්චි මහතා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (සමථ)
7. ඒ.කේ.යූ. රෝහන මහතා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි(තොරතුරු තාක්ෂණසහ කාර්යසම්පාදන)
8. පී.පී. වීරසේකර මහතා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි(රැකියා අනුමැති)
9. වයි.ඒ.එන්. අබේගුණවර්ධන මිය - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි(අභ්‍යන්තර විගණක)
10. කේ.එල්.එච්.කේ. විජේරත්න මහතා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි(විදේශ සම්බන්ධතා)
11. පී.ජී.ජී.එස්. යාපා මහතා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි(පුහුණු)
12. අයි. පතිනායක මිය - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි(ගුවන්තොටුපල සහ ප්‍රචාරණ)
13. ජේ.එම්.ආර්.යූ. ජයසිංහ මහතා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි(පරිපාලන හා මානව සම්පත්)
14. එන්.වයි. සමරසේකර මහතා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි(නීතී)
15. ජගත් බටුගෙදර මහතා - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි(සමාජ සංවර්ධන)

16. එච්.එම්. සුනිල් මහතා - ජෙෂ්ඨ කළමනාකරු (උතුරු මැද පළාත)
17. එම්.එම්.එස්. ස්විටි මිය - ජෙෂ්ඨ කළමනාකරු(උතුරු පළාත)
18. එල්.වයි. පතිරණ මහතා - ජෙෂ්ඨ කළමනාකරු(බදවාගැනීම් සහ පුහුණු)
19. පී.එම්. රත්නසිංහආරච්චි මිය - ජෙෂ්ඨ කළමනාකරු(බස්නාහිර පළාත)
20. එස්. ගාල්ලගේ මිය - ජෙෂ්ඨ කළමනාකරු(ඌව පළාත)
21. බී. හිත්තැටියගේ මහතා - ජෙෂ්ඨ කළමනාකරු(දකුණු පළාත)
22. ආර්.ඩබ්ලිව්.ජී.එස්. වාමින්ද මහතා - ජෙෂ්ඨ කළමනාකරු(මධ්‍යම පළාත)
23. ආර්.ඒ.එස්. වාමින්ද මහතා - ජෙෂ්ඨ කළමනාකරු(වයඹ පළාත)
24. ජී.ඒ.පී.එස්. නිලංගා මිය - ජෙෂ්ඨ කළමනාකරු(නැගෙනහිර පළාත)
25. බී.ඒ. රෝහිණි මිය - ජෙෂ්ඨ කළමනාකරු(සබරගමුව පළාත)

# සංවිධාන ව්‍යුහය




Admin& HR - පරිපාලන හා මානව සම්පත්
Admin - පරිපාලන
Air - ගුවන්තොටුපල එකකය
App - අනුමැති

BS - අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

Bus. Dis - ව්‍යාපාර නිරවුල් කිරීමේ ඒකකය
Con. I - සමථ I
Con II - සමථ II

Fin - මුදල්

FR - විදේශ සම්බන්ධතා හා දූත මණ්ඩල පරිපාලන

Hum. Tra - මිනිස් ජාවාරම්වලට එරෙහි එකකය
HR - මානව සම්පත්
IA - අභ්‍යන්තර විගණන
ICT - කාර්මික හා ආයතනික පුහුණු
Inv - විමර්ශන

IT - තොරතුරු තාක්ෂණ

Lice - බලපත්‍ර
Main - නඩත්තු

MPS - මිනිස්බල සැපයුම්
Mkt - අලෙවිකරණ

Plan - සැලසුම්

Proc - ප්‍රසම්පාදන
Pub - ප්‍රචාරණ

QA - තත්ත්ව ආර්ක්ෂණ
Rec (K) - බඳවාගැනීම් (කොරියානු)

Rec (G) - බඳවාගැනීම් (සාමාන්‍ය)
Rein - ප්‍රත්‍යානුකලන
Res - පර්යේෂණ

Train (D) - පුහුණු (ගෘහස්ථ)
Trans - ප්‍රවාහන
Wel - සුභසාධන

*පළාත් සඳහා පත් කර ඇතිජෙෂ්ඨ කළමනාකරුවන් අතිරේක සාමාන්‍යාධිකාරී (දේශීය කටයුතු) අධීක්ෂණය යටතේ පවතී

# කාර්යසාධන සමාලෝචනය

විදේශ රැකියා ක්ෂේත්‍රය නියාමනය සහ අධීක්ෂණය සඳහා වූ ආයතනය ලෙස ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, රැකියා සඳහා වූ සංක්‍රමණ ක්‍රියාවලියේ අදියරයන් එනම් සංක්‍රමණයට පෙර, සංක්‍රමණය අතරතුර සහ සංක්‍රමණය නිමා කිරීමෙන් පසු යන අදියරයන් යටතේ ක්‍රියාකාරකම් පිළිබඳ අවධානය යොමු කරමින් සිය මෙහෙයුම් කටයුතු ප්‍රධාන අරමුණුවලට අනුකූලව ව්‍යුහගත කර ඇත.

## අපගේ කාර්යයන්

- විදේශ රැකියා කර්මාන්තය නියාමනය කිරීම සහ ඊට අවශ්‍ය සහය ලබාදීම
  - බලපත්‍රකරණය
  - රැකියා ඇණවුම් අනුමත කිරීමේ හා රැකියා ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලීන්
  - නීති පැනවීම
  - ව්‍යාපාර ආරවුල් නිරාකරණය
- ශ්‍රී ලංකාවෙන් පිටත රැකියාවල නිරත ශ්‍රී ලාංකිකයින් සහ මෙරට සිටින ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ සුභසාධනය හා සුරක්ෂිතතාව සහතික කිරීමේ විධිවිධාන අනුගමනය කිරීම
  - සමථකරණය
  - සුභසාධන සේවා
  - පැය 24 තොරතුරු සේවා
  - නැවත පැමිණි විගමනික ශ්‍රමිකයින් සඳහා සහය
- ශ්‍රී ලාංකිකයින් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත රැකියා අවස්ථා පුළුල් කිරීම හා ඒවා ප්‍රවර්ධනය කිරීම
  - පුහුණු
  - බඳවාගැනීම්
  - රැකියා ප්‍රවර්ධනය
- පරිපාලනය, මූල්‍ය සහ යටිතල පහසුකම්

# විදේශ රැකියා කර්මාන්තය නියාමනය කිරීම හා ඊට අවශ්‍ය සහය ලබාදීම


## ➢ බලපත්‍රකරණය

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතේ විධිවිධාන ප්‍රකාරව අවශ්‍යතා සපුරන ලද අයවලුන් සඳහා විදේශ රැකියා ව්‍යාපාරයෙහි නිරත වීම පිණිස ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් බලපත්‍ර නිකුත් කරනු ලබයි. එම බලපත්‍රය වසරක කාලයක් සඳහා වලංගු වන අතර ඉන් අනතුරුව අලුත් කිරීම කළ යුතු වේ.

බලපත්‍ර අංශයේ ක්‍රියාකාරකම්;

i. නව බලපත්‍ර නිකුත් කිරීම හා බලපත්‍ර සහිත රැකියා නියෝජිත ආයතනවලට ශාඛා කාර්යාල පිහිටුවීම සඳහා අවසර ලබා දීම
ii. පවත්වා ගෙන යාම සඳහා බලපත්‍ර නිකුත් කිරීම
iii. බලපත්‍ර අලුත් කිරීම
iv. බලපත්‍ර අවලංගු කිරීම
v. නව බලපත්‍රලාභීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම
vi. උසාවි නඩු සඳහා පෙනී සිටීම
vii. සම්මුඛ පරීක්ෂණයෙන් තේරී පත් වූ නව බලපත්‍රලාභීන් සඳහා අයදුම්පත් නිකුත් කිරීම
viii. බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතනවල ශාඛා කාර්යාල සඳහා බලපත්‍ර නිකුත් කිරීම
ix. බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතන ශ්‍රේණිගත කිරීම

| අංශය මඟින් සිදු කරනු ලබන කටයුතු | | 2020 | 2021 | 2022 |
|---|---|---|---|---|
| 1. | නිකුත් කරන ලද නව බලපත්‍ර සංඛ්‍යාව | 46 | 37 | 113 |
| 2. | අලුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව | 635 | 808 | 864 |
| 3. | අවලංගු කරන ලද බලපත්‍ර සංඛ්‍යාව | 38 | 19 | 22 |
| 4. | දැනුවත් කිරමේ වැඩසටහන් සංඛ්‍යාව | 04 | 02 | 4 |
| 5. | නඩු සඳහා උසාවියේ පෙනී සිටි වාර ගණන | 101 | 46 | 108 |
| 6. | නව බලපත්‍රලාභීන් සඳහා නිකුත් කරන ලද අයදුම්පත් සංඛ්‍යාව | 82 | 157 | 233 |
| 7. | ශාඛා කාර්යාල සංඛ්‍යාව | 0 | 0 | 15 |




දැනුවත් කිරීමේ වැඩසටහන්



## ➢ රැකියා ඇණවුම් අනුමත කිරීමේ හා රැකියා ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලීන්

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ පළමු අනුමැති අංශය සහ අවසාන අනුමැති අංශය ක්‍රියාත්මක වන්නේ මෙම රැකියා ඇණවුම් අනුමත කිරීම සහ රැකියා ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලයි සඳහාය.

පළමු අනුමැති අංශය;

බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතන මඟින් ඉදිරිපත් කරනු ලබන රැකියා ඇණවුම් සහ වෙළඳ දැන්වීම් සඳහා අනුමැතිය ලබා දෙනු ලබයි. එමෙන්ම, පෞද්ගලික ක්‍රමයන් (ස්වයං ලියාපදිංචිය) ඔස්සේ රැකියා අවස්ථා ලැබෙන විගමණික ශ්‍රමිකයින් ලියාපදිංචි කිරීම හා ලියාපදිංචිය අලුත් කිරීම සඳහා ද මෙමඟින් පහසුකම් සලසනු ලබයි.

අවසාන අනුමැති අංශය;

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් අනුමත කරන ලද රැකියා ඇණවුම් ප්‍රකාරව විදේශ රැකියා අවස්ථා සඳහා ශ්‍රී ලාංකිකයින් බඳවා ගැනීම පිණිස බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතන වෙත අනුමැතිය ලබා දෙනු ලබයි.


පළමු අනුමැති අංශය

2022 වර්ෂයේදී අංශය මඟින් සිදු කරන ලද ක්‍රියාකාරකම්

| අනු අංකය | ක්‍රියාකාරකම් | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | රැකියා ඇණවුම් අනුමත කිරීම් | 3,138 |
| 01 | වෙළඳ දැන්වීම් අනුමත කිරීම් | 1,005 |
| 03 | කාර්යාංශ ස්වයං ලියාපදිංචිය – නව/අලුත් කිරීම් | 18,7639 |

2022 වර්ෂයට සාපේක්ෂව පසුගිය වසර 2ක කාර්යසාධනය විශ්ලේෂණය

| අංශය මඟින් සිදු කරනු ලබන කටයුතු | වර්ෂය | | |
|---|---|---|---|
| | **2020** | **2021** | **2022** |
| ස්වයං මාර්ගය ඔස්සේ විදේස් රැකියා සඳහා පිටත්ව යෑම් | 35,644 | 81,281 | 187,639 |
| අනුමත කරන ලද රැකියා ඇණවුම් සංඛ්‍යාව | 863 | 2,392 | 3,138 |
| අනුමත කරන ලද වෙළඳ දැන්වීම් සංඛ්‍යාව | 387 | 746 | 1,005 |





අවසන් අනුමැති අංශය

බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතන හරහා විදේශ ගතවන ශ්‍රමිකයින් කාර්යාංශයේ ලියාපදිංචි කිරීම

| # | මධ්‍යස්ථානය | ලියාපදිංචි කිරීම් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | ප්‍රධාන කාර්යාලය | 89,105 |
| 02 | පළාත් කාර්යාල | 36,345 |
| | **මුළු සංඛ්‍යාව** | **125,450** |

2022 වර්ෂයට සාපේක්ෂව පසුගිය වසර 2ක කාර්යසාධනය විශ්ලේෂණය

| # | මධ්‍යස්ථානය | ලියාපදිංචි කිරීම් සංඛ්‍යාව | | |
|---|---|---|---|---|
| | | **2020** | **2021** | **2022** |
| 01 | ප්‍රධාන කාර්යාලය | 13,414 | 31,967 | 89,105 |
| 02 | පළාත් කාර්යාල | 5,971 | 11,011 | 36,345 |
| | **මුළු සංඛ්‍යාව** | **19,385** | **42,978** | **125,450** |




**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතේ විධිවිධාන ප්‍රකාරව, ශ්‍රී ලංකාවෙන් බැහැර රැකියා අවස්ථාවන් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන සෑම ශ්‍රී ලාංකිකයෙකු විසින් ම එසේ පිටත්ව යාමට පෙරාතුව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සමඟ ලියාපදිංචි විම අනිවාර්ය වේ.** ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සමඟ එසේ ලියාපදිංචි වීම මඟින්, සත්කාරක රටවලදී ශ්‍රී ලාංකිකයින්ගේ අයිතිවාසිකම් සහ අපේක්ෂාවන් සුරක්ෂිත කෙරෙන වලංගු රැකියා ගිවිසුමක් සහිතව ශ්‍රී ලාංකිකයින් විදේශගත රැකියාවක නිරත වන බවට සහතික කරනු ලබයි. **එසේ ලියාපදිංචි වන විගමණික ශ්‍රමිකයින් හට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් ගාස්තු අයකිරීමකින් තොරව රක්ෂණාවරණයක් පිරිනමනු ලබන අතර එය ඔවුන්ගේ කොන්ත්‍රාත් කාල පරිච්ඡේදය සඳහා වලංගු වේ.** අදාළ රැකියා කොන්ත්‍රාත්තුව ප්‍රකාරව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ ලියාපදිංචිය වසර දෙකක හෝ තුනක කාලයක් සඳහා වලංගු වේ. රැකියා නියුක්තිකයින් සඳහා සිය ලියාපදිංචිය දිර්ඝ කර ගැනීම ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ ප්‍රධාන කාර්යාලය, පළාත් කාර්යාල හෝ විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල මඟින් සිදු කර ගැනීම සඳහා පහසුකම් සලසා ඇත.

## ➢ නීති පැනවීම


ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ නීති අංශය, විශේෂ විමර්ශන අංශය සහ මිනිස් ජාවාරම්වලට එරෙහි ඒකකය නීතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය වෙනුවෙන් ක්‍රියා කරනු ලැබේ. ශ්‍රී ලංකාවේ විදේශ රැකියා කර්මාන්තයේ නියුතු විවිධ පාර්ශවකරුවන් විසින් සිදු කරනු ලබන නීතිවිරෝධී ක්‍රියාකාරකම්, අකටයුතුකම්, පුද්ගල ජාවාරම් තුරන් කිරීම සඳහාත් යහපත් පරිචයන් ප්‍රවර්ධනය කිරීම සඳහාත් හැකි සෑම උත්සාහයක්ම ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් ගනු ලබයි. මෙම සන්දර්භය තුළ, විදේශ රැකියා අපේක්ෂකයින්ගේ, විගමනික ශ්‍රමිකයින්ගේ, ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්ගේ සහ අනෙකුත් අගතියට පත් පාර්ශවයන්ගේ අයිතිවාසිකම් සහ අවශ්‍යතා ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් විවිධ නීති බලාත්මක කිරීමේ යාන්ත්‍රණ ක්‍රියාත්මක කරනු ලබයි. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතන සහ වෙනත් බලපත්‍රලාභී නොවන පාර්ශවයන් විසින් සිදු කරනු ලබන නීති විරෝධී බඳවා ගැනීම් සම්බන්ධයෙන් ලැබෙන මහජන පැමිණිලි පිළිබඳ විභාග කිරීම් සිදු කරනු ලබයි. සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා වැටලීම් සිදුකරනු ලබන අතර විධිමත් විමර්ශනවලින් අනතුරුව නීතිය උල්ලංඝනය කළ පුද්ගලයින්ට එරෙහිව නීති පියවර ගනු ලබයි.

2022 වර්ෂය තුළ නීති අංශය මඟින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම්:


| | |
|---|---|
| • ස්ථාපිත නව නඩු සංඛ්‍යාව | 54 |
| • ස්ථාපිත කොරියානු නඩු සංඛ්‍යාව (මුදල් අය කර ගැනීම්) | 83 |
| • වසා දැමූ නඩු සංඛ්‍යාව | 63 |
| • අධිකරණයේ දී පෙනී සිටි නඩු ගණන | 4,121 |
| • සහතික කරන ලද කොරියානු බැදුම්කර සංඛ්‍යාව | 6,487 |
| • නඩු පැවරීමෙන් අය කර ගන්නා ලද මුදල් | රු.1,590,000 |
| • ගොනු කරන ලද නඩු සඳහා නියම කර ඇති දඩ මුදල් | රු. 1,640,000 |
| • පනවන ලද දඩ මුදලෙන් වී.සේ.නි.කා වෙත ප්‍රේෂණය කිරීම් **(75%)** | රු. 1,346,250 |
| • කොරියානු රැකියා සඳහා ගොස් පලාගිය අයවලුන්ගෙන් අයකර ගන්නා ලද මුදල් | රු. 11,470,797 |
| • බලපත්‍ර අලුත් කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වාර්තා සංඛ්‍යාව | 1,233 |
| • රක්ෂණ ගෙවීම් ගොනු කිරීමට උපදෙස් දුන්/ නිර්දේශ කරන ලද සංඛ්‍යාව | 199 |
| • සකස් කරන ලද බදු ගිවිසුම්, අවබෝධතා ගිවිසුම් සහ අනෙකුත් නීතිමය ලියවිලි සංඛ්‍යාව | 57 |
| • මානව හිමිකම් කොමිසම් සභාව හා එවැනි වෙනත් සංවිධානවල පෙනී සිටීම් සහ අවශ්‍ය පරිදි අවශ්‍ය අවසථාවලදී තොරතුරු සැපයීම | 56 |
| • දැනුවත් කිරීමේ වැඩසටහන් සහ මාධ්‍ය වැඩසටහන් සඳහා සම්පත් දායකයෙකු ලෙස දායක වීම | 12 |

## 2020 සිට 2022 දක්වා නීති අංශයේ කාර්යාසාධන විශ්ලේෂණය

| අනු අංකය. | අංශයේ ක්‍රියාකාරකම් | 2020 (රු.) | 2021(රු.) | 2022(රු.) |
|---|---|---|---|---|
| 1 | නඩු පැවරීමෙන් අය කර ගන්නා ලද මුදල් | 2,622,000 | 3,006,100 | 1,590,000 |
| 2 | ගොනු කරන ලද නඩු සඳහා නියම කර ඇති දඩ මුදල් | 2,550,000 | 503,000 | 1,640,000 |
| 3 | පනවන ලද දඩ මුදලෙන් වි.සේ.නි.කා කම්කරු සුභසාධන අරමුදල වෙත ප්‍රේෂණය කිරීම (75%) | 1,912,500 | 377,000 | 1,346,250 |
| 4 | කොරියානු රැකියා සඳහා ගොස් පලාගිය අයවලුන්ගෙන් අයකර ගන්නා ලද මුදල් | 3,129,033 | 5,423,377 | 11,470,797 |




2020 සිට 2022 දක්වා සිදු කරන ලද ක්‍රියාකාරකම්





**විශේෂ විමර්ශන අංශය විසින් සිදු කරනු ලබන කාර්යභාරය**

01. යම්කිසි පුද්ගලයෙකුගෙන් ශ්‍රී ලංකාවෙන් පිටත සේවානියුක්තිය සඳහා 1994 අංක 04 සහ 2009 අංක 56 මඟින් සංශෝධිත 1985 අංක 21 දරන පනතේ 51 වැනි වගන්තියේ දක්වා ඇති ගාස්තු හැර වෙනත් ගාස්තු අය කර කරන බලපත්‍රලාභීන්ට එරෙහිව විමර්ශන හෝ පරීක්ෂණ පැවැත්වීම.

02. යම්කිසි පුද්ගලයෙකුගෙන් ශ්‍රී ලංකාවෙන් පිටත සේවානියුක්තිය සඳහා යම් මුදලක් තමාට හෝ වෙනත් පුද්ගලයෙකුට ලබා ගැනීම හෝ ලබා ගැනීමට තැත් කරන බලපත්‍රලාභියෙකු නොවන පුද්ගලයින්ට එරෙහිව විමර්ශන හෝ පරීක්ෂණ පැවැත්වීම.

03. කාර්යාංශය විසින් නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් නොමැති විදේශ රැකියා නියෝජිතායතනයක් ලෙස ව්‍යාපාර කටයුතු කර ගෙන යන ඕනෑම පුද්ගලයෙකුට එරෙහිය වැටලීම් සිදු කිරීම.

04. කාර්යාංශයේ නීති අංශයේ සහ මිනිස් ජාවාරම්වලට එරෙහි එකකයේ සහය ඇතිව රජයේ නිළධාරීන් සහ මහජනතාව දැනුවත් කිරීම.

05. විදේශ රැකියා සඳහා කිසියම් ලියවිල්ලක් ව්‍යාජ ලෙස සකස් කරන හෝ වෙනස් කරන ඕනෑම පුද්ගලයෙකු අත්අඩංගුවට ගැනීම (පනතේ 63 වැනි වගන්තිය යටතේ ප්‍රතිපාදන වෙන් කර ඇත).

06. යම් පුද්ගලයෙකු කාර්යාංශයේ ලිඛිත පූර්ව අනුමැතියකින් තොරව විදේශ රැකියා සම්බන්ධව සහ/හෝ ඊට අදාළව කිසියම් දැන්වීමක් පළ කරන්නේ නම්, පනතේ 37 වැනි වගන්තිය යටතේ වැරදිකරුවන්/සැකකරුවන් අත්අඩංගුවට ගැනීමට කාර්යාංශ නිළධාරීන්ට බලතල පැවරී ඇත.

07. වැරදිකරුවන් අධිකරණයට ඉදිරිපත් කර වගඋත්තරකරුවන්ට එරෙහිව නඩු පැවරීමට නීති අංශයට සහය වීම.

08. ප්‍රකාශ සටහන් කිරීම සහ උසාවියට කරුණු ඉදිරිපත් කිරීම මඟින් අධිකරණයේ පැමිණිලි ගොනු කිරීමට සහ පැමිණිලි ඉදිරිපත් කිරීම සඳහා නීති අංශයට සහය වීම.

09. නඩු පවරන්නන්/සාක්ෂිකරුවන් ලෙස අධිකරණයේ පෙනී සිටීම.

10. වගඋත්තරකරුවන්ට සහ සාක්ෂිකරුවන්ට අධිකරණය විසින් නිකුත් කරන සිතාසි ලබාදීම සහ වරෙන්තු ක්‍රියාත්මක කිරීම.

11. පොලිස් නිළධාරීන් සහ කාර්යාංශ පනත ක්‍රියාත්මක කිරීමට සහ එහි අන්තර්ගත නීති සහ රෙගුලාසි ක්‍රියාවට නැංවීමට සම්බන්ධවන රජයේ නිළධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම සහ පැවැත්වීම.

12. නීතිවිරෝධී එජන්සි ආයතන, ස්ථාන හෝ විදේශ රැකියාවක් සඳහා නීතිවිරෝධී (ව්‍යාජ හෝ කූට) ලේඛන හෝ උපකරණ ළඟ තබා ගන්නා පුද්ගලයින් පිළිබඳ ලැබෙන තොරතුරු මත වැටලීම් සිදු කිරීම.

13. වෙස්වලාගත් නිලධාරීන් සහ විශේෂ ඔත්තුකරුවන්ගේ සහය ඇතිව තොරතුරු රැස් කිරීම.


2022.08.19 දින විමර්ශන පැමිණිලි සහ අධිකරණ කටයුතු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ නිලධාරීන් සඳහා පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන






ලැබුන පැමිණිලි සංඛ්‍යාව

| වර්ෂය | ලැබුනු පැමිණිලි සංඛ්‍යාව |
|---|---|
| 2020 | 1143 |
| 2021 | 552 |
| 2022 | 1338 |
| **මුළු සංඛ්‍යාව** | **3033** |




කාර්යාංශය මඟින් නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් නොමැති විදේශ රැකියා ව්‍යාපාර කටයුතුවල නියැලි සිටින පුද්ගලයින්ට එරෙහි ගොනු කර ඇති පැමිණිලි සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීම

| වර්ෂය | පවත්වන ලද පරීක්ෂණ සංඛ්‍යාව |
|---|---|
| 2020 | 394 |
| 2021 | 80 |
| 2022 | 485 |
| **මුළු සංඛ්‍යාව** | **959** |





කාර්යාංශය මඟින් නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් නොමැති පුද්ගලයින් විසින් සිදු කරනු ලබන බඳවාගැනීම්වලදී වැටලීම් සිදු කිරීම

| වර්ෂය | සිදු කරන ලද වැටලීම් සංඛ්‍යාව | සාර්ථක වැටලීම් සංඛ්‍යාව |
|---|---|---|
| 2020 | 173 | 173 |
| 2021 | 04 | 04 |
| 2022 | 27 | 27 |
| **මුළු සංඛ්‍යාව** | **204** | **204** |




**2020 සිට 2022 වර්ෂ තුළ විසඳූ පැමිණිලි සංඛ්‍යාව**

| වර්ෂය | විසඳූ පැමිණිලි සංඛ්‍යාව |
|---|---|
| 2020 | 936 |
| 2021 | 1065 |
| 2022 | 921 |
| මුළු සංඛ්‍යාව | **2922** |



මිනිස් ජාවාරම්වලට එරෙහි කාර්යාංශ ඒකකය වෙත 2022 වර්ෂයේදී ලැබුනු පැමිණිලි සංඛ්‍යාව - 36

මිනිස් ජාවාරම්වලට එරෙහි කාර්යාංශ ඒකකය වෙත ලැබුනු පැමිණිලි සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග

- ❖ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලද පැමිණිලි සංඛ්‍යාව - 36

## ➢ ව්‍යාපාර ආරවුල් නිරාකරණය

විදේශ රැකියා කර්මාන්තයෙහි නිරත පාර්ශවයන් අතර පැන නඟින ව්‍යාපාර ආරවුල් විසඳීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මැදිහත් වේ. එනම්, බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතන දෙකක් හෝ ඊට වැඩි ගණනක් අතර, විදේශ බදවාගැනීම් ආයතනයක් සහ බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතනයක් අතර හෝ බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතනයක් සහ විගමනික ශ්‍රමිකයකු හෝ රැකියා අපේක්ෂකයෙකු අතර වශයෙනි.

| පැමිණිල්ලේ ස්වභාවය | පැමිණිලි සංඛ්‍යාව | | | | | |
|---|---|---|---|---|---|---|
| | 2020 | | 2021 | | 2022 | |
| | ලැබුණු | විසඳූ | ලැබුණු | විසඳූ | ලැබුණු | විසඳූ |
| මෙරට බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතන සහ විදේශ එජන්සි ආයතන අතර ව්‍යාපාර ආරවුල් | 29 | 2 | 10 | 2 | 42 | 8 |
| මෙරට බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතන අතර ව්‍යාපාර ආරවුල් | 13 | 2 | 26 | 5 | 0 | 0 |
| බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතන සහ විගමනික ශ්‍රමිකයකින් අතර ව්‍යාපාර ආරවුල් | 175 | 30 | 141 | 26 | 683 | 144 |
| බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතනවලට එරෙහිව විගමනික ශ්‍රමිකයකින් අතර ව්‍යාපාර ආරවුල් | - | - | - | - | 202 | 66 |
| **මුළු සංඛ්‍යාව** | **217** | **34** | **177** | **33** | **927** | **218** |

| | 2020 | 2021 | 2022 |
|---|---|---|---|
| සියළු කාණ්ඩ යටතේ ලද මුළු පැමිණිලි සංඛ්‍යාව | 217 | 177 | **927** |
| සියළු කාණ්ඩ යටතේ විසඳූ පැමිණිලි සංඛ්‍යාව | 34 | 33 | **218** |
| විසඳීමේ ප්‍රතිශතය | 15.66% | 18.64 % | **23.52%** |

ව්‍යාපාර ආරවුල් නිරාකරණය කිරීමේ ඒකකය වෙත බහුතරයක් ලැබී ඇති පැමිණිලි (74%කට වැඩි) බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතන විසින් විදේශ රැකියාවට යාම ප්‍රතික්ෂේප කරන ලද හෝ පරිවාස කාලය තුළ නැවත ශ්‍රී ලංකාවට පැමිණි විගමනික ශ්‍රමිකයින්ට එරෙහිව ගොනු කර ලද පැමිණිලි වේ. මෙවැනි පැමිණිලිවල අදාල ශ්‍රමිකයාගේ විදේශ රැකියා ගමන වෙනුවෙන් මුලික වියදම් දරා ඇත්තේ අදාල බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතන විසිනි. 2020 සහ 2021 වර්ෂවල මෙම අංශය වෙත ලැබුණු පැමිණිලි සංඛ්‍යාවට සාපේක්ෂව 2022 වර්ෂයේදී ලැබුනු පැමිණිලි සංඛ්‍යාව ක්‍රමානුකූලව වැඩි වී ඇත්තේ විගමනික ශ්‍රමිකයින්ගේ විදේශ ගමන් බලපත්‍රය / ජාතික හැඳුනුම්පත අත්හිටුවීමට ව්‍යාපාර ආරවුල් නිරාකරණය කිරීමේ ඒකකය විසින් අනුගමනය කරනු ලබන ක්‍රමවේදය පිළිබඳව බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතන දැනුවත් වීමත් සමඟිනි.

2022 දෙසැම්බර් දක්වා ව්‍යාපාර ආරවුල් නිරාකරණය කිරීමේ ඒකකය විසින් විගමනික ශ්‍රමිකයින්ගේ පැමිණිලි 202 ක් භාර ගෙන ඇති අතර ඉන් 66 ක් සමථයකට පත් කර ඇත. ඇතැම් අවස්ථාවලදී විගමනික ශ්‍රමිකයින් විසින් හෝ අදාල බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතන විසින් පැමිණිලි විසඳී ඇති බවට ව්‍යාපාර ආරවුල් නිරාකරණය කිරීමේ ඒකකය වෙත දැනුම් දීම සිදු නොකරනු ලැබේ. එසේ නොවුනේ නම් විසඳී ඇති පැමිණිලි සංඛ්‍යාව මීට වඩා වැඩි විය හැක.


කෙසේ නමුත්, පැමිණිලි විසඳීම් සලකා බැලීමේදී, සියලුම කාණ්ඩ යටතේ පැමිණිලි විසඳීමේ ප්‍රතිශතය 2022 වර්ෂයේදී 23.52% වූ අතර මෙය 2020 සහ 2021 වර්ෂයන්ට සාපේක්ෂව ඉහළ අගයක් ගන්නා ලදී.

# ශ්‍රී ලංකාවෙන් බැහැරව රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයින් හා ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්ගේ ආරක්ෂාව හා සුභසාධනය සහතික කිරීම

## ➢ පැමිණිලි නිරාකරණය

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සමථ අංශය, අදාල රටේ ශ්‍රී ලංකා දූත මණ්ඩලවල පිහිටුවා ඇති කම්කරු හා සුභසාධන අංශ මඟින් විගමනික ශ්‍රමිකයකු හෝ ඔහු / ඇය වෙනුවෙන් පැමිණිලි භාර ගැනීම සිදු කරයි. ලියාපදිංචි විගමනික ශ්‍රමිකයෙකු හෝ ඔහු / ඇය වෙනුවෙන් පෙනී සිටින පුද්ගලයෙකුට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රධාන කාර්යාලයේ, පළාත් කාර්යාලවල හෝ අදාල රටේ ශ්‍රී ලංකා දූත මණ්ඩලවල කම්කරු හා සුභසාධන අංශවල පැමිණිලි ගොනු කිරීම කළ හැක. සමථ අංශයට හෝ එතෙර පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලවල කම්කරු හා සුභසාධන අංශයට අනුයුක්තව සිටින කාර්යාංශයේ බලය ලත් නිළධාරින්, අදාල බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතන හා විදේශ රැකියා එජන්සි ආයතන හරහා පැමිණිලි විසඳීමේ කාර්යක්ෂමව ඉහළ නැංවීම උදෙසා කාර්යාංශය විසින් පැමිණිලි කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කරනු ලබයි. අදාල පාර්ශවයන්ට පැමිණිලි කළමනාකරණ පද්ධතිය ඔස්සේ සන්නිවේදනය කිරීමට හා තොරතුරු වාර්තා කිරීමට පහසුකම් සලසා ඇත.

| | වර්ෂය | | |
|---|---|---|---|
| | 2020 | 2021 | 2022 |
| ලැබුණු පැමිණිලි | 3,350 | 2,362 | 3,236 |
| විසඳූ පැමිණිලි | 2,421 | 3,360 | 3,167 |
| විගමනික ශ්‍රමිකයින් ලද මූල්‍ය ප්‍රතිලාභ | රු.2,370,612/- | රු.2,295,925/- | රු.17,992,054/- |



## ➢ සුභසාධන සේවා

විගමනික ශ්‍රමිකයින්ගේ සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්ගේ ආරක්ෂාව හා යහපැවැත්ම සහතික කිරීම ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රධාන අරමුණු අතරින් එකක් වන බැවින් විගමනික ශ්‍රමිකයින් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ මූල්‍ය ස්ථාවරත්වයත්, ඔවුන්ගේ දරුවන්ගේ අධ්‍යාපනය පිළිබඳව අවධානය යොමු කරමින් සුභසාධන අංශය හරහා සේවා ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලැබේ. එමෙන්ම, හදිසි අවස්ථාවන්හි දී අපගේ සහයෝගයේ දැන් දිගු කරන අතර වෛද්‍ය සහාය සැපයීමත්, ආබාධිත විගමනික ශ්‍රමිකයින් සඳහා සහාය විමත් ආදිය සිදු කරනු ලැබේ.

සුභසාධන කටයුතු

| අනු අංකය | ක්‍රියාකාරකම් | ප්‍රතිලාභීන්ගේ සංඛ්‍යාව | දරන ලද පිරිවැය රු. (මිලි) |
|---|---|---|---|
| 01 | **රක්ෂණ ප්‍රතිලාභ ලබාදීම**<br>• ලියාපදිංචි වූ දින සිට වසර දෙකක කාල සීමාව තුළදි මියගිය, රෝගාබාධ, ශුද්ගලික අනතුරු හෝ හිරිහැරයට ලක් වූ ලියාපදිංචි විගමනික ශ්‍රමිකයින් | 551 | 111.688 |
| | විගමනික ශ්‍රමිකයින් වෙනුවෙන් ගෙවන ලද රක්ෂණ වාරික (දේශිය) | 314,057 | 444.5 |
| 02 | **ශිෂ්‍යත්ව පිරිනැමීම**<br>ලියාපදිංචි විගමනික ශ්‍රමිකයින්ගේ දූ දරුවන් වෙත ශිෂ්‍යත්ව පිරිනැමීම | 2,755 | 3.3 |
| | | | |
| 03 | **පාසල් උපකරණ ලබා දීම**<br>විදේස් ගතව සිටින දෙමව්පියන් රැකියාවේදි මුහුණ පාන ගැටලු හේතුවෙන් ඇතිවූ මූල්‍ය දුෂ්කරතා හේතු කොට ගෙන අධ්‍යාපන කටයුතු කර ගෙන යා නොහැකි විගමනික ශ්‍රමිකයින්ගේ දරුවන් සඳහා පාසල් උපකරණ ලබා දීම | 789 | 7.5 |
| 04 | විශේෂ අවශ්‍යතා ඇති විගමනික ශ්‍රමිකයින්ගේ දරුවන් සඳහා සහය ලබා දීම | 11 | 0.633 |
| 05 | විගමනික ශ්‍රමිකයින්/පවුලේ සාමාජිකයින් සඳහා බස් ගාස්තු හා සුළු ආහාරපාන සැපයීම | 182 | 0.196 |
| 06 | සේවක සුභසාධන අරමුදල යටතේ විගමනික ශ්‍රමිකයින්ට හා ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්හට විශේෂ සහන ලබා දීම | 66 | 14.025 |
| 07 | නිවාස ඉදිකිරීම සඳහා මූල්‍යමය සහ තාක්ෂණික සහාය ලබා දීම<br>විදේශ රැකියාවක නිරතව සිටියදි සිදු වූ අනතුරකින් ආබාධිත තත්ත්වයට පත් වූ (65% හෝ ඊට වැඩි) ලියාපදිංචි විගමනික ශ්‍රමිකයින් | 06 | 2.1 |
| 08 | අවශ්‍ය විගමනික ශ්‍රමිකයින්හට මූල්‍ය හා මූල්‍ය නොවන අයුරින් වෛද්‍ය පහසුකම් ලබා දීම<br>• අවශ්‍යතා ඇති ලියාපදිංචි විගමනික ශ්‍රමිකයින්හට සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්හට වෛද්‍ය ප්‍රතිකාර, නිර්දේශිත ඖෂධ සහ පෝෂදායී ආහාර සඳහා ගෙවීම් සිදු කිරීම | 15 | 0.221 |
| 09 | නිවාස ණය සඳහා සහනාධාර ගෙවීම | 4 | 0.05 |
| 10 | අපදා තත්ත්ව | 5 | 0.75 |

ශීෂ්‍යත්ව ප්‍රදානය






ආබාධිත විගමනික ශ්‍රමිකයින් සඳහා සහාය වීම



| # | ක්‍රියාකාරකම් | 2020 | | 2021 | | 2022 | |
|---|---|---|---|---|---|---|---|
| | | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | වියදම (රු. මිලි) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | වියදම (රු. මිලි) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | වියදම (රු. මිලි) |
| 1 | විගමනික ශ්‍රමිකයින්ගේ දු දරුවන් සඳහා ශිෂ්‍යත්ව ප්‍රදානය | 797 | 20.24 | 872 | 21.51 | 2755 | 3.3 |
| 2 | විගමනික ශ්‍රමිකයින්ගේ දු දරුවන් සඳහා පාසල් උපකරණ ලබා දීම | 124 | 0.57 | 46 | 0.22 | 789 | 7.5 |
| 3 | අවශ්‍යතා ඇති විගමනික ශ්‍රමිකයින් සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් වෙත සේවක සුභසාධන අරමුදල යටතේ විශේෂ සහන ලබා දීම | 59 | 11.22 | 131 | 26.92 | 66 | 14.025 |
| 4 | පකිස්ථානයේදී ඝාතනයට ලක් වූ ප්‍රියන්ත කුමාර මහතාගේ පවුලේ සාමාජිකයින් වෙත විශේෂ ආධාර පිරි නැමීම | - | - | 3 | 2.5 | - | - |
| 5 | නිවාස ණය සඳහා සහනාධාර (පැවති යොජනාක්‍රමය පවත්වාගෙන යාමට උනන්දුවක් දක්වන) | 0 | 0 | 4 | 0.099 | 4 | 0.005 |
| 6 | විගමණික ශ්‍රමිකයින් වෙනුවෙන් රක්ෂණ වාරික ගෙවීම (සහන රක්ෂණය) | 48,464 | 30.14 | 72,946 | 60.43 | 314,057 | 444.5 |
| 7 | විගමනික ශ්‍රමිකයින් සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් සඳහා රක්ෂණ ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා සහය වීම | 1,344 | 104.64 | 640 | 130.29 | 551 | 111.685 |
| 8 | විගමනික ශ්‍රමිකයින්ට සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් සඳහා වෛද්‍ය ප්‍රතිකාර, නිර්දේශිත ඖෂධ, ආහාර සහ අනෙකුත් ද්‍රව්‍ය සඳහා ගෙවීමට සහය වීම | 8 | 0.068 | 5 | 0.248 | 15 | 0.221 |
| 9 | ආබාධිත විගමනික ශ්‍රමිකයින් සඳහා නිවාස ඉදි කිරීම සඳහා මූල්‍ය සහ තාක්ෂණික සහය ලබා දීම | 4 | 0.504 | 2 | 0.60 | 06 | 2.1 |
| 10 | හඳුනාගත් විශේෂ අවශ්‍යතා ඇති විගමනික ශ්‍රමිකයින්ගේ දරුවන්හට විශේෂ සහන ලබා දීම | 12 | 0.13 | 14 | 0.188 | 11 | 0.633 |
| 11 | විගමනික ශ්‍රමිකයින් සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් සඳහා වෛද්‍ය කඳවුරු පැවැත්වීම | 1 | 0.448 | 0 | 0 | 2 | 0.629 |
| 12 | ළමා රක්ෂණය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | 1 | 0.063 | 0 | 0 | - | - |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 13 | විගමනික ශ්‍රමිකයින්/පවුලේ සාමාජිකයින් සඳහා බස් ගාස්තු හා සුළු ආහාරපාන සැපයීම | 112 | 0.01 | 7 | 0.004 | 182 | 0.6 |
| 14 | අපදා තත්ත්වයන්හිදී විගමනික ශ්‍රමිකයින්ගේ පවුලේ සාමාජිකයින් සඳහා සහය වීම | 13 | 0.17 | 0 | 0 | 5 | 0.75 |
| 15 | කොවිඩ් වසංගත ආසාදනය වී මිය ගිය විගමනික ශ්‍රමිකයින්ගේ ආගමික කටයුතු වෙනුවෙන් රු .40,000/- මූල්‍ය ආධාර පිරි නැමීම | - | - | 83 | 3.32 | - | - |
| 16 | විගමනික ශ්‍රමිකයින්ගේ නිරෝධායන සඳහා ගෙවීම් සිදු කිරීම | - | - | 575 | 25.08 | - | - |
| | **මුළු කාර්යසාධනය** | **50,939** | **168.203** | **75,328** | **271.409** | **318,443** | **708.2299** |





පාසල් උපකරණ ලබා දීම







**මනුසවි විශ්‍රාම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම**

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සහ ශ්‍රී ලංකා සමාජ රක්ෂණ මණ්ඩලය එකාබද්ධව "මනුසවි" නමින් විශ්‍රාම යෝජනා ක්‍රමයක් ලියාපදිංචි විගමනික ශ්‍රමිකයින් සඳහා හඳුන්වා දෙන ලදී. වයස අවුරුදු 60 ඉක්මවූ පසු විගමනික ශ්‍රමිකයින් මෙම යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා සුදුසුකම් ලබන අතර ඔවුන්ට ඔවුන්ගේ විදේශයන්හි ලබන ඉපැයීම් මඟින් මෙම යෝජනා ක්‍රමයට දායක්තවය ලබා දිය හැකිය.





ආගමන හා විගමන දෙපාර්තමේන්තුව මඟින් විගමනික ශ්‍රමිකයින්ට ගුවන්ගමන් බලපත්‍රවලට අදාල සේවාවන් ලබා ගැනීම සඳහා විශේෂ කවුළුවක් ආරම්භ කරන ලදී.


**ගුවන්තොටුපල අංශය (ගුවන්තොටුපල ඒකකය සහ සහන පියස)**

විදේශ රැකියාවලට අදාළ නීතිය ක්‍රියාත්මක කිරීමේ වගකීමේ අංගයක් ලෙස, විදේශ රැකියා සඳහා පිටත්ව යන ශ්‍රී ලාංකිකයන් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙහි ලියාපදිංචිය සහිතව විදේශ ගතවන්නේද යන්න තහවුරු කිරීම සඳහා බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ පිටත්වීමේ පර්යන්තයේ සේවා කවුළුවක් කාර්යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලැබේ. විදේශ රැකියා සඳහා නීතිවිරෝධී බඳවා ගැනීම් සහ මිනිස් ජාවාරම් සඳහා දරන උත්සහයන් ද මෙම ඒකකයට අනුයුක්ත කාර්යාංශයේ නිලධාරීන් විසින් අනාවරණය කරනු ලැබේ. මෙම ඒකකය මඟින් විගමනික ශ්‍රමිකයින්හට රටින් පිටවීමට පෙර ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචිය ලබා ගැනීමට පහසුකම් සපයයි.

මීට අමරතව, ශ්‍රී ලංකාවට ආපසු පැමිණීමෙදි විශේෂ සහයන් අවශ්‍ය ශ්‍රී ලාංකික විගමනික ශ්‍රමිකයින්ට සේවාවන් සැපයීම සඳහා බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ පැමිණීමේ පර්යන්තයේ තවත් සේවා ඒකකයක් ක්‍රියාත්මත කරනු ලැබේ. ආපසු පැමිණෙන විගමනික ශ්‍රමිකයින් සඳහා සුහසාධන පහසුකම් සම්බන්ධීකරණය කිරීමට සහ සුහසාධන සේවා සැපයීම සඳහා බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළට ආසන්නයේ "සහන පියස" නමින් සුහසාධන මධ්‍යස්ථානයක් (18 කණුව, මීගමුව පාර, සීදුව) ගුවන්තොටුපළ ඒකකය යටතේ ක්‍රියාත්මක කරනු ලැබේ.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ගුවන්තොටුපල අංශය හරහා සපයනු ලබන විශේෂ සහයන් අතරට රෝගීවූ, මානසිකව අසංතුලිත වූ, තුවාල වූ හෝ බරපතල සෞඛ්‍ය තත්ත්වයන් සහිතව ආපසු පැමිණෙන විගමනික ශ්‍රමිකයින් රෝහල්ගත කිරීම, ආබාධිතවූ, තුවාල වූ, අසනීප වූ හෝ රෝහල වෙත හෝ පදිංචි ස්ථානයට විශේෂ ප්‍රවාහන පහසුකම් අවශ්‍ය ආපසු පැමිණෙන විගමනික ශ්‍රමිකයින් සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීම, විශේෂ වෛද්‍ය සායන වෙත, පරිවාස දෙපාර්තමේන්තුව වෙත, වැඩිදුර සුභසාධන ආධාර සඳහා කාර්යාංශයේ සුභසාධන අංශය වෙත හෝ පැමිණිලි ඉදිරිපත් කිරීමට සමථ අංශය හෝ විශේෂ විමර්ශන අංශය වෙත යොමු කිරීම, නවාතැන් පහසුකම්, ආහාර, ඖෂධ, ඇදුම් පැළඳුම්, ගමන් වියදම් ලබා දීම ආදීය ඇතුළත් වේ.

බාහිරින් ගිලන් රථ සේවා අවශ්‍ය රෝගීන් සඳහා එවැනි සේවාවන් ද සපයනු ලැබේ.ගුවන්තොටුපළ වෛද්‍ය මධ්‍යස්ථානයේ වෛද්‍ය නිලධාරිවරයාගේ නිරදේශය මත රෝහල් වෙත රෝගීන් යොමු කිරීම හා ඇතුළත් කිරීම හෝ පදිංචි ස්ථාන වෙත ප්‍රවාහන පහසුකම් සැලසීම සිදු කරනු ලැබේ.ගුවන්තොටුළ අංශය මඟින් මියගිය විගමනික ශ්‍රමිකයින්ගේ ළඟම ඥාතීන් වෙත ගුවන්තොටුපළේ අදාළ බලධාරීන්ගෙන් මිය ගිය විගමනික ශ්‍රමිකයාගේ දේහය නිදහස් කර ගැනීම සඳහා සහාය වන අතර මියගිය අයගේ ළඟම ඥාතීන් වෙත අවමංගල්‍ය කටයුතු වෙනුවෙන් රු. 40,000ක මුදලක් ලබා දෙනු ලැබේ. මියගිය විගමනික ශ්‍රමිකයින්ගේ ළඟම ඥාතීන්ගේ ඉල්ලීම පරිදී දේහය පශ්චාත් මරණ පරීක්ෂණ සිදු කිරීමට යොමු කිරීමට සහය වීම සහ දේහය අවශ්‍ය ප්‍රදේශය වෙත රැගෙන යාම සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීම ද ගුවන්තොටුපල අංශය මඟින් සිදු කරනු ලැබේ.


## පැය 24 පුරා තොරතුරු සේවය

විදේශ රැකියා පිළිබඳ ඕනෑම පුද්ගලයෙකුට තොරතුරු සැපයීම සඳහා මෙන්ම විගමනික ශ්‍රමිකයින් හෝ ඔහු/ඇය වෙනුවෙන් පෙනී සිටින අයගේන් ලැබෙන පැමිණිලි ලබා ගැනීමට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් පැය 24 තොරතුරු මධ්‍යස්ථානයක් මෙහෙයවනු ලබයි. 1989 ක්ෂණික ඇමතුම් අංකය ඔස්සේ හා විශේෂිත වෙන් කරන ලද 011-2879900 දරන දුරකථන අංකය ඔස්සේ හෝ infor_center@slbfe.lk දරන විද්‍යුත් ලිපිනය ඔස්සේ හා 24 hours call center - SLBFE යන ස්කයිප් මාර්ගය ඔස්සේ ඕනෑම අයෙකුට මෙම තොරතුරු මධ්‍යස්ථානය සමඟ සම්බන්ධ විය හැකිය.



## ➢ ආපසු මෙරටට පැමිණි විගමනික ශ්‍රමිකයින් සඳහා සහාය සැපයීම

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රත්‍යානුකලන ඒකකය මඟින් සිය විෂය පථය තුළ විගමණික ශ්‍රමිකයින් වෙත ඔවුන්ගේ සමාජ ආර්ථික වශයෙන් යළි සමාජගත කිරීම, ඔවුන්ගේ කුසලතා වර්ධනය කිරීම, නැවත රැකියාවක යෙදවීම සහ නැවත ශ්‍රම බලකාය වෙත ඇතුළු කිරීම වෙනුවෙන් ක්‍රියාකාරකම් රාශියක් දිස්ත්‍රික් සම්බන්ධීකරණ සහ අදාල වෙනත් පාර්ශවයන්ගේ සහයෝගයෙන් ක්‍රියාත්මක කරන ලදී.

2022 වර්ෂයේ ප්‍රත්‍යානුකලන ඒකකයේ ප්‍රධාන ක්‍රියාකාරකම්


1. ස්වයං රැකියා ආරම්භ කිරීම/තවදුරටත් දියුණු කිරීම සඳහා විගමනික ශ්‍රමිකයින් සඳහා උපකරණ ලබා දීම
2. ආපසු මෙරටට පැමිණි විගමනික ශ්‍රමිකයින්ගේ දු දරුවන් සඳහා පාසල් උපකරණ ලබා දීම
3. සංවර්ධන නිලධාරීන්ගේ රාජකාරී ජංගම දුරකථනවල දුරකථන බිල්පත් සඳහා ගෙවීම් සිදු කිරීම
4. අවශ්‍යතා සහිත ආපසු මෙරටට පැමිණි විගමනික ශ්‍රමිකයින් සහ ඔවුන්ගේ පවුලේ සමාජිකයින් සඳහා උපදේශන සේවා/සහයෝගයන් ලබා දීම
5. විගමනික ශ්‍රමිකයින්ගේ ව්‍යාපාර/ආයෝජන/ප්‍රත්‍යානුකූලන සැලසුම් ක්‍රියාත්මක කිරීම අධික්ෂණය කිරීම සඳහා සමාලෝචන වැඩසටහන් පැවැත්වීම
6. ප්‍රගති සමාලෝචන කිරීම සඳහා බහු අංශික කමිටු රැස්වීම් පැවැත්වීම
7. රේඛීය අමාත්‍යාංශයේ සහයෝගයෙන් සංවර්ධන නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම
8. ආපසු මෙරටට පැමිණි විගමනික ශ්‍රමිකයින්හට දේශීය රැකියා ලබා ගැනීම සඳහා අදාල පාර්ශව වෙත යොමු කිරීම.
9. සිවිල් සමාජ සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන, පෞද්ගලික අංශය සහ වෘත්තිය සමිති සමඟ සම්බන්ධීකරණය කිරීම

**ස්වයං රැකියා ආරම්භ කිරීම/තවදුරටත් දියුණු කිරීම සඳහා විගමනික ශ්‍රමිකයින් සඳහා උපකරණ ලබා දීම**






| පළාත | 2021<br>එක් පුද්ගලයෙකුට රු.25,000/= දක්වා | | 2022<br>එක් පුද්ගලයෙකුට රු. 50,000/= දක්වා | |
|---|---|---|---|---|
| | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | වියදම (රු.) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | වියදම (රු.) |
| බස්නාහිර | - | - | 72 | 2,300,478.66 |
| දකුණ | - | - | 42 | 2,142,107.00 |
| මධ්‍යම | - | - | 24 | 1,313,088.12 |
| ඌව | 10 | 241,949.00 | 15 | 747,800.00 |
| උතුරු මැද | - | - | 14 | 600,000.00 |
| සබරගමුව | 67 | 1,642,653.00 | 8 | 399,950.00 |
| නැගෙනහිර | 54 | 1,188,715.00 | 5 | 247,600.00 |
| වයඹ | 76 | 1,812,482.00 | 1 | 49,845.00 |
| මුළු සංඛ්‍යාව | **207** | **4,885,799** | **181** | **7,800,868.78** |





2021 – 2022 වර්ෂවල කාර්යසාධනය





ආපසු මෙරටට පැමිණි විගමනික ශ්‍රමිකයින්ගේ දු දරුවන් සඳහා පාසල් උපකරණ ලබා දීම

| පළාත | 2020 | | 2021 | | 2022 | |
|---|---|---|---|---|---|---|
| | ශිෂ්‍යයන් සංඛ්‍යාව | වියදම (රු) | ශිෂ්‍යයන් සංඛ්‍යාව | වියදම (රු) | ශිෂ්‍යයන් සංඛ්‍යාව | වියදම (රු) |
| දකුණ | 17 | 84907.20 | 05 | 24960.54 | 205 | 1,007,085.75 |
| ඌව | 02 | 9444.00 | - | - | 127 | 595,322.00 |
| බස්නාහිර | 02 | 10000.00 | 12 | 57330.00 | 59 | 269,481.30 |
| සබරගමුව | 05 | 24988.25 | 32 | 152139.00 | 141 | 654,599.50 |
| උතුරු මැද | - | - | 03 | 14978.54 | 134 | 694,629.41 |
| වයඹ | - | - | 11 | 54945.00 | 59 | 284,205.30 |
| මධ්‍යම | 02 | 9328.00 | 20 | 97553.00 | 33 | 147,780.00 |
| උතුර | - | - | - | - | 38 | 194,389.10 |
| නැගෙනහිර | - | - | - | - | 19 | 94,707.40 |
| මුළු සංඛ්‍යාව | 28 | 138,667.45 | 83 | 401,906.08 | 815 | 3,942,199.76 |






**ප්‍රත්‍යානුකලන ඒකකය විසින් 2022 වර්ෂයේදී සිදු කරන ලද විශේෂ ක්‍රියාකාරකම්**


IM Japan වැඩසටහන යටතේ පිටත් වන පුහුණුලාභීන්හට ඔවුන් විසින් සේවය කරන ලද ජපන් සමාගම් විසින් පුහුණු කාලය අවසන් කර නැවත ශ්‍රී ලංකාවට පැමිණි පසු වසරකට ජපන් යෙන් 200,000 බැගින් ජපන් යෙන් 600,000ක දිරි දීමනාවක් ලබා දෙනු ලැබේ. IM Japan මඟින් මෙම දිරි දීමනාව පුහුණුලාභීන් නව රැකියාවක් සොයා ගැනීම හෝ ව්‍යාපාරයක් ආරම්භ කිරීම සිදු කරනු ඇතැයි අපේක්ෂවෙන් ලබා දෙනු ලැබේ.

මෙම දිරි දීමනාව කාර්යාංශයේ ගිණුම වෙත පුහුණුලාභීන් ජපානයේදී සේවය කරන ලද සෑම ආයතනයකින්ම ප්‍රේෂණය කරන අතර එසේ ප්‍රේෂණය වූ මුදල අදාළ පුහුණුලාභීන් වෙත ලබා දීම ප්‍රත්‍යානුකලන ඒකකය මඟින් සිදු කරනු ලැබේ. ආපසු ශ්‍රී ලංකාවට පැමිණි පුහුණුලාභීන් සඳහා ව්‍යාපෘති සහ ව්‍යවසායකත්වය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම ද ඔවුන්ගේ ව්‍යාපරවල සාර්ථකත්වය පිළිබඳ පසු විපරම් කිරීම ද ප්‍රත්‍යානුකලන ඒකකය මඟින් සිදු කරනු ලැබේ.

ඒ අනුව, 2022 වර්ෂයේදී ප්‍රත්‍යානුකලන ඒකකය විසින් සිදු කරන ලද ඉහත ක්‍රියාකරකම්වල ප්‍රගතිය පහත පරිදි වේ.

| | |
|---|---|
| 2022 වර්ෂය තුළ පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව | - 02 |
| ප්‍රතිලාභ ලැබූ පුහුණුලාභීන් සංඛ්‍යාව | - 40 |
| පුහුණුලාභීන් වෙත ප්‍රේෂණය කරන ලද මුළු මුදල | - Rs. 53,478,278.36. |

ව්‍යාපෘති සහ ව්‍යවසායකත්වය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන සහ වෙක්පත් ප්‍රධානය කිරීමේ උත්සවය



# ශ්‍රී ලාංකිකයින් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත රැකියා අවස්ථා පුළුල් කිරීම හා ඒවා ප්‍රවර්ධනය කිරීම

## ➢ පුහුණු කිරීම්


නිපුණතා සහිත විගමණික ශ්‍රම බලකායක් ඇති කිරීම සහ ඔවුන්ගේ කුසලතා වර්ධනය කිරීම සහ අනෙකුත් ජාතිකයින් අතර විදේශ රැකියා සඳහා අවශ්‍ය නිපුණතා මට්ටම සාක්ෂාත් කර ඇති දක්ෂ අයදුම්කරුවෙකු වීම සඳහා සහය වීම අරමුණු කරගනිමින්, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් රැකියා සොයන්නන් සඳහා පෙර විගමනික පුහුණුව ලබා දීම සඳහා අංශ දෙකක් ස්ථාපිත කර ඇත.

පුහුණු (ගෘහස්ථ) සහ පුහුණු (කාර්මික හා ආයතනික) අංශය විසින් විදේශ රැකියා අපේක්ෂා කරන විගමනික ශ්‍රමිකයින්ගේ කුසලතා වර්ධනය කිරීම සඳහා සහ සහතික කිරීම හරහා විදේශ රැකියා ක්ෂේත්‍රයේ අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය නිපුණතා මට්ටම ලබා දීම සහ විදේශ ශ්‍රම වෙළඳපොළේ අවශ්‍යතාවයට සරිලන නිපුණතා සහිත විගමනික ශ්‍රම බලකායක් ඇති කිරීම උදෙසා විවිධ පුහුණු වැඩසටහන් පැවැත්වීම සිදු කරනු ලැබේ.


පුහුණු (ගෘහස්ථ) මඟින් සිදු කරනු ලබන ක්‍රියාකරකම්

- ගෘහස්ථ ගෘහපාලිකා සහායිකාවන් ලෙස මැද පෙරදිග රටවල් සඳහා යන කාන්තා විගමනික ශ්‍රමිකයින් සඳහා දින 15ක පුහුණු වැඩසටහන පැවැත්වීම
- ගෘහස්ථ ගෘහපාලිකා සහායිකාවන් ලෙස යුරෝපීය සහ පෙරදිග ආසියාතික රටවල් සඳහා යන කාන්තා විගමනික ශ්‍රමිකයින් සඳහා රටවල් ඉලක්ක කරගත් දින 15ක පුහුණු වැඩසටහන පැවැත්වීම
- නැවත සංක්‍රමණය වන සේවා පළපුරුද්ද කල් ඉක්මවා ඇති කාන්තා විගමනික ශ්‍රමිකයින් සහ අතීත පළපුරුද්ද තහවුරු කිරීම සඳහා ලේඛනගත සාක්ෂි ඉදිරිපත් කළ නොහැකි කාන්තා විගමනික ශ්‍රමිකයින් සඳහා දින 07ක පුහුණු පාඨමාලා පැවැත්වීම
- සාත්තු සේවය සඳහා විදෙස් ගත වීමට අපේක්ෂා කරන රැකියා ආපේක්ෂිතයින් සඳහා දින 45ක පුහුණුව පැවැත්වීම
- ඊශ්‍රායලය වෙත සාත්තු සේවය සඳහා විදෙස් ගත වීමට අපේක්ෂා කරන තෝරාගත් විදේශ රැකියා අපේක්ෂකයින් සඳහා දින 07ක පුහුණුව ලබා දීම
- සිංහල සහ දෙමළ භාෂා සාක්ෂරතා පුහුණු පාඨමාලා පැවැත්වීම
- විදේශ රැකියා අපේක්ෂකයින් සඳහා විදේශ රැකියා ඉලක්ක කරගත් ඉංග්‍රීසි භාෂා පුහුණු පැවැත්වීම

| පුහුණු වැඩසටහන් (ගෘහස්ථ) | පුහුණුලාභීන් සංඛ්‍යාව - 2022 | පුහුණු පංති සංඛ්‍යාව - 2022 |
|---|---|---|
| ගෘහස්ථ ගෘහපාලන සහයිකා - මැද පෙරදිග (දින 15)<br>(2022.01.01 සිට 2022.10.31 දක්වා මාර්ග ගත ක්‍රමය ඔස්සේ / 2022.09.01 සිට 2022.12.31 දක්වා නේවාසික) | 27,923 | 556 |
| ගෘහස්ථ ගෘහපාලන සහයිකා - යුරෝපීය සහ පෙරදිග ආසියානික රටවල් (දින 15)<br>(2022.01.01 සිට 2022.10.31 දක්වා මාර්ග ගත ක්‍රමය ඔස්සේ / 2022.09.01 සිට 2022.12.31 දක්වා නේවාසික) | 1,426 | 37 |
| සාත්තු සේවක/සේවිකා (දින 30) NVQ III මට්ටම් තක්සේරු කිරීම සහිතව<br>(2022.01.01 සිට 2022.10.31 දක්වා මාර්ග ගත ක්‍රමය ඔස්සේ / 2022.09.01 සිට 2022.12.31 දක්වා නේවාසික) | 4,497 | 74 |
| සාක්ෂරතා පුහුණු පාඨමාලාව (දින 18) – සිංහල සහ දෙමළ භාෂා | 43 | 5 |
| විදේශ අත්දැකීම් හදුනා ගැනීම (IFE)පුහුණු පාඨමාලාව (දින 7) | 1,481 | 61 |
| ඉංග්‍රීසි භාෂා පුහුණු පාඨමාලාව | 1,978 | 42 |







**පුහුණු (කාර්මික හා ආයතනික) අංශය විසින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම්**

01. පිරිමි සහ කාන්තා විදේශ රැකියා අපේක්ෂිතයින් සඳහා පෙර විගමනික පුහුණු පාඨමාලා පැවැත්වීම
02. කොරියාවේ රැකියා අපේක්ෂා කරන්නන් සඳහා පෙර විගමනික පුහුණු පාඨමාලා පැවැත්වීම
03. විදේශ රැකියා අපේක්ෂා කරන්නන් සඳහා ජපන් භාෂා පුහුණු වැඩසටහන් පැවැත්වීම
04. ජපානයේ රැකියා අපේක්ෂා කරන්නන් සඳහා (TITP) පෙර විගමනික පුහුණු පාඨමාලා පැවැත්වීම
05. පුහුණු උපදේශකයින් සඳහා TOT වැඩසටහන් පැවැත්වීම
06. පුහුණු මධ්‍යස්ථාන පරීක්ෂා කිරීම (වි.සේ.නි.කා සහ පුහුණු)
07. පුහුණු පාඨමාලාවල පුහුණු සහතික මුද්‍රණය කිරීම සහ බෙදා හැරීම
08. ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම් වැඩසටහන්/ පෙර ඉගෙනුම හඳුනා ගැනීමේවැඩසටහන් ක්‍රියාත්මක කිරීම (RPL). (රැකියා කාණ්ඩ අනුව ලබා ගත යුතු වෘත්තීය කුසලතා මට්ටම ලබා ගැනීම සඳහා විදේශ රැකියා සඳහා යාමට අපේක්ෂ කරන අයදුම්කරුවන් අදාළ වෘත්තීය පුහුණු ආයතන වෙත යොමු කිරීම)

| පුහුණු පාඨමාලා (කාර්මික හා ආයතනික) | පුහුණුලාභීන් සංඛ්‍යාව - 2022 | පුහුණු පංති සංඛ්‍යාව - 2022 |
|---|---|---|
| ගෘහස්ථ නොවන අනෙකුත් රැකියා සඳහා දින 02 පුහුණු පාඨමාලාව | 15,273 | 1592 |
| පෙර විගමනික කොරියානු පුහුණුව | 1,410 | 43 |
| ජපන් භාෂා පුහුණු වැඩසටහන | 3,660 | 98 |
| ජපානයේ රැකියා අපේක්ෂා කරන්නන් සඳහා (TITP) පෙර විගමනික පුහුණු පාඨමාලා පැවැත්වීම | 65 | 07 |


කාර්යාංශයේ සහ අනෙකුත් පුහුණු ආයතනවල ජපන් භාෂා උපදේශකයින් සඳහා TOT වැඩසටහන් පැවැත්වීම





මිනුවන්ගොඩ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් පැවැත්වීමට නියමිත ජපන් භාෂා පංති පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන





## ➢ බඳවාගැනීම්


ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් බඳවාගැනීම් (සාමාන්‍ය) අංශය **සහ** බඳවාගැනීම් (කොරියානු) අංශය කොරියාව, ජපානය සහ ඊශ්‍රායලය වෙත ශ්‍රී ලාංකිකයින් රැකියා සඳහා යොමු කිරීම සඳහා ක්‍රියාත්මක වේ.


බඳවාගැනීම් (සාමාන්‍ය) අංශය පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

- ජපානයේ International Manpower Organization හරහා කාර්මික සේවාස්ථ අභ්‍යාසලාභීන් (Technical Intern Trainees) යොමු කිරීම
- ජපානයේ International Relations Organizationහරහා කාර්මික සේවාස්ථ අභ්‍යාසලාභීන් (Technical Intern Trainees) යොමු කිරීම
- ජපානයේ රැකියා සඳහා නිශ්චිත පුහුණු සේවකයින් (Specified skilled workers) යොමු කිරීම
- ඊශ්‍රායලය සඳහා ගෘහ ආශ්‍රිත සාත්තුසේවක/සේවිකාවන් බඳවා ගැනීම

ජපානයේ International Manpower Organization හරහා කාර්මික සේවාස්ථ අභ්‍යාසලාභීන් (Technical Intern Trainees) යොමු කිරීම

| | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තෝම්බර් | නොවැම්බර් | දෙසැම්බර් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සාත්තු සේවය | - | - | - | 6 | 12 | 21 | 08 | - | 10 | 04 | - | - |
| ඉදි කිරීම් | - | - | - | - | 10 | 3 | 14 | - | 16 | 06 | 01 | - |








ජපානයේ International Relations Organization හරහා කාර්මික සේවාස්ථ අභ්‍යාසලාභීන් (Technical Intern Trainees) යොමු කිරීම

පිටත්වීම් සංඛ්‍යාව

| | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තෝම්බර් | නොවැම්බර් | දෙසැම්බර් |
|---|---|---|---|---|---|---|---|---|---|
| සාත්තු සේවය | - | - | 01 | - | - | - | - | - | - |
| ඉදි කිරීම් | - | 02 | - | - | - | - | - | - | - |
| කාර්මික ඇසුරුම් | - | - | 18 | - | - | - | - | - | - |
| ආහාර සකස් කිරීම | - | - | 02 | 02 | - | - | - | - | - |






ජපානයේ රැකියා සඳහා නිශ්චිත පුහුණු සේවකයින් (Specified skilled workers) යොමු කිරීම

ජපාන රජය විසින් SSW වැඩසටහන යටතේ රැකියා ක්ෂේත්‍ර 14ක් විවෘත කර ඇති අතර ඒ යටතේ පහත සඳහන් ක්ෂේත්‍රවල නිපුණතා පරීක්ෂණවලට මුහුණ දීමට ශ්‍රී ලාංකිකයන්ට හැකියාව ඇත.


1. හෙද සත්කාර සේවය
2. ආහාර සේවා කර්මාන්තය
3. කෘෂිකර්මය




ඊශ්‍රායලය සඳහා ගෘහ ආශ්‍රිත සාත්තුසේවක/සේවිකාවන් බඳවා ගැනීමේ වැඩසටහනට අදාල ප්‍රගතිය

| අනු අංකය | විස්තරය | | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තොම්බර් | නොවැම්බර් | දෙසැම්බර් | මුළු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | කාර්යාංශයේ ලියාපදිංචි අයදුම්කරුවන් සංඛ්‍යාව | පිරිමි | 169 | 94 | 172 | 133 | 185 | 309 | 176 | 175 | 262 | 349 | 124 | 91 | 2,239 |
| | | ගැහැණු | 76 | 49 | 75 | 74 | 91 | 307 | 162 | 186 | 179 | 199 | 121 | 127 | 1,646 |
| 02 | ඊශ්‍රායලය වෙත යොමු කරන ලද සුදුසුකම් ලත් අයදුම්කරුවන් සංඛ්‍යාව | පිරිමි | 157 | 161 | 108 | 55 | - | - | - | - | - | 393 | 163 | - | 1,037 |
| | | ගැහැණු | 81 | 52 | 58 | 28 | 93 | 152 | 188 | 159 | 14 | 141 | 122 | 85 | 1,173 |

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 03 | ලොතරැයි ක්‍රමය මඟින් ඊශ්‍රායලය විසින් තොරා ගන්නා ලද අයදුම්කරුවන් සංඛ්‍යාව | පිරිමි | - | 130 | - | 118 | - | - | - | - | - | - | 130 | - | 378 |
| | | ගැහැණු | - | 77 | - | 52 | - | - | 145 | 170 | - | - | 193 | - | 637 |
| 04 | ගිවිසුම් ලැබූ සංඛ්‍යාව | පිරිමි | - | - | - | - | 05 | 04 | 08 | 09 | 15 | 08 | 05 | 04 | 58 |
| | | ගැහැණු | - | - | 08 | 13 | 29 | 16 | 43 | 45 | 44 | 19 | 19 | 14 | 250 |
| 05 | අවලංගු වූ ගිවිසුම් සංඛ්‍යාව | පිරිමි | - | - | - | - | - | - | - | 04 | 07 | - | - | 01 | 12 |
| | | ගැහැණු | - | - | - | - | - | - | 06 | 04 | 06 | 04 | 03 | 04 | 27 |
| 06 | සේවා ගිවිසුම් අත්සන් කරන ලද අයදුම්කරුවන් සංඛ්‍යාව | පිරිමි | - | - | - | - | 05 | 04 | 08 | 09 | 15 | 08 | 05 | 03 | 57 |
| | | ගැහැණු | - | - | 08 | 10 | 27 | 18 | 42 | 44 | 44 | 19 | 18 | 13 | 243 |
| 07 | පිටත්වීම් සංඛ්‍යාව | පිරිමි | - | - | - | - | - | 4 | 03 | 06 | 07 | 04 | 07 | 08 | 39 |
| | | ගැහැණු | - | - | - | 05 | 04 | 25 | 16 | 33 | 32 | 26 | 31 | 28 | 200 |





බඳවාගැනීම් (කොරියානු) අංශය විසින් ශ්‍රී ලංකාව සහ කොරියානු රජය විසින් 2004 වසරේදී අත්සන් කර වරින් වර අලුත් කෙරෙන අවබෝධතා ගිවිසුමට අනුව කොරියාවේ රැකියා බලපත්‍ර ක්‍රමය (Employment Permit System) යටතේ දකුණු කොරියාව වෙත ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් බඳවා ගැනීමට පහසුකම් සලසනු ලැබේ.

අංශය මඟින් සිදු කරනු ලබන ක්‍රියාකාරකම්

- විශේෂ EPS-TOPIK විභාගය සහ සාමාන්‍ය EPS-TOPIK විභාගය සඳහා මාර්ග ගත ක්‍රමය ඔස්සේ අයදුම්පත්‍ර නිකුත් කිරීම
- විශේෂ EPS-TOPIK විභාගය සහ සාමාන්‍ය EPS-TOPIK විභාගය පන්නිපිටිය CBT මධ්‍යස්ථානයේ පැවැත්වීම
- රැකියා ගිවිසුම් අත්සන් කිරීම
- අපේක්ෂකයින් පෙර විගමනික පුහුණු වැඩසටහන සඳහා යොමු කිරීම
- රැකියා අපේක්ෂකයින් කොරියාව වෙත පිටත් කිරීම
- පැමිණිලි පිළිබඳ කටයුතු කිරීම

- **සාමාන්‍ය EPS-TOPIK විභාගය පැවැත්වීම**

සාමාන්‍ය EPS-TOPIK විභාගය පළමු වරට කොරියාව සඳහා යාමට අපේක්ෂා කරන අය සඳහා හා කොරියාවේ නීත්‍යානුකූලව රැදි සිට සිය නියමිත සේවා කාලය අවසන් කර නැවත ශ්‍රී ලංකාවට පැමිණි අය සඳහා පවත්වනු ලැබේ.

| වර්ෂය | අයදුම්පත්‍ර නිකුත් කළ සංඛ්‍යාව | සමත් වූ සංඛ්‍යාව |
|---|---|---|
| 2020 | කොවිඩ් වසංගත තත්ත්වය යටතේ EPS Topik විභාගය නොපැවැත්විණි | |
| 2021 | | |
| 2022 | 31,378 | 5,146 |
| එකතුව | | |


- **විශේෂ EPS-TOPIK විභාගය පැවැත්වීම**

විශේෂ EPS-TOPIK විභාගය කොරියාවේ නීත්‍යානුකූලව රැදි සිට සිය නියමිත සේවා කාලය අවසන් කර නැවත ශ්‍රී ලංකාවට පැමිණි අය සඳහා පවත්වනු ලැබේ.


| වර්ෂය | අයදුම්පත්‍ර නිකුත් කළ සංඛ්‍යාව | සමත් වූ සංඛ්‍යාව |
|---|---|---|
| 2020 | 1,446 | 561 |
| 2021 | 1,431 | 756 |
| 2022 | 1,652 | 1,398 |
| එකතුව | **4,529** | **2,715** |

සාමාන්‍ය EPS-TOPIK, විශේෂ EPS-TOPIK සහ නැවත ඇතුල් වීමේ (re-entry) ක්‍රම යටතේ 2020 සිට 2022 වර්ෂවලදී රැකියා සඳහා පිටත්ව ගිය සංඛ්‍යාව

| වර්ෂය / අංශය | 2020 | 2021 | 2022 | මුළු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| සාමාන්‍ය | 266 | 152 | 4,594 | 5,012 |
| විශේෂ | 18 | 02 | 888 | 908 |
| නැවත ඇතුල් වීම | 216 | 954 | 1,157 | 2,327 |
| **මුළු සංඛ්‍යාව** | **500** | **1,108** | **6,639** | **8,247** |




www.slbfe.lk




මාර්ග ගත රැකියා බැංකුව

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් රැකියා අපේක්ෂකයින්ට ලියාපදිංචි වී විදේශ රැකියා අවස්ථාවන් සොයාගැනීම සඳහා පහසුකම් සලසයි.ඔවුන්ට මාර්ග ගත ක්‍රමය ඔස්සේ ලියාපදිංචි වීමට හෝ කාර්යාංශයේ ප්‍රධාන කාර්යාලයට හෝ දිවයින පුරා පිහිටුවා ඇති පළාත් කාර්යලයක් වෙත අයදුම්පත් යොමු කිරීම සිදු කල හැක. බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතවලට හා සේවායෝජකයින්ට ඔවුන් සතු පුරප්පාඩු සඳහා මාර්ග ගත රැකියා බැංකුව මඟින් සුදුසු අයදුම්කරුවන් සොයා ගැනීමට ද පහසුකම් සලසා ඇත.

## ➢ රැකියා ප්‍රවර්ධනය

ශ්‍රී ලාංකිකයින් අතර විදේශ රැකියා ප්‍රවර්ධනය අරමුණු කොට ගෙන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් කාර්යාංශයේ පළාත් කාර්යාල, මෙරට පිහිටි රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන සහ එතෙර පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩවල කම්කරු හා සුභසාධන අංශවල සම්බන්ධීකරනය සහිතව ජංගම සේවා, රැකියා පොළවල් සහ දැනුවත් කිරීමේ වැඩසටහන් ආදිය මඟින් රැකියා අපේක්ෂකයින් සඳහා වෘත්තිය මාර්ගෝපදේශනය සපයනු ලැබේ. කාර්යාංශයේ **අලෙවිකරණ අංශය** විසින් පහත සඳහන් ක්‍රියාකරකම්වලට අමතරව 2022 වර්ෂයේදී දිවයින පුරා රැකියා වෙළඳපොළවල් සංවිධානය කරන ලදී.

අලෙවිකරණ අංශය මඟින් 2022 වර්ෂයේදී දේශීය වශයෙන් පවත්වන ලද රැකියා පොළවල්


| දිනය | ස්ථානය | සහභාගිවූ බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතන සංඛ්‍යාව | මූලික අදියරයේදී තෝරා ගන්නා ලද රැකියා අපේක්ෂකයින් සංඛ්‍යාව | විදේශ රැකියා සඳහා පිටත්ව ගිය අපේක්ෂකයින් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 27.02.2022 | ආනමඩුව (සුඩම්පාය පුරහල) | 44 | 3,473 | 183 |
| 14.08.2022 | මතුගම (ශාන්ත මරියා විද්‍යාලය) | 20 | 2,635 | 26 |
| 15&16.10.2022 | ගාල්ල (සමනල ක්‍රීඩාංගනය) | 39 | 10,823 | 348 |

රැකියා පොළවල්










Zoom තාක්ෂණය ඔස්සේ පුර්ව පටිගත කරන ලද මාර්ගගත රැකියා වෙළඳපොලවල් කාර්යාංශයේ YouTube නාලිකාව සහ Face book පිටුව හරහා විකාශනය - 2022.01.01 සිට 2022.12.31 දක්වා


| අනු අංකය | සහභාගිවූ බලපත්‍රලාභී විදේශ රැකියානියෝජිතායතන සංඛ්‍යාව | රැකියා කාණ්ඩය | පටිගත කරන ලද දිනය | විකාශනය කරන ලද දිනය | YouTube නාලිකාව හරහා දර්ශන සංඛ්‍යාව *2022 දෙසැම්බර් 31* | You Tube හරහා ලද අදහස් සංඛ්‍යාව *2022 දෙසැම්බර් 31* | Face book හරහා දර්ශන සංඛ්‍යාව *2022 දෙසැම්බර් 31* | Face book හරහා ලද අදහස් සංඛ්‍යාව *2022 දෙසැම්බර් 31* |
|---|---|---|---|---|---|---|---|---|
| 01 | 05 | හොටල් සහ අපනශාලා | 24.06.2022 | 28.06.2022 | 68,177 | 77 | 14K | 30 |
| 02 | 08 | ඉදි කිරීම් | 03.08.2022 | 08.08.2022 | 61,436 | 115 | 15K | 88 |
| 03 | 13 | අගලුම් | 25.08.2022 | 31.08.2022 | 12,430 | 45 | 10K | 04 |
| 04 | 09 | ප්‍රවාහන | 08.09.2022 | 14.09.2022 | 36,923 | 79 | 14K | 32 |
| 05 | 04 | සෞඛ්‍ය | 27.09.2022 | 30.09.2022 | 11,298 | 20 | 16K | 28 |

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රචාරක අංශය මහජනතාව දැනුවත් කිරීම සහ විදේශ රැකියා පිළිබඳ ප්‍රවර්ධන වැඩසටහන් කිරීම ආදිය ඇතුලත්ව පහත ක්‍රියාකාරකම් සිදු කරනු ලැබේ.


පුවත්පත් දැන්වීම්/අතිරේක ප්‍රදර්ශනය


Daily News


SRI LANKA BUREAU OF FOREIGN EMPLOYMENT (SLBFE)




රූපවාහිනී වැඩසටහන්, වාණිජ සහ ගුවන්විදුලි වැඩසටහන් වෙළඳ දැන්වීම්




මාධ්‍ය ආවරණ සහ වැඩසටහන් මහජනතාව දැනුවත් කිරීම







මාධ්‍ය හමු සහ මාධ්‍ය වෙත නිවේදන නිකුත් කිරීම




දින 15 තුනුළුව පෙබරවාරි 1 දින සිට දින 28ක් දක්වා දිරිස කෙරේ...



Date - 2022.12.30 Page - 07

කැනඩාවට යවනවැයි කෝටි 3ක මුදලක් වංචා කළ සැකකරුවෙක් රිමාන්ඩ්



මහ බැංකුව හා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් විගමනික ශ්‍රමිකයින් සඳහා මුදල් ප්‍රේෂණය මඟින් ගනුදෙනු කිරීම සඳහා හඳුන්වාදෙන ලද Lanka Remit Appහි ප්‍රවර්ධන වැඩසටහන

# පරිපාලනය, මූල්‍ය සහ යටිතල පහසුකම්


ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ පරිපාලන හා මානව සම්පත් අංශය, ප්‍රසම්පාදන අංශය, නඩත්තු අංශය, ප්‍රවාහන අංශය, තොරතුරු තාක්ෂණ අංශය, අභ්‍යන්තර විගණන අංශය සහ පර්යේෂණ අංශය ආයතනයේ ඉලක්ක සපුරා ගැනීම සඳහා එහි සියළුම පාර්ශවකරුවන් සඳහා කාර්යක්ෂම හා ඵලදායි සේවාවන් සැපයීමේ ප්‍රධාන අරමුණින් උපකාරක සේවා ලෙස ක්‍රියාත්මක වේ.

ප්‍රධාන කාර්යාලය, විදේශයන්හි පිහිටි දූත මණ්ඩලවල කම්කරු හා සුභසාධන අංශ ඇතුළු දේශීය සහ විදේශීය කාර්යාල, බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතන සහ විදේශ බදවාගැනීම් ආයතන සම්බන්ධ කරන පුළුල් ප්‍රදේශීය ජාලය (Wide Area Network) මඟින් කාර්යාංශයේ මෙහෙයුම් කටයුතුවල කාර්යක්ෂමතාව වැඩිදියුණු කෙරේ.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ නිල වෙබ් අඩවිය (www.slbfe.lk) ශ්‍රී ලංකාවේ විදේශ රැකියා කාර්මාන්තය පිළිබඳ නොයෙකුත් තොරතුරු සපයන මූලාශ්‍රය වී ඇත.

අභ්‍යන්තර විගණන අංශය මඟින් 2022 වර්ෂයේදී සිදු කරන ලද ක්‍රියාකාරකම්

| | |
|---|---|
| විගණන හා කළමනාකරණ රැස්වීම් | 4 |
| COPE රැස්වීම් | 1 |
| විගණන පරීක්ෂණ (දේශීය) | 10 |




විගමනික ශ්‍රමිකයින් සඳහා සහය වීම සඳහා බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලේ "හොප් ගෙට්" (Hope Gate) නමින් විශේෂ පිවිසුම් මාර්ගයක් විවෘත කරන ලදී.



## ➢ මූල්‍ය දළ විශ්ලේෂණය

2020 සිට 2022 වර්ෂ දක්වා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ මූල්‍ය කාර්යසාධනය (රු. මිලියන)

| | 2020 | 2021 | 2022 |
|---|---|---|---|
| | | | |
| මුළු ආදායම | 1,780 | 3,053 | 11,470 |
| මුළු වියදම | -2,411 | -2,421 | -3,680 |
| **බදු පෙර ලාභය** | **-736** | **632** | **7,790** |
| | | | |
| ජංගම නොවන වත්කම් | 2,087 | 1,905 | 1,863 |
| ජංගම වත්කම් | 14,440 | 15,651 | 25,167 |
| **මුළු වත්කම්** | **16,527** | **17,556** | **27,030** |
| | | | |
| ජංගම වගකීම් | 1,817 | 1,756 | 3,855 |
| ජංගම නොවන වගකීම් | 4,071 | 4,257 | 5,538 |
| **මුළු වගකීම්** | **5,834** | **6,013** | **9,393** |
| | | | |
| **ශුද්ධ වත්කම්** | **10,693** | **11,543** | **17,637** |

ඉහත දක්වා ඇති පරිදි 2021 වර්ෂයේ ආදායම වූ රුපියල් මිලියන 3,053ට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය සඳහා මුළු ආදායම රුපියල් මිලියන 11,470ක් විය. 2021 වර්ෂයට සාපේක්ෂව සමස්ත ආදායමේ 276%ක වර්ධනයක් පෙන්නුම් කරයි.

අයවැය සහ 2021 වසරට සාපේක්ෂව විදේශ දූත මණ්ඩලවල ආදායම, ලියාපදිංචි ගාස්තු, සෙස් ආදායම සහ අනෙකුත් සියලුම ආදායම් මූලාශ්‍රවල සැලකිය යුතු දියුණුවක් ඇති වූ බැවින් කාර්යාංශයේ මෙහෙයුම් ආදායමේ වැඩිවීමක් පෙන්නුම් කරයි. තවද, වෙළඳපොළ තුළ පැවැති ඉහළ පොලී ආදායම සහ නිසි අයෝජන කළමනාකරණය හේතුකොට ගෙන 2021 වසරට සාපේක්ෂව ආයෝජන මත පොලී ආදායමේ 255% ක කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කර ඇත.


වර්ෂය සඳහා මුළු වියදම රුපියල් මිලියන 3,680ක් වූ අතර එය සමස්ත අයවැයට සාපේක්ෂව 6.6% ක වැඩිවීමක් වූ අතර 2021 වසරට සාපේක්ෂව 52% ක වර්ධනයකි. රුපියල අවප්‍රමාණය වීම විදේශ දූත මණ්ඩල වියදම වැඩිවීමට සැලකිය යුතු බලපෑමක් සිදු කිරීම සහ ඉහළ උද්ධමනය දේශීය වෙළඳපොළ තුළ භාණ්ඩ හා සේවා ඉහළ යාමට බලපෑම නිසා කාර්යාංශයේ සමස්ථ වියදම 2022 වර්ෂයේදී ඉහළ යන ලදී.

සුභසාධන ආශ්‍රිත වැඩසටහන් රැසක් නැවත ක්‍රියාත්මක කිරීම හේතුවෙන් 2021 වසරට සාපේක්ෂව විගමනික ශ්‍රමිකයින් සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් වෙනුවෙන් දේශීය වශයෙන් සිදු කරන ලද සුභසාධන වියදම් 88% කින් ඉහළ ගොස් ඇත.

2022 වර්ෂය සඳහා බදු ගෙවීමට පෙර ලාභය රුපියල් මිලියන 7,790 ක් වූ අතර එය 2021 වර්ෂය සඳහා වූ රුපියල් මිලියන 632ක සැබෑ ලාභයට සාපේක්ෂව 1,132% ක වර්ධනයකි. මෙය ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ඉතිහාසයේ මෙතෙක් ලැබූ ඉහළම ලාභය වන අතර දුරදර්ශී සහ යහපත් සමස්ත කළමනාකාරිත්වයේ සහ නායකත්වයක ප්‍රතිඵලයක් ලෙස මෙය සැලකිය හැක.


කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශනවල කුවේට් වන්දි සංචිතයට අදාළ රුපියල් බිලියන 5.2ක අයෝජන සහ බැංකු ශේෂයන් ඇතුළත් වන අතර 2022 වර්ෂයේදී එකාබද්ධ අරමුදලට රුපියල් බිලියන 1.2. ක් ගෙවා ඇත. තවද,මහා භාණ්ඩාගාරයේරාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ ඉල්ලීම පරිදි 2023 ජනවාරි මාසය තුළ ඉහත ආයෝජනවලින් රුපියල් මිලියන 3000ක් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මඟින් එකාබද්ධ අරමුදලට ගෙවා ඇත.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අදායම් විශ්ලේෂණය 2020 සිට 2022 දක්වා





වි.සේ.නි.කා හි ප්‍රධාන ආදායම් මූලාශ්‍ර විශ්ලේෂණය – (රු. මිලියන)

| | 2020 | 2021 | 2022 |
|---|---|---|---|
| ලියාපදිංචි ගාස්තු (ඒජන්සි) | 83 | 188 | 555 |
| ලියාපදිංචි ගාස්තු (ස්වයං) | 276 | 690 | 1,757 |
| කොරියානු බඳවාගැනීම් ප්‍රවර්ධන ගාස්තු | 48 | 7 | 230 |
| පහසුකම් ගාස්තු | 11 | 25 | 61 |
| බලපත්‍ර ගාස්තු | 42 | 60 | 93 |
| සෙස් ආදායම | 55 | 317 | 943 |
| කොරියානු පරිපාලන ගාස්තු | 5 | 0.8 | 26 |
| නැවත ඇතුල්වීමේ කොරියානු ගාස්තු | 7 | 17 | 23 |
| පුහුණු ආදායම | 25 | 192 | 575 |
| විදේශ තානාපති කාර්යාලවල ආදායම | 274 | 869 | 3,599 |
| මූල්‍ය ආදායම | 765 | 532 | 1,888 |





**ව්.සේ.නි.කා හි 2020 සිට 2022 දක්වා ප්‍රධාන මෙහෙයුම් වියදම් විශ්ලේෂණය (රු. මිලියන)**

| | 2020 | 2021 | 2022 |
|---|---|---|---|
| කාර්ය මණ්ඩල පිරිවැය | 1,467 | 1,341 | 1,893 |
| ආයතනික වියදම් | 391 | 412 | 581 |
| මෙහෙයුම් වියදම් | 298 | 278 | 402 |
| මූල්‍ය වියදම් | 33 | 22 | 24 |
| වෙළඳ දැන්වීම් සහ ප්‍රචාරණ | 6 | 8 | 20 |
| ව්‍යාපාර ප්‍රවර්ධන වියදම් | 9 | 5 | 93 |
| සුභසාධන - වෙනත් වියදම් | 204 | 352 | 664 |




ලංකා බැංකුව
BANK OF CEYLON
PEOPLE'S BANK
THE VOICE OF THE PEOPLE
අපගේ
ගණුදෙනුකාර
බැංකු
NSB
National Savings Bank
SMIB

# අපගේ ප්‍රධාන පාර්ශවකරුවන්



# ශ්‍රී ලංකා විදේශ රැකියා එජන්සි ආයතනය (SLFEA)

## ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අනුබද්ධ ආයතනයකි

---

ශ්‍රී ලංකා විදේශ රැකියා එජන්සිය, රජයට අයත් එකම එජන්සි ආයතනය, 1996දී ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අනුබද්ධ ආයතනයක් ලෙස ස්ථාපිත කරන ලදී. ශ්‍රී ලංකා විදේශ රැකියා එජන්සිය2013 වසරේදි ISO 9001:2008 තත්ත්ව සහතිකයෙන් පිරි නැමුම් ලබා ඇත.

**ශ්‍රී ලංකා විදේශ රැකියා එජන්සියේ අරමුණු**

- 1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත හෝ දැනට හෝ කලින් කලට බලාත්මක වෙනත් ඕනෑම ව්‍යවස්ථාවක් හෝ නීති සම්පාදනයක් යටතේ ප්‍රතිපාදන වෙන් කර ඇති පරිදි විදේශ රැකියා නියෝජිතායතනයක් ලෙස ව්‍යාපාර කටයුතු කර ගෙන යාම.

- වෘත්තිකයන්, පරිපාලකයින්, කාර්මික හා යාන්ත්‍රික නිපුණතා සහිත පුද්ගලයින්, අර්ධ පුහුණු හෝ නුපුහුණු සේවකයින්, ගෘහස්ථ හා හොටල් සේවකයින්, ගුරුවරුන්, සේවා සපයන්නන් සහ අනෙකුත් සියළුම කාණ්ඩසඳහා ශ්‍රී ලංකා තුළ හෝ වෙනත් රටවල රැකියා පිරිනැමීම, සැපයීම හෝ ලබා ගැනීම.


- මිනිස් බල සැපයුම, වෙළඳාම, රක්ෂණය, වාණිජ හෝ කර්මාන්තයේ නියැලී සිටින පුද්ගලයින්, ආයතන සහ සංවිධාන සඳහා නියෝජිතයින්, තැරැව්කරුවන්, නියෝජිතයින් සහ උපදේශකයන් ලෙස කටයුතු කිරීම සහ එවැනි සේවාවන් ලබා ගැනීම සහ සැපයීම සඳහා එකඟතා සහ අවබෝධතා ගිවිසුම්වලට එළඹීම.

- රැකියා ඉල්ලුම සපුරාලීම සඳහා පවතින පුද්ගලයින්ගේ කුසලතා වැඩි දියුණු කිරීම සඳහා පුහුණුව ලබා ගැනීම.


## ලාභ සහ අලාභ විශ්ලේෂණය


SLFEA 2022 මුළු වසර සඳහා බඳවා ගැනීමේ ක්‍රියාවලිය තුළ අඛණ්ඩ දියුණුවක් පෙන්නුම් කරයි.


2020-2022 බඳවා ගැනීමේ ප්‍රගතිය සංසන්දනය කිරීම





අඛණ්ඩ ප්‍රගමනයක් 2022 වර්ෂය තුළ නිරූපණය කෙරේ







2021 වසරට සාපේක්ෂව බඳවා ගැනීමේ ප්‍රගතිය 131% කි





| Year | Total Departures |
|---|---|
| 2020 | 113 |
| 2021 | 140 |
| 2022 | 324 |

2020-2022 කාලය තුළ මුළු බඳවා ගැනීම් සංඛ්‍යාව ක්‍රමයෙන් වැඩිවන බව පෙන්නුම් කෙරේ



2022 වර්ෂයේදී SLFEA බඳවා ගැනීම් සහ අනෙකුත් ව්‍යාපාර යන දෙකෙහිම කැපී පෙනෙන දියුණුවක් පෙන්නුම් කර ඇත. එම නිසා SLFEA හට ලැබුණු ලාභය උපරිම කර ගැනීමට හැකි විය.

මෙම ජයග්‍රහණය පසුගිය වසර හා සසඳන විට 2022 වසරේ ලාභය පැහැදිලිව පෙන්නුම් කරයි. වසර තුනකට පසු SLFEA අනෙකුත් මූලික ව්‍යාපාරවල පමණක් නොව ප්‍රධාන බඳවා ගැනීමේ ක්ෂේත්‍රයේද ලාභයක් පෙන්නුම් කර ඇත.




- බඳවාගැනීම් ආදායම 2022 – රු. 23,452,369.01
- ගුවන්ගමන් ප්‍රවේශ පත්‍ර ආදායම 2022 - රු. 49,857,483.00
- වෙනත් ආදායම් 2022 - රු. 12,402,598.99
- මුළු ආදායම- රු. 42,654,935.21

# පාලන ව්‍යුහය

**විශ්ලේෂණය**

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය (SLBFE) ශ්‍රී ලංකාවේ විදේශ රැකියා ක්‍රියාකාරකම් නියාමනය කිරීම සහ පාලනය කිරීම පිළිබඳ වගකීම දරයි. 1985 දී පිහිටුවන ලද ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය ශ්‍රී ලාංකීය විදේශ රැකියා ක්ෂේත්‍රයේ සුමට ක්‍රියාකාරිත්වය සහතික කරන අතරම ශ්‍රී ලාංකික විගමනික ශ්‍රමිකයන්ගේ අවශ්‍යතා සහ සුබසාධනය සුරක්ෂිත කිරීමෙහිලා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

**පාලන ව්‍යුහය**

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයකම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ක්‍රියාත්මක වේ. කාර්යාංශය සාමාජිකයින් එකොළොස් දෙනෙකුගෙන් (11) සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් පාලනය වේ. මෙම බහු පාර්ශ්වකරුවන්ගේ ප්‍රවේශය තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී අදාළ සියලු පාර්ශ්වයන්ගේ අවශ්‍යතා සලකා බලන බව සහතික කරයි.

**ප්‍රධාන මූල පිරිමි:**

1. ප්‍රතිපත්ති සංවර්ධනය සහ නියාමනය: විදේශ රැකියා සම්බන්ධ ප්‍රතිපත්ති සහ රෙගුලාසි සැකසීමේදී ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. මෙම ප්‍රතිපත්ති මගින් ශ්‍රී ලාංකික විගමනික ශ්‍රමිකයන්ගේ අයිතිවාසිකම් සහ සුබසාධනය ආරක්ෂා කිරීමත් සදාචාරාත්මක බඳවා ගැනීමේ පිළිවෙත් ප්‍රවර්ධනය කිරීමත් අරමුණු කරයි. නැගී එන අභියෝගවලට මුහුණ දීම සඳහා සහ ඒවායේ කාර්යක්ෂමතාව සහතික කිරීම සඳහා කාර්යාංශයමෙම ප්‍රතිපත්ති නිරන්තරයෙන් සමාලෝචනය කර යාවත්කාලීන කරයි.
2. පෙර විගමනික පුහුණු පාඨමාලා: විගමනික ශ්‍රමිකයින්ට අවශ්‍ය නිපුණතා සහ දැනුමෙන් සන්නද්ධ කිරීම සඳහා, කාර්යාංශය විසින් පෙර විගමනික පුහුණු වැඩසටහන් පවත්වයි. මෙම වැඩසටහන් භාෂා පුහුණුව, සංස්කෘතික දැනුවත්භාවය, රැකියා විශේෂිත කුසලතා සහ නීතිමය අයිතිවාසිකම් වැනි විවිධ අංශ ආවරණය කරයි. අදාළ තොරතුරු සමඟින් විදෙස්ගත ශ්‍රමිකයින් සවිබල ගැන්වීම මගින් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අරමුණ වන්නේ ඔවුන්ගේ සේවා නියුක්තිය ඉහළ නැංවීම සහ විදේශයන්හි ඔවුන්ගේ යහපැවැත්ම සහතික කිරීමයි.
3. බඳවාගැනීම සහ ලියාපදිංචිය: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතන නියාමනය සහ අධීක්ෂණය කරයි. කාර්යාංශය විසින් ලියාපදිංචි නියෝජිතායතනවල දත්ත ගබඩාවක් පවත්වාගෙන යන අතර ස්ථාපිත මාර්ගෝපදේශවලට අනුකූලව පවත්වා ගෙන යාම අධීක්ෂණය කරයි. මෙම ක්‍රමය නීතිවිරෝධී සහ සදාචාර විරෝධී බඳවා ගැනීමේ පිළිවෙත් මැඩලීමට උපකාරී වන අතර ශ්‍රමිකයින්ට බලයලත් මාර්ග ඔස්සේ රැකියා අවස්ථා වෙත ප්‍රවේශ වීමට විශ්වාසදායක මාර්ගයක් සපයයි.

4. සුභසාධන හා ආරක්ෂණ සේවා: කාර්යාංශයසැලකිය යුතු ශ්‍රී ලාංකික ඩයස්පෝරාවක් සිටින රටවල විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල සමඟ සහයෝගයෙන් සුබසාධන මධ්‍යස්ථාන ක්‍රියාත්මක කරයි. විගමනික ශ්‍රමිකයින්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා උපදේශනය, නීති ආධාර, සෞඛ්‍ය පහසුකම් සහ හදිසි ආධාර ඇතුළු සේවාවන් රැසක් මෙම මධ්‍යස්ථාන මඟින් සපයයි. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, ශ්‍රමිකයන් මුහුණ දෙන ගැටලුවලට කාලෝචිත සහය ලබා දීම සඳහා ශ්‍රමිකයින් බඳවාගන්නා රටවල අදාළ බලධාරීන් සමඟ සමීප සම්බන්ධීකරණයක් ද පවත්වාගෙන යයි.
5. තොරතුරු හා දැනුවත් කිරීමේ ව්‍යාපාර: විදෙස් ගත වීමට බලාපොරොත්තු වන විගමනික ශ්‍රමිකයින්, ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් සහ සාමාන්‍ය ජනතාව ඉලක්ක කර ගනිමින් කාර්යාංශය විසින් පුළුල් දැනුවත් කිරීමේ ව්‍යාපාර පවත්වයි. මෙම ව්‍යාපාරවල අරමුණ වන්නේ ආරක්ෂිත සංක්‍රමණ පිළිවෙත්, විභව අවදානම් සහ විදේශ රැකියා සඳහා නීත්‍යානුකූල මාර්ග භාවිතා කිරීමේ වැදගත්කම පිළිබඳව පුද්ගලයන් දැනුවත් කිරීමයි. මීට අමතරව, විදේශ රැකියා පිළිබඳ තොරතුරු සොයන අයට විමසීම් සහ මගපෙන්වීම සඳහා තොරතුරු උපකාරක සේවාවක් කාර්යාංශයවිසින් පවත්වාගෙන යනු ලැබේ.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ පාලනය ශ්‍රී ලාංකික සංක්‍රමණික ශ්‍රමිකයන්ගේ සුබසාධනය සහ ආරක්ෂාව සහතික කිරීම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ඵලදායී ප්‍රතිපත්ති සංවර්ධනය, නියාමනය සහ විස්තීරණ ආධාරක සේවා හරහා, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විදේශ රැකියා අපේක්ෂාවෙන් සිටින ශ්‍රමිකයින් සඳහා ආරක්ෂිත සහ හිතකර පරිසරයක් නිර්මාණය කිරීමට උත්සාහ කරයි. ආචාරධාර්මික බඳවා ගැනීම් ප්‍රවර්ධනය කිරීම සහ ශ්‍රී ලාංකික විගමනික ශ්‍රමිකයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ඵලදායීතාවය තවදුරටත් ඉහළ නැංවීම සඳහා පාලනය ශක්තිමත් කිරීම,පාර්ශවකරුවන් සමඟ සහයෝගීතාව වැඩිදියුණු කිරීම සහ නැගී එන අභියෝගවලට මුහුණ දීම සඳහා අඛණ්ඩ උත්සාහයන් අත්‍යවශ්‍ය වේ.

## ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ විගණන හා කළමනාකරණ කමිටුවේ (Audit and Management Committee - AMC) කාර්යභාරය

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ විගණන හා කළමනාකරණ කමිටුව ආයතනය තුළ විනිවිදභාවය, වගවීම හා ඵලදායී කළමනාකරණය සහතික කිරීම සඳහා අත්‍යාවශ්‍ය කාර්යභාරයක් ඉටු කරයි. මූල්‍ය කටයුතු, අභ්‍යන්තර පාලන, අවදානම් කළමනාකරණය සහ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සමස්ත කාර්ය සාධනය අධීක්ෂණය කිරීම සඳහා මෙම කමිටුව වගකීව යුතුය. විගණන හා කළමනාකරණ කමිටුව ප්‍රධාන භූමිකාවන් සහ වගකීම් පහත පරිදි වේ:

1. මූල්‍ය අධීක්ෂණය: ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ මූල්‍ය ක්‍රියාකාරකම් සමාලෝචනය කිරීම සහ අධීක්ෂණය කිරීම කමිටුවේ වගකීම වේ. මූල්‍ය ප්‍රකාශන පරීක්ෂා කිරීම, ගිණුම්කරණ ප්‍රමිතීන් සහ රෙගුලාසිවලට අනුකූල වීම සහතික කිරීම සහ අයවැය ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම මෙයට ඇතුළත් වේ. මූල්‍ය අඛණ්ඩතාව ප්‍රවර්ධනය කිරීමට සහ මූල්‍ය අක්‍රමිකතා වැළැක්වීමට කමිටුව ස්වාධීන අධීක්ෂණයක් සපයයි.

2. අභ්‍යන්තර පාලන හා අවදානම් කළමනාකරණය: කමිටුව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය තුළ ක්‍රියාත්මක වන අභ්‍යන්තර පාලන පද්ධති තක්සේරු කිරීම සහ අධීක්ෂණය කිරීම සිදු කරයි. අවදානම් අවම කිරීම සහ වත්කම් ආරක්ෂා කිරීම සඳහා අභ්‍යන්තර පාලනවල ප්‍රමාණවත් බව සහ සඵලතාවය සමාලෝචනය කිරීහ මෙයට ඇතුළත් වේ. කමිටුව අවදානම් කළමනාකරණ පිළිවෙත් ඇගයීමට ලක් කරන අතර අවදානම් අවම කිරීමේ උපාය මාර්ග ශක්තිමත් කිරීම සඳහා නිර්දේශ සපයයි.
3. විගණන කාර්යය: කමිටුව කාර්යාංශයෙහි අභ්‍යන්තර හා බාහිර විගණන කටයුතු අධීක්ෂණය කරයි. එය අභ්‍යන්තර විගණන ක්‍රියාවලිය ස්වාධීන සහ වෛෂයික බව හා එම මඟින් සංවිධානයේ මෙහෙයුම්වල සියලුම ක්ෂේත්‍ර ආවරණ වන බව සහතික කරයි. කමිටුව විසින් විගණන සොයාගැනීම්, නිර්දේශ සහ කළමනාකරණ ප්‍රතිචාර සමාලෝචනය කරන අතර, ආයතනික කාර්යක්ෂමතාව සහ ඵලදායීතාවය වැඩිදියුණු කිරීම සඳහා ඒවා ක්‍රියාත්මක කිරීම සහතික කරයි.
4. අනුකූලතාවය සහ ආචාර ධර්ම: අදාළ නීති, රෙගුලාසි සහ සදාචාරාත්මක ප්‍රමිතීන්ට අනුකූල වීම ප්‍රවර්ධනය කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා කමිටුව වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. එය නීතිමය සහ සදාචාරාත්මක අවශ්‍යතා පිළිපැදීම සහතික කිරීම සඳහා ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කරයි. කමිටුව විසින් වාර්තා වී ඇති අනුකූල නොවන හෝ සදාචාරාත්මක ගැටළු පිළිබඳ වාර්තා සමාලෝචනය ක්ර විමර්ශනය කරන අතර, එවැනි ගැටළු නිවැරදි කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගනී.
5. කාර්ය සාධන ඇගයීම: කමිටුව විසින් ස්ථාපිත අරමුණු සහ ඉලක්කවලට එරෙහිව කළමනාකරණ ඇතුළුව කාර්යාංශයෙහි කාර්ය සාධනය ඇගයීමට ලක් කරයි. එය සංවිධානයේ උපාය මාර්ග, ප්‍රතිපත්ති සහ වැඩසටහන් වල සඵලතාවය තක්සේරු කිරීම සිදු කරන අතර, වැඩිදියුණු කිරීම සඳහා නිර්දේශ සපයයි. ප්‍රගතිය මැනීම සහ නිරීක්ෂණය කිරීම සඳහා කාර්ය සාධන දර්ශක සහ අධීක්ෂණ යාන්ත්‍රණ ක්‍රියාත්මක වන බවට කමිටුව සහතික කරයි.
6. වාර්තා කිරීම සහ සන්නිවේදනය: කාර්යාංශයෙහි කළමනාකාරිත්වය, අධ්‍යක්ෂ මණ්ඩලය සහ අනෙකුත් පාර්ශවකරුවන් අතර ඵලදායී සන්නිවේදනය සඳහා කමිටුව පහසුකම් සපයයි. එය ප්‍රධාන මූල්‍ය, මෙහෙයුම් සහ අවදානම් කළමනාකරණ කරුණු ඉස්මතු කරමින් අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා සපයයි. කමිටුව අවශ්‍ය පරිදි බාහිර විගණකවරුන්, නියාමකයින් සහ අනෙකුත් අදාළ බලධාරීන් සමඟ ද සම්බන්ධ වේ.
7. අඛණ්ඩ වැඩිදියුණුව: කමිටුව කාර්යාංශයතුළ අඛණ්ඩ වැඩිදියුණු කිරීමේ සංස්කෘතියක් ප්‍රවර්ධනය කරයි. එය පාලනය, මූල්‍ය කළමනාකරණය, අවදානම් කළමනාකරණය සහ මෙහෙයුම් ක්‍රියාවලීන් වැඩිදියුණු කිරීම සඳහා ක්ෂේත්‍ර හඳුනා ගනී. කමිටුව පාලනය ශක්තිමත් කිරීම, අවදානම් අවම කිරීම සහ සමස්ත ආයතනික කාර්ය සාධනය වැඩිදියුණු කිරීම සඳහා මාර්ගෝපදේශ සහ නිර්දේශ සපයයි.

සංවිධානය තුළ නිසි පාලනය, මූල්‍ය වගවීම, අවදානම් කළමනාකරණය සහ අනුකූලතාව සහතික කිරීම උදෙසාකාර්යාංශයෙහි විගණන සහ කළමනාකරණ කමිටුව තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. කමිටුව සිය අධීක්ෂණ කාර්යයන් හරහා, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ මෙහෙයුම්වල අඛණ්ඩතාව සහ සඵලතාවය පවත්වා ගැනීමට උපකාර වන අතර, එමඟින් ශ්‍රී ලාංකික විගමනික ශ්‍රමිකයින්ගේ ආරක්ෂාව සහ සුබසාධනය තහවුරු කිරීම සඳහා සහාය වීම සිදු වේ.

# අභ්‍යන්තර පාලන ව්‍යුහය

**අනුකූලතාව**

**අනිවාර්ය අනුකූලතා**

- 1985 අංක 21 දරන පාර්ලිමේන්තු පනත සහ 1994 අංක 04 දරන සහ 2009 අංක 56 දරන සංශෝධිත පනත්
- ජාතික කම්කරු සංක්‍රමණ ප්‍රතිපත්තිය
- විදේශ රැකියා අමාත්‍යාංශය සහ විදේශ කටයුතු අමාත්‍යාංශයේ නීති සහ රෙගුලාසි
- ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ
- මූල්‍ය රෙගුලාසි
- පරිපාලන රෙගුලාසි
- අභ්‍යන්තර චක්‍රලේඛ, නීති, ක්‍රියාවලි සහ හොඳ වර්යා

**ස්වේච්ඡා අනුකූලතා**

- ශ්‍රී ලංකා ආරක්ෂක ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ආයතනික පාලනය පිළිබඳ හොඳ වර්යා සංග්‍රහය

**ශ්‍රී ලංකා රජය**

**රේඛීය අමාත්‍යාංශය**

**වී.සේ.නි.කා**

**සභාපති සහ අධ්‍යක්ෂක මණ්ඩලය**

- සභාපති
  අධ්‍යක්ෂක මණ්ඩලය
- සාමාජිකයින් 03 – විෂයභාර අමාත්‍යවරයා විසින් පත් කරනා
- සාමාජිකයින් 04 – බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතන
- එක් සාමාජිකයෙකු – මුදල් අමාත්‍යාංශය විසින් පත් කරනා
- එක් සාමාජිකයෙකු– කාන්තා කටයුතු අමාත්‍යාංශයෙන් පත් කරනා
- එක් සාමාජිකයෙකු – විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් පත් කරනා

**සාමාන්‍යාධිකාරී**

අතිරේක සාමාන්‍යාධිකාරිවරුන්
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරුන්
ජ්‍යේෂ්ඨ කළමනාකරුවන්
කළමනාකරුවන්
සහකාර කළමනාකරුවන්

මුළු කාර්ය මණ්ඩලය
**1,160**

**සහතිකකරණය**

**පොදු ව්‍යාපාර කාරක සභාව (COPE)**

**ජාතික විගණන කාර්යාලය**

**විගණන හා කළමනාකරණ දෙපාර්තමේන්තුව**

**වී.සේ.නි.කා අභ්‍යන්තර විගණනය**

→ තේරි පත් වන/පත් කරන

⇢ තොරතුරු/වාර්තා

# අධ්‍යක්ෂකගේ වාර්තාව

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ 2022 වසර සඳහා අධ්‍යක්ෂ වාර්තාව සහ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණනය කරන ලද එකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සතුටින් ඉදිරිපත් කරන්නෙමු. ජයග්‍රහණ, අභියෝග සහ සදාචාරාත්මක බඳවා ගැනීම් ප්‍රවර්ධනය කිරීම හා ශ්‍රී ලාංකික විගමනික ශ්‍රමිකයින්ගේ අයිතිවාසිකම් සහ සුබසාධන ආරක්ෂා කිරීම උදෙසා ආයතනයේ අනාගත සැලසුම් අධ්‍යක්ෂක මණ්ඩලය ලෙස මහත් ආඩම්බරයෙන් මෙහි විදහා දක්වන්නෙමු.

**මූල්‍ය කාර්යසාධනය:**

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය 2022 වසරේ දී ශක්තිමත් මූල්‍ය කාර්ය සාධනයක් අත්කර ගත් බව වාර්තා කිරීමට ලැබීම ගැන අපි සතුටු වෙමු. COVID-19 වසංගතය නිසා ඇති වූ ගෝලීය අවිනිශ්චිතතා සහ ආර්ථික අභියෝග මධ්‍යයේ වුවද, අපගේ සංවිධානය මූල්‍යමය වශයෙන් ස්ථාවරව පැවතුනි. අපගේ විචක්ෂණශීලී මූල්‍ය කළමනාකරණ භාවිතයන්, පිරිවැය ඉතිරිකිරීමේ පියවරයන් සමඟින් සම්පත් ඵලදායී ලෙස භාවිතා කිරීම සහතික විය. මෙම වාර්ෂික වාර්තාවේ ඇතුළත් සවිස්තරාත්මක මූල්‍ය ප්‍රකාශන අපගේ මූල්‍ය තත්ත්වය සහ කාර්ය සාධනය පිළිබඳ පුළුල් දළ විශ්ලේෂණයක් සපයයි. මූල්‍ය ප්‍රකාශය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2023.04.06 දින අනුමත කරන ලදී.

**මෙහෙයුම් ජයග්‍රහණ:**

2022 වසර පුරාවට, විදේශ රැකියා අංශයේ පාලනය සහ නියාමනය වැඩි දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇත. ප්‍රධාන මෙහෙයුම් ජයග්‍රහණ කිහිපයක් ඉස්මතු කිරීමට ලැබීම ගැන අපි ආඩම්බර වෙමු:

1. ප්‍රතිපත්ති වැඩිදියුණු කිරීම: විදේශ රැකියා ක්ෂේත්‍රයේ නැගී එන අභියෝගවලට මුහුණ දීම සඳහා අපගේ ප්‍රතිපත්ති සහ රෙගුලාසි සමාලෝචනය කිරීම සහ යාවත්කාලීන කිරීම කෙරෙහි අපි අවධානය යොමු කළෙමු. අපගේ අරමුණ වූයේ විගමනික ශ්‍රමිකයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, සදාචාරාත්මක බඳවා ගැනීමේ පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම සහ අදාළ පාර්ශවකරුවන් සමඟ ශක්තිමත් සහයෝගිතාවයක් ඇති කිරීම ය. මෙම ප්‍රතිපත්ති වැඩිදියුණු කිරීම් අපගේ මෙහෙයුම්වල පදනම ශක්තිමත් කර ඇත.
2. පෙර පිටත්වීමේ පුහුණුව සහ දිශානතිය: අපගේ පෙර පිටත්වීමේ පුහුණු වැඩසටහන් 2022 දී සැලකිය යුතු දියුණුවක් ලබා ඇත. අපි විගමනික ශ්‍රමිකයින් ඔවුන් විදෙස්ගත වන රටවල සංස්කෘතික සහ සේවා පරිසරයට අනුවර්තනය වීමට අවශ්‍ය කුසලතා, දැනුම සහ දැනුවත්භාවයෙන් සන්නද්ධ කිරීමට ප්‍රමුඛත්වය ලබා දුන්නෙමු. භාෂා පුහුණුව, රැකියා-ආශ්‍රිත කුසලතා සංවර්ධනය සහ විගමනික ශ්‍රමිකයින් ඔවුන්ගේ අයිතිවාසිකම් සහ වගකීම් පිළිබඳව දැනුවත් කිරීම අපගේ ප්‍රධාන අවධානයට ලක් විය.

3. සුබසාධන සහ උපකාරක සේවා: අපගේ සුභසාධන මධ්‍යස්ථාන, විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල සමඟ සහයෝගයෙන්, විදේශගත ශ්‍රී ලාංකික විගමනික ශ්‍රමිකයින්ට අත්‍යවශ්‍ය ආධාර සහ සහාය අඛණ්ඩව ලබා දුන්නේය. අපි ඔවුන්ගේ යහපැවැත්ම සහ ආරක්ෂාව සහතික කිරීම සඳහා උපදේශන සේවා, නීතිමය සහාය, සෞඛ්‍ය සේවා පහසුකම් සහ හදිසි ආධාර ලබා දුන්නෙමු. අපගේ විගමනික ශ්‍රමිකයින්ගේ අයිතිවාසිකම් සහ සුභසාධනය සුරක්ෂිත කිරීම සඳහා මෙම සේවාවන් තීරණාත්මක කාර්යභාරයක් ඉටු කළේය.
4. බඳවා ගැනීම් සහ ලියාපදිංචිය: බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතායතන නියාමනය කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා අපගේ උත්සාහයන් අපි ශක්තිමත් කළෙමු. අපගේ ලියාපදිංචි කිරීමේ ක්‍රමය විනිවිදභාවය ප්‍රවර්ධනය කරමින්, නීතිවිරෝධී සහ සදාචාර විරෝධී බඳවා ගැනීමේ පිළිවෙත් මැඩලමින් විගමනික ශ්‍රමිකයින්ට රැකියා අවස්ථා සඳහා සොයා ගැනීම සඳහානීත්‍යානුකූල මාර්ග සහතික කරයි. එසේ කිරීමෙන්, විගමනික ශ්‍රමිකයින්ට සහ බඳවා ගැනීමේ ආයතන සඳහා වඩාත් සදාචාරාත්මක සහ සාධාරණ පරිසරයක් නිර්මාණය කිරීම අපගේ අරමුණයි.

**අභියෝග සහ අභියෝග අවම කිරීම්:**

විශේෂයෙන් ගෝලීය COVID-19 වසංගතය හේතුවෙන් 2022 වර්ෂය අපට අද්විතීය අභියෝග ඉදිරිපත් කළේය. මෙම අභියෝගවලට ගමන් සීමා කිරීම්, රැකියා අහිමිවීම් සහ අතරමං වූ විගමනික ශ්‍රමිකයින් ආපසු ගෙන්වා ගැනීම ඇතුළත් විය. කෙසේ වෙතත්, අපි ක්‍රියාශීලී පියවරයන් හරහා මෙම බාධාවන් ක්‍රියාකාරීව කටයුතු කළෙමු,

1. වසංගතට ප්‍රතිචාරය: අතරමං වූ විගමනික ශ්‍රමිකයින්ට සහාය වීම, නැවත මෙරටට ගෙන්වා ගැනීමට පහසුකම් සැලසීම සහ අර්බුදයෙන් පීඩාවට පත් වූවන්ට අත්‍යවශ්‍ය සේවා සැපයීම සඳහා ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමෙන් අපි COVID-19 වසංගතයට වේගයෙන් ප්‍රතිචාර දැක්වූවෙමු. අපගේ විගමනික ශ්‍රමිකයින්ගේ යහපැවැත්ම සහ ආරක්ෂාව සහතික කිරීම සඳහා අපි අදාළ බලධාරීන් සහ පාර්ශවකරුවන් සමඟ සමීපව සහයෝගයෙන් කටයුතු කළෙමු.
2. තාක්ෂණය සහ නවෝත්පාදනය: තාක්ෂණය සහ නවෝත්පාදනය වැලඳ ගැනීමේ වැදගත්කම හඳුනා ගනිමින්, අපි 2022 දී ඩිජිටල් මූලාරම්භයන් ආරම්භ කළෙමු. මෙම මුල පිරීම් අපගේ සේවා බෙදා හැරීම වැඩිදියුණු කිරීම, ක්‍රියාවලීන් විධිමත් කිරීම සහ විගමනික ශ්‍රමිකයින්ට සහ පාර්ශවකරුවන් සඳහා කාර්යක්ෂම සහ ප්‍රවේශ විය හැකි වේදිකා සැපයීම අරමුණු කර ගෙන ඇත. තාක්ෂණය උපයෝගී කර ගනිමින්, අපි විගමනික ශ්‍රමිකයින් සහ නියෝජිතායතන යන දෙඅංශයේම සමස්ත අත්දැකීම වැඩිදියුණු කිරීමට උත්සාහ කළෙමු.

**අනාගත ඉදිරි දැක්ම:**

ඉදිරිය දෙස බලන විට, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විගමනික ශ්‍රමිකයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ ආචාරධාර්මික බඳවා ගැනීමේ පිළිවෙත් ප්‍රවර්ධනය කිරීමේ එහි මූලික අරමුණු වෙනුවෙන් කැපවී සිටී.

ඉදිරි වසරවලදී අපි පහත සඳහන් ප්‍රධාන ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරන්නෙමු:

1. පාලනය ශක්තිමත් කිරීම: අපගේ සියලුම මෙහෙයුම්වල විනිවිදභාවය, වගවීම සහ අඛණ්ඩතාව සහතික කිරීම සඳහා අපි අපගේ පාලන ව්‍යුහය සහ නියාමන රාමු තවදුරටත් වැඩිදියුණු කරන්නෙමු. අභ්‍යන්තර පාලන සහ පාලන යාන්ත්‍රණ ශක්තිමත් කිරීම ප්‍රමුඛතාවයක් ලෙස පවතිනු ඇත.
2. සහයෝගීතාවය සහ හවුල්කාරිත්වයන්: රාජ්‍ය ආයතන, ජාත්‍යන්තර සංවිධාන, සිවිල් සමාජ කණ්ඩායම් සහ අනෙකුත් පාර්ශවකරුවන් සමඟ සහයෝගීතාවයේ සහ හවුල්කාරිත්වයේ වැදගත්කම අපි හඳුනා ගනිමු. එකට වැඩ කිරීමෙන්, අපට ඒකාබද්ධව අභියෝගවලට මුහුණ දිය හැකි අතර විගමනික ශ්‍රමිකයින්ගේ අභිවෘද්ධිය සඳහා නව්‍ය විසඳුම් සකස් කළ හැකිය.
3. ධාරිතා වර්ධනය: ශ්‍රී ලාංකික විගමනික ශ්‍රමිකයින්ට ඵලදායී ලෙස සේවය කිරීම සඳහා අපගේ හැකියාවන් වැඩිදියුණු කිරීම සඳහා අපගේ කාර්ය මණ්ඩලයේ අඛණ්ඩ පුහුණුව සහ සංවර්ධනය සඳහා ආයෝජනය කිරීම අත්‍යවශ්‍ය වේ. නීති රාමු, උපදේශනය සහ අපගේ සේවාවන්හි ඩිජිටල් පරිවර්තනය වැනි ක්ෂේත්‍රවල විශේෂඥතාව ගොඩනැගීම කෙරෙහි අපි අවධානය යොමු කරන්නෙමු.

අවසාන වශයෙන්, අපගේ කොටස්කරුවන්ට, පාර්ශවකරුවන්ට සහ කැපවූ කාර්ය මණ්ඩල සාමාජිකයින්ට ඔවුන්ගේ නොසැලෙන සහයෝගය සහ කැපවීම සඳහා අපගේ අවංක කෘතඥතාව පළ කරමු. අපි එක්ව, ආචාරධාර්මික බඳවා ගැනීමේ පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම සහ ශ්‍රී ලාංකික විගමනික ශ්‍රමිකයින්ගේ අයිතිවාසිකම් සහ සුබසාධනය සුරක්ෂිත කිරීමෙහිලා සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇත. අපගේ විගමනික ශ්‍රමිකයින් සඳහා වඩා හොඳ අනාගතයක් නිර්මාණය කිරීම සඳහා අපගේ කැපවීම තුළ අපි නොසැලී සිටින අතර, ඉදිරි වසරවලදී මෙම වැදගත් කාර්යය දිගටම කරගෙන යාමට අපි බලාපොරොත්තු වෙමු.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් සහ ඒ වෙනුවෙන්.

ජී.ජී.එම්.හිල්මි
සභාපති

මහේන්ද්‍ර කුමාරසිංහ
අධ්‍යක්ෂක

# මූල්‍ය ප්‍රකාශන

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
විස්තීරණ ආදායම පිළිබඳ ඒකාබද්ධ ප්‍රකාශය
2022 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා

ඒකාබද්ධ ආදායම් ප්‍රකාශය

| | ඇටහන් | සමූහය 2022 රු. | සමූහය 2021 රු. | ශ්‍රී.ල.වි.සේ.නි.කා 2022 රු. | ශ්‍රී.ල.වි.සේ.නි.කා 2021 රු. |
|---|---|---|---|---|---|
| ආදායම | 4 | 7,929,502,632 | 2,381,850,667 | 7,867,797,179 | 2,368,908,903 |
| වෙනත් ආදායම් | 5 | 1,771,465,140 | 156,664,357 | 1,714,889,345 | 152,295,251 |
| | | **9,700,967,772** | **2,538,515,024** | **9,582,686,524** | **2,521,204,154** |
| වියදම් | | | | | |
| කාර්ය මණ්ඩල පිරිවැය | 6 | 1,917,890,400 | 1,358,402,799 | 1,893,353,426 | 1,341,022,288 |
| ආයතනික වියදම් | 6 | 591,014,974 | 416,604,417 | 581,282,404 | 412,550,502 |
| මෙහෙයුම් වියදම් | 6 | 453,335,333 | 294,417,173 | 402,426,195 | 278,321,573 |
| මූල්‍ය වියදම් | 6 | 24,897,211 | 23,163,121 | 24,761,025 | 22,990,261 |
| ප්‍රචාරය සහ දැන්වීම් | 6 | 20,674,282 | 8,485,017 | 20,606,606 | 8,485,017 |
| ව්‍යාපාර ප්‍රවර්ධන වියදම් | 6 | 93,448,787 | 6,411,834 | 93,087,645 | 5,666,615 |
| සුභසාධන වෙනත් වියදම් | 6 | 664,997,730 | 352,023,282 | 664,997,730 | 352,023,282 |
| | | **3,766,258,716** | **2,459,507,643** | **3,680,515,030** | **2,421,059,538** |
| මූල්‍ය ආදායම් | | 1,901,017,641 | 538,457,542 | 1,888,162,823 | 532,647,224 |
| | | **1,901,017,641** | **538,457,542** | **1,888,162,823** | **532,647,224** |
| බදු වලට පෙර ලාභය/(අලාභය). | | **7,835,726,697** | **617,464,922** | **7,790,334,318** | **632,791,840** |
| බදු වියදම් | 8 | 1,712,422,780 | 262,689,290 | 1,704,722,014 | 262,689,289 |
| බදු ගෙවීමෙන් පසු ලාභය | | **6,123,303,917** | **880,154,212** | **6,085,612,304** | **895,481,128** |

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර් යාංශය
ඒකාබද්ධ විස්තීරණ ආදායම් ප්‍රකාශය
**2022** දෙසැම්බර් **31**න් අවසන් වර්ෂය සඳහා

| | සමූහය | සමූහය | ශ්‍රී.ල.වි.සේ.නි.කා | ශ්‍රී.ල.වි.සේ.නි.කා |
|---|---|---|---|---|
| | **2022** | **2021** | **2022** | **2021** |
| | රු | රු | රු | රු |
| බදු ගෙවීමෙන් පසු ලාභය | 6,123,303,917 | 880,154,212 | 6,085,612,304 | 895,481,128 |
| වෙනත් විස්තීරණ ආදායම් | | | | |
| පශ්චාත් රැකියා ප්‍රතිලාභ මත ආයුගනනක ලාභ/(අලාභ ) | 9,659,468 | 9,629,293 | 9,803,587 | 9,773,412 |
| ආයුගණක ලාභ/(අලාභ ) මත කල් දැමූ බද්ද | (2,646,968) | (2,345,619) | (2,646,968) | (2,345,619) |
| මුළු වර්ෂය සඳහා අදාළ වෙනත් විස්තීර්ණය ආදායම්, බදු ශුද්ධ | **7,012,500** | **7,283,674** | **7,156,619** | **7,427,793** |
| වර්ෂය සඳහා සම්පූර්ණ ආදායම | **6,130,316,417** | **887,437,886** | **6,092,768,923** | **902,908,921** |

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය
**2022 දෙසැම්බර් 31 දිනට**

| | සටහන් | සමූහය 2022 | සමූහය 2021 | ශ්‍රී.ල.වි.සේ.නි.කා 2022 | ශ්‍රී.ල.වි.සේ.නි.කා 2021 |
|---|---|---|---|---|---|
| **වත්කම්** | | රු. | රු. | රු. | රු |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| අස්පෘශ්‍ය වත්කම් | 9 | 1,000 | 1,000 | 1,000 | 1,000 |
| භාවිතා කිරීමේ අයිතිය ඇති වත්කම් | 10.1 | 159,881,649 | 211,904,659 | 159,881,649 | 211,904,658 |
| දේපළ, පිරියත සහ උපකරණ | 10.2 | 1,309,077,569 | 1,397,863,567 | 1,233,433,090 | 1,319,100,423 |
| අනුබද්ධිත ආයෝජනය | 11 | - | - | 5,000,000 | 5,000,000 |
| කාර්යය මණ්ඩල ණය | 12.1 | 289,571,002 | 233,155,099 | 284,715,739 | 231,555,371 |
| පෙරගෙවුම් කාර්යය මණ්ඩල ණය | 12.2 | 138,770,846 | 79,784,849 | 138,770,846 | 79,784,849 |
| බදු අය කිරීම | 18.2 | - | 39,830,516 | - | 37,864,104 |
| කල් දැමූ බදු වත්කම් | 18.1 | 36,356,505 | 16,081,210 | 36,091,851 | 15,816,556 |
| සිසුවෙමින් පවතින වැඩ - ගොඩනැගිලි | 10.3 | 5,375,927 | 4,621,324 | 5,375,927 | 4,621,324 |
| | | **1,939,034,498** | **1,983,242,224** | **1,863,270,102** | **1,905,648,285** |
| **ජංගම වත්කම්** | | | | | |
| ඉන්වෙන්ටරි | 14 | 16,054,361 | 9,313,467 | 15,781,946 | 9,041,052 |
| ජංගම මූල්‍ය වත්කම් | 13 | 23,251,261,985 | 10,692,902,315 | 23,127,984,014 | 10,586,492,671 |
| කාර්යය මණ්ඩල ණය | 12.1 | 106,368,866 | 90,386,524 | 106,368,866 | 90,335,524 |
| පූර්ව ගෙවීම් සහ අනෙකුත් ලැබිය යුතු දෑ විවිධ | 15 | 1,106,014,117 | 1,292,415,113 | 1,088,416,478 | 1,284,306,881 |
| | | 16,551,789 | 32,407,031 | 16,481,983 | 32,407,031 |
| මුදල් සහ මුදල් සමාන දෑ | 16 | 850,363,625 | 3,650,718,901 | 812,244,924 | 3,648,417,601 |
| | | **25,346,614,743** | **15,768,143,351** | **25,167,278,211** | **15,651,000,761** |
| **මුළු වත්කම්** | | **27,285,649,241** | **17,751,385,575** | **27,030,548,313** | **17,556,649,045** |
| **හිමිකම් සහ වගකීම්** | | | | | |
| **හිමිකම්** | | | | | |
| ප්‍රාග්ධනය | | 691,161,789 | 691,161,789 | 691,161,789 | 691,161,789 |
| සමුච්චිත අරමුදල | | 17,046,963,678 | 10,914,681,441 | 16,904,500,172 | 10,809,578,243 |
| නැවත තක්සේරු කිරීමේ සංචිතය | | 66,167,346 | 66,167,346 | 41,713,346 | 41,713,346 |
| ප්‍රදානයන් | | - | 44,760 | - | 44,760 |
| **සම්පූර්ණ හිමිකම්** | | **17,804,292,813** | **11,672,055,335** | **17,637,375,307** | **11,542,498,138** |
| **ජංගම නොවන වගකීම්** | | | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම | 3.11 | 276,131,384 | 234,884,597 | 270,845,610 | 230,309,332 |
| කුවේට් වන්දි-සංචිතය | 20 | 5,212,391,154 | 3,917,196,853 | 5,212,391,154 | 3,917,196,853 |
| බදු වගකීම් | | 54,803,487 | 110,144,618 | 54,803,487 | 110,144,618 |
| | | **5,543,326,025** | **4,262,226,068** | **5,538,040,251** | **4,257,650,803** |
| **ජංගම වගකීම්** | | | | | |
| බදු අය කිරීම | 18.2 | 1,143,883,629 | - | 1,138,149,275 | - |
| නියෝජිතායතන ණය හිමියන් | | 374,287,836 | 249,339,563 | 376,748,580 | 250,487,782 |
| උපචිත වියදම් | | 315,602,562 | 85,191,927 | 309,653,297 | 80,910,193 |
| විවිධ ණය හිමියන් ණය ගැනීම් | 19 | 2,038,301,480 | 1,422,618,819 | 1,964,642,766 | 1,366,814,325 |
| බදු වගකීම් | | 55,341,133 | 49,002,041 | 55,341,133 | 49,002,041 |
| සංක්‍රමණික සේවකයන්ගේ දායකත්වය | | 10,597,704 | 9,285,763 | 10,597,704 | 9,285,763 |
| කෙටි කාලීන ණය ගැනීම | | - | 1,650,000 | | |
| ගෙවිය යුතු ලාභාංශ බද්ද | | 16,059 | 16,059 | - | - |
| | | **3,938,030,403** | **1,817,104,172** | **3,855,132,755** | **1,756,500,104** |
| **සම්පූර්ණ හිමිකම් සහ වගකීම්** | | **27,285,649,241** | **17,751,385,575** | **27,030,548,313** | **17,556,649,045** |

08 පිටුවේ සිට 53 පිටුව දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා , අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරයි. මෙම මූල්‍ය ප්‍රකාශන 2023.04.06 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මුදල්

සභාපති

අධ්‍යක්ෂ

**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය**

කාර්යාංශයේ අරමුදල සහ සුභසාධක අරමුදල (WWF) අතර මූල්‍ය තත්ත්ව ප්‍රකාශය වෙන් කිරීම

**2022 දෙසැම්බර් 31 දිනට**

| | සටහන් | ශ්‍රී.ල.වි.සේ.නි.කා | කාර් යාංශය අරමුදල | සුභසාධන අරමුදල |
|---|---|---|---|---|
| **වත්කම්** | | **2022** | **2022** | **2022** |
| **ජංගම නොවන වත්කම්** | | රු | රු | රු |
| අස්පෘශ්‍ය වත්කම් | 9 | 1,000 | 1,000 | - |
| භාවිතා කිරීමේ අයිතිය ඇති වත්කම් | 10.1 | 159,881,649 | 159,881,649 | - |
| දේපළ, පිරියත සහ උපකරණ | 10.2 | 1,233,433,090 | 849,945,791 | 383,487,299 |
| අනුබද්ධිත ආයෝජනය | 11 | 5,000,000 | 5,000,000 | - |
| කාර්යය මණ්ඩල ණය | 12.1 | 284,715,739 | 284,715,739 | - |
| පෙරගෙවුම් කාර්යය මණ්ඩල ණය | 12.2 | 138,770,846 | 138,770,846 | - |
| කල් දැමූ බදු වත්කම් | 18.1 | 36,091,851 | 36,091,851 | - |
| පූර්ව ගෙවීම් සහ අනෙකුත් ලැබිය යුතු දෑ | 15 | - | - | |
| සිදුවෙමින් පවතින වැඩ- ගොඩනැගිලි | 10.3 | 5,375,927 | 5,375,927 | - |
| | | **1,863,270,102** | **1,479,782,803** | **383,487,299** |
| **ජංගම වත්කම්** | | | | |
| ඉන්වෙන්ටරි | 14 | 15,781,946 | 15,781,946 | - |
| ජංගම මූල්‍ය වත්කම් | 13 | 23,127,984,014 | 7,137,661,975 | 15,990,322,039 |
| කාර්යය මණ්ඩල ණය | 12.1 | 106,368,866 | 106,368,866 | - |
| ලැබිය යුතු සුබසාධන අරමුදල | | - | 1,512,657,528 | - |
| පෙරගෙවුම් සහ අනෙකුත් ලැබිය යුතු දෑ | 15 | 1,088,416,478 | 139,883,629 | 948,532,849 |
| විවිධ අත්තිකාරම් | | 16,481,983 | 3,014,198 | 13,467,785 |
| මුදල් සහ සමානදෑ | 16 | 812,244,924 | 335,673,243 | 476,571,680 |
| | | **25,167,278,211** | **9,251,041,385** | **17,428,894,354** |
| **මුළු වත්කම්** | | **27,030,548,313** | **10,730,824,188** | **17,812,381,652** |
| **හිමිකම් සහ වත්කම්** | | | | |
| **හිමිකම්** | | | | |
| ප්‍රාග්ධනය | | 691,161,789 | 691,161,789 | - |
| සමුච්චිත අරමුදල | | 16,904,500,172 | 7,399,311,563 | 9,505,188,609 |
| නැවත තක්සේරු කිරීමේ සංචිතය | | 41,713,346 | 41,713,346 | - |
| **සම්පූර්ණ හිමිකම්** | | **17,637,375,307** | **8,132,186,698** | **9,505,188,609** |
| **ජංගම නොවන වගකීම්** | | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් | 3.11 | 270,845,610 | 270,845,610 | |
| කුවේට් වන්දි-සංචිතය | 20 | 5,212,391,154 | | 5,212,391,154 |
| බදු වගකීම් | | 54,803,487 | 54,803,487 | |
| | | **5,538,040,251** | **325,649,097** | **5,212,391,154** |
| **ජංගම වගකීම්** | | | | |
| බදු අය කිරීම | 18.2 | 1,138,149,275 | 1,138,149,275 | - |
| නියෝජිතායතන ණයගැතියන් | | 376,748,580.05 | 376,748,580 | - |
| කාර්යාංශයට ගෙවිය යුතු මුදල | | - | - | 1,512,657,528 |
| උපචිත වියදම් | | 309,653,297.01 | 235,140,899 | 74,512,398 |
| විවිධ ණය හිමියන් සහ ණය ගැනීම් | 19 | 1,964,642,766.32 | 467,608,507 | 1,497,034,259 |
| බදු වගකීම් | | 55,341,132.54 | 55,341,133 | - |
| සංක්‍රමණික සේවකයන්ගේ දායකත්වය | | 10,597,704.00 | - | 10,597,704 |
| | | **3,855,132,755** | **2,272,988,393** | **3,094,801,889** |
| **සම්පූර්ණ හිමිකම් සහ වගකීම්** | | **27,030,548,313** | **10,730,824,188** | **17,812,381,652** |

08 පිටුවේ සිට 53 පිටුව දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා , අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරයි. මෙම මූල්‍ය ප්‍රකාශන 2023.04.06 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී- මූදල්

සභාපති

අධ්‍යක්ෂ

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
මුදල් ප්‍රවාහයන් පිළිබඳ ඒකාබද්ධ ප්‍රකාශය
2022 දෙසැම්බර් 31 න් අවසන් වසර සඳහා

| | | සමූහය 2022 රු | සමූහය 2021 රු | ශ්‍රී.ල.වි.සේ.නි.කා 2022 රු | ශ්‍රී.ල.වි.සේ.නි.කා 2021 රු |
|---|---|---|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය | | | | | |
| බදු ගෙවීමට පෙර ශුද්ධ ලාභය | | **7,835,726,697** | **617,464,922** | **7,790,334,318** | **632,791,840** |
| ගැලපීම් සඳහා; | | | | | |
| ක්ෂය වීම | | 226,567,296 | 215,559,553 | 221,306,601 | 210,368,107 |
| පොලී ආදායම | | (1,901,017,641) | (538,457,542) | (1,888,162,823) | (532,647,224) |
| මූල්‍ය වියදම් | | 24,897,211 | 23,163,121 | 24,761,025 | 22,990,261 |
| බදු කුලී වියදම් | | 1,820,318 | 16,108,533 | 1,820,318 | 16,108,533 |
| දේපළ පිරියත හා උපකරණ විනිමය | | 342,949 | (15,788,207) | 342,949 | (15,788,207) |
| විනිමය හුවමාරු ලාභය | | (1,607,036,283) | (83,302,845) | (1,606,547,459) | (83,374,284) |
| ප්‍රදාන ආදායම (විවිධ ආදායම) | | (44,760) | (14,000) | (44,760) | (14,000) |
| වියදම් වෙන්කිරීම අධි/ඌන | | (187,186) | (1,838,670) | - | - |
| පාරිතෝෂික වෙන්කිරීම | | 69,527,296 | 31,820,866 | 68,960,908 | 31,081,007 |
| | | **4,650,595,897** | **264,715,731** | **4,612,771,076** | **281,516,030** |
| ගෙවූ බදු | | (551,663,573) | (171,496,799) | (551,663,573) | (171,496,799) |
| ගෙවූ පාරිතෝෂික | | (18,621,043) | (17,792,345) | (18,621,043) | (17,792,345) |
| | | **(570,284,616)** | **(189,289,144)** | **(570,284,616)** | **(189,289,144)** |
| වැඩ කරන ප්‍රාග්ධන වෙනස්කම් වලට පෙර මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ගලා ඒම / පිටතට ගලා යාම | | **4,080,311,281** | **75,426,587** | **4,042,486,460** | **92,226,886** |
| කාරක ප්‍රාග්ධන වෙනස්කම් | | | | | |
| ලැබිය යුතු මුදල් වැඩි වීම/අඩුවීම | i | 195,515,343 | (104,318,662) | 205,074,556 | (104,510,413) |
| වර්ෂය සඳහා ප්‍රතිපාදන (කුවේට අරමුදල) | | 32,674 | 34,319,606 | 32,674 | 34,319,606 |
| ණය හිමියන්ගේ වැඩි වීම/අඩුවීම | ii | 2,058,665,570 | 508,760,139 | 2,039,967,517 | 499,456,748 |
| | | **2,254,213,588** | **438,761,084** | **2,245,074,747** | **429,265,941** |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ගලා ඒම / පිටතට ගලා යාම | | **6,334,524,868** | **514,187,670** | **6,287,561,207** | **521,492,829** |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය | | | | | |
| දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම | | (88,335,772) | (7,947,008) | (86,193,742) | (7,723,179) |
| දේපළ, පිරියත සහ උපකරණ ඉවත් කිරීමෙන් ලැබෙන ආදායම | | 417,365 | 16,046,145 | 417,365 | 16,046,145 |
| පොලී ආදායම | | 19,946,128 | 723,416,475 | 7,091,311 | 718,342,481 |
| මූල්‍ය වත්කම්වල ආයෝජනය | iii | (8,992,740,930) | (1,094,306,127) | (8,972,668,067) | (1,094,727,932) |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ගලා ඒම / පිටතට ගලා යාම | | **(9,060,713,209)** | **(362,790,515)** | **(9,051,353,134)** | **(368,062,485)** |
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය | | | | | |
| මූල්‍ය වියදම් | | (23,514,896) | (25,310,944) | (23,378,709) | (25,684,313) |
| භාවිතා කිරීමේ අයිතිය ඇති වත්කම් | | (49,002,040) | (45,839,086) | (49,002,040) | (45,839,086) |
| ණය ලබා ගැනීමෙන් ලැබෙන ආදායම | | (1,650,000) | (1,800,000) | - | - |
| ශුද්ධ මුදල් ගලා ඒම/ගලා යාම මුදල් ක්‍රියාකාරකම් වලින් | | **(74,166,936)** | **(72,950,029)** | **(72,380,749)** | **(71,523,398)** |
| මුදල් සහ මුදල් සමාන දෑ ශුද්ධ වෙනස් කිරීම | | **(2,800,355,277)** | **78,447,126** | **(2,836,172,676)** | **81,906,947** |
| වසර ආරම්භයේදී මුදල් සහ මුදල් සමාන දෑ | | **3,650,718,902** | **3,572,271,776** | **3,648,417,601** | **3,566,510,654** |
| වසර අවසානයේදී මුදල් සහ මුදල් සමාන දෑ | | **850,363,625** | **3,650,718,902** | **812,244,925** | **3,648,417,601** |

**මුදල් ප්‍රවාහය පිළිබඳ ඒකාබද්ධ ප්‍රකාශය**
**2022 දෙසැම්බර් 31 න් අවසන් වසර සඳහා**

| | සමූහය | සමූහය |
|---|---|---|
| **සටහන් I** | රු | රු |
| **ලැබිය යුතු මුදල් වැඩි වීම / අඩුවීම** | | |
| පරිභෝජන භාණ්ඩවල වැඩි වීම / අඩුවීම | (6,740,894) | (6,740,894) |
| ගෙවීම් සහ අනෙකුත් ලැබිය යුතු මුදල් වැඩි වීම /අඩුවීම | 186,400,995 | 195,890,402 |
| විවිධ අත්තිකාරම් වැඩි වීම /අඩුවීම | 15,855,242 | 15,925,048 |
| | **195,515,343** | **205,074,556** |
| **සටහන් II** | | |
| **ණය හිමියන්ගේ වැඩි වීම / අඩුවීම** | | |
| නියෝජිතායතන ණය හිමියන්ගේ වැඩි වීම / අඩුවීම | 124,948,273 | 126,260,798 |
| උපචිත වියදම් වැඩිවීම / අඩුවීම | 230,410,635 | 228,743,104 |
| සංක්‍රමණික සේවක දායකත්වයේ වැඩිවීම / අඩුවීම | (70,374) | (70,374) |
| කුවේට් වන්දි සංචිතය | 1,295,194,301 | 1,295,194,301 |
| අනෙකුත් ණය හිමියන්ගේ වැඩිවීම / අඩුවීම | 408,182,733 | 389,839,686 |
| | **2,058,665,570** | **2,039,967,517** |
| **සටහන් III** | | |
| **මූලික වත්කම්වල ආයෝජනය** | | |
| කාර්යය මණ්ඩල ණය වැඩිවීම / අඩුවීම | (131,384,241) | (128,179,706) |
| ස්ථාවර තැන්පතු වැඩි වීම / අඩු වීම | (8,861,356,690) | (8,844,488,362) |
| | **(8,992,740,930)** | **(8,972,668,067)** |

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
මුදල් ප්‍රවාහයන් පිළිබඳ ඒකාබද්ධ ප්‍රකාශය
**2022** දෙසැම්බර් **31** න් අවසන් වසර සඳහා

| | සමූහය | | | | ශ්‍රී.ල.වි.සේ.නි.කා | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රාග්ධනය | සමුච්චිත අරමුදල | නැවත ඇගයීමේ අතිරික්තය | එකතුව | ප්‍රාග්ධනය | කාර්යාංශය | සුභසාධන අරමුදල | එකතුව | නැවත ඇගයීමේ අතිරික්තය | එකතුව |
| | රු. | රු. | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 2021 ජනවාරි 01 දිනට ශේෂය | 691,161,789 | 10,029,082,225 | 66,167,346 | 10,786,411,360 | 691,161,789 | 5,264,264,844 | 4,642,404,478 | 9,906,669,322 | 41,713,346 | **10,639,544,457** |
| වසර සඳහා ලාභය | - | 880,154,212 | - | 880,154,212 | - | 558,657,549 | 336,823,579 | 895,481,128 | | **895,481,128** |
| වෙනත් විස්තීර්ණ ආදායම් | - | 7,283,674 | - | 7,283,674 | - | 7,427,793 | | 7,427,793 | | **7,427,793** |
| වර්ෂය සඳහා ගැලපීම් | - | (1,838,670) | - | (1,838,670) | - | - | - | - | | - |
| එකතුව | - | **885,599,216** | - | **885,599,216** | - | **566,085,342** | **336,823,579** | **902,908,921** | - | **902,908,921** |
| **2022** දෙසැම්බර් **31** දිනට ශේෂය | **691,161,789** | **10,914,681,441** | **66,167,346** | **11,672,010,576** | **691,161,789** | **5,830,350,186** | **4,979,228,057** | **10,809,578,243** | **41,713,346** | **11,542,453,378** |
| 2022 ජනවාරි 31 දිනට ශේෂය | 691,161,789 | 10,914,681,441 | 66,167,346 | 11,672,010,576 | 691,161,789 | 5,830,350,186 | 4,979,228,057 | 10,809,578,243 | 41,713,346 | 11,542,453,378 |
| වසර සඳහා ලාභය | - | 6,123,303,917 | - | 6,123,303,917 | - | 1,559,651,752 | 4,525,960,552 | 6,085,612,304 | | 6,085,612,304 |
| වෙනත් විස්තීර්ණ ආදායම් | - | 7,012,500 | - | 7,012,500 | | 7,156,619 | | 7,156,619 | | 7,156,619 |
| වර්ෂය සඳහා ගැලපීම් | - | 1,965,820 | - | 1,965,820 | - | 2,153,006 | - | 2,153,006 | | 2,153,006 |
| එකතුව | - | **6,132,282,237** | - | **6,132,282,237** | - | **1,568,961,377** | **4,525,960,552** | **6,094,921,929** | | **6,094,921,929** |
| **2022** දෙසැම්බර් **31** දිනට ශේෂය | **691,161,789** | **17,046,963,678** | **66,167,346** | **17,804,292,813** | **691,161,789** | **7,399,311,563** | **9,505,188,609** | **16,904,500,172** | **41,713,346** | **17,637,375,307** |

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2022 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා

කාර්යාංශයේ අරමුදල සහ සුබසාධන අරමුදල (WWF) අතර ආදායම් සහ වියදම් වෙන් කිරීම

| විස්තර | 2022 | | | 2021 |
|---|---|---|---|---|
| | කාර්යාංශය | සේ.සු.අ | එකතුව | |
| | රු. | රු. | රු. | රු. |
| ආදායම් | | | | |
| බදවා ගැනීමේ ගාස්තු - නියෝජිතායතන | 370,545,481 | 185,174,521 | 555,720,001 | 188,059,217 |
| බදවා ගැනීමේ ගාස්තු - පුද්ගල | 1,585,683,192 | 172,227,310 | 1,757,910,502 | 690,103,452 |
| කොරියානු බදවාගැනීම් ප්‍රවර්ධන ගාස්තු | - | 230,730,797 | 230,730,797 | 7,621,757 |
| පහසුකම් ගාස්තු | 61,705,919 | - | 61,705,919 | 25,601,643 |
| බලපත්‍ර ගාස්තු | 93,970,173 | - | 93,970,173 | 60,263,259 |
| සෙස් ආදායම | 943,245,661 | - | 943,245,661 | 317,219,004 |
| කොරියානු පරිපාලන ගාස්තු | 26,080,484 | - | 26,080,484 | 821,756 |
| නැවත ඇතුල්වීමේ කොරියානු ගාස්තුව | 23,271,992 | - | 23,271,992 | 17,260,380 |
| කොරියානු පුහුණු ගාස්තු | - | 54,679,103 | 54,679,103 | 15,618,785 |
| පුහුණු ආදායම | - | 521,323,621 | 521,323,621 | 177,280,879 |
| විදේශීය මෙහෙවරෙන් ලැබෙන ආදායම (සටහන 04.1) | 88,557,440 | 3,510,601,486 | 3,599,158,926 | 869,058,772 |
| | **3,193,060,342** | **4,674,736,837** | **7,867,797,179** | **2,368,908,903** |
| වෙනත් මෙහෙයුම් ආදායම් | | | | |
| රක්ෂණ කොමිස් (දේශීය සහ විදේශීය) | - | 5,444,905 | 5,444,905 | 18,158,740 |
| විදේශ විනිමය ලාභය | 34,163,623 | 1,572,383,836 | 1,606,547,459 | 83,374,284 |
| විවිධ ආදායම් (උප සටහන-05.1) | 94,782,280 | 8,114,702 | 102,896,981 | 50,762,226 |
| | **128,945,902** | **1,585,943,443** | **1,714,889,345** | **152,295,251** |
| අඩු: | | | | |
| කාර්යය මණ්ඩල පිරිවැය | 1,477,490,475 | 415,862,951 | 1,893,353,426 | 1,341,022,288 |
| ආයතනික වියදම් | 234,204,493 | 347,077,911 | 581,282,404 | 412,550,502 |
| මෙහෙයුම් වියදම් | 324,465,099 | 77,961,095 | 402,426,195 | 278,321,573 |
| මූල්‍ය වියදම් | 19,053,280 | 5,707,745 | 24,761,025 | 22,990,261 |
| වෙළඳ දැන්වීම් සහ ප්‍රචාරණය | 19,222,584 | 1,384,022 | 20,606,606 | 8,485,017 |
| ව්‍යාපාර ප්‍රවර්ධන වියදම් | 88,479,449 | 4,608,196 | 93,087,645 | 5,666,615 |
| සුභසාධන වෙනත් වියදම් | - | 664,997,730 | 664,997,730 | 352,023,282 |
| | **2,162,915,379** | **1,517,599,650** | **3,680,515,030** | **2,421,059,538** |
| මූල්‍ය ආදායම් සටහන-7 | 815,550,159 | 1,072,612,665 | 1,888,162,823 | 532,647,224 |
| | **815,550,159** | **1,072,612,665** | **1,888,162,823** | **532,647,224** |
| බදු වලට පෙර ලාභය/(අලාභය). | **1,974,641,024** | **5,815,693,294** | **7,790,334,318** | **632,791,840** |
| අඩු: ආදායම් බදු * | (414,989,272) | (1,289,732,742) | (1,704,722,014) | 262,689,289 |
| බදු ගෙවීමෙන් පසු ලාභය | **1,559,651,752** | **4,525,960,552** | **6,085,612,304** | **895,481,128** |
| වෙනත් විස්තීර්ණ ආදායම් | | | | |
| පශ්චාත් රැකියා ප්‍රතිලාභ මත ආයුගණක (අලාභය)/ලාභ | 9,803,587 | - | 9,803,587 | 9,773,412 |
| ආයුගණක අලාභ /ලාභ මත කල් දැමූ බද්ද | (2,646,968) | | (2,646,968) | (2,345,619) |
| **මුළු අනෙකුත් විස්තීර්ණ ආදායම** | **7,156,619** | | **7,156,619** | **7,427,793** |
| **සම්පූර්ණ විස්තීර්ණ ආදායම** | **1,566,808,371** | **4,525,960,552** | **6,092,768,923** | **902,908,921** |

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2022 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය

## 1. ආයතනික තොරතුරු

### 1.1 සාමාන්‍ය

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය (SLBFE) යනු 1985 අංක 21 දරන පනත (පසුකාලීන සංශෝධන පනත 1994 අංක 04 සහ 2009 අංක 56 දරන පනත) යටතේ පිහිටුවා ඇති අතර දැනට කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ස්ථාපිත රාජ්‍ය සංස්ථාවකි. .ලියාපදිංචි කාර්යාලය සහ ව්‍යාපාරයේ ප්‍රධාන ස්ථානය අංක 234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල යන ස්ථානයේ පිහිටා ඇත.

### 1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය

### 1.2.1 ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රධාන ක්‍රියාකාරකම් වන්නේ ශ්‍රී ලාංකිකයන් සඳහා විදේශ රැකියා ප්‍රවර්ධනය සහ සංවර්ධනය කිරීම වන අතර රටින් පිටත රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සුබසාධනය සහ ආරක්ෂාව සුරක්ෂිත කිරීම සඳහා විදේශ රැකියා ව්‍යාපාරවලට සහාය වීම සහ නියාමනය කිරීමයි.

### 1.2.2 පරිපාලිත කොටස් හිමිකම

2022 දෙසැම්බර් 31 සහ 2021 දෙසැම්බර් 31 දිනට පරිපාලිත ආයතන සහ එහි හිමිකාරිත්වය පහත පරිදි වේ.

| පරිපාලිත ආයතන | ප්‍රධාන ක්‍රියාකාරකම් | ආයෝජන වර්ගය | 31 දෙසැම්බර් | |
|---|---|---|---|---|
| | | | 2022 | 2021 |
| සීමා සහිත ශ්‍රී ලංකා විදේශ රැකියා නියෝජිත (පුද්ගලික ) සමාගම | කුසලතා වැඩි දියුණු කිරීම සඳහා පුහුණුව ලබා දීම<br><br>විදේශ රැකියා සඳහා බඳවා ගැනීම | පරිපාලිත ආයතනය | 100% | 100% |

සමූහයේ මූල්‍ය ප්‍රකාශන දෙසැම්බර් 31 වැනිදායින් අවසන් වන පොදු මූල්‍ය වර්ෂයක් ඇත. 2022 දෙසැම්බර් 31 වන දිනට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ (ශ්‍රී.ල.වි.සේ.නි.කා) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන කාර්යාංශය සහ එහි අනුබද්ධ ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි (පුද්ගලික) සමාගම (ශ්‍රී.ල.වි.රැ.නි) සමන්විත වේ.

## 2. සැකසීමේ පදනම

### 2.1 අනුකූලතා ප්‍රකාශය

ආදායම් ප්‍රකාශය, අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, කොටස්වල වෙනස්වීම් ප්‍රකාශය, සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් සමඟින් ('මූල්‍ය ප්‍රකාශන') 31 වැනි දිනට ඇතුළත් වන මූල්‍ය ප්‍රකාශන 2022 දෙසැම්බර් සහ අවසන් වූ වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කර ඇති අතර, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති ("SLFRS"), ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ("LKAS"), ස්ථාවරයේ අදාළ අර්ථකථන ඇතුළත් වේ. අර්ථකථන කමිටුව ("SIC") සහ ජාත්‍යන්තර මූල්‍ය වාර්තා අර්ථකථන කමිටුව ("IFRIC"). මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අදාළ වන ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දක්වා ඇත. මෙම ප්‍රතිපත්ති වෙනත් ආකාරයකින් ප්‍රකාශ නොකළහොත් ඉදිරිපත් කරන ලද සියලුම වසර සඳහා මෙම ප්‍රතිපත්ති අඛණ්ඩව භාවිතා කෙරේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම්

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRS/LKAS) අනුව කාර්යාංශයේ සහ එහි පරිපාලිත ආයතනයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ. අධ්‍යක්ෂ මණ්ඩලය මෙම වගකීම "මූල්‍ය ප්‍රකාශන සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම" (77 සහ 79 පිටුව බලන්න), "අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව" සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා ඇති පරිදි මෙම වගකීම පිළිගනී. මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය (77 සහ 79 පිටුව බලන්න). 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන, 2023.04.06 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර නිකුත් කිරීමට අවසර දෙන ලදී.

## 2.3 මිනුම් පදනම

මූල්‍ය ප්‍රකාශන උපචිත පදනමක් මත සහ වෙනත් ආකාරයකින් ප්‍රකාශ නොකළහොත් ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ සකස් කර ඇත.

මූල්‍ය ප්‍රකාශන සමූහයේ ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ විනිමය වන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කෙරේ.

## 2.4 සැලකිය යුතු ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන

සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා කළමනාකරණය විසින් වාර්තා කරන ලද ආදායම්, වියදම්, වත්කම් සහ වගකීම් ප්‍රමාණයන්ට බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන මෙන්ම ඒ සමඟ ඇති හෙළිදරව් කිරීම් සහ අවිනිශ්චිත වගකීම් හෙළිදරව් කිරීම ද අවශ්‍ය වේ. මෙම උපකල්පන සහ ඇස්තමේන්තු පිළිබඳ අවිනිශ්චිතතාවය අනාගත කාල පරිච්ඡේදවල බලපෑමට ලක් වූ වත්කම් හෝ වගකීම් දරා ගැනීමේ ප්‍රමාණයට ද්‍රව්‍යමය ගැලපීමක් අවශ්‍ය වන ප්‍රතිඵලවලට හේතු විය හැක.

සමූහයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියේදී කළමනාකාරිත්වය විවිධ විනිශ්චයන් සිදු කර ඇත. ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන ඇති සැලකිය යුතු බලපෑම් ඇතිකිරීමට කළමණාකරණය විසින් තක්සේරු කර ඇති ඒවා අදාල මූල්‍යය ප්‍රකාශන තනි සටහන්වල සාකච්ඡා කර ඇත.

ඉදිරි මූල්‍ය වර්ෂය තුළ වත්කම් සහ බැරකම් ප්‍රමාණයට ප්‍රමානාත්මක ගැලපීමක් ඇති කිරීමේ සැලකිය යුතු අවදානමක් ඇති, අනාගතය පිළිබඳ ප්‍රධාන උපකල්පන සහ වාර්තා කරන දිනයේ ඇස්තමේන්තු අවිනිශ්චිතතාවයේ අනෙකුත් ප්‍රධාන මූලාශ්‍ර ද තනි පුද්ගල සටහන් වල විස්තර කර ඇත. ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී පවතින ප්‍රමිතීන්මත සමූහය සිය උපකල්පන සහ ඇස්තමෙන්තු පදනම් කර ඇත. කෙසේ වෙතත්, පවතින තත්වයන් සහ අනාගත වර්ධනයන් පිළිබඳ උපකල්පන, වෙළඳපල වෙනස්වීම් හෝ සමූහයේ පාලනයෙන් පරිභාහිරව පැන නගින තත්වයන් හේතුවෙන් වෙනස් විය හැකිය. එවැනි වෙනස්කම් සිදු වන විට උපකල්පනවලින් පිළිබිඹු වේ. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී සැලකිය යුතු විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන භාවිතා කර ඇති පහත අයිතම කළමනාකරණය විසින් සලකා බලන ලදී.

### අඛණ්ඩ පැවැත්ම

කළමනාකාරිත්වය විසින් ඉදිරි පැවැත්ම ලෙස ඉදිරියට යෑමට ඇති හැකියාව පිළිබඳව තක්සේරුවක් කර ඇති අතර අපේක්ෂා කළ හැකි අනාගතයක් සඳහා ව්‍යාපාර කටයුතු ඉදිරියට කරගෙන යාමට සම්පත් ඇති බවට සෑහීමකට පත්වේ. තවද, සමූහයේ/කාර්යාංශයට ඉදිරියට යාමේ අවශ්‍යතාවයක් ලෙස ඉදිරියට යාමට ඇති හැකියාව පිළිබඳව සැලකිය යුතු සැකයක් ඇති

කළ හැකි සිදුවීම් හෝ කොන්දේසිවලට අදාළ කිසිදු ප්‍රමාණාත්මක සැකයක් පිළිබඳව කළමනාකාරිත්වය නොදනී. එබැවින්, මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩව ඉදිරියට ගෙන යාමේ පදනම මත සකස් කරනු ලැබේ.

2022 දෙසැම්බර් 31 න් අවසන් වන වසර තුළ වත්කම් සහ බැරකම් ප්‍රමාණාත්මක ද්‍රව්‍යමය ගැලපීමකට සැලකිය යුතු අවදානමක් ඇති උපකල්පන සහ ඇස්තමේන්තු අවිනිශ්චිතතා පිළිබඳ තොරතුරු පහත සටහන්වල ඇතුළත් වේ:

- දේපල, පිරියත සහ උපකරණ නැවත තක්සේරු කිරීම (සටහන් 3.1)
- ආදායම් බදු (වත්මන් බද්ද සහ විලම්බිත බද්ද) (සටහන් 3.6)
- මූල්‍ය වත්කම් වල හානිය : අයකරගත හැකි මුදලට යටින් පවතින ප්‍රධාන උපකල්පනය (සටහන් 3.7.5)
- හඳුනාගැනීම් සහ වෙන්කිරීම් මැනීම සහ අසමීභාව්‍යය: සම්පත් පිටතට ගලා යාමේ සම්භාවිතාව සහ විශාලත්වය පිළිබඳ ප්‍රධාන උපකල්පනය (සටහන් 3.10.1.2)
- නිශ්චිත ප්‍රතිලාභ අයිතීන් මැනීම: ප්‍රධාන ක්‍රියාකාරී උපකල්පන (සටහන් 3.11)

## 2.5 සංසන්දනාත්මක තොරතුරු

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRS/LKAS) අනුකූලව මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වල සඳහන් කර ඇති සංසන්දනාත්මක තොරතුරු නැවත සකස්කර දක්වා ඇත. වෙනත් ආකාරයකින් ප්‍රකාශ කර නොමැති නම්, LKAS 01 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම අනුව ගිණුම්කරණ ප්‍රතිපත්ති (SLBFE) විසින් පසුගිය මූල්ය වර්ෂයේ ප්‍රතිපත්ති සමඟ අඛණ්ඩව යෙදී ඇත. තවද, සංසන්දනාත්මක තොරතුරු වත්මන් ඉදිරිපත් කිරීම සමග අනුකූල වීම සඳහා අවශ්‍යය ඕනෑම තැනක නැවත වර්ගීකරණය කර ඇත.

## 3. සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් සිය මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අදාළ කර ඇති සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දැක්වේ. පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනත් ආකාරයකින් දක්වා නොමැති නම් මිස මෙම මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති සියලුම කාල පරිච්ඡේද සඳහා අඛණ්ඩව යෙදී ඇත.

### ජංගම හා ජංගම නොවන වර්ගීකරණය

සමූහය වත්මන්/වර්තමාන නොවන වර්ගීකරණය මත පදනම්ව මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වත්කම් සහ වගකීම් ඉදිරිපත් කරන්නේ ජංගම හා ජංගම නොවන වර්ගීකරණය පදනම්ව වේ.

වත්කමක් ජංගම වත්කමක් වනවිට එය:

- සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ සාක්ෂාත් කර ගැනීමට හෝ විකිණීමට හෝ පරිභෝජනය කිරීමට අපේක්ෂා කෙරේ.
- මූලික වශයෙන් වෙළඳාම් කිරීමේ අරමුණින් පවත්වනු ලැබේ.
- වාර්තාකරණ කාලයෙන් පසු මාස දොළහක් ඇතුළත සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කෙරේ; හෝ
- මුදල් හෝ මුදල් සමාන දේ වාර්තාකිරීමේ කාලසීමාවෙන් පසු අවම වශයෙන් මාස දොළහක් සඳහා වගකීමක් හුවමාරු කර හෝ වගකීමකින් නිදහස් වීමකට භාවිතා කිරීමට සීමාකර නොමැති විටෙක,

අනෙකුත් සියලුම වත්කම් ජංගම නොවන වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්
2022 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය

වගකීමක් ජංගම වගකීමක් වන්නේ නම් එය,

- එය සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ නිරාකරණය කිරීමට අපේක්ෂා කෙරේ.
- එය මූලික වශයෙන් වෙළඳාම් කිරීමේ අරමුණින් පවත්වනු ලැබේ.
- වාර්තාකරණ කාලයෙන් පසු මාස දොළහක් ඇතුළත එය පියවීමට නියමිතය; හෝ

වාර්තාකරණ කාලයෙන් පසු අවම වශයෙන් මාස දොළහක් සඳහා වගකීම් පියවීම කල් දැමීමට කොන්දේසි විරහිත අයිතියක් නොමැත.

කල් දැමූ බදු වගකීම් ඇතුළු අනෙකුත් සියලුම වගකීම් සමූහය ජංගම නොවන ලෙස වර්ගීකරණය කරයි

වත්කම් සහ ලැබිය යුතු දේ

**3.1** *දේපල පිරියත සහ උපකරණ*

දේපල (ඉඩම් සහ ගොඩනැගිලි) මුලදී පිරිවැයට පිළිගනු ලබන අතර පසුව සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානි අලාභ තිබේ නම් නැවත තක්සේරු කල ශේෂවල සඳහන් වේ. වටිනාකම්වල නොවැදගත් වලනයන් තිබේ නම් පමණක්, දේපල නැවත තක්සේරු කිරීම සෑම වසර 5 කට වරක් සිදු කරනු ලැබේ. දේපල වටිනාකම්වල සැලකිය යුතු වලනයන් තිබේ නම් නැවත ඇගයීම වාර්ෂිකව සිදු කරනු ලැබේ.

පිරියත සහ උපකරණ මුලදී පිරිවැය ලෙස හඳුනාගෙන පසුව සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානි පාඩු ඇත්නම් ඒවා ශුද්ධ වර්තමාන පිරිවැය ලෙස ප්‍රකාශ කරනු ලැබේ. ඒවා එදිනෙදා කලයුතු අලුත්වැඩියා සහ නඩත්තු වියදම් දැරූ ලෙස ආදායම් ප්‍රකාශයේ හඳුනාගෙන ඇත.

දේපල පිරියත සහ උපකරණවල අයිතමයක් සහ මුලින් හඳුනාගත් කිසියම් සැලකිය යුතු කොටසක් බැහැර කිරීමේදී හෝ එය භාවිතයෙන් හෝ බැහැර කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විට හඳුනා නොගනී. වත්කම හඳුනා නොගැනීමෙන් ඇතිවන ඕනෑම ලාභයක් හෝ අලාභයක් වේනම් (ශුද්ධ බැහැර කිරීමේ ආදායම සහ වත්කම් තබාගැනීමේ වියදම් අතර වෙනස ),ලෙස ගණනය කෙරේ. එකී වත්කම බැහැර කිරීම පිළිබඳව ආදායම් ප්‍රකාශයේ ඇතුළත් වේ.

**3.1.1** ***ක්ෂය වීම***

සින්නක්කර ඉඩම් හැර අනෙකුත් සියලුම දේපල පිරියත සහ උපකරණවල ඇස්තමේන්තුගත ඵලදායි ආයු කාලය මත සරල මාර්ග පදනම මත ක්ෂයවීම් ගණනය කෙරේ.

ඵලදායි ආයු කාලය සහ වත්කම්වල පවතින වටිනාකම එක් එක් මූල්‍ය වර්ෂය අවසානයේ තක්සේරු කෙරේ.
ශ්‍රී.ල.වි.සේ.නි.කා වත්මන් සහ ඒ ඒ සංසන්දනාත්මක වසර සඳහා ඇස්තමේන්තුගත ඵලදායි ආයු කාලය පහත පරිදි වේ;

| | |
|---|---|
| ගොඩනැගිලි සහ කොටස් කිරීම | අවුරුදු 13 1/3 |
| මෝටර් වාහන | අවුරුදු 5 |
| වෙනත් කාර්යාල උපකරණ | අවුරුදු 5 |
| පරිගණක | අවුරුදු 4 |
| විදුලි භාණ්ඩ සහ උපාංග | අවුරුදු 5 |
| විවිධ උපකරණ | අවුරුදු 2 |
| පුස්තකාල පොත් | අවුරුදු 2 |
| ගෘහ භාණ්ඩ සහ උපාංග - ලී | අවුරුදු 13 1/3 |
| සවිකිරීම් - වානේ | අවුරුදු 13 1/3 |
| පුහුණු උපකරණ | අවුරුදු 5 |
| බදු වත්කම් | බදු කාලය ඉක්මවා |

**3.1.2** ප්‍රත්‍යාගණනය

ආදායම් ප්‍රකාශයේ කලින් හඳුනාගෙන ඇති වත්කම්වල ප්‍රත්‍යාගණන අගය අඩුවීමක් ප්‍රතිවර්තනය කරන ප්‍රමාණයට හැර, ඕනෑම ප්‍රත්‍යාගණනය අතිරික්තයක් වෙනත් විස්තීරණ ආදායමක් තුළ හඳුනාගෙන වත්කම් ප්‍රත්‍යාගණනය සංචිතයේ කොටස් වශයෙන් රැස් කර ඇත. වත්කම් ප්‍රත්‍යාගණනය සංචිතයේ පිළිගත් එම වත්කමේ පවතින අතිරික්තයක් පියවන ප්‍රමාණයට හැර, ආදායම් ප්‍රකාශයේ ප්‍රත්‍යාගණනය හිහයක් හඳුනාගෙන ඇත. වත්කමේ දළ රැගෙන යා හැකි ප්‍රමාණයට එරෙහිව ප්‍රත්‍යාගණනය දිනයේදී සමුච්චිත ක්ෂයවීම් ඉවත් කරනු ලබන අතර ශුද්ධ මුදල වත්කම් ප්‍රත්‍යාගණනය කළ ප්‍රමාණයට නැවත ලබා දෙනු ලැබේ. බැහැර කිරීමෙන් පසු, විකුණනු ලබන නිශ්චිත වත්කමට අදාළ ඕනෑම ප්‍රත්‍යාගණන සංචිතයක් රඳවා ගත් ඉපැයීම් වෙත මාරු කරනු ලැබේ. ඉඩම් සහ ගොඩනැගිලි පසුව නැවත තක්සේරු කරන විට, නැවත තක්සේරු කරන දිනයේ දී මුළු වත්කම් පන්තියම සාධාරණ අගයට නැවත තක්සේරු කරනු ලැබේ.

### 3.1.3 සම්පූර්ණයෙන්ම ක්ෂය වූ වත්කම්වල පිරිවැය

පහත සඳහන් දේපල, පිරියත සහ උපකරණ සම්පූර්ණයෙන්ම ක්ෂය වී ඇති අතර සමූහය විසින් අඛණ්ඩව භාවිතයේ පවතී.

| අවසන් වූ වසර සඳහා | 31 දෙසැ2022<br>රු.මිලියන | 31 දෙසැ 2021<br>රු.මිලියන |
|---|---|---|
| සම්පූර්ණයෙන්ම ක්ෂය වූ වත්කම්වල පිරිවැය | 1,262.16 | 1,219.74 |

**3.1.4** ශ්‍රී.ල.වි.සේ.නි.කා **සහ සමූහය බදුකරු වන බදු සඳහා ගිණුම්කරණය**

බදු භාවිතයේ අයිතිය ('ROU') වත්කම් ලෙස පිළිගනු ලබන අතර, බදු වත්කම් ශ්‍රී.ල.වි.සේ.නි.කා සහ සමූහය (එනම් ආරම්භක දිනය) භාවිතය සඳහා ලබා ගත හැකි දිනයේ දී අනුරූප වගකීමක් ලෙස පිළිගනු ලැබේ.

(අ) ROU වත්කම්

ROU වත්කම් මූලිකව මනිනු ලබන්නේ පහත සඳහන් දෑ වලින් සමන්විත පිරිවැයෙනි:

- කල්බදු වගකීමේ මූලික මිනුම් ප්‍රමාණය
- බදු ආරම්භක දිනට හෝ ඊට පෙර සිදු කරන ලද ඕනෑම බදු ගෙවීමක් සඳහා ලැබුණු බදු දිරිගැන්වීම් අඩුය;
- ඕනෑම මූලික සෘජු පිරිවැයක්

ROU වත්කම් පසුව මනිනු ලබන්නේ සමුච්චිත ක්ෂයවීම් සහ හානි නිසා වන පාඩු (ඇත්නම්). අඩුකර ලැබෙන පිරිවැයටයි. ROU වත්කම් සාමාන්‍යයෙන් ක්ෂය වී ඇත්තේ වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය සහ සරල මාර්ග පදනමක් මත බදු කාල සීමාව තුළ ය.

(ආ) බදු වගකීම්

බදු වගකීම් මුලින් මනිනු ලබන්නේ එම දිනයේ නොගෙවන කල්බදු ගෙවීම්වල වර්තමාන වටිනාකම් අනුව ය. බදු ගෙවීම්වලට පහත සඳහන් දෑ ඇතුළත් වේ:

ස්ථාවර ගෙවීම් (ප්‍රමාණාත්මක ස්ථාවර ගෙවීම් ඇතුළුව), ලැබිය යුතු වෙනත් දිරි දීමනා අඩුකල වටිනාකම්

කල්බදු ගෙවීම් සඳහා වට්ටම් කරනු ලබන්නේ කල්බදු තුළ අන්තර්ගත පොලී අනුපාත භාවිතා කරමිනි. සාමාන්‍යයෙන් ශ්‍රී.ල.වි.සේ.නි.කා සහ සමූහයේ කල්බදු සඳහා අදාළ වන එම අනුපාතය පහසුවෙන් තීරණය කළ නොහැකි නම්, බදුකරුගේ වර්ධක ණය ගැනීම් භාවිතා කරනු ලැබේ.

- සමාන කාලසීමාවක්, ආරක්ෂාවක් සහ කොන්දේසි සහිත සමාන ආර්ථික පරිසරයක් තුළ ROU වෙත සමාන වටිනාකමක් ඇති වත්කමක් ලබා ගැනීමට අවශ්‍ය අරමුදල් ණයට ගැනීම සඳහා තනි බදුකරුට ගෙවිය යුතු අනුපාතය මෙයයි. මූලික හා මූල්‍ය පිරිවැය අතර ලීසිං ගෙවීම් වෙන් කරනු ලැබේ. එක් එක් කාල සීමාව සඳහා ඉතිරිව ඇති වගකීම් ශේෂය මත ස්ථාවර කාලීන පොලී අනුපාතයක් ඇතිකිරීම සඳහා කල්බදු කාල සීමාව තුළ ලාභය හෝ අලාභය සඳහා මූල්‍ය පිරිවැය අය කෙරේ. ශ්‍රී.ල.වි.සේ.නි.කා සහ සමූහය මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ වෙනම රේඛීය අයිතමයක් ලෙස කල්බදු වගකීම් ඉදිරිපත් කරයි. කල්බදු වගකීමේ පොලී වියදම විස්තීරණ ආදායමේ මූල්‍ය පිරිවැය තුළ ඉදිරිපත් කෙරේ.

**(ඇ) කෙටි කාලීන බදු**

කෙටි කාලීන කල්බදු යනු මාස 12ක හෝ ඊට අඩු බදු කාල සීමාවක් සහිත කල්බදු සහ විස්තීරණ ආදායමේ වියදමක් ලෙස සරල රේඛීය පදනමක් මත පිළිගැනේ.

**3.3** අස්පෘශ්‍ය වත්කම්

**3.3.1** *හඳුනාගැනීමේ පදනම*

වත්කමකින් ආයතනයට අනාගත ආර්ථික ප්‍රතිලාභ අත්වේ යැයි අපේක්ෂකල හැකිවන්නේ නම් හා වත්කම්වල පිරිවැය විශ්වාසනීය ලෙස ගණනය කල හැකි වන්නේ නම් එය අස්පෘෂ්‍ය වත්කමක් ලෙස හඳුනාගැනේ.

**3.3.2** *මිනුම් පදනම*

වෙන් වෙන් වශයෙන් අත්පත් කරගත් අස්පෘශ්‍ය වත්කම් මිනිනු ලබන්නේ පිරිවැයේ මූලික හඳුනාගැනීම් මත ය. මූලික හඳුනාගැනීමෙන් පසුව, අස්පෘශ්‍ය වත්කම්, සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත අලාභ හානි පාඩු පවතීනම් එහි පිරිවැය මිලට වඩා අඩුවනු ඇත.

**3.3.3** *ඵලදායි ආර්ථික ආයුකාලය සහ ක්‍රමක්ෂය*

ක්‍රමක්ෂ කිරීම, ඒවා භාවිතයට ඇති දින සිට, කීර්තිනාමය සහ වෙළඳ නාමය හැර, අස්පෘශ්‍ය වත්කම්වල ඇස්තමේන්තුගත සළුල ආයු කාලය මත සරල රේඛීය පදනමක් මත ලාභ හා අලාභ ක්‍රමය ලෙස හඳුනා ගනී.
වත්මන් සහ සංසන්දනාත්මක කාල පරිච්ඡේද සඳහා ඇස්තමේන්තුගත සළුල ආයු කාලය පහත පරිදි වේ:

*නොරතුරු පද්ධතිය සහ වැඩසටහන්  වසර 5*

**3.3.4** *අස්පෘශ්‍ය වත්කම් හඳුනා නොගැනීම*

අස්පෘශ්‍ය වත්කම් බැහැර කිරීමේදී හෝ එය භාවිතයෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ අත්නොවේයැයි අපේක්ෂා කරන විට අස්පෘශය වත්කම් ඉවත්කිරීම සිදුවේ/ හඳුනා නොගනී. අස්පෘශ්‍ය වත්කමක් හඳුනා නොගැනීමෙන් ඇතිවන ලාභ හෝ අලාභ මනිනු ලබන්නේ ශුද්ධ බැහැර කිරීමේ ආදායම සහ වත්කම් රැගෙන යන ප්‍රමාණය අතර වෙනස ලෙස වන අතර වත්කම හඳුනා නොගත් විට ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගැනේ.

### 3.3.5 *පසුකාලීන වියදම්*

පසුකාලීන වියදම් ප්‍රාග්ධනීකරණය වන්නේ එය අදාළ නිශ්චිත වත්කම් තුළ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ වැඩි කරන විට පමණි. අභ්‍යන්තරව ජනනය කරන ලද කීර්තිනාමය සහ වෙළඳ නාම සඳහා වන වියදම් ඇතුළුව අනෙකුත් සියලුම වියදම්, ලාභ සහ අලාභ ලෙස හඳුනා ගැනේ.

### 3.4 මූල්‍ය නොවන වත්කම් හානිකරණය වීම

වත්කමක් දුර්වල විය හැකි බවට ඇඟවීමක් තිබේද යන්න ශ්‍රී.ල.වි.සේ.නි.කා විසින් වාර්තා කරන සෑම දිනකම තක්සේරු කරයි. කිසියම් ලක්ෂණයක් තිබේ නම්, හෝ වත්කමක් සඳහා වාර්ෂික හානිකරන පරීක්ෂණයක් අවශ්‍ය වූ විට, ශ්‍රී.ල.වි.සේ.නි.කා වත්කම් ආපසු ලබාගත හැකි මුදල ඇස්තමේන්තු කරයි. වත්කමක අයකරගත හැකි මුදල වත්කමක සාධාරණ වටිනාකමට වඩා වැඩි අගයක් වන අතර එය විකිණීමට අඩු වියදම් සහ භාවිතයේ ඇති වටිනාකම සහ තනි වත්කමක් සඳහා තීරණය කරනු ලැබේ, එම වත්කම වෙනත් වත්කම්වලින් හෝ වත්කම් කාණ්ඩවලින් බොහෝ දුරට ස්වාධීන වන මුදල් ගලා ඒම උත්පාදනය නොකරන්නේ යැයි තීරණය කර ඇත. වත්කමක රැගෙන යා හැකි ප්‍රමාණය එහි අයකරගත හැකි ප්‍රමාණය ඉක්මවන විට, එම වත්කම ආබාධිත ලෙස සලකනු ලබන අතර එහි අයකරගත හැකි මුදලට ලියා ඇත. භාවිතයේ ඇති වටිනාකම තක්සේරු කිරීමේදී, ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් ඒවායේ වර්තමාන වටිනාකමට වට්ටම් කරනු ලබන්නේ, මුදල්වල කාල වටිනාකම සහ වත්කමට විශේෂිත වූ අවදානම් පිළිබඳ වත්මන් වෙළඳපල තක්සේරු කිරීම් පිළිබිඹු කරන පූර්ව බදු වට්ටම් අනුපාතයක් භාවිතා කරමිනි. සාධාරණ වටිනාකමක් තීරණය කිරීමේදී විකිණීම සඳහා පිරිවැයක් තීරණය කිරීමේදී මෑත වෙළඳපල ගනුදෙනු සැලකිල්ලට ගනී. එවැනි ගනුදෙනු හඳුනා ගත නොහැකි නම්, සුදුසු තක්සේරු ආකෘතියක් භාවිතා කරනු ලැබේ.

### 3.5 විදේශ විනිමය

**අ) ක්‍රියාකාරී සහ වටිනාකම් ඉදිරිපත් කිරීමේ විනිමය**

ශ්‍රී.ල.වි.සේ.නි.කා හි මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් අයිතම මනිනු ලබන්නේ ආයතනය ක්‍රියාත්මක වන ප්‍රාථමික ආර්ථික පරිසරයේ මුදල් (ක්‍රියාකාරී මුදල්) භාවිතා කරමිනි. මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරනු ලබන්නේ ශ්‍රී ලංකා රුපියල් වලින් වන අතර එය ශ්‍රී.ල.වි.සේ.නි.කා හි ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් වේ.

**ආ) විදේශ විනිමය ගනුදෙනු කටයුතු**

විදේශ මුදල් වල ගණුදෙණු ශ්‍රී.ල.වි.සේ.නි.කා හි අදාල ක්‍රියාකාරී මුදල් වලට පරිවර්ථනය කරනු ලබන්නේ ගණුදෙණුවේ දිනයන්හිදී අදාල විනිමය අනුපාත යටතේය. වාර්තා කරන දිනයේදී විදේශ මුදල් වලින් නම් කරන ලද මුදල් වත්කම් සහ වගකීම් වාර්තා කරන දිනයේ විනිමය තීරණය කිරීමේ ක්‍රියාකාරී මුදල් අනුපාතයට නැවත පරිවර්තනය කල යුතුය.. නැවත පරිවර්තනය කිරීමෙදී පැන නගින විදේශ මුදල් වෙනස්කම් ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනේ. මුදල් අයිතමයන් පියවීම හෝ පරිවර්තනය මත පැන නගින සියලුම වෙනස්කම් ආදායම් ප්‍රකාශනයට ගනු ලැබේ. විදේශීය මුදල් ඒකකයක ඓතිහාසික පිරිවැය අනුව සිදු කරනු ලබන මූල්‍ය නොවන වත්කම් සහ වගකීම් මූලික ගනුදෙනුවේ දිනයේ පැවති විනිමය අනුපාතයට පරිවර්තනය කරනු ලැබේ. විදේශ මුදලකින් සාධාරණ වටිනාකමකින් මනිනු ලබන මුදල් නොවන අයිතම සාධාරණ වටිනාකම තීරණය කරන දිනයේ විනිමය අනුපාත භාවිතයෙන් පරිවර්තනය කරනු ලැබේ.

මූල්‍යය නොවන අයිතම නැවත පරිවර්තනය කිරීමේදී ඇති වන ලාභය හෝ අලාභය අයිතමයේ සාධාරණ වටිනාකමේ වෙනසක් මත ලාභය හෝ අලාභය හඳුනා ගැනීම සමඟ අනුකූලව සලකනු ලැබේ (එනම්, වෙනත් විස්තීර්ණ ආදායම්වල

සාධාරණ වටිනාකමක් ඇති ලාභ හෝ අලාභ හඳුනාගෙන ඇති අයිතමවල පරිවර්තන වෙනස්කම් හෝ ආදායම් ප්‍රකාශය පිළිවෙළින් වෙනත් විස්තීරණ ආදායම් හෝ ආදායම් ප්‍රකාශයේ ද පිළිගෙන ඇත).

**3.6** *බදු අය කිරීම*

**3.6.1** *ප්‍රවර්තන බදුකරණය*

ප්‍රවර්තන බදු යනු වාර්තා කරන දිනයේ දී පනවන ලද බදු අනුපාත සහ පෙර වර්ෂවලට අදාළව ගෙවිය යුතු බදු සඳහා යම් ගැලපීම් භාවිතා කරමින් වර්ෂය සඳහා බදු අය කළ හැකි ආදායම මත ගෙවිය යුතු අපේක්ෂිත බද්දයි.

අනෙකුත් විස්තීරණ ආදායම්වල සෘජුවම හඳුනාගෙන ඇති අයිතමවලට අදාළ ප්‍රවර්තන බදු ආදායම් ප්‍රකාශයේ නොව වෙනත් විස්තීර්ණ ආදායම්වල හඳුනාගෙන ඇත. කළමනාකාරිත්වය විසින් අදාළ බදු රෙගුලාසි අර්ථ නිරූපණයට යටත් වන අවස්ථා සම්බන්ධයෙන් බදු වාර්තාවල ගනු ලබන තනතුරු වරින් වර ඇගයීමට ලක් කරන අතර සුදුසු අවස්ථාවලදී ප්‍රතිපාදන ස්ථාපිත කරයි.

**3.6.2** විලම්බිත බදු

වත්කම් සහ බැරකම්වල බදු පදනම් සහ මූල්‍ය වාර්තාකරණ අරමුණු සඳහා ඒවා ධාරණ වටිනාකම් අතර වාර්තා කරන දිනයේ තාවකාලික වෙනස්කම් මත වගකීම් ක්‍රමය භාවිතා කරමින් විලම්බිත බදු සපයනු ලැබේ. විලම්බිත බදු වගකීම් සියලු බදු අය කළ හැකි තාවකාලික වෙනස්කම් සඳහා හඳුනාගෙන ඇත .

විලම්බිත බදු වත්කම් සියලු අඩු කළ හැකි තාවකාලික වෙනස්කම්, භාවිත නොකළ බදු බැර ඉදිරියට ගෙන යාම සහ භාවිත නොකළ බදු අලාභ සඳහා විලම්බිත බදු වත්කම් හඳුනාගැන ඇත. අඩු කළ හැකි තාවකාලික වෙනස්කම් සහ භාවිතයට නොගත් බදු බැර සහ භාවිතයට නොගත් බදු අලාභයක් ඉදිරියට ගෙනයාමට යොදා ගත හැකි බදු අය කළ හැකි ලාභයක් ලබා ගැනීමට ඉඩ ඇති ප්‍රමාණයට කල් දැමූ බදු වත්කම් හඳුනාගෙන ඇත.
විලම්බිත බදු වත්කම් ධාරණ වටිනාකම් එක් එක් වාර්තා කරන දිනයකදීම සමාලෝචනය කෙරෙන අතර විලම්බිත බදු වත්කම් සියල්ල හෝ කොටසක් භාවිත කිරීමට ඉඩ දීම සඳහා ප්‍රමාණවත් බදු අය කළ හැකි ලාභයක් තවදුරටත් පවතින ඇතැයි සීතිය නොහැකිය. හඳුනා නොගත් විලම්බිත බදු වත්කම් සෑම වාර්තාකරණ දිනයකදීම නැවත තක්සේරු කරනු ලබන අතර අනාගත බදු අය කළ හැකි ලාභය කල් දැමූ බදු වත්කම් ආපසු අයකර ගැනීමට ඉඩ සලසා දීමේ සම්භාවිතාව දක්වා හඳුනා ගැනේ.

විලම්බිත බදු වත්කම් සහ වගකීම් මනිනු ලබන්නේ වත්කම් සාක්ෂාත් කර ගත් හෝ වගකීම් පියවන වර්ෂයේ අදාළ වීමට අපේක්ෂා කරන බදු අනුපාත මතය. වාර්තා කරන දිනයේ දී පනවා ඇති හෝ සැලකිය යුතු ලෙස පනවන ලද බදු අනුපාත මතය.

**3.7** මූල්‍ය වත්කම්

**3.7.1** ඉදිරිපත් කිරීම සහ හෙළිදරව් කිරීම

**SLFRS 9, 'මූල්‍ය උපකරණ'** ට අනුකූලව මූල්‍ය වත්කම් ඉදිරිපත් කර අනාවරණය කර ඇත.

මූල්‍ය වත්කම් මූල්‍ය ප්‍රකාශනවල සටහන් යටතේ අංක **13** සටහනේ අනාවරණය කර ඇත.

3.7.2 මූලික හඳුනාගැනීම සහ මැනීම

මූල්‍ය වත්කම්, ලාභ හෝ අලාභ, ණය සහ ලැබිය යුතු, පරිනත ආයෝජන සහ විකිණීමට ඇති මූල්‍ය වත්කම් අනුව සාධාරණ වටිනාකමින් යුත් මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කර ඇති අතර මුල් හඳුනාගැනීමේදී එහි මූල්‍ය වත්කම් වර්ගීකරණය තීරණය කරයි.

ලාභය හෝ අලාභය මගින් සාධාරණ වටිනාකමක් නොලබන ආයෝජන සම්බන්ධයෙන් සියලු මූල්‍ය වත්කම් මුලින් සාධාරණ වටිනාකමට සහ වත්කම්වල ගනුදෙනු පිරිවැයට හඳුනා ගැනේ.

3.7.3 පසුකාලීන මිනුම්

මූල්‍ය වත්කම් පසුකාලීනව මැනීම පහත පරිදි වර්ගීකරණය මත රඳා පවතී,

3.7.3.1 ණය සහ ලැබිය යුතු දේ

ණය සහ ලැබිය යුතු මුදල් යනු සක්‍රීය වෙළඳපොලක සඳහන් කර නොමැති ස්ථාවර හෝ තීරණය කළ හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. මූලික මිණුම්වලින් පසුව, එවැනි මූල්‍ය වත්කම් පසුව හාණිකරන වටිනාකම්, සඵල පොලී අනුපාත ක්‍රමය (EIR) භාවිතා කරමින් ක්‍රමක්ෂ වියදම් යටතේ මනිනු ලැබේ. සඵල පොලී අනුපාත ක්‍රමයෙහි අනිවාර්ය අංගයක් වන අත්පත් කර ගැනීම් සහ ගාස්තු හෝ පිරිවැය පිළිබඳ යම් වට්ටමක් හෝ වාරිකයක් සැලකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය කළ පිරිවැය ගණනය කෙරේ. සඵල පොලී අනුපාත ක්‍රමක්ෂය කිරීම ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායමට ඇතුළත් වේ. හාණිකරනය හේතුවෙන් ඇතිවන පාඩු ආදායම් ප්‍රකාශයේ මූල්‍යය පිරිවැය ලෙස හඳුනාගෙන ඇත.

3.7.3.2 කල් පිරෙන තුරු රඳවාගන්නා ආයෝජන

ස්ථාවර හෝ තීරණය කළ හැකි ගෙවීම් සහ ස්ථාවර කල්පිරීමක් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් කල්පිරීම දක්වා රඳවා ගැනීමේ ධනාත්මක චේතනාවක් සහ හැකියාවක් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට ඇති විට කල්පිරීම ලෙස වර්ගීකරණය කෙරේ. මූලික මිණුම් වලින් පසු, කල්පිරීමේ කාලය දක්වා වූ ආයෝජන සඵල පොලී අනුපාත ක්‍රමය භාවිතා කරමින් හාණිකරනය අඩුකිරීමෙන් ක්‍රමක්ෂ වියදම් මත මනිනු ලැබේ. EIR හි අනිවාර්ය අංගයක් වන අත්පත් කර ගැනීම් සහ ගාස්තු හෝ පිරිවැය පිළිබඳ යම් වට්ටමක් හෝ වාරිකයක් සැලකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය කළ පිරිවැය ගණනය කෙරේ. EIR ක්‍රමක්ෂය කිරීම ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායමට ඇතුළත් වේ. ආබාධ හේතුවෙන් ඇතිවන පාඩු ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැය ලෙස හඳුනාගෙන ඇත.

3.7.4 *හඳුනා නොගැනීම*

මූල්‍ය වත්කමක් (හෝ, අදාළ වන විට මූල්‍ය වත්කමක කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් සමූහයක කොටසක්) හඳුනා නොගන්නා විට,

i) වත්කමෙන් මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතිය කල් ඉකුත් ව ඇති අවස්ථාවල,

ii) ශ්‍රී.ල.වි.සේ.නි.කා මඟින් වත්කමෙන් මුදල් ප්‍රවාහ ලබා ගැනීමේ අයිතිය පවරා ඇති අවස්ථාවල හෝ, ලැබුණු මුදල් ප්‍රවාහයන් සැලකිය යුතු ප්‍රමාදයකින් තොරව සම්පූර්ණයෙන් ගෙවීමට වගකීමක් තුන්වන පාර්ශ්වයකට ඉන් ඉදිරියට යාමේ විධිවිධානයක් යටතේ පවරා ඇතිවීම.

- ශ්‍රී.ල.වි.සේ.නි.කා විසින් වත්කම්වල සියලුම අවදානම් සහ පිරිනැමීම් සැලකිය යුතු ලෙස මාරු කර ඇති, හෝ
- ශ්‍රී.ල.වි.සේ.නි.කා වත්කමේ සියලුම අවදානම් සහ පිරිනැමීම් සැලකිය යුතු ලෙස මාරු කර හෝ රඳවා තබා ගෙන නැති, නමුත් වත්කම් පාලනය පවරා ඇති.

**3.7.5** මූල්‍ය වත්කම්වලට හානිකරවීම

මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිවී ඇති බවට කිසියම් සාධකමය සාක්ෂි තිබේද යන්න ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් සෑම වාර්තාකරණ දිනයකදීම තක්සේරු කරයි. මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිකර වූවක් ලෙස සලකනු ලබන්නේ, වත්කම් මුලික වශයෙන් හඳුනා ගැනීමෙන් පසුව සිදු වූ සිදුවීම් එකක හෝ වැඩිගණනක සිදුවීම්වල ප්‍රතිඵලයක් ලෙස හානි වූ බවට සාධකමය සාක්ෂි ඇත්නම් සහ එම අලාභ සිදුවීමක් තිබේ නම් පමණි. මූල්‍ය වත්කම්වල හෝ විශ්වාසනීය ලෙස ඇස්තමේන්තු කළ හැකි මූල්‍ය වත්කම් සමූහයේ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් කෙරෙහි බලපෑමක් වේ.

ණයගැතියන් හෝ ණයගැතියන් පිරිසක් සැලකිය යුතු මූල්‍ය දුෂ්කරතා අත් විඳින බවට , පොලී හෝ මූලික ගෙවීම් පැහැර හැරීම් පැවතීම, ඔවුන් බංකොලොත්භාවයට හෝ මූල්‍ය ප්‍රතිසංවිධානයට ඇතුලත්වීමේ සවිභාවිතාව සහ නිරීක්ෂණය කල හැකි දත්ත මගින් මැනිය හැකි බවට සාක්ෂි ඇතුලත් විය හැකිය.හිඟ මුදල්වල වෙනස්වීම් හෝ පැහැර හැරීම් සමග සම්බන්ධවන ආර්ථිකතාවයන් වැනි ඇස්තමෙන්තුගත අනාගත මුදල් ප්‍රවාහවල අඩුවීමක් පැවතීම.

**3.7.5.1 ක්‍රමක්ෂය පිරිවැයට ගනු ලබන මූල්‍ය වත්කම්**

ක්‍රමක්ෂ වියදම් යටතේ ගෙන යන මූල්‍ය වත්කම් සඳහා, හානිකරණය වීම පිළිබඳ සාධකමය සාක්ෂි තනි තනිව පවතින්නේද යන්න ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් තක්සේරු කරයි.

එවැනි හානිකරන අලාභයක් සිදුවී ඇති බවට සාධකමය සාක්ෂි තිබේ නම්, වත්කම් ධාරණ වටිනාකම සහ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහවල වර්තමාන වටිනාකම අතර වෙනස ලෙස අලාභයේ ප්‍රමාණය මනිනු ලැබේ (තවමත් සිදුවී නොමැති අනාගත අපේක්ෂිත ණය පාඩු හැර) . ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහවල වර්තමාන වටිනාකම මූල්‍ය වත්කම්වල මූලික සඵලදායී පොලී අනුපාතයට වට්ටම් කරනු ලැබේ.

දීමනා ගිණුමක් භාවිතා කිරීම මගින් වත්කම් ධාරණ වටිනාකම අඩු වන අතර අලාභයේ ප්‍රමාණය ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනේ. අනාගත ප්‍රතිසාධනය පිළිබඳ යථාර්ථවාදී අපේක්ෂාවක් නොමැති විට අදාළ දීමනාව සමඟ ණය කපා හරිනු ලැබේ. පසු වසරක දී, හානිකරණය හඳුනා ගැනීමෙන් පසුව සිදු වූ සිදුවීමක් හේතුවෙන් ඇස්තමේන්තුගත හානිකරණ අලාභයේ ප්‍රමාණය වැඩි වීමක් හෝ අඩුවීමක් සිදු වුවහොත්, දීමනා ගිණුම සකස් කිරීමෙන් කලින් හඳුනාගත් හානිකරණ පාඩුව වැඩි කිරීම හෝ අඩු කිරීම සිදු කළයුතු අනාගත කපා හැරීමක් පසුව අයකරගනු ලැබුවහොත්, ආදායම් ප්‍රකාශයේ මූල්‍ය වියදම් ලෙස බැර කෙරේ.

**3.8** පරිභෝජන භාණ්ඩ

යල්පැන ගිය සහ සෙමින් චලනය වන අයිතම සඳහා දීමනාවක් ලබා දීමෙන් පසු පරිභෝජන ද්‍රව්‍ය මනිනු ලබන්නේ පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු වටිනාකමට වේ.

ශුද්ධ උපලබ්ධි වටිනාකම යනු සාමාන්‍ය ව්‍යාපාරයේ ඇස්තමේන්තුගත විකුණුම් මිල අඩු කිරීම, සම්පූර්ණ කිරීමේ ඇස්තමේන්තුගත පිරිවැය සහ විකිණීම සිදු කිරීමට අවශ්‍ය ඇස්තමේන්තුගත පිරිවැයයි.

**3.9** මුදල් සහ මුදල් සමානදේ,

මුදල් සහ මුදල් සමාන සමානදෑ සඳහා අතැති මුදල් සහ බැංකුවේ මුදල්, අත්පත් කරගත් දින සිට මාස තුනක් හෝ ඊට අඩු කාලයක් තුල කල්පිරීමක් සහිත අනෙකුත් කෙටි කාලීන අධික ද්‍රවශීලතාවයකින් යුතු කෙටිකාලීන ආයෝජන ඇතුළත් වේ.

## වගකීම් සහ ප්‍රතිපාදන

### 3.10 මූල්‍ය වගකීම්

මූල්‍ය වගකීම් මුලින් හඳුනාගනු ලබන්නේ ගනුදෙනු පිරිවැයේ සාධාරණ වටිනාකමකින් වන අතර පසුව සඵල පොලී අනුපාත ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය කළ පිරිවැය යටතේ සිදු කෙරේ. ඒවා ජංගම වගකීම්වලට ඇතුළත් කර ඇත, වාර්තා කිරීමේ දිනය අවසන් වීමෙන් පසු මාස 12 කට වඩා වැඩි කල්පිරීමක් හැර, ඒවා ජංගම නොවන වගකීම් ලෙස වර්ගීකරණය කර ඇත.

**හඳුනා නොගැනීම**

වගකීම යටතේ ඇති බැඳීම අවසන් වූ විට මූල්‍ය වගකීමක් හඳුනා නොගනී.

### 3.10.1 පසුකාලීන මිනුම්

මූල්‍ය වගකීම් මැනීම පහත පරිදි ඒවායේ වර්ගීකරණය මත රඳා පවතී;

### 3.10.1.1 වෙනත් මූල්‍ය වගකීම්

මූලික හඳුනාගැනීමෙන් පසුව, පොලී සහිත ණය සහ ණය ගැනීම් සඵල පොලී අනුපාත ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂණ පිරිවැය යටතේ මනිනු ලැබේ. වගකීම් හඳුනා නොගත් විට මෙන්ම සඵල පොලී අනුපාත ක්‍රමය (EIR) ක්‍රමක්ෂකරණ ක්‍රියාවලිය හරහා ආදායම් ප්‍රකාශයේ ලාභ සහ අලාභ ලෙස හඳුනා ගැනේ.
EIR හි අනිවාර්ය අංගයක් වන අත්පත් කර ගැනීම් සහ ගාස්තු හෝ පිරිවැය සඳහා යම් වට්ටමක් හෝ වාරිකයක් සැලකිල්ලට ගනිමින් ක්‍රමක්ෂය කළ පිරිවැය ගණනය කෙරේ. EIR ක්‍රමක්ෂය ආදායම් ප්‍රකාශයේ මූල්‍ය පිරිවැයට ඇතුළත් වේ.

### 3.10.1.2 ප්‍රතිපාදන, බැඳීම් සහ අසම්භාවය ගිණුම්කරණ ප්‍රතිපත්තිය

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස සමූහයට වර්තමාන වගකීමක් (නීතිමය හෝ නිර්මාණාත්මක) ඇති විට ප්‍රතිපාදන හඳුනාගනු ලැබේ, එම වගකීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ඇතුළත් සම්පත් පිටතට ගලා යාමක් අවශ්‍ය වනු ඇති අතර විශ්වාසදායක ඇස්තමේන්තුවක් කළ හැකිය. සමූහය විසින් යම් ප්‍රතිපාදනයක් හෝ සියල්ල ප්‍රතිපූරණය කරනු ඇතැයි අපේක්ෂා කරන විට ප්‍රතිපූරණය සත්‍ය වශයෙන්ම ස්ථිර වූ විට ප්‍රතිපූරණය වෙනම වත්කමක් ලෙස පිළිගැනේ. ප්‍රතිපාදනවලට අදාළ වියදම ඕනෑම ප්‍රතිපූරණයක ශුද්ධ ආදායම් ප්‍රකාශයේ ඉදිරිපත් කෙරේ.
මුදල්වල කාල වටිනාකමෙහි බලපෑම ප්‍රමාණාත්මක නම්, සුදුසු වීට වගකීමට විශේෂිත වූ අවදානම් පිළිබිඹු කරන වත්මන් බදු පෙර අනුපාතයක් භාවිත කරමින් ප්‍රතිපාදන වට්ටම් කරනු ලැබේ. වට්ටම් භාවිතා කරන විට, කාලයාගේ ඇවෑමෙන් ප්‍රතිපාදන වැඩි වීම මූල්‍ය පිරිවැයක් ලෙස පිළිගැනේ.
ප්‍රතිපාදන ගණනය කරනු ලබන්නේ ඓතිහාසික අත්දැකීම් සහ එක් එක් අවස්ථාවන්හි නිශ්චිත නියමයන් මතය. සමූහය ඇස්තමේන්තුවකට පැමිණෙන්නේ බොහෝ දුරට ඉඩ ඇති ප්‍රතිඵලය පිළිබඳ ඇගයීමක පදනම මතය. මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී දන්නා සියලුම ප්‍රතිපාදන ගිණුම්ගත කර ඇත.

අසම්භාවය වගකීම් යනු අවිනිශ්චිත අනාගත සිදුවීම් හෝ ආර්ථික ප්‍රතිලාභ මාරු කිරීමේ සම්භාවිතාව නොමැති හෝ පහසුවෙන් මැනිය නොහැකි වර්තමාන බැඳීම් මගින් පමණක් පැවැත්ම තහවුරු කළ හැකි බැඳීම් වේ. සම්පත් පිටතට ගලායාම දුරස්ථ නම් මිස සියලු අසම්භාවය වගකීම් මූල්‍ය ප්‍රකාශන සඳහා සටහනක් ලෙස හෙළිදරව් කෙරේ.

**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය**

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට එරෙහිව සේවකයින් සහ පිටස්තර පුද්ගලයින් විසින් ගොනු කරන ලද අධිකරණමය නඩු විභාග වෙමින් පවතින අතර, රුපියල් 42,160,740.00 ක අසම්භාව්‍ය වගකීමක් ඇත.

| නඩු අංක | ශ්‍රී.ල.වි.සේ.නි.කා වෙතින් වන්දි අපේක්ෂා කිරීම (ශ්‍රී.ල.රු) |
|---|---|
| SC/FR/39/17 | - |
| DC/1852/13 | 10,000,000/- |
| DC 3895 | 10,000,000/- |
| DC/1229/2017 | 3,000,000/- |
| LT 8/582/2011 | - |
| LT 6R/7015 | 2,216,760/- |
| SC/FR/66/19 | 10,000,000/- |
| SC/FR/72/19 | 5,000,000/- |
| A/46/2018 | 600,000/- |
| A/24/2018 | 671,990/- |
| A/55/2018 | 671,990/- |
| අභි/25/20 | - |
| අභි/27/20 | - |
| CA/PHC/APN/62/2001 | - |
| SC/SPL/LA/61/20 | - |
| DMR/2165/2011 | - |

**ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි (පුද්ගලික ) සමාගම**

ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි (පුද්ගලික ) සමාගමට එරෙහිව විභාග වෙමින් පවතින නඩු 3ක් පවතින අතර, වත්මන් තත්ත්වය හේතුවෙන් පහත සඳහන් නඩු සඳහා ප්‍රතිපාදන සපයා ඇත.

- ශ්‍රියානි මාදම්පගේ මිය - කළමණාකරන සහකාර - කම්කරු දෙපාර්තමේන්තුව CW/Com/02L/201805/328
- L.K නජිත් දර්ශන මයා (හිටපු කළමනාකරු-ව්‍යාපාර ප්‍රවර්ධන ) මහාධිකරණය - HCALT79/19
- M/S ඉන්සිලැබ් වෛද්‍ය මධ්‍යස්ථාන ගොඩනැගිල්ල - දිස්ත්‍රික් අධිකරණය CMB – DRE/45/2019

**3.10.1.3 බදු තක්සේරු කිරීම්**

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2012 සිට 2017 වසර සඳහා ආදායම් බදු පිළිබඳ වරිපනම් නිකුත් කර ඇත.

ශ්‍රී.ල.වි.සේ.නි.කා එම තක්සේරුවලට එරෙහිව අභියාචනා ඉදිරිපත් කර ඇත. අපගේ බදු උපදේශක Ms.Nexia Business Advisory Services (Pvt) Ltd විසින් ඉහත අභියාචනා අවසන් අදියරේ පවතින බැවින්, පහත දැක්වෙන පරිදි රුපියල් 91,164,396/= ක අවසාන බදු වගකීමක් ඇති බව තහවුරු කර ඇත.

| | මුදල (රු) |
|---|---|
| ආදායම් බදු 2012-2014 | වගකීමක් නැත |
| ආදායම් බදු 2015 | 3,383,653 |
| ආදායම් බදු 2016 | 29,007,314 |
| ආදායම් බදු 2017 | 58,773,428 |
| **සම්පූර්ණ බදු වගකීම්** | 91,164,396 |

2022 වසර මූල්‍ය වාර්තාවල අවශ්‍යය වෙන්කිරීම් සිදුකර ඇත

**3.11 විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම්**

**3.11.1 අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ සැලැස්ම – විශ්‍රාමික පාරිතෝෂිතය**

අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ සැලැස්ම සම්බන්ධයෙන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ හඳුනාගෙන ඇති වගකීම යනු වාර්තා කරන දිනයේ දී නිශ්චිත ප්‍රතිලාභ වගකීමේ වර්තමාන වටිනාකම වේ. LKAS 19 - "සේවක ප්‍රතිලාභ" මගින් නිර්දේශිත පරිදි ප්‍රක්ෂේපිත ඒකක ණය (PUC) ක්‍රමය භාවිතා කරමින් ස්වාධීන ගණක විශේෂඥයන් විසින් නිර්වචනය කරන ලද ප්‍රතිලාභ වගකීම වාර්ෂිකව ගණනය කරනු ලැබේ. ක්‍රියාකාරී ලාභ සහ අලාභ ඇතුළත් ප්‍රති-මිණුම්, ඒවා සිදු වන කාල සීමාව තුළ OCI හරහා රඳවා ගත් ඉපැයීම්වලට අනුරූප හර හෝ ණය සමඟ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය තුළ වහාම හඳුනාගෙන ඇත. සේවා පිරිවැය (වත්මන් සේවා පිරිවැය සහ ඕනෑම අතීත සේවා පිරිවැය) සහ ලාභය හෝ අලාභය පොලී වියදමට ආරෝපණය කළ හැකි අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ වගකීම්වල වෙනස්කම් සමූහය හඳුනා ගනී. නිර්වචනය කරන ලද ප්‍රතිලාභ වගකීම තීරණය කිරීමේදී භාවිතා කරන ප්‍රධාන උපකල්පන සටහන 3.11.4 හි දක්වා ඇත.

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් වගකීම් සඳහා ශ්‍රී.ල.වි.සේ.නි.කා මෙන්ම සමූහයේ අනුබද්ධිත ආයතනය විසින් බාහිරව අරමුදල් සපයා නොමැත.කෙසේ වෙතත් වගකීම් පියවීම සඳහා ආයෝජන වෙන් කරනු ලැබේ. 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතට අනුව සේවකයකුට පාරිතෝෂික ගෙවීමේ වගකීම පැන නගින්නේ වසර පහක අඛණ්ඩ සේවා කාලය සම්පූර්ණ කිරීමෙන් පසුවය.

**3.11.2** ශුද්ධ නිර්වචනය කරන ලද ප්‍රතිලාභ වගකීම් සඳහා ආරම්භක ශේෂයේ සිට අවසන් ශේෂයන් දක්වා සංසන්දය පහත වගුවේ දැක්වේ.

| දෙසැම්බර් 31 වන විට | සමූහය 2022 ශ්‍රී.ල.රු | සමූහය 2021 ශ්‍රී.ල.රු | ශ්‍රී.ල.වි.සේ.නි.කා 2022 ශ්‍රී.ල.රු | ශ්‍රී.ල.වි.සේ.නි.කා 2021 ශ්‍රී.ල.රු |
|---|---|---|---|---|
| වසර මුලදී ශේෂය | 234,358,404 | 230,132,652 | 230,309,332 | 226,794,082 |
| වත්මන් සේවා පිරිවැය | 14,363,603 | 13,236,778 | 14,064,305 | 12,937,480 |
| පසුගිය සේවා පිරිවැය | 28,411,030 | | 28,411,030 | |
| පොලී පිරිවැය | 26,752,664 | 18,410,613 | 26,485,573 | 18,143,527 |
| සත්‍ය (ලාභ)/අලාභ | (9,659,468) | (9,629,293) | (9,803,587) | (9,773,412) |
| | **294,226,233** | **252,150,750** | **289,466,653** | **248,101,677** |

**3.11.3 ලාභ හෝ අලාභ සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගෙන ඇති වියදම්**

| දෙසැම්බර් 31 වන විට | සමූහය 2022 ශ්‍රී.ල.රු | සමූහය 2021 ශ්‍රී.ල.රු | ශ්‍රී.ල.වි.සේ.නි.කා 2022 ශ්‍රී.ල.රු | ශ්‍රී.ල.වි.සේ.නි.කා 2021 ශ්‍රී.ල.රු |
|---|---|---|---|---|
| වත්මන් සේවා පිරිවැය | 14,363,603 | 13,236,778 | 14,064,305 | 12,937,480 |
| පොලී පිරිවැය | 26,752,659 | 18,410,613 | 26,485,573 | 18,143,527 |
| අතීත සේවා පිරිවැය | 28,411,030 | | 28,411,030 | |
| වෙනත් විස්තීර්ණ ආදායමක් තුළ හඳුනාගෙන ඇති සත්‍ය (ලාභ)/අලාභ | (9,659,468) | (9,629,293) | (9,803,587) | (9,773,412) |
| **ආදායම් ප්‍රකාශයේ හඳුනාගත් වියදම්** | **59,579,586** | **22,018,098** | **59,157,321** | **21,307,595** |

**3.11.4 ප්‍රධාන උපකල්පන සහ ප්‍රමාණාත්මක සංවේදීතා විශ්ලේෂණය**

නිර්වචනය කරන ලද ප්‍රතිලාභ සැලැස්මේ පිරිවැය ක්‍රියාකාරී තක්සේරු කිරීම් භාවිතයෙන් තීරණය කරනු ලබන අතර එයට විවිධ උපකල්පන සිදු කිරීම ඇතුළත් වේ. වට්ටම් අනුපාතය තීරණය කිරීම, අනාගත වැටුප් වැඩිවීම්, කාර්ය මණ්ඩල පිරිවැටුම සහ විශ්‍රාම යන වයස (සේවක මරණ අනුපාතය) මෙයට ඇතුළත් වේ. තක්සේරු කරණයේ ඇති සංකීර්ණතා සහ එහි දිගුකාලීන ස්වභාවය හේතුවෙන් මෙම උපකල්පනවල වෙනස්වීම්වලට නිශ්චිත ප්‍රතිලාභ වගකීමක් ඉතා සංවේදී වේ. සියලුම උපකල්පන සෑම වාර්තාකරණ දිනයකදීම සමාලෝචනය කෙරේ.

ප්‍රධාන උපකල්පන සහ ඒවායේ සංවේදීතා විශ්ලේෂණයන් තවදුරටත් පහත සාකච්ඡා කෙරේ.

**3.11.4.1 ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය**

මෙසස් ඇක්චූරියල් ඇන්ඩ් මැනෙජ්මන්ට් කන්සල්ටන්ට්ස් (පුද්ග ) සමාගම නම් වූ වෘත්තීය ආයුගණක සමාගම විසින් විශ්‍රාම ප්‍රතිලාභ වගකීමේ ස්වාධීන ආයුගණක තක්සේරුවක් 2022 දෙසැම්බර් 31 දිනට සිදු කරන ලදී.විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් අගයකිරීම සඳහා වෘත්තීය ආයුගණක සමාගම විසින් භාවිතාකරන තක්සේරු ක්‍රමය වන්නේ ප්‍රතික්ෂේපිත ඒකක ණය ක්‍රමය වේ. LKAS 19 මගින් නිර්දේශිත ක්‍රමය "සේවක ප්‍රතිලාභ" ක්‍රමය වේ.

සේවක ප්‍රතිලාභවල පිරිවැය තීරණය කිරීමේදී භාවිතා කරන ලද ප්‍රධාන උපකල්පන වූයේ:

| විස්තර | 2022 | 2021 |
|---|---|---|
| වට්ටම් අනුපාතය (%) | 18 p.a | 11.50 p. a |
| අපේක්ෂිත වාර්ෂික සාමාන්‍ය වැටුප් වර්ධක අනුපාතය (%) | 10 | 5 |
| කාර්ය මණ්ඩල පිරිවැටුම් සාධකය (%) | 1 | 1 |
| විශ්‍රාම යන වයස (වසර) | 60 | 62 |

### 3.11.4.2 සමූහය

**ශ්‍රී ලංකා විදේශ රැකියා නියෝජිතායතන පුද්ගලික සමාගම**

සේවක ප්‍රතිලාභ සඳහා වන ප්‍රතිපාදන පිළිබඳ ආයුගණක තක්සේරුවක් 2022 දෙසැම්බර් 31 දිනට සීමාසහිත ඇක්චූරියල් ඇන්ඩ් මැනැජ්මන්ට් කන්සල්ටන්ස් (පුද්ගලික )සමාගම නම් වූ වෘත්තිය ආයුගණක සමාගමක් තක්සේරු කිරීම සඳහා ආයුගණක විශේෂඥයන් විසින් භාවිතා කරනු ලබන තක්සේරු ක්‍රමය වන්නේ "ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය" වේ. LKAS 19 මගින් නිර්දේශිත ක්‍රමය - "සේවක ප්‍රතිලාභ" ක්‍රමයවේ.

සේවක ප්‍රතිලාභ වගකීම් තීරණය කිරීමේදී භාවිතා කරන ප්‍රධාන උපකල්පන වූයේ:

| විස්තර | 2022 | 2021 |
|---|---|---|
| වට්ටම් අනුපාතය (%) | 11.5 | 11.5 |
| කාර්ය මණ්ඩල පිරිවැටුම් සාධකය (%) | 8 | 8 |
| විශ්‍රාමික වයස (අවුරුදු) | 60 | 62 |

### 03.11.4.3 භාවිතා කරන උපකල්පනවල සංවේදීතාව

දෙසැම්බර් 31 වන විට සැලකිය යුතු උපකල්පන සඳහා ප්‍රමාණාත්මක සංවේදීතා විශ්ලේෂණයක් පහත පරිදි වේ:

**අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ වගකීම් මත බලපෑම.**

| විස්තර | ශ්‍රීලවිසේනිකා | |
|---|---|---|
| | 2022 (ශ්‍රී.ල.රු) | 2021 (ශ්‍රී.ල.රු) |
| වට්ටම් අනුපාතයේ සියයට එකකින් වැඩි කිරීම | 255,342,002 | 211,678,319 |
| වට්ටම් අනුපාතිකයේ සියයට එකකින් අඩු කිරීම | 288,111,579 | 251,551,486 |

ඉහත සංවේදීතා විශ්ලේෂණ තීරණය කර ඇත්තේ වාර්තාකරණ කාල සීමාව අවසානයේ සිදුවන ප්‍රධාන උපකල්පනවල සාධාරණ වෙනස්කම්වල ප්‍රතිඵලයක් ලෙස නිර්වචනය කරන ලද ප්‍රතිලාභ වගකීමට ඇති බලපෑම නිස්සාරණය කරන ක්‍රමයක් මත පදනම්වය. සංවේදීතා විශ්ලේෂණ පදනම් වන්නේ සැලකිය යුතු උපකල්පනයක වෙනසක් මත වන අතර අනෙකුත් සියලුම උපකල්පන ස්ථාවරව තබා ගනී. සංවේදීතා විශ්ලේෂණ නිර්වචනය කරන ලද ප්‍රතිලාභ වගකීමේ සත්‍ය වෙනසක් නියෝජනය නොකළ හැකිය, මන්ද එක් එක් උපකල්පන පවතින විට වෙනස්කම් සිදු නොවන ඇතැයි සිතිය නොහැකි බැවිනි.

### 3.11.5 *නිර්වචනය කළ දායක සැලසුම් - සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල*

ශ්‍රී.ල.වි.සේ.නි.කා සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල සඳහා අදාල නීතිරීති රෙගුලාසිවලට අනුකූලව දායකවේ. සේවකයින් ආවරණය වන සැලසුම් ආශ්‍රිත දායක මුදල් සඳහා වන වගකීම්. ආදායම් ප්‍රකාශයේ වියදමක් ලෙස හඳුනා ගැනේ .

*සේවක අර්ථසාධක අරමුදල*

ශ්‍රී ල වි සේ නි කා සහ සේවක අර්ථසාධක අරමුදලට පිළිවෙළින් 15% සහ 10% බැගින් වැටුපෙන් දායක වේ.

**සේවක භාරකාර අරමුදල**
ශ්‍රී. ල. වි. සේ. නි. කා විසින් සේවක භාරකාර අරමුදලට වැටුපෙන් 3% බැගින් දායක වේ.

**3.12** රජයේ ප්‍රදානයන්

**3.12.1** වත්කම් සම්බන්ධ ප්‍රදානයන්

හාලි-ඇල, කතරගම සහ රත්නපුර පුහුණු මධ්‍යස්ථාන ඉදිකිරීම සඳහා භාණ්ඩාගාරය රුපියල් ***691, 161,789*** ක් ලබා දී ඇත.

***2017*** වසර දක්වා, වත්කම් සම්බන්ධ රජයේ ප්‍රදාන කොටස් යටතේ සටහන් කර ඇති අතර වත්කම් අපේක්ෂිත භාවිතය සඳහා සූදානම් වූ පසු වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය පිළිබඳ ක්‍රමානුකූල පදනමක් මත ආදායම් ප්‍රකාශය හඳුනා ගැනීමට අපේක්ෂා කෙරේ.
කෙසේ වෙතත්, ***2018*** වර්ෂයේදී එම ප්‍රදාන භාණ්ඩාගාරය විසින් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රාග්ධන දායකත්වයේ කොටසක් ලෙස සලකා බලන ලෙස උපදෙස් දෙන ලදී. ඒ අනුව අවශ්‍ය වෙනස්කම් සිදු කරන ලදී.

**ආදායම් සහ වියදම්**

**3.13** ආදායම් හඳුනාගැනීම

අ) ගාස්තු ආදායම්

පොරොන්දු වූ සේවාව පාරිභෝගිකයා වෙත පැවරීමෙන් එක් එක් කාර්ය සාධන වගකීම් තෘප්තිමත් වන විට සේවා සැපයීමෙන් ලැබෙන ආදායම් ලාභ හෝ අලාභ ප්‍රකාශයේ හඳුනා ගැනේ. මෙයට බඳවා ගැනීමේ ගාස්තු, පහසුකම් ගාස්තු, බලපත්‍ර ගාස්තු, සෙස්, කොරියානු පරිපාලන සහ නැවත ඇතුල්වීමේ ගාස්තු, කොරියානු ප්‍රවර්ධන ගාස්තු, කොරියානු පුහුණු ගාස්තු සහ අනෙකුත් පුහුණු ගාස්තු සහ සියලුම විදේශීය මෙහෙවර ආදායම් ඇතුළත් වේ.

ආ) පොලී ආදායම්
ක්‍රමකෂය පිරිවැයෙන් මනිනු ලබන සියලුම මූල්‍ය උපකරණ සඳහා පොලී ආදායම් හෝ වියදම් සඵල පොලී අනුපාතිකය (EIR) භාවිතයෙන් වාර්තා කරනු ලැබේ, සුදුසු අවස්ථාවලදී මූල්‍ය වත්කම්වල හෝ වගකීම්වල ශුද්ධ රැගෙන යන මුදලට මූල්‍ය උපකරණයේ අපේක්ෂිත ආයු කාලය හෝ කෙටි කාලසීමාව හරහා ඇස්තමේන්තුගත අනාගත මුදල් ගෙවීම් හෝ ලැබීම් හරියටම වට්ටම් කරන අනුපාතයයි. ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායමට පොලී ආදායම් ඇතුළත් වේ.

ඇ) වෙනත් ආදායම්

වෙනත් ආදායම් උපචිත පදනම මත හඳුනා ගැනේ.

**3.14** *වියදම්*

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමේදී දරන ලද සියලුම වියදම්, වසර තුල කරන ලද පදනම් නොසලකා වර්ෂය සඳහා ලාභ ගණනය කිරීමේදී ආදායමට එක්කර ඇත.

**3.15 සුභසාධන අරමුදල (WF)**

1985 අංක 21 දරන පනතේ 45 වැනි වගන්තියට අනුකූලව ශ්‍රී ලංකාවෙන් පිටත සේවය කරන සේවකයන්ගේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් සුබසාධන අරමුදල (WF) පිහිටුවා ඇත. එය WF

විසින් දැරීමට අවශ්‍ය ආදායම සහ වියදම් නියම කර ඇත. ඊට අමතරව පනතට අනුකූල විය යුතු ආදායම් සහ වියදම් වාර්තා කිරීම සඳහා ශ්‍රී.ල.වි.සේ.නි.කා විසින් වෙනම බැංකු ගිණුමක් පවත්වාගෙන ගොස් ඇත.

හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මහත්මිය විසින් 1997.08.31 දින කැඳවා තිබූ රැස්වීමට අනුව ගෘහ සේවිකාවන් විශේෂයෙන් මුහුණ දෙන දුෂ්කරතා සහ දුෂ්කරතා සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ගේ සුබසාධන කටයුතු සඳහා විශේෂ අරමුදලක් පිහිටුවීම පිළිබඳව අවධානය යොමු කරන ලදී. 1998.04.21 දිනැති අංක 15/98 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව හිටපු ගරු. කම්කරු අමාත්‍යාවරයා 1985 අංක 21 දරන ශ්‍රී.ල.වි.සේ.නි.කා පනතේ 45 වැනි වගන්තියේ සුබසාධන අරමුදල සඳහා පවතින ප්‍රතිපාදන භාවිතා කිරීමට තීරණය කරන ලදී. විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් ලයනල් ප්‍රනාන්දු මහතා විසින් නිකුත් කරන ලද 1999 අංක 01 ගිණුම් වක්‍රලේඛයේ ප්‍රතිපාදන කම්කරු සුබසාධන අරමුදල අඩංගු වේ. එකී වක්‍රලේඛයට අනුව 4 වැනි වගන්තිය යටතේ කම්කරු සුබසාධන අරමුදලට ලැබෙන රිසිට්පත් ලැයිස්තුගත කර ඇති අතර සේවක සුබසාධන අරමුදලේ ගෙවීම් 5 වැනි වගන්තිය යටතේද ලැයිස්තුගත කර ඇත. ඒ අනුව, WF හි ආදායම සහ වියදම් පහත පරිදි වේ.

ආදායම්

- ශ්‍රී ලංකාවෙන් පිටත සේවයේ නියුතු ශ්‍රී ලාංකිකයින්, විදේශ සේවා යෝජකයින් සහ බලපත්‍රලාභීන් සහ වෙනත් ඕනෑම පාර්ශ්වයකින් ලැබෙන සියලුම පරිත්‍යාග සහ දායකත්වයන් WF හි ආදායම ලෙස ගණුන් ගත යුතුය.
- ශ්‍රී.ල.වි.සේ.නි.කා වෙතින් දායකත්වය
- එක් එක් පුද්ගලයාගේ බඳවා ගැනීමේ ගාස්තුවෙන් 10% - 1994 අංක 4 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය (සංශෝධන) පනත.
- පුහුණු ගාස්තු
- විදේශ දූත මණ්ඩල මගින් එකතු කරන ගාස්තු (කම්කරු කොන්ත්‍රාත් ගිවිසුම් ක්‍රමය යටතේ)
- ආයෝජන ආදායම සහ වෙනත්

වියදම

- ශ්‍රී ලංකාවෙන් පිටත රැකියාවල නිරත වී නැවත ශ්‍රී ලංකාවට පැමිණෙන ශ්‍රී ලාංකිකයන් සඳහා පුනරුත්ථාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ශ්‍රී ලංකාවෙන් පිටත රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයන්ගේ පවුල්වලට මාර්ගෝපදේශ හා තොරතුරු සැපයීම.
- ශ්‍රී ලංකාවෙන් පිටත රැකියා සඳහා බඳවා ගන්නා ශ්‍රී ලාංකිකයන් පුහුණු කිරීම සහ දැනුවත්භාවය ඇතිකිරීම
- ශ්‍රී ලංකාවෙන් පිටත රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයන්ට සහ ඔවුන්ගේ පවුල්වලට ආධාර සැපයීම.
- විදේශ බ්‍රහමණ්ඩලවලට අදාලව වැටුප්, සංචාර, ප්‍රාග්ධන වියදම්, නැවත මෙරටට ගෙන්වා ගැනීමේ පිරිවැය, කුලී, ආහාර සහ ඖෂධ, නීති ගාස්තු සහ අනෙකුත් සුබසාධන වියදම්.
- රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ කරනු ලබන වැටුප් සහ වේතන, මුද්‍රණ සහ ලිපි ද්‍රව්‍ය, නඩත්තු වියදම්, උපයෝගිතා ගාස්තු යනාදී සුභසාධන අරමුදල සඳහා සෘජුව හඳුනාගත නොහැකි ශ්‍රී.ල.වි.සේ.නි.කා විසින් දරනු ලබන වියදම්වලින් 5% ක්.

### 3.16 කාර්යාංශයේ අරමුදල

1994 අංක 4 දරන පනත සහ 2009 අංක 56 දරන පනත මගින් සංශෝධිත 1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ පනතේ විධිවිධාන යටතේ මෙම අරමුදල පිහිටුවන ලදී. අරමුදලේ සංයුතිය සාධාරණ වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය යටතේ කර ඇති අතර එය පහත සඳහන් දේවලින් සමන්විතව එම පනතේ අවශ්‍යතාවලට අනුකූලවේ.

මෙම අරමුදලට ගෙවිය යුතු වන්නේ

- ප්‍රදාන, ණය හෝ වෙනත් ආකාරයකින් රජය විසින් කාර්යාංශය වෙත සපයනු ලබන ඕනෑම අරමුදල්;
- මෙම පනත යටතේ අය කරනු ලබන සහ එකතු කරන ලද යම් සෙස් බද්දක ආදායම;
- ගාස්තු සහ ගාස්තු වශයෙන් කාර්යාංශයට ලැබෙන සියලුම මුදල්;
- කාර්යාංශය විසින් කරන ලද ඕනෑම ආයෝජනයකින් ආදායම ලෙස කාර්යාංශයට ලැබෙන සියලුම මුදල්;
- කාර්යාංශයට එහි බලතල, රාජකාරි සහ කාර්යයන්, කාර්ය සාධනය සහ ඉටුකිරීමේදී ලැබුණු සියලුම මුදල්.

එහි අරමුදලින් ගෙවිය යුතු වන්නේ

- අධ්‍යක්ෂවරුන්ට ගෙවිය යුතු වේතන;
- කාර්යාංශයේ නිලධාරීන්, සේවකයින් සහ සේවා නියුක්තිකයින් සඳහා ගෙවිය යුතු වැටුප්;
- කාර්යාංශයේ නියෝජිතයින්ට ගෙවිය යුතු යම් දීමනා; සහ
- කාර්යාංශය විසින් එහි බලතල, යුතුකම් සහ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීමේදී, කාර්ය සාධනය සහ ඉටුකිරීමේදී දරන ඕනෑම වියදමක් පියවීමට අවශ්‍ය සියලුම මුදල්.

ඉහත සඳහන් පරිදි, ශ්‍රී.ල.වි.සේ.නි.කා විසින් 2022 වසරේ මූල්‍ය ප්‍රකාශනවල වත්කම් සඳහා වන සටහන් වලට අමතරව සුබසාධන අරමුදලේ සහ කාර්යාංශයේ අරමුදලේ ආදායම් සහ වියදම් වෙනම සටහනක (සටහන අංක 6.1) සහ වත්කම් සහ වගකීම් වෙන වෙනම ශේෂ පත්‍රයක දක්වා ඇත. සහ හෙළිදරව් කිරීමේ අරමුණ සඳහා වර්ෂයතුලදී වත්කම් සහ වගකීම් වෙනස්වීම් සුභසාධන අරමුදල වෙනම පෙන්වීම සඳහා හිමිකම් වෙනස්වීම් ප්‍රකාශය යටතේ සුභසාධන අරමුදල සඳහා වෙනම තීරුවක් දක්වා ඇත.

4 ආදායම

| විස්තර | 2022 | 2021 | 2022 | 2021 |
|---|---|---|---|---|
| | සමූහය | සමූහය | ශ්‍රී.ල.වි.සේ.නි.කා | ශ්‍රී.ල.වි.සේ.නි.කා |
| | රු | රු | රු | රු |
| බදවා ගැනීමේ ගාස්තු - නියෝජිතායතනය | 555,720,001 | 188,059,217 | 555,720,001 | 188,059,217 |
| බදවා ගැනීමේ ගාස්තු - පුද්ගල | 1,757,910,502 | 690,103,452 | 1,757,910,502 | 690,103,452 |
| කොරියානු බදවාගැනීම් ප්‍රවර්ධන ගාස්තු | 230,730,797 | 7,621,757 | 230,730,797 | 7,621,757 |
| පහසුකම් ගාස්තු | 61,705,919 | 25,601,643 | 61,705,919 | 25,601,643 |
| බලපත්‍ර ගාස්තු | 93,920,173 | 60,213,259 | 93,970,173 | 60,263,259 |
| සෙස් ආදායම | 943,245,661 | 317,219,004 | 943,245,661 | 317,219,004 |
| කොරියානු පරිපාලන ගාස්තු | 26,080,484 | 821,756 | 26,080,484 | 821,756 |
| නැවත ඇතුල්වීමේ කොරියානු ගාස්තු | 23,271,992 | 17,260,380 | 23,271,992 | 17,260,380 |
| කොරියානු පුහුණු ගාස්තු | 54,679,103 | 15,618,785 | 54,679,103 | 15,618,785 |
| පුහුණු ආදායම | 521,323,621 | 177,280,879 | 521,323,621 | 177,280,879 |
| විදේශීය මෙහෙවරෙන් ලැබෙන ආදායම් (උප නොවේ 04.1) | 3,599,158,926 | 869,058,772 | 3,599,158,926 | 869,058,772 |
| බදවා ගැනීමේ ආදායම | 61,755,453 | 5,428,006 | - | - |
| ලියාපදිංචි ගාස්තු | - | 146,620 | - | - |
| | **7,929,502,632** | **2,374,433,530** | **7,867,797,179** | **2,368,908,903** |

නියෝජිතායතන බදවා ගැනීමේ පහසුකම් සම්බන්ධයෙන් ගාස්තු සහ බදවා ගැනීමේ ගාස්තු පහත පරිදි ගණනය කෙරේ:

| ගෙවිය යුතු ගාස්තු (රු.) | පහසුකම් ගාස්තු (රු.) | බදවා ගැනීමේ ගාස්තු (රු.) | නියෝජිතායතන කොටස (70%) (රු.) |
|---|---|---|---|
| 15,200 | 200 | 4,500 | 10,500 |

4.1 විදේශ දූත මෙහෙවරෙන් ලැබෙන ආදායම්

| විස්තර | 2022 | 2022 | | | 2021 |
|---|---|---|---|---|---|
| | සමූහය | සමූහය | සේ.සු.අ | එකතුව | එකතුව |
| | (රු.) | (රු.) | (රු.) | (රු.) | (රු.) |
| විශ්වසනීයත්වය තක්සේරු කිරීම | 2,864,616 | - | 2,864,616 | 2,864,616 | 8,138,314 |
| රැකියා ඇණවුම් අනුමත කිරීම් | 137,920,175 | - | 137,920,175 | 137,920,175 | 70,143,694 |
| සේවා නියුක්තිය නහවුරු කිරීම/ලියාපදිංචි කිරීම | 1,226,807,065 | - | 1,226,807,065 | 1,226,807,065 | 245,618,242 |
| ආපසු නොගෙවන තැන්පතු | 1,464,102,577 | - | 1,464,102,577 | 1,464,102,577 | 285,979,362 |
| ශ්‍රී.ල.වි.සේ.නි.කා ලියාපදිංචි ගාස්තුව අලුත් කිරීම | 105,136,671 | 88,557,440 | 16,579,231 | 105,136,671 | 76,363,670 |
| විදේශ නියෝජිතායතන අලුත් කිරීමේ ගාස්තුව | 13,941,366 | - | 13,941,366 | 13,941,366 | 3,007,362 |
| විවිධ ආදායම් | 310,397 | - | 310,397 | 310,397 | 764,602 |
| කොන්ත්‍රාත් ලියාපදිංචි කිරීමේ ගාස්තුව | 648,076,058 | | 648,076,058 | 648,076,058 | 179,043,526 |
(iii) පහත සඳහන් විදේශ රැකියා නියෝජිතායතනවල බලපත්‍රලාභීන් 2022 වර්ෂයේදී ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් ලෙස සේවය කර ඇත. ඔවුන් වෙත ආපසු ගෙවා ඇති බදවා ගැනීමේ ගාස්තුවෙන් 70% ක කොටස පහත පරිදි වේ.

| අධ්‍යක්ෂ සහ නියෝජිතායතනයේ නම | සම්පූර්ණ ආපසු ගෙවීම් | 70 %ආපසු ගෙවීම් | සෙස් | |
|---|---|---|---|---|
| | | | අයවීම් -2022 | 2022.12.31 දිනට ලැබිය හැකිය |
| ඩබ්.එස්.එච්. සපුමොහොට්ටි මහතා-එමරල්ඩ අයි.එස්.එල්.ඉ මිනිස්බල සහ සංචාරක සේවා | 409,500 | 16,768,500 | 1,973,693 | 173,162 |
| එම්.එන්.එම්. අර්ෂාඩ් මහතා - ඊබ්‍රාහිම් එන්ටර්ප්‍රයිසස් | 333,710 | 8,032,500 | 3,837,067 | (5,214) |
| ඒ.එල්.ඒ හසාම් මහතා - අල් අකීම් එන්ටර්ප්‍රයිසස් | 10,500 | 7,234,500 | 4,463,369 | 1,775,015 |
| එම්.ආර්.එම්. ෆස්ලී මහතා - ට්‍රාන්ස් ගල්ෆ් කුරුණෑගල | 850,500.0 | 18,669,000 | 21,060,393 | 1,546,063 |

ශ්‍රී.ල.වි.රැ.ඒ

**21 ප්‍රධාන කළමනාකරණ පුද්ගලයින් සමඟ ගනුදෙනු**

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රධාන කළමනාකාරීත්වයේ සාමාජිකයින් වන්නේ.

ප්‍රධාන කළමනාකාරීත්වයේ පුද්ගලයන් සහ ඔවුන්ගේ සමීපතම පවුලේ සාමාජිකයන් සම්බන්ධ සැලකිය යුතු ගනුදෙනු කිසිවක් සිදුවී නොතිබුණි.

**22 මූල්‍ය අවදානම් කළමනාකරණ අරමුණු සහ ප්‍රතිපත්ති**

මූල්‍ය වත්කම් වලින් පහත අවදානම් වලට සමූහයට නිරාවරණය වී ඇත;

1. ණය අවදානම
2. ද්‍රවශීලතා අවදානම
3. වෙළඳපල අවදානම

**අවදානම් කළමනාකරණ රාමුව**

සමූහ ව්‍යාපාරයේ අවදානම් කළමනාකරණ රාමුව ස්ථාපිත කිරීම සහ අධීක්ෂණය කිරීමේ සමස්ත වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ.
සමූහයේ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සංවර්ධනය කිරීම සහ අධීක්ෂණය කිරීම ඇතුළත් වේ.

ශ්‍රී.ල.වි.සේ.නි.කා හි අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති ස්ථාපිත කර ඇත්තේ ආයතනය මුහුණ දෙන අවදානම් හඳුනා ගැනීමට, ප්‍රමාණ කිරීමට සහ විශ්ලේෂණයට, සුදුසු අවදානම් සීමාවන් සහ පාලනයන් සැකසීමට සහ අවදානම් නිරීක්ෂණය කිරීමට සහ සීමාවන්ට අනුගත වීමටය. වෙළෙඳපොළ තත්ත්වයන් සහ සමූහයේ ක්‍රියාකාරකම්වල වෙනස්කම් පිළිබිඹු කිරීම සඳහා අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ පද්ධති නිරන්තරයෙන් සමාලෝචනය කෙරේ.

ශ්‍රී.ල.වි.සේ.නි.කා හි අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටිවලට අනුකූල වීම කළමනාකරණය අධීක්ෂණය කරන්නේ කෙසේද යන්න අධ්‍යක්ෂ මණ්ඩලය අධීක්ෂණය සමාලෝචනය කරයි.
සමූහයේ අවදානම් මුහුණත සම්බන්ධයෙන් අවදානම් කළමනාකරණ රාමුවේ ප්‍රමාණවත් බව සමාලෝචනය කරයි.

**ණය අවදානම**

ණය අවදානම යනු මූල්‍ය අලාභයකට තුඩු දෙන මූල්‍ය උපකරණ සහ අනෙකුත් ලැබිය යුතු වගකීම් ප්‍රති පාර්ශවය විසින් ඉටු නොකිරීමේ අවදානමයි.

දැනට ශ්‍රී.ල.වි.සේ.නි.කා රජයේ භාණ්ඩාගාර බැඳුම්කර සහ රජයේ බැංකුවල ස්ථාවර තැන්පතු වල ආයෝජනය කර ඇත. එබැවින් ශ්‍රී.ල.වි.සේ.නි.කා හි ණය අවදානම සුළුපටු නොවන බව ශ්‍රී.ල.වි.සේ.නි.කා කළමනාකාරිත්වයේ අදහසයි.

**ද්‍රවශීලතා අවදානම**

ද්‍රවශීලතා අවදානම යනු මුදල් හෝ වෙනත් මූල්‍ය වත්කම් ලබා දීමෙන් පියවා ගන්නා මූල්‍ය වගකීම් හා සම්බන්ධ වගකීම් සපුරාලීමේදී සමූහයට දුෂ්කරතා ඇති වීමේ අවදානමයි. සමූහයේ ද්‍රවශීලතාවය කළමනාකරණය කිරීමේ ප්‍රවේශය නම්, හැකිතාක් දුරට, සාමාන්‍ය සහ ආතති තත්වයන් යටතේ, පිළිගත නොහැකි පාඩු නොලබා, සමූහයේ කීර්ති නාමයට හානියක් නොවන පරිදි, නියමිත වේලාවට එහි වගකීම් සපුරාලීමට ප්‍රමාණවත් ද්‍රවශීලතාවයක් ඇති බව සහතික කිරීමයි.

පහත වගු මගින් සමූහයේ සහ භාරකාර අරමුදලේ මූල්‍ය වගකීම් ගිවිසුම්ගත කල්පිරෙන දිනය දක්වා ඉතිරිව ඇති කාලසීමාව මත පදනම්ව අදාළ කල්පිරීමේ කණ්ඩායම්වලට විශ්ලේෂණය කරයි.

**වෙළඳපල අවදානම**

වෙළෙඳපොළ අවදානම යනු වෙළෙඳපොළ මිලෙහි වෙනස්වීම් හේතුවෙන් මූල්‍ය උපකරණවල අනාගත මුදල් ප්‍රවාහවල සාධාරණ වටිනාකම් උච්චාවචනය වීමේ අවදානමයි. වෙළඳපල මිල අවදානම් වර්ග හතරකින් සමන්විත වේ; පොලී අනුපාත අවදානම, මුදල් අවදානම, භාණ්ඩ මිල අවදානම සහ කොටස් මිල අවදානම් වැනි අනෙකුත් මිල අවදානම. වෙලඳපොල අවදානමට බලපාන මූල්‍ය උපකරණ අතරට ණය සහ ණය ගැනීම්, තැන්පතු, විකිණීමට ඇති ආයෝජන සහ ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ ඇතුළත් වේ.වෙළඳපල අවදානම් කළමනාකරණයේ පරමාර්ථය වන්නේ ප්‍රතිලාභය ප්‍රශස්ත කරන අතරම පිළිගත හැකි පරාමිතීන් තුළ වෙළඳපල අවදානම් නිරාවරණ කළමනාකරණය සහ පාලනය කිරීමයි.

**පොලී අනුපාත අවදානම**

පොලී අනුපාත අවදානම යනු වෙළෙඳපොළ පොලී අනුපාතවල වෙනස්වීම් හේතුවෙන් මූල්‍ය උපකරණයක සාධාරණ වටිනාකම් හෝ අනාගත මුදල් ප්‍රවාහය උච්ඡාවචනය වීමේ අවදානමයි. වෙළඳපොල පොලී අනුපාත වෙනස් වීමේ අවදානමට සමූහයේ නිරාවරණය මූලික වශයෙන් පාවෙන පොලී අනුපාත සමඟ සමූහයේ දිගුකාලීන ණය බැඳීම් සමඟ සම්බන්ධ වේ.

**කොටස් මිල**

සමූහයේ ලැයිස්තුගත කර ඇති සහ ලැයිස්තුගත නොකළ කොටස් සුරැකුම්පත් ආයෝජන සුරැකුම්පත්වල අනාගත වටිනාකම් පිළිබඳ අවිනිශ්චිතතාවයන් නිසා ඇතිවන වෙළඳපල මිල අවදානමට ගොදුරු වේ. සමූහය විවිධාංගීකරණය කිරීම සහ පුද්ගල සහ සම්පූර්ණ කොටස් උපකරණ සඳහා සීමාවන් පැනවීම හරහා කොටස් මිල අවදානම් කළමනාකරණය කරයි.

## 23 වෙනත් ගනුදෙනු

විදේශ රැකියා ලොතරැයි ජයග්‍රාහකයින් සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ විවෘත කර ඇති ස්ථාවර තැන්පතු ගිණුම් 07ක් අවසන් ගිණුම්වල පෙන්වා නොමැත.

| ස්ථාවර තැන්පතු ගිණුම් අංක | බැංකුව |
|---|---|
| 20001-90-14730 | ජා.ඉ.බැ |
| 20001-90-14985 | ජා.ඉ.බැ |
| 20001-90-15027 | ජා.ඉ.බැ |
| 20001-90-15051 | ජා.ඉ.බැ |
| 20001-90-15078 | ජා.ඉ.බැ |
| 20001-90-15094 | ජා.ඉ.බැ |
| 20001-90-15892 | ජා.ඉ.බැ |

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වී ඇති ශ්‍රී ලංකා සංක්‍රමණික සේවකයින් සඳහා නිවාස ණය යෝජනා ක්‍රම සඳහා පහත සඳහන් ස්ථාවර තැන්පතු බැංකු ඇපකර ලෙස තබා ඇත.

ස්ථාවර තැන්පතු ගිණුම් අංක

| | | රු |
|---|---|---|
| 89883354 | ලංකා බැංකුව | 100,284,931.50 |
| 204-60-01-000304290 | මහජන බැංකුව | 49,066,952.05 |
| SMIB-IFD-001203 | රා.උ.ආ.බැ | 110,102,846.30 |
| SMIB-IFD-001201 | රා.උ.ආ.බැ | 18,405,600.70 |
| SMIB-IFD-001200 | රා.උ.ආ.බැ | 18,506,104.95 |
| | | **296,366,435.50** |

ලංකා බැංකුවේ ගිණුම් අංක **1650** බැංකුවේ **A/C** වෙත කරන ලද හඳුනා නොගත් හර කිරීම්

පහත වෙක්පත් දෙකක අගයන් ලංකා බැංකුවේ ආයතනික ශාඛාවේ අපගේ චත්මන් අංක 1650 වෙත හර කර ඇත. ඉහත වෙක්පත් සොරකම් කර ව්‍යාජ අත්සන් තනා බැංකුවට ඉදිරිපත් කර ඇති බැවිනි.

| වෙක්පත් අංකය | හර කළ දිනය | වටිනාකම් - රු. |
|---|---|---|
| 239481 | 11.09.2009 | 400,000 |
| 239482 | 12.10.2009 | 400,000 |

මේ සම්බන්ධයෙන් අපි මිරිහාන පොලිස් ස්ථානයේ චංචා විමර්ශන ඒකකයට පැමිණිල්ලක් කර ඇති අතර ඔවුන් විසින් පරීක්ෂණ පවත්වනවා. මේ සම්බන්ධයෙන් කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් විභාග වෙමින් පවතී.

ශික්ෂණ ක්‍රියාමාර්ගයට අනුව සේවකයින් 2 දෙනෙකු එම මුදල පියවීමට බැඳී සිටී (එක් සේවකයෙකු 200,000 සහ තවත් 600,000) අයකර ගැනීමේ ක්‍රියා සිදුවෙමින් පවතී.

## 24 වාර්තාකරණ කාලය අවසන් වීමෙන් පසු සිදුවීම්

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් 2023 ජනවාරි මාසය තුළ රාජ්‍ය ව්‍යවසාය මහා භාණ්ඩාගාරය විසින් කරන ලද ඉල්ලීමට අනුව රුපියල් 3,000,000,000 ඒකාබද්ධ අරමුදලට ගෙවන ලදී.

# විගණකාධිපති වාර්තාව

# ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE


මගේ අංකය எனது இல. My No. VOT/C/SLBFE/FA/01/22/01 ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2023 ජූලි 31 දින

සභාපති

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සහ එහි පරිපාලිතයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ("කාර්යාංශය") සහ එහි පරිපාලිතයේ ("සමූහය") 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, කාර්යාංශයේ සහ සමූහයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.




අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 1 හි 32 ඡේදය අනුව අස්තිත්වයක් විසින් ප්‍රමිතියක් මඟින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටක හැර වත්කම් සහ වගකීම් හිලව් නොකළ යුතු වුවත් 2022 දෙසැම්බර් 31 දිනට ජංගම ගිණුමේ පැවති රු.25,932,669ක අවාසි සහගත ශේෂය මුදල් හා මුදල් සමාන දෑ වලින් අඩුකර දැක්වීම හේතුවෙන් මුදල් හා මුදල් සමාන දෑ වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 1 හි 60 ඡේදය ප්‍රකාරව ජංගම වත්කම් හා ජංගම නොවන වත්කම් වෙන්කර දැක්විය යුතු වුවද, 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු පොළී ආදායම රු.2,089,671,823 ක් හා ස්ථාවර තැන්පතු වටිනාකම රු.21,038,312,191ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් හා ජංගම නොවන වත්කම් ලෙස වෙන්කර දැක්වීමකින් තොරව එකතුව රු.23,127,984,014 ක ස්ථාවර තැන්පතු ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 7 හි 28 ඡේදය ප්‍රකාරව විදේශ ව්‍යාවහාර මුදල්වල විනිමය අනුපාතයන්ගේ වෙනස්වීම් නිසා පැන නගින උපලබ්ධි නොවූ හානි සහ වාසි පමණක් මුදල් ප්‍රවාහයන් ලෙස හඳුනාගත යුතු නමුත්, කාර්යාංශය විසින් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහයන් ගණනය කිරීමේදී උපලබ්ධි වූ විදේශ විනිමය හුවමාරු ලාභයද ඇතුළත්ව සම්පූර්ණ විදේශ විනිමය හුවමාරු ලාභය (exchange gain) ලෙස රු.1,606,547,459ක් බදු පෙර ලාභයට ගලපා තිබුණි.

(ඈ) මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහයේ කාරක ප්‍රාග්ධන වෙනස්වීම් ගැලපීමේදී මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙනත් ණයහිමියන් තුළ ඇතුලත් නොවූ රු.209,375,755ක් ගලපා තිබුණි.

(ඉ) මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ආයෝජන මිලදී ගැනීම් සහ විකිණීම්, මුදල් ගලායාම් සහ මුදල් ගලා ඒම් ලෙස දැක්විය යුතු නමුත් ආයෝජනය කළ වර්ෂයේ ආරම්භක හා අවසාන ශේෂ අතර වෙනස දක්වා තිබුණි.

(ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 12 හි 47 ඡේදය ප්‍රකාරව වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයේ බදු අනුපාතයට අනුව විලම්බිත බදු ගණනය නොකිරීම හේතුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ විලම්බිත බදු වත්කම් රු.4,010,206 ක් අඩුවෙන් දක්වා තිබුණි. ඒ අනුව වර්ෂයට අදාල ආදායම් බදු රු.1,700,711,809 ක් වුවද ගණනය කළ බදු වටිනාකම රු.1,704,722,015 ක් විය.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 34 ඡේදය ප්‍රකාරව දේපළ, පිරියත හා උපකරණ අයිතම සඳහා සෑම වර්ෂ 03කට හෝ 05කට වරක් ප්‍රත්‍යාගණනයක් සිදු කළයුතු වුවත් කාර්යාංශය විසින් 2010 වර්ෂයෙන් පසු එත්කම් සම්බන්ධයෙන් ප්‍රත්‍යාගණනයක් සිදු කර නොතිබුණු බැවින් ස්ථාවර වත්කම්වල සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශන මඟින් නිරූපනය නොකෙරුණි.

(ඌ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 51 ඡේදය ප්‍රකාරව වත්කම්වල අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය කර නොතිබීම හේතුවෙන් පිරිවැය රුපියල් මිලියන 1262.16 ක් වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ නමුත් තවදුරටත් භාවිතයට ගනිමින් පැවතිණි. ඒ අනුව වත්කම්වල ඵලදායී ජීව කාලය පිළිබඳ වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 අනුව නැවත ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(එ) විගමණික ශ්‍රමිකයන් පුහුණු කර ලබා දෙනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් සහතික පත්‍ර (NVQ) මුද්‍රණය කිරීම වෙනුවෙන් 2017 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාල පරිච්ඡේදයට අදාළව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව වෙත ගෙවිය යුතු රු.2,846,025 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඒ) මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රඳවා ගැනීම් මුදල් ලෙස රු.44,490,054ක් දක්වා තිබුණද ප්‍රසම්පාදන අංශයේ ඇති උපලේඛනය අනුව එම ශේෂය රු.3,172,467 ක් වූයෙන් රඳවා ගැනීමේ මුදල් රු.41,317,857 ක් වැඩියෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි.

(ඔ) කම්කරු සුභසාධන අරමුදලට හා කුවේට් වන්දි අරමුදල් වලට අදාළ ස්ථාවර තැන්පතු කල් පිරීමේදී හා නැවත ආයෝජනය කිරීමේදී එදිනට පැවති විදේශ විනිමය අනුපාතයට අනුව විදේශ විනිමය ඉුවමාරු ලාභය හෝ අලාභය හඳුනා නොගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ විදේශ විනිමය ඉුවමාරු ලාභය රු.5,581,297 ක් අඩුවෙන් දක්වා තිබීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඕ) විදේශ රැකියා නියෝජිත ආයතන සඳහා ගෙවිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ එකතු වටිනාකම රු.376,748,580ක් වූ ණයහිමි ශේෂයන් 1576 ක ශේෂ තහවුරු කිරීමට නොහැකි වී තිබුණි.

(ක) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සුභසාධක අරමුදලේ ගෙවිය යුතු ශේෂ තුළ දැනටමත් ගෙවා ඇති රු.3,708,962 ක් නැවත ගෙන්වා ගැනීමේ තැන්පතුවල ඇතුලත් වීමෙන් උපචිත හා වෙනත් ගෙවිය යුතු ශේෂ එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ග) 2020 වර්ෂයේදී කුවේට් හි සේවය කළ විගමණිකයින් 14 දෙනෙකුගේ ගුවන් ගමන් ගාස්තු ලෙස කාර්යාංශය විසින් දරන ලද රු.2,951,091ක මුදල 2021 වර්ෂයේදී ගල්ෆ් රක්ෂණ සමාගමෙන් ප්‍රතිපූර්ණය කිරීමේදී ඒකාබද්ධ අරමුදලට ගැලපීම වෙනුවට ගෙවිය යුතු ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි.

(ඝ) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචිය ලබා විදේශගත වන ශ්‍රමිකයින් වෙනුවෙන් නොමිලේ ලබා දෙන රක්ෂණාවරණය සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සමග එළඹ තිබූ ගිවිසුමේ 4 ඡේදය ප්‍රකාරව පරිපාලන වියදම් ලෙස සියයට 15ක කොමිස් මුදලක් කාර්යාංශය වෙත ලැබිය යුතු වුවද 2022 වර්ෂය සඳහා ගෙවන ලද රු.444,490,978 ක වාරික මුදලින් තවදුරටත් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් ලැබිය යුතු රු.60,267,876 ක රක්ෂණ කොමිස් මුදල ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් වර්ෂයේ ආදායම හා ලැබිය යුතු ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඞ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙනත් ලැබිය යුතු යටතේ දක්වා ඇති විගමණික ශ්‍රමිකයින් වෙත ණය ලබා දීමේ අරමුණෙන් මහජන බැංකුවේ රු.1,000,000 ක තැන්පතුව හා මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු ලෙස දක්වා තිබුණු රු.869,955,802 කට අදාළ ශේෂ තහවුරු කිරීමට අදාළව ලිඛිත සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

(ඩ) 2022 දෙසැම්බර් 08 දින පැවති පොදු ව්‍යාපාර කාරක සභාවේ නිර්දේශ පරිදි කම්කරු සුභසාධන අරමුදලේ ආදායම් හා වියදම් වෙනම හඳුනාගත හැකි පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි. එමෙන්ම කාර්යාංශ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් යටතේ සුභසාධක අරමුදලින් ලැබිය යුතු ලෙස දක්වා තිබූ රු.1,512,657,528 කට අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීමයන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 සමූහයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සමූහයේ වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ

ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතික වීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සමූහයේ වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය.තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව, මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මේහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කාර්යාංශයේ සහ සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම.

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරවිකිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සහ සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය

කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්ව් ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත්කිරීම අගයන ලදී.

- ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම සඳහා සමූහය තුළ ඇති ආයතන හෝ ව්‍යාපාර ක්‍රියාකාරකම්වල මූල්‍ය තොරතුරු සම්බන්ධයෙන් ප්‍රමාණවත් සුදුසු විගණන සාක්ෂි ලබා ගන්නා ලදී. සමූහ විගණනයේ මෙහෙයවීම, අධීක්ෂණය සහ කාර්යසාධනය සඳහා මා වගකිව යුතුය. මගේ විගණන මතය සඳහා මම සම්පූර්ණයෙන්ම වගකිව යුතුය.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව.

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද අතර මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමූහය පවත්වා ගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමූහයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සික්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමාකිරීම තුළ පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කාර්යාංශයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට කාර්යාංශය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට කාර්යාංශයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීතිරීති / විධානයට යොමුව | නිරීක්ෂණ |
|---|---|
| (අ) 1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත<br>(i) 17(2) වගන්තිය සහ 45(2) වගන්තිය | පනතෙහි සඳහන් විධිවිධානයන්ට අනුකූල නොවන ලෙස කාර්යාංශය විසින් කාර්යාංශ අරමුදලට එක්රැස් විය යුතු ආදායම් කම්කරු සුභසාධන අරමුදලට එක්රැස් කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ එම ආදායම්වල එකතුව රු.3,494,022,254ක් වී තිබුණි. |
| (ii) 17(3) වගන්තිය සහ 48(1) වගන්තිය | පනතෙහි සඳහන් විධිවිධානයන්ට අනුකූල නොවන ලෙස කාර්යාංශ අරමුදලින් ගෙවියයුතු විදේශ දූත මණ්ඩලවල සේවය සඳහා අනුයුක්ත කරන ලද කාර්යාංශ කාර්යමණ්ඩලවලට අදාළ වැටුප් සහ වෙනත් දීමනා සඳහා එකතුව රු.684,351,761 ක් කම්කරු සුභසාධන අරමුදලෙන් සමාලෝචිත වර්ෂය තුළදී වැය කර තිබුණි. |
| (ආ) 1971 අංක 38 දරන මුදල් පනත xi වන වගන්තිය හා 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.1(ii) වගන්තිය | i. මුදල් අමාත්‍යාවරයාගේ හා අදාල අමාත්‍යාවරයාගේ එකඟතාවය ලබා ගැනීමෙන් තොරව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.21,038,312,191 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි.<br>ii. 2022 ජනවාරි 01 දිනැති අංක 01/2022 දරන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)ගේ අභ්‍යන්තර උපදෙස් පත්‍රිකාව අනුව අරමුදල් නුවමාරු කිරීම, ආපසු ගැනීම හා ස්ථාවර |

නැන්පතු වල ආයෝජනය කිරීම සඳහා සභාපති, සාමාන්‍යාධිකාරී හා අතිරේක සාමාන්‍යාධිකාරී වෙත මූල්‍ය බලතල පවරා ඇති නමුත් ඊට අදාළ සීමාවන් දක්වා නොතිබුණි. ඒ අනුව විගණනය විසින් සිදුකළ නියැදි පරීක්ෂාවට අනුව චරකට සිදු කරනු ලබන මුදල් හුවමාරු කිරීම් සහ ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීම් රු.මිලියන 10 සිට රු.මිලියන 250 දක්වා පරාසය තුළ ඉහළ අගයක් ගෙන ඇති බව අනාවරණය විය.

(ඇ) 2008 දෙසැම්බර් 31 දිනැති අංක 30/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2021 ඔක්තොබර් 14 හා 2022 පෙබරවාරි 10 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු ලිපි

චක්‍රලේඛයට පටහැනිව 2002 වර්ෂයේ ගනු ලැබූ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත දීමනා ඇතුළත් දළ වැටුප මෙන් 12 ගුණයක් ආපදා ණය ලෙස ගෙවීමට කාර්යාංශය විසින් කටයුතු කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී නිලධාරීන් 525 දෙනෙකු වෙත සීමාව ඉක්මවා එකතුව රු.67,673,231ක් ආපදා ණය ලෙස ගෙවා තිබුණි. තවද ක්ෂණික ණය ලෙස නිලධාරියකුගේ මාසයකට සමාන වැටුපක් සියයට 4.2 පොළී අනුපාතයක් යටතේ නිලධාරීන් 107 දෙනෙකු සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු.3,826,900 ක් ගෙවීම් කර තිබුණි.

(ඈ)ආයතන සංග්‍රහයේ XLV(III)වැනි පරිච්ඡේදයේ 12 වන වගන්තිය

කාර්යාංශයේ සේවය කරමින් සිටි නිලධාරීන් දෙදෙනෙකුට විරුද්ධව විනය පරීක්ෂණය කෙරෙමින් පැවතියද ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට පටහැනිව විදේශ දූත මණ්ඩලවල පිහිටි සුභසාධක අංශයේ සේවය සඳහා ඩුබායි හා කුවේට් රටවල්හි පිළිවෙලින් උපදේශක හා පළමු ලේකම් තනතුරු සඳහා 2021 වර්ෂයේදී බඳවා ගෙන තිබුණි.

(ඉ) 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය

මුදල් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, කාර්යාංශය විසින් දින 52ක් ප්‍රමාද වී 2023 අප්‍රේල් 21 දින මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර කාර්යාංශයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

| කාර්යාංශයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතෙහි 15 (අ), (ඔ),(ඕ) වගන්තිය | තොරතුරු දත්ත බැංකුවක් පිහිටුවා පවත්වා ගෙනයාමට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතෙහි 31 (1) වගන්තිය | 2015 සිට 2022 වර්ෂය කාලපරිච්ඡේදය තුළදී බලපත්‍රලාභී නියෝජිතායතන 04 ක් අසාදු ලේඛන ගත කර තිබියදීත් එම නියෝජිතායතන වෙත නැවතත් පැමිණිලි 315 ක් ලැබී තිබුණද එම නියෝජිතායතනයන්හි බලපත්‍ර අවලංගු කිරීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි. |
| (ඇ) 2020 ජනවාරි 14 දිනැති සභාපතිගේ 01/2020 වක්‍රලේඛය | i. වක්‍රලේඛ කොන්දේසි පදනම් කරගෙන විදේශ දූත මණ්ඩල සේවය සඳහා කාර්යාංශයේ කාර්යය මණ්ඩලයේ අයදුම්පත් ප්‍රතික්ෂේප කර තිබුණු නමුත් වක්‍රලේඛ කොන්දේසි සපුරා නොතිබූ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයෙක් ලෙස කටයුතු කළ කාර්යාංශයේ නිලධාරිණියක් ඩුබායි තානාපති කාර්යාලයේ කම්කරු සුභසාධන අංශයේ උපදේශක තනතුර සඳහා පත්කර තිබුණි. |
| | ii. වක්‍රලේඛය අනුව ඉල්ලුම් කිරීමට අවශ්‍ය අවම වයස් සීමාව සම්පූර්ණ වී නොතිබීම හා අවශ්‍ය සුදුසුකම් සපුරා නොතිබුණු අයදුම්කරුවෙකු සිංගප්පූරු තානාපති කාර්යාලයේ සුභසාධක අංශයේ උපදේශක තනතුර සඳහා බඳවාගෙන තිබුණි. |

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කාර්යාංශයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

2.3 වෙනත් කරුණු

(අ) කම්කරු යුහසාධන අරමුදල මගින් පූර්ණ ආබාධිත විගමණිකයින් සඳහා මිලියනයක් වටිනා නිවාසය බැඟින් තනාදීම සඳහා 2019 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදය තුල දී නිවාස 04 ක් ඉදිකිරීමට රු.9,600,000 ක් වෙන් කර කටයුතු ආරම්භකර තිබුණ ද 2022 දෙසැම්බර් 31 දින වන විට ඉන් නිවාස 03 ක වැඩ අවසන් කර නොනිබුණු අතර රු.2,222,650 ක් වැය කර තිබුණි.

(ආ) 1990 හා 1991 වර්ෂයන්හි ගල්ෆ් යුද්ධයෙන් රැකියා අහිමිවූවන්ට වන්දි ලබාදීම සඳහා එක්සත් ජාතීන්ගේ වන්දි කොමිසම ශ්‍රී ලංකාවට ලබාදී ඇති වන්දි අරමුදලෙහි, වන්දි ලබා දීම 1994 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කළ යුතු වුවද, 2022 දෙසැම්බර් 31 දින වන විටත් 948 දෙනෙකු වෙත රු.251,453,848ක් වන්දි ලෙස ගෙවිය යුතුව පැවතුණි. මෙම වන්දි අරමුදල ස්ථාවර තැන්පතු ලෙස ආයෝජනය කර 1997 සිට 2022 දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා රු.4,960,937,306 ක ආදායමක් උපයාගෙන ඇති අතර 2022 දෙසැම්බර් 31 වන විට, වන්දි අරමුදල රු.5,212,391,154ක් වී තිබුණි. කෙසේ වුවද 2022 දෙසැම්බර් 31 වන විටත් වන්දි ගෙවිය යුතු අය වෙත මෙම වන්දි ලබා දීමට කටයුතු කර නොනිබුණි.

(ඇ) කුවේට් වන්දි අරමුදලින් වන්දි ලබා ගැනීමට 2007 නොවැම්බර් 19 දින විගමණික ශ්‍රමිකයෙකු විසින් ඉල්ලුම් කර, සියලු ලියකියවිලි වන්දි ගෙවීමේ නිර්දේශ කමිටුව මගින් අනුමත වී තිබියදී හා 1991 වර්ෂයේ කුවේට් යුධ සමයෙහි කුවේට්හි සේවය කළ බවට තහවුරු කිරීම සඳහා සාක්ෂි ඉදිරිපත් කර තිබියදීත් වන්දි ලබා ගැනීමේ අයදුම්පත් ඉදිරිපත් කර සමාලෝචිත වර්ෂය වන විට වසර 15ක් ගතවී ඇතත් මේ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොනිබුණි.

(ඈ) කාර්යාංශය සතුව එකතුව රු.397,366,435ක් වටිනා ස්ථාවර තැන්පතු 07ක් බැංකු ඇපකර ලෙස තබා ගනිමින් නිවාස ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක වෙමින් පවතින බව සඳහන් කර තිබුණද එහි ප්‍රගතිය පිළිබඳ නොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඉ) 2023 ජනවාරි 18 දින පැවති පොදු ව්‍යාපාර කාරක සභා රැස්වීමේදීද විදේශ දූත මණ්ඩල සඳහා නිලධාරීන් තෝරා ගැනීමේ ක්‍රමවේදය පිළිබඳව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ උපදෙස් අනුව විධිමත් ක්‍රියාපටිපාටියක් සකස් කරන ලෙස නිර්දේශ ලබාදී තිබුණද 2023 ජනවාරි 17 දින අනුමත කර නිබූ ක්‍රියාපටිපාටිය අඩුපාඩු පවතින බව සඳහන් කර කාර්යාංශය විසින් ප්‍රතික්ෂේප කර තිබුණි.

(ඊ) රැකියා බලපත්‍ර ක්‍රමය (Employment Permit System) යටතේ දකුණු කොරියාව වෙත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් යැවීමට අදාළව එරට රජය මැදිහත්ව අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුමෙහි කාලය

2019 සැප්තැම්බර් 29 දිනෙන් අවසන්වී තිබුණු අතර එම ගිවිසුමට අනුව සාධාරණ හේතුවකින් තොරව යාවත්කාලීන කිරීම ගිවිසුම් කාලය අවලංගු වී මාස 06 ක් ඉක්ම යන විටත් ප්‍රමාද වුවහොත් එම ගිවිසුම අවලංගු කිරීමේ හෝ අත්හිටුවීමේ හැකියාව පවතී. එසේ වුවද 2023 ජූනි 27 වනවිටත් ගිවිසුම යාවත්කාලීන කර නොතිබුණි. මෙම ගිවිසුම යටතේ පසුගිය වර්ෂ 06 තුළ ශ්‍රමිකයින් 20,667 දෙනෙකු රැකියා සඳහා යොමුකිරීමේ කටයුතු කාර්යාංශය විසින් සිදුකර තිබුණි.

(උ) හෝමාගම හා කහගොල්ලෙහි ඉඩම් බදු පදනම මත ලබා ගැනීම සඳහා අත්තිකාරම් ලෙස රු.46,000,000 ක් හා වෙනත් වියදම් සඳහා රු. 1,719,680 ක් වශයෙන් එකතුව රු.47,719,684 ක් වැය කර තිබුණද අදාල ඉඩම් නිෂ්කාර්යව පැවතීම හේතුවෙන් වෙනත් ආයතන විසින් එම ඉඩම් නැවත අත්පත් කර ගැනීමට කටයුතු කරමින් පැවතියද කාර්යාංශය විසින් ගෙවන ලද අත්තිකාරම් මුදල නැවත අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) තංගල්ල හා මතුගම විගමණික සම්පත් මධ්‍යස්ථානවල ගොඩනැගිලි ඉදිකිරීම සඳහා පිළිවෙළින් රු.302,112,904 ක් හා රු.153,686,495 ක් වැයකර තිබුණ ද ඉඩම්වල අයිතිය නීත්‍යානුකූලව පවරා ගැනීමට කාර්යාංශය අපොහොසත් වී තිබුණි.

(එ) අබුඩාබි තානාපති කාර්යාලයේ කම්කරු සුබසාධන අංශයේ කාර්යමණ්ඩල සාමාජිකයෙකු විසින් සිදුකරන ලද රු.1,149,258ක මුදල් අක්‍රමිකතාව සහ කාර්යාංශයේ කළමනාකරුවෙකු විසින් සිදු කරන ලද රු.3,638,368ක මුදල් අවභාවිතය සිදු කර සමාලෝචිත වර්ෂය අවසන් වන විට වසර 9 ක් ගත වී ඇතත් එය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඒ) ඕමාන් තානාපති කාර්යාලයේ කම්කරු සුභසාධන අංශයේ තුන්වන ලේකම් ලෙස කටයුතු කළ නිලධාරියා විසින් සිදු කරන ලද අක්‍රමිකතා හේතුවෙන් සේවය අත්හිටුවා 2022 නොවැම්බර් 29 දින ලංකාවට පැමිණීමෙන් පසුව සුදුසුකම් සපුරන ලද තුන්වන ලේකම්වරයෙකු 2023 ජූනි 20 දින දක්වා පත්කර නොතිබුණි. තවද එම තානාපති කාර්යාලයේ වෝදනාවලට ලක්වී සිටින සුරැකුම් නිවාස පාලිකාව විසින් සුරැකුම් නිවාසයට අදාළ ලිපිලේඛන නඩත්තු කර නොමැති බව 2023 ජනවාරි 31 දින තානාපතිතුමා විසින් සභාපති වෙත දන්වා තිබුණද ඒ වෙනුවට වෙනත් නිලධාරියෙකු පත්කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඔ) 2012 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාළව කාර්යාංශයේ විශේෂ විමර්ශන ඒකකයට ලැබෙන පැමිණිලි විමර්ශනයෙන් පසුව පැමිණිලිකරුවන් වෙත ගෙවීම සඳහා මුදල් වංචා කළ පුද්ගලයින්ගෙන් හා රැකියා නියෝජිත ආයතනවලින් අයකරගත් රු.21,649,779ක මුදලක් පැමිණිලිකරුවන් වෙත නොගෙවා කාර්යාංශ ගිණුමේ රඳවාගෙන තිබුණු අතර ඉන් වසර 2 ත් වසර 09 ත් අතර කාලයක සිට පැවත එන රු.20,079,603ක ශේෂයන් පැවතුණි. මෙම මුදල්

ලැබුණු බවට පැමිණිලිකරුවන් දැනුවත් කිරීමකින් තොරව පැමිණිලි කටයුතු අවසන් කර ලිපිගොනුව වසා දැමීම මෙයට හේතුව ලෙස විගණනයේදී අනාවරණය විය.

(ඕ) 2016 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා මියගිය විගමනික ශ්‍රමිකයින් 157 දෙනෙකු වෙත මරණ වන්දි වෙනුවෙන් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් ලැබී තිබූ රු.47,995,092ක් ඔවුන් වෙත ගෙවීම් නොකර ගෙවිය යුතු ලෙස සුබසාධක අරමුදලේ දක්වා තිබුණි. තවද, ගිණුම් අංශය හා සුභසාධන අංශය අතර සම්බන්ධීකරණයක් නොතිබීම හේතුවෙන් 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාළව ගිණුම් අංශය වෙත ලැබී තිබුණු ගිමිකම් ඉල්ලීම් 81ක් වෙනුවෙන් රු.22,539,765කට අදාළව නොරතුරු සුභසාධන අංශයේ නොතිබුණු අතර සුභසාධන අංශය වෙත ලැබී තිබුණු මරණ වන්දි 9ක් වෙනුවෙන් රු.4,282,435කට අදාළ නොරතුරු ගිණුම් අංශයේ නොතිබුණි.

(ක) සුරැකුම් නිවාස වලට ශ්‍රමිකයන් භාර ගන්නා අවස්ථාවේදී ඔවුන් සතු හා ඔවුන් සේවය කළ නිවැසියාගෙන් ලැබෙන මුදල් ආරක්ෂිත ගිණුමේ (Safe Account Deposit) තැන්පත් කර ලංකාවට පැමිණීමෙන් පසු එය ගෙවිය යුතු වුවත් 2022 දෙසැම්බර් 31 දිනට එසේ රු.81,728,897ක ශේෂයක් නොගෙවා එම ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ග) 2013 ජනවාරි 24 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ පරිදි ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය සමඟ ඒකාබද්ධව රටවිරුවෝ නිවාස ණය වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා වසර 05 කට අවබෝධතා ගිවිසුමක් අත්සන්කර කාර්යාංශය විසින් 2013 මාර්තු 08 දින සමෘද්ධි අධිකාරිය වෙත රු.100,000,000ක මුදලක් ගෙවා තිබූ අතර එම මුදල සමෘද්ධි අධිකාරිය නමින් ස්ථාවර තැන්පතුවක තැන්පත් කර තිබුණි. අවබෝධතා ගිවිසුමේ වලංගු කාලය 2018 මාර්තු 07 දිනෙන් අවසන් වී ඇතත් ව්‍යාපෘතියට අනුව ණය ලබා දීම පිළිබඳ නොරතුරු විගණනයට ඉදිරිපත් නොවූ අතර 2014 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම පොළී ආදායමක් ද ලැබී නොතිබුණි.

(ච) දකුණු කොරියාවේදී අනතුරකට ලක්වී සිටි ශ්‍රමිකයෙකු නැවත ලංකාවට ගෙන්වා ගැනීම සඳහා 2019 නොවැම්බර් 08 වන දින කාර්යාංශය වෙත තැන්පත් කරන ලද මුදලින් වැය නොවී ඉතිරිවී තිබූ රු.1,451,490ක් නැවත ඔවුන් වෙත ගෙවිය යුතු වුවද වසර 3ක් ඉකුත් වී තිබුණ ද එම මුදල ගෙවීමට කටයුතු කර නොතිබුණි.

ඩබ්ලිව්.ජී.ඒ.වික්‍රමරත්න

විගණකාධිපති

# විගණකාධිපති වාර්තාව පිළිබඳ සභාපතිතුමාගේ නිරීක්ෂණ

**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ 2022දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව(අවසන් වාර්තාව)**

| විගණකාධිපතිගේ වාර්තාව | කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම |
|---|---|
| **1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම** | |
| (අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 32 ඡේදය අනුව අස්තිත්වයක් විසින් ප්‍රමිතියක් මඟින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටක හැර වත්කම් සහ වගකීම් හිලව් නොකළ යුතු වුවත් 2022 දෙසැම්බර් 31 දිනට ජංගම ගිණුමේ පැවති රු.25,932,669ක අවාසි සහගත ශේෂය මුදල් හා මුදල් සමාන දෑවලින් අඩුකර දැක්වීම හේතුවෙන් මුදල් හා මුදල් සමාන දෑවල වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | 1650 ගිණුමේපවත්නාශේෂයපදනම්කරගනිමින්අරමුදල්කළමනාකරණ ගිණුමක් ලංකා බැංකුවේ පවත්වාගෙන යනු ලබන අතර මෙම ගිණුමේ අවාසි සහගත ශේෂයක් කිසිම අවස්ථාවක ඇති නොවන ආකාරයට අරමුදල් කළමනාකරණ ගිණුමේ ඇති ශේෂය මඟින් ආවරණය කරනු ලබයි.එකම ගිණුමේ පවත්නා අරමුදල් පදනම් කරගනිමින් අදාළ ශේෂය සෑදී ඇති බැවින් මුදල් හා මුදල් සමාන දෑ වල වටිනාකම අඩු කර දැක්වීමක් සිදු කර නොමැති අතර නිවැරදිව ගිණුම් තබා ඇත. |
| (ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 1 හි 60 ඡේදය ප්‍රකාරව ජංගම වත්කම් හා ජංගම නොවන වත්කම් වෙන්කර දැක්විය යුතු වුවද, 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු පොළී ආදායම රු.2,089,671,823 ක්හා ස්ථාවර තැන්පතු වටිනාකම රු. 21,038,312,191 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් හා ජංගම නොවන වත්කම් ලෙස වෙන්කර දැක්වීමකින් තොරව එකතුව රු. 23,127,984,014 ක ස්ථාවර තැන්පත් ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණි. | ලැබිය යුතු පොළී ආදායම මූල්‍ය වත්කම්හි කොටසක් වන අතර වෙනත් ලැබිය යුතු ආදායමක් නොවේ. එබැවින් පෙර සියලු වර්ෂයන්හි ද මේ ආකාරයට මූල්‍ය වත්කම්හි කොටසක් ලෙස ලැබිය යුතු පොළී ආදායම දක්වා ඇත. තවද ස්ථාවර තැන්පතු වටිනාකමේහි තැන්පතු කාල සීමාව වසරකට වඩා නොඉක්මවන බැවින් ශ්‍රී ලංකා ගිණුම්කරණ 1 හි 60 ඡේදය ප්‍රකාරව ජංගම වත්කම් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා ඇත. ඒ අනුව කාර්යාංශය විසින් නිවැරදිව ගිණුම් වල දැක්වීමක් සිදු කර ඇත. |
| (ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 28 ඡේදය ප්‍රකාරව විදේශ ව්‍යාවහාර මුදල්වල විනිමය අනුපාතයන්ගේ වෙනස්වීම නිසා පැන නගින උපලබ්ධි නොවූ හානි සහ වාසි, පමණක් මුදල් ප්‍රවාහයන් ලෙස හඳුනාගත යුතු නමුත්, කාර්යාංශය විසින් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහයන් ගණනය කිරීමේදී උපලබ්ධිවූ විදේශ විනිමය හුවමාරු ලාභයද ඇතුළත්ව | 2023 වර්ෂයේ දී විගණනය විසින් පෙන්වා දී ඇති නිරීක්ෂණ නිවැරදි කර මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කිරීමට කටයුතු කරනු ඇත. |

| | |
|---|---|
| සම්පූර්ණ විදේශ විනිමය හුවමාරු ලාභය **(exchange gain)** ලෙස රු.1,606,547,459ක් බදු පෙර ලාභයට ගලපා තිබුණි. | |
| (ඇ) මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහයේ කාරක ප්‍රාග්ධන වෙනස්වීම් ගැලපීමේදී මුල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙනත් ණයහිමියන් තුළ ඇතුළත් නොවූ රු. 209,375,755 ක් ගලපා තිබුණි. | 2023 වර්ෂයේ දී විගණනය විසින් පෙන්වා දී ඇති නිරීක්ෂණ නිවැරදි කර මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කිරීමට කටයුතු කරනු ඇත. |
| (ඉ) මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ආයෝජන මිලදී ගැනීම සහ විකිණීම, මුදල් ගලායාම් සහ මුදල් ගලා ඒම් ලෙස දැක්විය යුතු නමුත් ආයෝජනය කළ වර්ෂයේ ආරම්භක හා අවසාන ශේෂ අතර වෙනස දක්වා තිබුණි. | 2023 වර්ෂයේ දී විගණනය විසින් පෙන්වා දී ඇති නිරීක්ෂණ නිවැරදි කර මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කිරීමට කටයුතු කරනු ඇත. |
| (ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 12 හි 47 ඡේදය ප්‍රකාරව වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයේ බදු අනුපාතයට අනුව විලම්භීත බදු ගණනය නොකිරීම හේතුවෙන් මුල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ විලම්භීත බදු වත්කම් රු. 4,010,206 ක් අඩුවෙන් දක්වා තිබුණි. ඒ අනුව වර්ෂයට අදාළ ආදායම් බදු රු. 1,700,711,809 ක් වුවද ගණනය කළ බදු වටිනාකම රු. 1,704,722,015 ක් විය. | ප්‍රවර්තන වර්ෂයේ විලම්භීත බදු වත්කම / වගකීම් ගණනයේ දී 2022 වර්ෂයේ බදු අනුපාතයන් කිහිප වතාවක්ම වෙනස්වීම් හේතුවෙන් ආදායම් බදු ගණනය කළ ආකාරයටම මුල් අර්ධ වර්ෂයට 24%ක් හා අවසන් අර්ධ වර්ෂයට 30%ක් ලෙස බදු අනුපාතයව අනුව විලම්භීත බදු වත්කම ගණනය කොට ඇත. නමුත් LKAS 12 ප්‍රමිතියට අනුව වර්ෂ අවසන් බදු අනුපාතයට විලම්භීත බදු ගණනය කළ යුතු වේ. ඒ අනුව විලම්භීත බදු වත්කම් රු.4,010,206/- ක් අඩුවෙන් සටහන් වී ඇත. මෙය ප්‍රවර්ථන වර්ෂයේ බදු වෙන් කිරීම් දෝෂයක් වන අතර එය ඉදිරි වර්ෂයේ නිවැරදි කරනු ඇත.<br>විගණන විමසුමට විලම්භීත ආදායම් බදු නිදහස් වටිනාකම රු.26,932,469/- ලෙස පෙන්වා දී ඇතත් එය පහත පරිදි නිවැරදි විය යුතුය. |

| As per Note no.08 | Rs. |
|---|---|
| Deferred Tax on Actuarial (Loss/Gain) | 2,646,968.00 |
| Deferred Income Tax (release)/Charges | (22,922,264.00) |
| | (20,275,296.00) |
| Deferred tax adjustment as per audit query | (4,010,206.00) |
| Total differed tax as at 31.12.2022 | (24,285,502.00) |

තවදුරටත් විගණන විමසුමෙහි දක්වා ඇති පරිදි වර්ෂයේ ආදායම් බදු රු.1,700,711,809ක් ලෙස පෙන්නුම් කළත් එය පහත පරිදි නිවැරදි විය යුතුය.

| As per Note no.08 | Rs. |
|---|---|
| Current tax on profit for the year | 1,727,644,278.00 |
| Deferred Tax on Actuarial (Loss/Gain) | 2,646,968.00 |
| Deferred Income Tax (release)/Charges | (22,922,264.00) |
| | 1,707,368,982.00 |
| Deferred tax adjustment as per audit query | (4,010,206.00) |
| Corrected income tax for the year | 1,703,358,776.00 |

ඒ අනුව එහි වෙනස රු.4,010,206/= විය යුතුය.

සටහන් අංක 08ට අනුව ගණනය කරන ලද ආදායම් බදු වටිනාකම හා ආදායම් ප්‍රකාශනයේ පෙන්නුම් කරන ලද ආදායම් බදු වටිනාකම අතර රු.2,646,968/-ක වෙනසක් ඇති බව දක්වා ඇති අතර එය වෙනත් විස්තීරණ ආදායම් යටතේ සේවක ප්‍රතිලාභ පිළිබඳ ආයු ගණන (Deferred Tax on Actuarial) අනුව පෙන්වා ඇති අතර එය විගණනයේ දී සළකා බලා නොමැත.

| | |
|---|---|
| (උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 34 ඡේදය ප්‍රකාරව දේපළ, පිරියත හා උපකරණ අයිතම සඳහා සෑම වර්ෂ 03කට හෝ 05කට වරක් ප්‍රත්‍යාගණනයක් සිදු කළයුතු වුවත් කාර්යාංශය විසින් 2010 වර්ෂයෙන් පසු වත්කම් සම්බන්ධයෙන් ප්‍රත්‍යාගණනයක් සිදු කර නොතිබුණු බැවින් ස්ථාවර වත්කම්වල සාධාරණ අගය මූල්‍යප්‍රකාශන මගින් නිරූපනය නොකෙරුණි. | මෙම ප්‍රත්‍යාගණනය සඳහා රජයේ තක්සේරුකරුගේ සේවය ලබා ගැනීමට කටයුතු කළද එය සාර්ථක නොවූ බැවින් මේ වන විට බාහිර පැත්ශවයක් තෝරා ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු කර මෙම වර්ෂය තුළ නිම කිරීමට කටයුතු සිදු කරනු ලබන අතර මේ වන විට තාක්ෂණික ඇගයීම් කමිටුව මගින් ලංසු ඇගයීම සිදුකරගෙන යනු ලැබේ. |
| (ඌ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 51 ඡේදය ප්‍රකාරව වත්කම්වල අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය කර නොනිබීම හේතුවෙන් පිරිවැය රුපියල් මිලියන 1262.16 ක් වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ නමුත් තවදුරටත් භාවිතයට ගනිමින් පැවතිණි. ඒ අනුව වත්කම්වල ඵලදායී ජීව කාලය පිළිබඳව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 අනුව නැවත ප්‍රතිශෝධය කිරීමට කටයුතු කර නොතිබුණි. | කාර්යංශයටඅයත්වප්‍රධානකාර්යාලයභාශාඛාකාර්යාලවලවිශාලප්‍රමාණය ක්ස්ථාවරවත්කම්පවති.වත්කම්ප්‍රත්‍යාගණනයපිළිගත්ආයතනයක්මගින්සිදු කිරීමසඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර ප්‍රසම්පාදන කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතින අතර මේ වන විට තාක්ෂණික ඇගයීම් කමිටුව මගින් ලංසු ඇගයීම සිදුකරගෙන යනු ලැබේ. ඉහතපරිදිප්‍රත්‍යාගණනයෙන් පසුව අදාල ගිණුම්කරණ ගැළපුම් සිදු කරනු ඇත. |
| (එ) විගමණික ශ්‍රමිකයින් පුහුණු කර ලබා දෙනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් සහතික පත්‍ර (**NVQ**) මුද්‍රණය කිරීම වෙනුවෙන් 2017 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාල පරිච්ඡේදයට අදාළව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිසන් සභාව වෙත ගෙවිය යුත රු. 2,846,025 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ජාතික වෘත්තීය සුදුසුකම් සහතික පත්‍ර (**NVQ**) මුද්‍රණය කිරීම වෙනුවෙන් රු.1,501,875ක් තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව වෙත ගෙවිය යුතු බව එම ආයතනය විසින් කාර්යාංශය වෙත දන්වා ඇත්තේ 2023.05.04 දින වේ. අදාල දිනය වන විට අවසන් ගිණුම් පිළියෙල කර තිබූ බැවින් සහ ඉදිරිපත් කිරීමෙන් පසු ලැබූ තොරතුරක් බැවින් 2022 වර්ෂය සඳහා ගිණුමේ සටහන් තැබීමේ හැකියාවක් නොමැත. එය 2023 වර්ෂය සඳහා ගිණුම්ගත කිරීමට අවශ්ය කටයුතු සිදු කරනු ලැබේ. එබැවින් මෙය ගිණුම්කරණ අඩුපාඩුවක් නොවේ. ඒ අනුව කාර්යාංශය නිසි පරිදි ගිණුම් පවත්වාගෙන ඇත. |
| (ඒ) මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රඳවා ගැනීම් මුදල් ලෙස රු. 44,490,054 ක් දක්වා තිබුණද ප්‍රසම්පාදන අංශයේ ඇති උපලේඛන | 2011 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාර්යාංශය විසින් ඉදිකිරීම් කොන්ත්‍රාත් සම්බන්ධයෙන් රඳවා ගැනීමේ මුදල් ලෙස රු.44,490,054ක |

| | |
|---|---|
| අනුව එම ශේෂය රු. 3,172,467ක් රඳවා ගැනීමේ මුදල් රු 41,317,857 ක් වැඩියෙන් මුල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි. | ශේෂයක් ගිණුම් වල පෙන්නුම් කරනු ලබයි. කොන්ත්‍රාත් ගිවිසුම් ප්‍රකාරව මෙම මුදල නිවැරදි වන අතර රඳවා ගැනීමේ මුදල් නිදහස් කරනු ලබන්නේ අදාළ කොන්ත්‍රාත්තුවේ ගිවිසුමට අනුව කටයුතු කරන්නේ නම් පමණි. අදාළ ආයතන විසින් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර නොමැති බැවින් තවදුරටත් ගෙවිය යුතු ලෙස තබා ගත යුතු ශේෂය රු.18,142,998ක් ලෙස විගණනයේ සඳහන් කළ ද එය රු.3,172,467.38ක් ලෙස නිවැරදි විය යුතුය. ඉතිරි රු.41,317,586.62ක වටිනාකම 2023 වර්ෂයේදී ආදායමට ගැනීමට කටයුතු කරනුඇත. |
| (ඔ) කම්කරු සුභසාධන අරමුදලට හා කුවෙට් වන්දි අරමුදල් වලට අදාළ ස්ථාවර තැන්පතු කල් පිරිමේදී හා නැවත ආයෝජනය කිරිමේදී එදිනට පැවති විදේශ විනිමය අනුපාතයට අනුව විදේශ විනිමය හුවමාරු ලාභය හෝ අලාභය හඳුනා නොගැනිම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ විදේශ විනිමය හුවමාරු ලාභය රු. 5,581,297 ක් අඩුවෙන් දක්වා තිබීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණය අඩුවෙන් දක්වා තිබුණි. | කාර්යාංශය විසින් ගිණුම්ගත කර ඇති විදේශ විනිමය හුවමාරුලාභය නිවැරදි වේ. |
| (ඕ) විදේශ රැකියා නියෝජිත ආයතන සඳහා ගෙවිය යුතු ලෙස මුල්‍ය ප්‍රකාශන වල දක්වා තිබූ එකතු වටිනාකම රු. 379,748,580 ක් වූ ණයහිමි ශේෂයන් 1576 ක ශේෂ තහවුරු කිරිමට නොහැකි වී තිබුණි. | මේ වන විට 2022.12.31 දිනට ශේෂ තහවුරු කිරීමේ ලිපි යොමුකර ඇත. |
| (ක) මුල්‍ය තත්ත්ව ප්‍රකාශයේ සුභසාධක අරමුදලේ ගෙවිය යුතු ශේෂය තුළ දැනටමත් ගෙවා ඇති රු. 3,708,962 ක් නැවත ගෙන්වා ගැනීමේ තැන්පත්වල ඇතුළත් වීමෙන් උපචිත හා වෙනත් ගෙවිය යුතු ශේෂ එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | මෙම ශේෂයන් නිරවුල් කිරිමට සහ ගිණුම්කරණ දෝෂයන් නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවති. |
| (ග) 2020 වර්ෂයේ කුවේට් හි සේවය කළ විගමණිකයින් 14දෙනෙකුගේ ගුවන් ගමන් ගාස්තු ලෙස කාර්යාංශය විසින් දරණ ලද රු. 2,951,091ක මුදල 2021 වර්ෂයේදී ගල්ෆ් රක්ෂණ සමාගමෙන් ප්‍රතිපූර්ණය කිරිමේදි ඒකාබද්ධ අරමුලට | මේ වන විට නිවැරදිකර ඇත. |

| | |
|---|---|
| ගැලපීම වෙනුවට ගෙවිය යුතු ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි. | |
| (ඡ) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචිය ලබා විදේශගත වන ශ්‍රමිකයින් වෙනුවෙන් නොමිලේ ලබා දෙන රක්ෂාණාවරණය සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සමඟ එළඹ තිබූ ගිවිසුමේ 4 ඡේදය ප්‍රකාරව පරිපාලන වියදම් ලෙස සියයට 15 ක කොමිස් මුදලක් කාර්යාංශය වෙත ලැබිය යුතු වුවද 2022 වර්ෂය සඳහා ගෙවන ලද රු. 444,190,978 ක වාරික මුදලින් තවදුරටත් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් ලැබිය යුතු රු. 60,267,876 ක රක්ෂණ කොමිස් මුදල ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් වර්ෂයේ ආදායම හා ලැබිය යුතු ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව හා කාර්යංශය අතර ඇති ගිවිසුම් ප්‍රකාරව රක්ෂණ වාරික මුදලින් 15%ක කොමිස් මුදලක් රක්ෂණ සංස්ථාව විසින් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යංශයට පරිපාලන කටයුතු වෙනුවෙන් ගෙවීම් කරනු ලබයි. විගණනයෙන් පෙන්වා දෙන 2022 වර්ෂයට අදාළව ලැබිය යුතු කොමිස් මුදල රු.60,267,876 ලෙස දක්වා තිබුනද එම සංඛ්‍යාව රු 25,562,964.93 නිවැරදි විය යුතුය.ඒ පිළිබඳව ඔවුන් විසින් තහවුරු කරනු ලැබුයේ 2023.07.05 දිනය.ඒ දක්වා අදාල අගය පිළිබඳ නිශ්චිත තහවුරුවක් නොවූ බැවින් මූල්‍ය ප්‍රකාශනතුල ආදායමක් සහ ලැබිය යුතු ශේෂයක් ලෙස දැක්වීමක් සිදු කර නොමැත. එය එසේ දැක්වූයේ නම්, මෙම මුදලට ද බදු ගෙවීම් සිදුකල යුතුව පැවතුනි. එම නිසා නිශ්චිතව හඳුනානොගත් බැවින් ගිණුම්ගත කිරීමක් සිදුකර නොමැත. |
| (ට) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ වෙනත් ලැබිය යුතු යටතේ දක්වා ඇති විගමණික ශ්‍රමිකයින් වෙත ණය ලබා දීමේ අරමුණෙන් මහජන බැංකුවේ රු. 1,000,000 ක තැන්පතුව හා මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු ලෙස දක්වා තිබුණු රු. 869,955,802.00 කට අදාළ ශේෂ තහවුරු කිරීමට අදාළව ලිඛිත සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි. | විවිධ තැන්පතු වලට අදාල රු.1,000,000ක් මහජන බැංකුව නමින් 2011 වර්ෂයට පෙර සිටම ලැබිය යුතු ශේෂයක් ලෙස දක්වා ඇත. 2016 වර්ෂයේ දී කාර්යාංශය විසින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය අනුව රු.8,484,160.58 ක මහජන බැංකුව සතුව තිබූ හඳුනා නොගත් ශේෂයක් ආදායමට බැර කර ඇති අතර අදාල ශේෂය ඉහත දැක්වූ මුදලට අදාළ වන බව තහවුරු වේ. 2023.09.30 වන විට ගිණුම්ගතකර ඇත.<br>මෙම රු. 869,955,802.00 ක මුදල සම්බන්ධයෙන් 2023.08.22 දින සාමාන්‍යාධිකාරිගේ අත්සනින් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේනතුව වෙත ලිපියක් යොමු කර ඇත. |
| (ඩ) 2022 දෙසැම්බර් 08 වන දින පැවති පොදු ව්‍යාපාර කාරක සභාවේ නිර්දේශ පරිදි කම්කරු සුභසාධන අරමුදලේ ආදායම් හා වියදම් වෙනම හඳුනාගත හැකි පරිදි | 1985 අංක 21 දරණ කාර්යාංශ පනත අනුව නෛතික පුද්ගලයෙකු ලෙස කාර්යාංශය පිහිටුවා ඇත. පනතේ 17 වගන්තිය අනුව කාර්යාංශ |

| | |
|---|---|
| මුල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි. එමෙන්ම කාර්යාංශ මුල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් යටතේ සුභසාධන අරමුදලින් ලැබිය යුතු ලෙස දක්වා තිබූ රු. 1,512,657,528 කට අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | අරමුදලක් සහ 45 වගන්තිය අනුව කම්කරු සුභසාධන අරමුදලක් දක්වා ඇත. ගිණුම් තැබීමේ දී එක් නීතිමය පුද්ගලයෙකු සඳහා ඒකාබද්ධව එනම් කාර්යාංශය නමින් ගිණුම් පිළියෙල කරනු ලැබේ. එබැවින් කාර්යාංශයේ ගිණුම් තැබීම සඳහා එක් ලෙජරයක් පවත්වාගෙන යනු ලබයි. එය තුල කාර්යාංශ අරමුදලට සහ සුභසාධන අරමුදලට අදාලව ගිණුම් පවති. ඒ අනුව ඉහත ලෙජරය සඳහා පිළියෙල කළ හැකි වන්නේ එක් ශේෂ පිරිස්සුමක් වන අතර එය නිසිපරිදි තුලනය වේ. නමුත් කාර්යාංශ අරමුදල සඳහා ශේෂ පිරිස්සුමක් පිළියෙල කළ විට ශේෂ පිරික්සුමේ වෙනස ලෙස රු 1,512,657,528 /- ක හර ශේෂයක් පෙන්නුම් කරනු ලබයි. එලෙසම සුභසාධන අරමුදල සඳහා ශේෂ පිරික්සුමක් පිළියෙල කළ විට ශේෂ පිරික්සුමේ වෙනස ලෙස රු 1,512,657,528 /- ක බැර ශේෂයක් පෙන්නුම් කරනු ලබයි. විගණනයට අවශ්‍ය පරිදි ශේෂ පිරික්සුම් දෙකක් ලෙස වෙන වෙනම පිළියෙල කල ද කාර්යාංශය නඩත්තු කරන ලෙජර් ගිණුම් අනුව පිළියෙල කළ හැක්කේ එක් ශේෂ පිරික්සුමක් පමණි. මෙය ශේෂ පිරික්සුම් දෙකක් ලෙසින් පිළියෙල කළ විට මෙවැනි ශේෂයක් ඇති වීම වැලැක්වීය නොහැක. ඒකාබද්ධව පිළියෙල කළ විට තුලනය වන බැවින් එය සිහිවටන ගිණුම් ශේෂ සටහනක් ලෙස කාර්යාංශ අරමුදලට ලැබිය යුතු සහ සුභසාධන අරමුදලින් ගෙවිය යුතු මුදලක් ලෙස දක්වා ඇත. කාර්යාංශය ආරම්භයේ සිට සුභසාධන අරමුදල සඳහා අවශ්‍ය අවස්ථා වලදී කාර්යාංශ අරමුදල විසින් මුදල් ප්‍රේෂණය කර ඇති අතර සුභසාධන අරමුදල මඟින් කාර්යාංශය වෙත නොපියවා ඇති ශේෂය ලෙස ඉහත මුදල සැලකිය හැක. |

**2.** වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

| නීතිරීති / විධානයට යොමුව | නිරීක්ෂණ | |
|---|---|---|
| (අ) 1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත | පනතෙහි සඳහන් විධිවිධානයන්ට අනුකූල නොවන ලෙස කාර්යාංශය විසින් කාර්යාංශ අරමුදලට එක්රැස් විය යුතු ආදායම් කම්කරු සුභසාධන අරමුදලට එක්රැස් කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ එම ආදායම්වල එකතුව රු.3,494,022,254ක් වී තිබුණි. | |
| (i) 17 (2) වගන්තිය සහ 45 (2) වගන්තිය | | (i) මෙම ගිණුම් තැබීම සිදු කරනු ලබන්නේ කාර්යාංශ පනත හා 1998.06.03 දිනැති අංක 98/783/32/017 දරණ කැබිනට් මණ්ඩල අනුමැතිය අනුව සහ විදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් නිකුත් කරන ලද Accounting cir. No 01 OF 1999චක්‍රලේඛය අනුව වේ. |
| (ii) 17(3) වගන්තිය සහ (1) වගන්තිය | පනතෙහි සඳහන් විධිවිධානයන්ට අනුකූල නොවන ලෙස කාර්යාංශය විසින් කාර්යාංශ අරමුදලින් ගෙවියයුතු විදේශ දූත මණ්ඩලවල සේවය සඳහා අනුයුක්ත කරන ලද කාර්යාංශ කාර්යමණ්ඩලවලට අදාළ වැටුප් සහ වෙනත් දීමනා සඳහා සමාලෝචිත වර්ෂයේ එකතුව රු.684,351,761 ක් කම්කරු සුභසාධන අරමුදලෙන් වැය කර තිබුණි. | (ii) අදාළ චක්‍රලේඛයේ සඳහන් ප්‍රතිපාදන අනුව තව දුරටත් ගිණුම් තැබීම සිදු කළ යුතුද යන්න හෝ ඉන් ඉවත් විය යුතුද යන්න රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් විමසා ඇත. |
| ආ) 1971 අංක 38 දරන මුදල් පනත xi වන වගන්තිය හා 2021 නොවැම්බර් 16 දිනැති | (i) මුදල් අමාත්‍යවරයාගේ හා අදාළ අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගැනීමෙන් තොරව සමාලෝචිත | (ආ) කාර්යාංශ පනතේ 16 වන වගන්තිය අනුව අධ්‍යක්ෂ මණ්ඩල විසින් සභාපතිවරයාට පවරා ඇති මූල්‍ය බලය ප්‍රකාරව ස්ථාවර තැන්පතු ආයෝජනය සහ උපලබ්ධි කිරීම සිදු කල හැකිය. ඒ අනුව කාර්යාංශ ආරම්භයේ සිට රාජ්‍ය බැංකු සමඟ පමණක් අතිරික්ත මුදල් ආයෝජනය |

| | | |
|---|---|---|
| අංක 01/2021 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.1(ii) වගන්තිය | වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.21,038,312,191 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර ඇත. | සිදු කරනු ලබන අතර වර්තමානයේ දී තැන්පතු සඳහා කමිටුවක් පත් කර (Investment committee) අතිරික්ත මුදල් ආයෝජනය සිදු කරනු ලබයි. 2021.12.01 දින ආරම්භ කල අරමුදල් කළමනාකරන ඉතුරුම් ගිණුම හුදෙක් ජංගම ගිණුම් වල පවත්නා අතිරික්ත මුදල් තාවකාලිකව ප්‍රශස්ත මට්ටමින් තබා ගන්නා අතර කාර්යාංශට අමතර පොළි ආදායමක් එමගින් උත්පාදනයට සලස්වා ඇති ක්‍රමවේදයක් විනා මුදල් ආයෝජනය කිරීමක් නොවේ. |
| | (ii) 2022 ජනවාරි 01 දිනැති අංක 01/2022 දරණ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) ගේ අභ්‍යන්තර උපදෙස් පත්‍රිකාව අනුව අරමුදල් හුවමාරු කිරීම, ආපසු ගැනීම හා ස්ථාවර තැන්පතු වල ආයෝජනය කිරීම සඳහා සභාපති, සාමාන්‍යාධිකාරී හා අතිරේක සාමාන්‍යාධිකාරී වෙත මූල්‍ය බලතල පවරා ඇති නමුත් ඊට අදාළ සීමාවන් දක්වා නොතිබුණි. ඒ අනුව විගණනය විසින් සිදුකළ නියැදි පරීක්ෂාවට අනුව වරකට සිදු කරනු ලබන මුදල් හුවමාරු කිරීම් සහ ස්ථාවර තැන්පතු වල ආයෝජනය කිරීම් රු. මිලියන 10 | (ii)ජාතිකඉතිරිකිරීමේබැංකුවෙගිණුම්අංක 100800442461 දරණඉතිරිකිරීම්ගිණුමමගින් මුදල් එකතු කරනු ලබන අතර එය තුළින් ගෙවීම් කිසිවක් සිදු කරනු නොලබයි. ස්ථාවර තැන්පතු ආරම්භ කිරීම සහ, කාර්යාංශයේ මූල්‍යමය අවශ්‍යතා මත අවශ්‍ය වූ විට අනෙකුත් ජංගම ගිණුම් සඳහා මෙමඟින් මුදල් මාරු කර ගනු ලබන අතර ඒ සඳහා මූල්‍යමය බලතල සභාපතිවරයා වෙත කාර්යාංශ පනතෙහි 16 වන වගන්තිය ප්‍රකාරව අධ්‍යක්ෂක මණ්ඩලය විසින් බලය පවරා ඇත. ඉහත සියළුම අරමුදල් මාරු කිරීම් සභාපතිවරයාගේ අනුමැතිය මත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බලය පවරා ඇති ආකාරය අනුව සිදුකර ඇත. |

| | | |
|---|---|---|
| | සිට රු. මිලියන 250 දක්වා පරාසය තුළ ඉහළ අගයක් ගෙන ඇති බව නිරීක්ෂණය විය. | |
| (ඇ) 2008 දෙසැම්බර් 31 දිනැතිඅංක 30/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2021 ඔක්තොබර් 14 හා 2022 පෙබරවාරි 10 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු ලිපි | චක්‍රලේඛයට පටහැනිව 2022 වර්ෂයේ ගනු ලැබූ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත දීමනා ඇතුළත් දළ වැටුප මෙන් 12 ගුණයක් ආපදා ණය ලෙස ගෙවීමට කාර්යංශය විසින් කටයුතු කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී නිලධාරීන් 525 දෙනෙකු වෙත සීමාව ඉක්මවා එකතුව රු.67,673,231ක් ආපදා ණය ලෙස ගෙවා තිබුණි. තවද ක්ෂණික ණය ලෙස නිලධාරියකුගේ මසකට සමාන වැටුපක් සියයට 4.2 පොළි අනුපාතයක් යටතේනිලධාරීන් 107 දෙනෙකු සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු.3,826,900ක් ගෙවීම් කර තිබුණි. | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය 1994 අංක 04 හා 2009 අංක 56 දරණ පනත මගින් සංශෝධිත 1985 අංක 21 දරණ පනත මගින් සංස්ථාපනය කර ඇත.<br><br>එම පනතේ සඳහන් කාර්යාංශයේ පරමාර්ථ හා අරමුණු ඉටුකර ගනිමින් සේවක සුභසාධන ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරනු ලබන අතර, ඒ සඳහා පාර්ලිමේන්තුව මඟින් සම්මතකරන ලද කාර්යාංශ පනතේ 16(2) ඉ, ඊ හා උපවගන්ති ප්‍රකාරව ලැබී ඇති බලතල අනුව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත කාර්ය මණ්ඩලය වෙත 1995.05.01 දින සිට ආපදා ණය මුදල ලබාදීම සිදු කරනු ලබයි. මෙම සේවක ණය මුදල ලබාදීමේදී අයකර ගන්නා පොළී අනුපාතය පිළිබඳව 1999.08.02 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමැතිය ලබාගෙන ඇත.<br><br>2008.12.31වන දින නිකුත් කර ඇති 30/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත නිකුත් කර ඇති අතර රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල සඳහා උපදෙස් නිකුත් කර නොමැත.<br><br>එබැවින්, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය එපරිද්දෙන්ම රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල වලට අදාළ කර ගත හැකිද යන්න පිළිබඳ පැහැදිලි කිරීමක් ලබා දෙන ලෙස 2022.10.26 වන දින රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත ලිපියක් යොමු කර ඇති අතර මේ වන තෙක් ඒ සඳහා පිළිතුරක් ලැබී නොමැත. |

| | | |
|---|---|---|
| (ඇ) ආයතන සංග්‍රහයේ XLV(III)වැනි පරිච්ඡේදයේ 12 වන වගන්තිය | කාර්යාංශයේ සේවය කරමින් සිටි නිලධාරීන් දෙදෙනෙකුට විරුද්ධව විනය පරීක්ෂණය කෙරෙමින් පැවතියද ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට පටහැනිව විදේශ දූත මණ්ඩලවල පිහිටි සුභසාධක අංශයේ සේවය සඳහා ඩුබායි හා කුවේට් රටවල්හි පිළිවෙලින් උපදේශක හා පළමු ලේකම් තනතුරුසඳහා 2021 වර්ෂයේ බඳවා ගෙන තිබුණි. | ඒ අනුව ඉහත සඳහන් කළ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත කාර්ය මණ්ඩලය වෙත ආපදා ණය මුදල ලබා දීම සිදුකරනු ලබයි.<br><br>(ඇ) විදේශ දූත මණ්ඩල සඳහා වන කාර්යය මණ්ඩලය බඳවාගැනීම පිණිස අයදුම්පත් කැඳවීමෙන් අනතුරුව ඒ සඳහා අයදුම්කල නිලධාරීන් අතරින් කිසිවෙකු හෝ විනය චෝදනාවකට ලක්වී තිබේද යන්න පරීක්ෂා කරනු ලැබේ.<br>එහිදි එවැනි විනය චෝදනා පවතින බව අනාවරණය වන නිලධාරීන් එකී තනතුරු සඳහා අනුයුක්ත නොකරනු ලැබේ.<br>ඒ අනුව අදාල නිලධාරීන් දෙදෙනා දූතමණ්ඩල සේවය සඳහා අනුයුක්ත කරනු ලබන අවස්ථාව වනවිට ඔවුන්ට එරෙහිව කිසිදු විනය චෝදනාවක් නොපැවති බැවින් ඔවුන් දූත මණ්ඩල සේවය සඳහා අනුයුක්ත කරන ලදි. |
| (ඉ) 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මුල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, කාර්යාංශය විසින් දින 52 ක් ප්‍රමාද වී 2023 අප්‍රේල් 21 දින මුල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. | 2022 වර්ෂයේ අවසන් ගිණුම් පිළියෙල කර අවසන් වූ පසු පැවති ප්‍රථම අධ්‍යක්ෂක මණ්ඩල රැස්වීම පැවති 2023.04.06 දින මෙම ගිණුම් ඉදිරිපත් කළ අතර ඉන් අනතුරුව අවශ්‍ය ලිපි ලේඛන සමඟ 2023.04.21 දින රජයේ විගණන අංශය වෙත ඉදිරිපත් කර ඇත. |

| | | |
|---|---|---|
| 2.2.3<br>2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර කාර්යාංශයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව | | |
| **කාර්යාංශයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට යොමුව**<br>---------- | **අනුකූල නොවීම**<br>---------- | |
| (අ) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතෙහි 15 (අ), (ඔ),(ඕ) වගන්තිය . | තොරතුරු දත්ත බැංකුවක් පිහිටුවා සහ පවත්වාගෙනයාමට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි. | විදේශ රැකියා ක්ෂේත්‍රයට අදාළ වන පරිගණක වැඩසටහන් හා තොරතුරු සඳහා "තොරතුරු තාක්ෂණ" අංශය විසින් පවත්වා ගෙන යනු ලබන පරිගණක වැඩසටහන් දත්ත පද්ධතියක් යටතේ 1985 වර්ෂයේ සිට යාවත්කාලීන වෙමින් පවත්වා ගෙන යනු ලබයි.<br>කාර්යාංශ පනතේ අදාල වගන්ති ප්‍රකාරව විදේශ රැකියාවක් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත් වන ශ්‍රී ලාංකික විගමණික ශ්‍රමිකයින් කාර්යාංශ ලියාපදිංචිය ලබා ගැනීමෙන් පසු කාර්යාංශ පරිගණක පද්ධතියේ දත්ත ගොනුවලට ඇතුලත් කිරීමට අවශ්‍ය පරිගණක පහසුකම් කාර්යාංශයේ ප්‍රධාන කාර්යාලය , ශාඛා කාර්යාල, තානාපති කාර්යාල හා කොන්සියුලර් කාර්යාලවල පිහිටි කම්කරු අංශ සඳහා පූර්ණ පහසුකම් ලබා දී ඇත.<br>එමෙන්ම සේවය අවසන් කිරීමෙන් පසු නැවත මවුබිමට පැමිණෙන විගමනික ශ්‍රමිකයින්ගේ විස්තර ලබා ගැනීම සඳහා කාර්යාංශය හා ආගමන විගමන දෙපාර්තමේන්තුව අතර දත්ත හුවමාරු කර ගැනීමේ පරිගණක වැඩසටහනක් ක්‍රියාත්මක කෙරෙමින් පවතී.<br>මෙහිදි විගමණික ශ්‍රමිකයා ශ්‍රී ලංකාවෙන් පිටත් වූවාද යන්න, ඔහු පිටත් වූ ගුවන් යානා අංකය , දිනය , වේලාව හා ගමනාන්තයද නැවත පැමිණීමේදි ඔහු ගුවන් ගත වූ ගුවන් තොටුපල , ගුවන් යානා අංකය , පැමිණීමේ වේලාව හා දිනය දත්ත පද්ධතියට ඇතුලත් වේ. මෙම පද්ධතිය තවදුරටත් යාවත්කාලීන කිරීම සඳහා ආගමන විගමන දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් සිදු කර ඇති අතර ඒ සඳහා ආගමන විගමන දෙපාර්තමේන්තුවේ පරිගණක සේවා සම්බන්ධ වූ සේවා සපයනු ලබන ආයතනය වන Infomatic(Pvt) Ltd ආයතනය විසින් රුපියල් මිලියන 13.5 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර ඇත. මෙම ඇස්තමේන්තු ගත මුදල යාවත්කාලීන කරනු ලබන පද්ධතියේ ස්වභාවය අනුව පිළිගැනීමට |

නොහැකි බැවින් ඒ පිළිබඳව තවදුරටත් සාකච්ඡා පැවැත්වේ. මේ සඳහා මූල්‍ය පහසුකම් සපයන ලෙස IMO ආයතනය සමඟද සාකච්ඡා කෙරෙමින් පවතී.

තවද, මේ සම්බන්ධව ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ පාලකතුමාගේ ප්‍රධානත්වයෙන් 2023.10.13 වන දින රාජ්‍ය / පෞද්ගලික බැංකු හා රජයේ ආයතන මූලිකත්වයෙන් පැවති සාකච්ඡාවේදී ආගමන විගමන දෙපාර්තමේන්තුව සතු දත්ත නීත්‍යානුකූල ලෙස හුවමාරු කර ගැනීම ඉතාමත් කෙටි කාලයකදී ඉටුකිරීමට අවශ්‍ය පරිගණකමය පහසුකම් ලබාදීමට මේ වන විටත් කටයුතු ආරම්භ කර ඇති බව ප්‍රකාශ කර ඇත.

මෙම දත්ත හුවමාරුව 100% ක් ස්වයංක්‍රීයව සිදු කරන බැවින් පැමිණෙන විගමණික ශ්‍රමිකයින් විමසීමෙන් පසු යම් දත්තයක් ඇතුලත් කිරීමට මෙම පද්ධතිය තුලින් කළ නොහැක.

කෙසේ වෙතත් ආබාධිතවී පැමිණෙන විගමණික ශ්‍රමිකයින් සම්බන්ධයෙන් පහත ක්‍රියාමාර්ගය අනුගමනය කරනු ලබයි.

- එලෙස ආබාධිත වී පැමිණෙන විගමනික ශ්‍රමිකයින් නැවත පැමිණීමේ පර්යන්තයේ ස්ථාපිත කාර්යාංශ කවුළුව මගින් මෙහි අමුණා ඇති පෝරමය භාවිතයෙන් විස්තර ලබා ගනී.
- පසුව එම විගමණික ශ්‍රමිකයින්ගේ තත්වය අනුව ගුවන් තොටුපලේ වෛද්‍ය මධ්‍යස්ථානයට /මීගමුව රෝහල /වෙනත් සුදුසු රෝහලකට හෝ විගමණික ශ්‍රමිකයාගේ නිවසට යැමට පහසුකම් ලබා දේ.
- මෙහිදි විගමණික ශ්‍රමිකයාගේ ගමන් වියදම් ලබා දීම සිදු කරයි.

තවද

- ආබාධිත වී මව්බිමට පැමිණෙන විගමණික ශ්‍රමිකයින්ගේ තොරතුරු

ගුවන් තොටුපලට පැමිණීමේ පර්යන්තයේ ස්ථාපිත කාර්යාංශ ඒකකය මඟින් පෝරමයක් ආධාරයෙන් ලබා ගන්නා අතර, එහිදී එම තොරතුරු පරිගණක පද්ධතියට ඇතුළත් කරනු ලැබේ.

- කාර්යාංශයේ වලංගු ලියාපදිංචිය සහිත ආබාධිත වී මව්බිමට පැමිණෙන විගමණික ශ්‍රමිකයින් රක්ෂණය ලබා ගැනීම සඳහා ඉල්ලුම් කිරීමේදී එම දත්ත සුභසාධන අංශයේ රක්ෂණ හිමිකම් ලබා ගැනීම සඳහා වන පරිගණක පද්ධතියට ඇතුළත් කරනු ලැබේ.
- කාර්යාංශයේ ලියාපදිංචි වී වසර 05 ක් ඇතුළත ආබාධිත තත්ත්වයට පත් වී මව්බිමට පැමිණෙන විගමණික සේවකයින් සේවක සුභසාධන අරමුදල වෙත යොමු කරනු ලැබේ. එම තොරතුරු දත්ත ගොනුවක ඇතුළත් කරනු ලැබේ.

ආබාධිතව පැමිණෙන විගමනික ශ්‍රමිකයින්ගේ තොරතුරු කාර්යාංශය සතුව පවති.

(ආ)විදේශ රැකියා නියෝජිතායතනයක් අසාධු ලේඛන ගත කිරීම කාර්යාංශය මඟින් සිදු නොකෙරේ. කාර්යාංශය මඟින් සිදු කරන්නේ යම් විදේශ රැකියා නියෝජිතායතනයක අනුමැතින් අත්හිටුවීම පමණි. අනුමැතීන් අත්හිටුවීම තාවකාලික ක්‍රියාවකි. එය සිදුකරනු ලබන්නේ යම් විදේශ රැකියා නියෝජිතායතනයකට විරුද්ධව කාර්යාංශය වාර්තා වී ඇති පැමිණිලිවලට අදාළ ව පහත තත්වයන් සැළකිල්ලට ගැනීමෙනි.

1. යම් විදේශ රැකියා නියෝජිතායතනයකට විරුද්ධ ව වාර්තා වී ඇති පැමිණිලිවල මුළු මුලා වටිනාකම බැංකු ඇපකරයේ වටිනාකම ඉක්මවා ඇති අවස්ථාවක
2. සාධාරණ හේතු දැක්වීමකින් තොරව පැමිණිලි පරීක්ෂණ සඳහා බලපත්‍රලාභී සහභාගී නොවන අවස්ථාවක

| | | |
|---|---|---|
| (ආ) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතෙහි 31 (1)වගන්තිය | 2015 සිට 2022 වර්ෂය කාලපරිච්ඡේදය තුළදී බලපත්‍රලාභී නියෝජිතායතන 04 ක් අසාධු ලේඛන ගත කර තිබියදීත් එම නියෝජිතායතන වෙත පැමිණිලි 315 ක් ලැබී තිබුණදඑම නියෝජිතායතනහි බලපත්‍ර අවලංගු කිරීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි | 3. යම් පැමිණිල්ලකට අදාළව පැමිණිලි පරීක්ෂණයේ දී ඇති කර ගත් එකඟතාවයන්ට අනුව කටයුතු කිරීම පැහැරහරින අවස්ථාවක<br>ඉහත කරුණු එකක් හෝ කිහිපයක් හේතුවෙන් යම් විදේශ රැකියා නියෝජිතායතනයක අනුමැතීන් අත්හිටුවීම සිදු කෙරේ. එසේ කරනු ලබන්නේ පැමිණිලිකරුවන්ට සහනයක් සැළසීම සඳහා බලපත්‍රලාභී පෙළඹවීමේ අරමුණ ඇතිවය.<br>අනුමැතීන් අත්හිටුවීමෙන් පසුව බලපත්‍රලාභී ඉදිරිපත් වී පැමිණිල්ල/පැමිණිලි අවසන් කිරීමට කටයුතු කිරීමෙන් පසුව එම විදේශ රැකියා ආයතනයේ අනුමැතීන් නැවත සක්‍රීය කරනු ලැබේ.<br>යම් විදේශ රැකියා නියෝජිතායතනයක අනුමැතීන් අත්හිටුවීම සිදු කරනු ලබන්නේ එම විදේශ රැකියා නියෝජිතායතනයට විරුද්ධව වාර්තා වී ඇති පැමිණිල්ල/පැමිණිලි සම්බන්ධයෙන් සාර්ථක විමර්ශනයක් සිදු කිරීමෙන් පසුව එම පැමිණිල්ල/පැමිණිලි සඳහා එකී විදේශ රැකියා නියෝජිතායතනය සෘජුව ම වගකිවයුතු බවට කරුණු සනාථ වීමෙන් පසුවය.යම් විදේශ රැකියා නියෝජිතායතනයක අනුමැතීන් අත්හිටුවීමෙන් පසුව ද පැමිණිලි වාර්තා විය හැකිය. එම පැමිණිලි සම්බන්ධයෙන් අවසන් තීරණයක් ගනු ලබන්නේ එකී පැමිණිලි සම්බන්ධයෙන් සාර්ථක විමර්ශනයක් සිදු කිරීමෙන් පසුවය.<br>තවද, යම් විදේශ රැකියා ආයතනයක් විසින් බැංකු ඇපකරයේ වටිනාකම ද ඉක්මවා යන පරිදි මුදල් අයකොට විදේශ රැකියා ලබා නො දී වංචාවක් සිදු කරන බවට කරුණු අනාවරණය වන්නේ නම් අදාළ ආයතනයේ බැංකු ඇපකරය කාර්යාංශය භාරයට ගැනීම ද සිදු කරයි.<br>යම් බලපත්‍රලාභියෙකු විදේශ රැකියා ලබාදෙන බව පවසා මුදල් අයකොට යම් යුක්ති සහගත හේතුවක් නොමැති ව පොරොන්දු වූ විදේශ රැකියාව |

| | | |
|---|---|---|
| | | ලබා නො දී අයකර ගත් මුදල ආපසු නො දී සිටින්නේ නම් කාර්යාංශ පනතේ 64(අ) වගන්තිය ප්‍රකාර ව නඩු පැවරීම සිදු කරනු ලබයි. |
| (ඇ) 2020 ජනවාරි 14 දිනැති සභාපතිගේ 01/2020 චක්‍රලේඛය | (i) චක්‍රලේඛයකොන්දේසි පදනම් කරගෙන දූත මණ්ඩල සේවය සඳහා කාර්යාංශයේ කාර්යය මණ්ඩලයේඅයඳුම්පත් ප්‍රතික්ෂේප කර තිබුණු නමුත් චක්‍රලේඛකොන්දේසි සපුරා නොතිබූ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයෙක් ලෙස කටයුතු කළ කාර්යාංශයේ නිලධාරිණියක් ඩුබායි තානාපති කාර්යාලයේ කම්කරු සුභසාධන | (i) කරුණට අදාල නිලධාරිණිය දෙවන වර දූත මණ්ඩල සේවය සඳහා තෝරා ගනු ලැබුවේ 2018 වර්ෂයේදී පැවැත්වූ සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වීමෙන් අනතුරුවය. එම නිලධාරිණිය 2020 වර්ෂයේදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකාවක් ලෙස කටයුතු කර ඇතත් 2018 වර්ෂයේදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සාමාජිකාවක් ලෙස කටයුතු කර නොමැත.<br>2020 වර්ෂයේ මුල් භාගයේ සිට 2021 වර්ෂය අවසන් වන තෙක් පැවති කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් 2018 වර්ෂයේදීතේරීපත්වූඅදාළනිලධාරිණිය 2022.06.22 ලබාදීතිබූඅධ්‍යක්ෂකමණ්ඩලඅනුමැතියයටතේ විෂය භාර අමාත්‍යාවරයාගේ එකඟතාවය මත විදේශ දූත මණ්ඩල සේවය සඳහා අනුයුක්ත කෙරිණි. |
| | | (ii) සිංගප්පූරුවේ ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලයේ රැකියා හා සුභසාධන අංශයේ උපදේශක තනතුර සඳහා තෝරාගත් එන්.එම්.තිබ්බුටුමුණුව මහතා එම තනතුර සඳහා අනුයුක්ත කරන දින වන විට (පත්වීම් ලිපි දිනය 2021.05.21) ඔහුගේ අවම වයස් සීමාව සම්පූර්ණ කර තිබුණි. |

| | |
|---|---|
| අංශයේ උපදේශක තනතුර සඳහා පත්කර තිබුණි.<br>(ii) චක්‍රලේඛය අනුව ඉල්ලුම් කිරීමට අවශ්‍ය අවම වයස් සීමාව සම්පූර්ණ වී නොතිබීම හා අවශ්‍ය සුදුසුකම් සපුරා නොතිබුණුඅයදුම්කරුවෙකු සිංගප්පූරු තානාපති කාර්යාලයේසුභසාධක අංශයේ උපදේශක තනතුර සඳහා බඳවා ගෙන තිබුණි. | |
| 2.3 වෙනත් කරුණු<br>(අ) කම්කරු සුභසාධක අරමුදල මඟින් පූර්ණ ආබාධිත විගමණිකයින් සඳහා මිලියනයක්වටිනා නිවාසය බැගින් තනාදීම සඳහා 2019 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදය තුළ දී නිවාස 04ක් පමණක් ඉදිකිරීමට රු. 9,600,000 ක් වෙන් කර කටයුතු ආරම්භ කර තිබුණද 2022 දෙසැම්බර් 31 දින වන විට ඉන් නිවාස 03 ක වැඩ අවසන් කර නොතිබුණු අතර රු.2,222,650 ක් වැය කර තිබුණි. | • ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟින් නිවාස ඉදිකිරීමේ දී දිගින් දිගට වූ ප්‍රමාදවීම් සළකා එම නිවාස දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ අධීක්ෂණය යටතේ අදාළ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල වල තාක්ෂණික නිළධාරීන්ගේ සහයෝගය ඇතිව ඉදිකිරීමට ගත් පියවර අනුව පහත සඳහන් නිවාස 02ක් ඒ ඒ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල වල තාක්ෂණික නිළධාරී, සංවර්ධන නිළධාරී (විදේශරැකියා) සහ කාර්යාංශයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරුගේ ද අධික්ෂණය යටතේ සිදු කිරීමට කටයුතු කරන ලදී.<br>i. හිදෝගම, පහළ වැව, අඹගස්වැව, අංක 464 ලිපිනයේ ආබාධිත විගමනික ශ්‍රමික ටී.ඩබ්.නිලන්ති හේමමාලා මහත්මියගේ වෙනුවෙන් ඉදිකරන නිවස සඳහා නාච්චියාදුව ප්‍රා.ලේ කාර්යාලය සමග ඇති කර ගත් ගිවිසුමක් අනුව මේ වන විට ඒ ඒ අදියර අවසන් කල ආකාරය අනුව මුදල් නිදහස් කර තිබේ. කෙසේ වෙතත්, මෑත කාලීනව ගොඩනැගිලි හා කම්කරු කුලී ගාස්තු ඉහළයාම හේතුවෙන් |

ඇස්තමේන්තු කර ඇති පිරිවැය යටතේ ඉතිරි වැඩ කළ නොහැකි බව අදාළ ප්‍රතිලාභී කාන්තාව විසින් වාචිකව දන්වා ඇත. එබැවින් දැනට වැඩ නිම කර ඇති ඉදිකිරීම් ප්‍රමාණය හා නිම කිරීමට ඇති ප්‍රමාණය පිළිබඳව තක්සේරුවක් සිදු කර කඩිනමින් එම නිවසේ වැඩ නිම කිරීමට අපේක්ෂිතය.

ii. මොනරාගල, මාගන්දනමුල්ල, අංක 129/ඊ ලිපිනයේ ඉදිවන ආබාධිත විගමනික ශ්‍රමික කේ.එම්.කාන්තිරත්න මැණිකේ මහත්මිය වෙනුවෙන් ඉදිකරමින් පවතින නිවස සඳහා අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සමග ඇති කර ගත් එකඟතා ගිවිසුම් ප්‍රකාරව ඒ ඒ අදියර අවසන් කල ආකාරය අනුව මුදල් නිදහස් කර තිබේ. කෙසේ වෙතත්, මෑත කාලීනව ගොඩනැගිලි හා කම්කරු කුලී ගාස්තු ඉහළයාම හේතුවෙන් ඇස්තමේන්තු කර ඇති පිරිවැය යටතේ ඉතිරි වැඩ කළ නොහැකි බව අදාළ ප්‍රතිලාභී කාන්තාව විසින් වාචිකව දන්වා ඇත. එබැවින් දැනට වැඩ නිම කර ඇති ඉදිකිරීම් ප්‍රමාණය හා නිම කිරීමට ඇති ප්‍රමාණය පිළිබඳව තක්සේරුවක් සිදු කර කඩිනමින් එම නිවසේ වැඩ නිම කිරීමට අපේක්ෂිතය.

- සහන නිවාස ව්‍යාපෘතිය යටතේ නිවාස තැනීම සඳහා රාජ්‍ය ඉදිකිරීම් ආයතනය වූ නිවාස සංවර්ධන අධිකාරියේ සහය ඇතිව (ගිවිසුමට අනුව ) නිවාස 02ක් තැනීම ආරම්භ කරන ලදී.

i. තිස්සමහරාමය,එකමුතුගම, අංක 1165/1ඒ ලිපිනයේ පදිංචි ආබාධිත විගමනික ශ්‍රමික සුජීවා මල්කාන්ති මහත්මියගේ නිවස අර්ධ වශයෙන් බිත්ති නිම කර තිබූ නිවසක් වූ අතර එහි මිලියන 01 යටතේ ඉදිකර දිය හැකි කොටස් අදාළ වන පරිදි ඇස්තමේන්තුවක් ලබා ගන්නා ලදී. ඒ අනුව වහළයේ කොටසක්, කාමරයක් හා නාන කාමරය සාදා නිම

කිරීම සඳහා ලබාගත් ඇස්තමේන්තුව අනුව වහලය ඉදිකිරීමට ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ඉල්ලීම් කළ රු.822,655.60 ක මුදල ජාතික නිවාස සංවර්ධන අධිකාරි වෙත ලබා දී තිබේ. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මගින් එකී මුදලින් රු.200,000.00 මුදලක් වහලයේ වැඩ ආරම්භ කිරීම සඳහා මූලික වියදමක් ලෙස අදාළ විගමනික ශ්‍රමික මහත්මිය වෙත ලබා දී තිබේ.

එකී කාන්තාව හා පවුලේ අය අතර ඇති වූ ආරවුලක් මත වෙනත් පුරුෂයෙකුගේ නිවසක පදිංචියට ගොස් ඇති බැවින් එම මහත්මිය වෙත සඳහා යෝජනා කළ නිවස වැඩ නිම කිරීමට බාධාවක් වී ඇති බැවින් එම මුදල් එම මහත්මිය වෙත මුදල් නිදහස් කිරීම තාවකාලිකව නවතා ඇති අතර, ඉතිරි මුදල ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මගින් කාර්යාංශය වෙත නැවත ලබා ගැනීමට අපේක්ෂිතය.

ii. වැලිපැන්නගහමුල, හොරතැපොල, ආබාධිත විගමනික ශ්‍රමික ඒ ඒ ධම්මි විජයන්ති අමරසිංහ මහත්මිය සඳහා සහන නිවාස වැඩසටහන යටතේ කුරුණෑගල ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ දිස්ත්‍රික් කාර්යාලයේ අධීක්ෂණය යටතේ ඉදි කළ නිවස මේ වන විට සම්පූර්ණ වශයෙන් ඉදිකර වැඩ අවසන් කර ඇති අතර නිවාසලාභියාගේ ඉල්ලීම පරිදි එහි පදිංචි වීමට ද අනුමැතිය ලබා දී ඇත.කාර්යාංශයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව ආබාධිත විගමනික ශ්‍රමිකයින් සඳහා අවශ්‍යතාවය පරිදි ප්‍රයෝජනයට ගැනීම සඳහා මුදල් වෙන්කරනු ලැබේ.මෙම තොරතුරු ලබාගැනීම සඳහා

කාර්යාංශයේ,

- කටුනායක ගුවන්තොටුපල අංශය මගින් ද තොරතුරු
- ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් සංවර්ධන නිලධාරීන් මගින් ද

| | |
|---|---|
| | • කාර්යාංශයේ ප්‍රාදේශීය කාර්යාල නිලධාරීන් මගින් ද<br>• මහජනතාව දැනුවත් කිරීම මගින් ද<br>• කාර්යාංශ වෙබ් අඩවියේ මෙන්ම මුද්‍රිත පත්‍රිකාද මගින් ද සිදු කරයි. |
| **(ආ)** 1990 හා 1991 වර්ෂයන්හි ගල්ෆ් යුද්ධයෙන් රැකියා අහිමිවූවන්ට වන්දි ලබාදීම සඳහා එක්සත් ජාතීන්ගේ වන්දි කොමිසම ශ්‍රී ලංකාවට ලබාදී ඇති වන්දි අරමුදලෙහි, වන්දි ලබා දීම 1994 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කළ යුතු වුවද, 2022 දෙසැම්බර් 31 දින වන විට රු.251,453,848ක් වන්දි ලෙස 948 දෙනෙක් වෙත ගෙවිය යුතුව පැවතුණි. මෙම වන්දි අරමුදල ස්ථාවර තැන්පතු ලෙස ආයෝජනය කර 1997 සිට 2022 දක්වා රු.4,960,937,306ක ආදායම් උපයාගෙන ඇති අතර 2022 දෙසැම්බර් 31 වන විට, වන්දි අරමුදල රු.5,212,391,154ක් විය. කෙසේ වුවද 2022 දෙසැම්බර් 31 වන විටත් වන්දි ගෙවිය යුතු අය වෙත මෙම වන්දි ලබා දීමට කටයුතු කර නොතිබුණි. | 1990-1991 කුවේට් ඉරාක යුධ සමයේදී ආසන්න වශයෙන් ශ්‍රීලාංකිකයන් 120,000ක් පමණ කුවේටයේ සේවා නියුක්තව ඇති අතර රැකියා සහ දේපළ අහිමිව ආපදාවට ලක්විය. මෙම ආපදාවන්ට ලක් වූ අය සඳහා එක්සත් ජාතීන්ගේ වන්දි කොමිසම මගින් (UNCC) වන්දි හිමිකම් ඉල්ලීමට 1994.12.31 වන දින දක්වා අවස්ථාව ලබා දී තිබුණි. ඉහත දක්වා ඇති කාලය තුලදී වන්දි ඉල්ලීම් 94,820 ක් ලැබුනු අතර එක්සත් ජාතීන්ගේ වන්දි කොමිසම මගින් 88,875 ක් ඉල්ලීම් සඳහා වන්දි ගෙවීම් අනුමත කර ඇත.<br>ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් කුවේට් වන්දි පිළිබඳ කටයුතු මෙහෙයුම් සඳහා වෙනම අංශයක් (කුවේට් වන්දි අංශය නමින්) පිහිටුවා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයෙකුගේ අධීක්ෂණය යටතේ වන්දි ගෙවීම් කටයුතු සිදු කර ඇත. මෙහිදී එක්සත් ජාතීන්ගේ වන්දි කොමිසම මගින් ඇමරිකානු ඩොලර් මිලියන 308ක මුදලක් (රුපියල් මිලියන 20,900) වන්දි වශයෙන් අනුමත වී ඇත.<br>කාර්යාංශයේ වාර්තාවන්ට අනුව ඉල්ලීම් කළ වන්දිලාභීන් අතරින් ප්‍රමාණවත් පරිදි ලිපි ලේඛන ඉදිරිපත් කර වන්දි හිමිකම සනාථ කරන ලද 87,934 ක පිරිසක් සඳහා කාර්යාංශය විසින් ආදළ වන්දි මුදල් ගෙවීම් කර ඇත. තවදුරටත් ගෙවීම් සඳහා ඇත්තේ වන්දිලාභීන් 948 ක් පමණක් වන අතර ඔවුන් වෙනුවෙන් ගෙවිය යුතු වන්දි වටිනාකම රුපියල්මිලියන 251 කි. ඒ අනුව ඉදිරිපත් නොවූ වන්දිලාභීන් ප්‍රමාණය සමස්ථ අනුමත වූ සංඛ්‍යාවෙන් 1% ක් පමණ වන අතර සමස්ථ අනුමත වූ වන්දි මුදලින් |

2%ක් පමණවේ. අවස්ථා ගණනාවකදී කාර්යාංශය විසින් පුවත් පත් නිවේදන මගින් හා ලිපි මගින් වන්දි ඉල්ලීම් ලාභීන් දැනුවත් කලද රැකියා සඳහා යලි විදේශ ගත වීම, පදිංචිය වෙනස්වීම, ප්‍රමාණවත් ලිපිලේඛන ඉදිරිපත් නොකිරීම වැනි කරුණු මත මෙම පුද්ගලයන්ට වන්දි ලබා ගැනීමට නොහැකි වී ඇත.

වන්දි කොමිසමෙන් ලද මුදල ගෙවීම් කටයුතු ආරම්භ කරන තෙක් තාවකාලික තැන්පතුවල රඳවා තිබූ අතර එමගින් පොලී ආදායමක් උපයාගෙන අදාළ ගිණුම වෙත බැර කර ඇත. එක්සත් ජාතීන්ගේ වන්දි කොමිසම මගින් ප්‍රතික්ෂේපිත වූ වන්දි ඉල්ලුම්කරුවන් (5,945)වන්දි මුදල් ලබා දෙන ලෙස කාර්යාංශය වෙත නිරතුරුව ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. උපයාගත් පොලී මුදල් භාවිතා කර එම ඉල්ලුම්කරුවන් අතුරින් තොරතුරු සනාතකර ගත් 1692 ක් සඳහා (වන්දි ගෙවීමට) 2002.09.25 වන දින කැබිනට් අනුමැතිය මත වන්දි ගෙවීම් කර ඇත.

1994.12.31 වන දිනෙන් පසුව ලැබුනු අයදුම්පත් සහ ඉහත ආකාර දෙකටම ප්‍රතික්ෂේප වූ වන්දිලාභීන් සහ ඉල්ලීම් නොකල තැනැත්තන් හඳුනාගැනීම සඳහා 2002 වර්ෂයේදී කාර්යාංශය විසින් සමීක්ෂණයක් පවත්වා ඇති අතර එමගින් 15,500 දෙනෙකුගේ පමණ තොරතුරු රැස් කරගෙන ඇත. 2007 ජුලි 11 වන දින පැවැත්වුණු කැබිනට් මණ්ඩල රැස්වීමේදී උපයන ලද පොළියෙන් වන්දි ඉල්ලීම්වල නිවැරදිතාවය ඔප්පුකල හැකි එක් වන්දි ලාභියෙකු සඳහා රුපියල් 75,000 ක මුදලක් ගෙවීම සඳහා අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව වන්දි ඉල්ලුම්කරුවන් 5,472ප්‍රමාණයකට වන්දිලබා දීම සිදු කර ඇති අතර මේ වන විටද ඉදිරිපත් වන වන්දිලාභීන් සඳහා ගෙවීම් කටයුතු සිදු කරනු ලැබේ.

ඉහත ගිණුමෙහි 2022.12.31 වන දිනට රු.5,212,391,154 ක ශේෂයක්

| | |
|---|---|
| | පවතින අතර එය සෑදී ඇත්තේ පහත ආකාරයටයි.<br><br>රු.<br>ගෙවිය යුතු කුවේට් වන්දි (වන්දි ලාභීන් 948 සඳහා) - 251,453,848<br>1997 සිට 2022 දක්වා උපයන ලද පොළී ශේෂය - 4,960,937,306<br>---<br>2020.12.31 දිනට ශේෂය 5,212,391,154<br>ඉහත සඳහන් මුදල් කාර්යාංශය සතුව පැවතිය ද කාර්යාංශය ආදායමක් ලෙස හෝ කාර්යාංශයේ වියදම් මෙමඟින් දැරීමක් හෝ සිදු කර නොමැත. |
| (ඇ) කුවේට් වන්දි අරමුදලින් වන්දි ලබා ගැනීමට 2007 නොවැම්බර් 19 දින එක් විගමණික ශ්‍රමිකයෙකු විසින් ඉල්ලුම් කර, සියලු ලියකියවිලි වන්දි ගෙවීමේ නිර්දේශ කමිටුව මඟින් අනුමත වී තිබියදී හා 1991 වර්ෂයේ කුවේට් යුධ සමයෙහි කුවේට්හි සේවය කළ බවට තහවුරු කිරීමට සඳහා සාක්ෂිඉදිරිපත් කර තිබියදීත් වන්දි ලබා ගැනීමේ අයදුම්පත් ඉදිරිපත් කර තිබියදීත් වන්දි ලබා ගැනිමේ අයදුම්පත් ඉදිරිපත් කර සමාලෝචිත වර්ෂය වන විට වසර 15 ක් ගතවී ඇතත් මේ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි | 1990 -1991 කුවේට් ඉරාක යුධ සමයේ ආපදාවන්ට ලක් වූ අය සඳහා එක්සත් ජාතීන්ගේ වන්දි කොමිසම මගින් (UNCC) වන්දි හිමිකම් ඉල්ලීමට 1994.12.31 වන දින දක්වා අවස්ථාව ලබා දී තිබුණි. ඔබ විසින් දක්වා ඇති ශ්‍රමිකයා වන්දි ඉල්ලා ඇති කාලය අදාල කාල සීමාව තුලට අයත් නොවේ.<br>එක්සත් ජාතීන්ගේ වන්දි කොමිසම මගින් ප්‍රතික්ෂේපිත වූ වන්දි ඉල්ලුම්කරුවන් (5,945)වන්දි මුදල් ලබා දෙන ලෙස කාර්යාංශය වෙත නිරතුරුව ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. උපයාගත් පොළී මුදල් භාවිතා කර එම ඉල්ලුම්කරුවන් අතුරින් තොරතුරු සනාථ කරගත් 1692 ක් සඳහා වන්දි ගෙවීමට 2002.09.25 වන දින කැබිනට් අනුමැතිය මත ගෙවීම් කර ඇත. ඔබ විසින් දක්වා ඇති ශ්‍රමිකයා වන්දි ඉල්ලා ඇති කාලය අදාල කාල සීමාව තුලට ද අයත් නොවේ.<br>1994.12.31 වන දිනෙන් පසුව ලැබුනු අයදුම්පත් සහ ඉහත ආකාර දෙකටම ප්‍රතික්ෂේප වූ වන්දිලාභීන් සහ ඉල්ලීම් නොකල තැනැත්තන් හදුනාගැනීම සඳහා 2002 වර්ෂයේදී කාර්යාංශය විසින් සමීක්ෂණයක් පවත්වා ඇති අතර එමගින් 15,500 දෙනෙකුගේ පමණ තොරතුරු රැස් |

| | |
|---|---|
| | කරගෙන ඇත. 2007 ජූලි 11 වන දින පැවැත්වුණු කැබිනට් මණ්ඩල රැස්වීමේදී උපයන ලද පොළියෙන් වන්දි ඉල්ලීම්වල නිවැරදිකාවය ඔප්පුකල හැකි එක් වන්දි ලාභියෙකු සඳහා රුපියල් 75,000 ක මුදලක් ගෙවීම සඳහා අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව වන්දි ඉල්ලුම්කරුවන් 5,472ප්‍රමාණයකට වන්දි ලබා දීම සිදු කර ඇති අතර මේ වන විටද ඉදිරිපත් වන වන්දි ලාභීන් සඳහා ගෙවීම් කටයුතු සිදු කරනු ලැබේ. ඔබ විසින් දක්වා ඇති ශ්‍රමිකයා වන්දි ඉල්ලා ඇති කාලය අදාල කාල සීමාව තුලට ද අයත් නොවේ. එබැවින් එවැනි ඉල්ලීම් සඳහා මෙම අරමුදල මගින් ගෙවීම් කිරීමේ හැකියාවක් නොමැත. |
| (ඇ) කාර්යාංශය සතුව එකතුව රු.397,366,435ක් වටිනා ස්ථාවර තැන්පතු 07ක් බැංකු ඇපකර ලෙස තබා ගනිමින් නිවාස ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක වෙමින් පවතින බව සඳහන් කර තිබුණද එහි ප්‍රගතිය පිළිබඳව තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | වර්තමානයේ පවත්නා පොළී අනුපාතයන් ඉතා ඉහළ අගයෙන් යුක්ත වන බැවින් ණය ලබා ගැනීම් සීමා වී ඇති අතර ඉහත ඇපකර ලෙස තබාගත් ණය යෝජනා ක්‍රම වර්තමානයේ සක්‍රීය ව ක්‍රියාත්මක නොවේ. එබැවින් මහ බැංකුවේ නියෝජනයෙන් සහ වාණිජ බැංකුවල නියෝජිතයන්ගේ අදහස් ලබා ගැනීමෙන් නව ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා කැබිනට් මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. කුවේට් අරමුදල මගින් විගමණිකයින්ගේ සුභසාධනය උදෙසා වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන ලෙස පොදු ව්‍යාපාර කාරක සභාවේදී ලබා දුන් නිර්දේශවලට අනුගත වෙමින් ඉහත ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරණු ලැබේ.තවද අදාළ අරමුදල පිහිටුවීමේ අරමුණ සාක්ෂාත් කර ඇති බව ඉදිරිපත් නොවූ වන්දි ලාභීන් ප්‍රමාණය සමස්ථ අනුමත වූ සංඛ්‍යාවෙන් 1% ක් වීමෙන් සහ සමස්ථ නොගෙවූ ප්‍රමාණය අනුමත වූ වන්දි මුදලින් 2%ක් පමණ වීමෙන් තහවුරු වේ. |
| (ඉ) 2023 ජනවාරි 18 දින පැවැත්වූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේදීද | විදේශදූතමණ්ඩලසඳහාඅවශ්‍ය කාර්යය මණ්ඩලය බදවා ගැනීම පිණිස |

| | |
|---|---|
| විදේශ දූත මණ්ඩල සඳහා නිලධාරීන් තෝරා ගැනීමේ ක්‍රමවේදය පිළිබඳව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ උපදෙස් අනුව විධිමත් ක්‍රියාපටිපාටියක් සකස් කරන ලෙස නිර්දේශ ලබා දී තිබුණද 2023 ජනවාරි 17 දින අනුමත කර තිබූ ක්‍රියාපටිපාටියේ අඩුපාඩු පවතින බව සඳහන් කර කාර්යාංශය විසින් ප්‍රතික්ෂේප කර තිබුණි. | වන බඳවා ගැනීම් පටිපාටිය, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2023.01.17 දින අනුමත කර කාර්යාශය වෙත ලබා දී ඇත. කෙසේවුවදඑමබඳවාගැනීම්පටිපාටියයටතේඉල්ලුම්කිරීමටJM 1-2ශ්‍රේණියේ නිලධාරීන්ට අවස්ථාව අහිමි වී ඇති බැවින් ඒ පිළිබඳව සේවක විරෝධතාවයක් මතු වූ අතර එම ගැටළුව විසඳා ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත කිහිප අවස්ථාවක දී රේඛීය අමාත්‍යාංශය හරහා ලිපියොමු කර ඇත. එකී ගැටළුව නිරාකරණය වූ වහාම එම බඳවාගැනීම් පටිපාටිය යටතේ ඉදිරියේදී සිදු කරන බඳවා ගැනීම් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. |

| | |
|---|---|
| (ඊ) රැකියා බලපත්‍ර ක්‍රමය (Employment Permit System) යටතේ දකුණු කොරියාව වෙත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් යැවීමට අදාළව එරට රජය මැදිහත්ව අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුමෙහි කාලය 2019 සැප්තැම්බර් 29දිනෙන් අවසන්වී තිබුණු අතර එම ගිවිසුමට අනුව සාධාරණ හේතුවකින් තොරව යාවත්කාලීන කිරීම ගිවිසුම් කාලය අවලංගු වී මාස 06 ක් ඉක්ම යන විටත් ප්‍රමාද වුවහොත් එම ගිවිසුම අවලංගු කිරීමේ හෝ අත්හිටුවීමේ හැකියාව පවතී. එසේ වුවද 2023 ජූනි 27 වනවිටත් ගිවිසුම යාවත්කාලීන කර නොතිබුණි. මෙම ගිවිසුම යටතේ පසු ගිය 06 තුළ එකතුව 20,667ක් රැකියා සඳහා යොමු කිරීමේ කටයුතු කාර්යාංශය විසින් සිදු කර තිබුණි. | අමාත්‍ය මණ්ඩලයේ නිර්දේශ අනුව යාවත්කාලීන කරන ලද අවබෝධතා ගිවිසුම කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය විසින් 2023.03.02 දිනැතිව නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.<br><br>නීතිපතිතුමාගේ නිර්දේශ මේ වන විට ලැබී ඇති බැවින් අදාළ නිර්දේශ ද එකී ගිවිසුමට ඇතුලත් කරමින් කොරියානු පාර්ශවයේ එකඟතාවය ලබා ගැනීම සඳහා සංශෝධිත ගිවිසුම විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය විසින් යොමු කර ඇත. මෙහි වර්තමාන තත්ත්වය 2023.08.09 දින දුරකතනය ඔස්සේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ නීති අංශයෙන් විමසන ලද අතර සංශෝධිත ගිවිසුම නිර්දේශ කරමින් කොරියානු පාර්ශවය වෙත යොමු කිරීමට අදාළ අංශය වෙත 2023. 08.08 දින යොමු කළ බැව තහවුරු කරන ලදී.<br>කෙසේ වෙතත්, 2017.11.17 දිනැතිව අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුමේ වගන්ති අංක 17 ප්‍රකාරව නව ගිවිසුම අත්සන් කරන තෙක් දැනට අත්සන් කරන ලද ගිවිසුමේ වලංගු භාවය පවතින බැවින් රැකියා අභිමිවීම සම්බන්ධයෙන් ගැටළුවක් ඇති නොවේ. |
| (උ) හෝමාගම හා කහගොල්ලෙහි ඉඩම් බදු පදනම මත ලබා ගැනීම සඳහා අත්තිකාරම් ලෙස රු. 46,000,000 ක් හා වෙනත් වියදම් සඳහා රු. 1,719,680 ක් වශයෙන් එකතුව රු. 47,719,684 ක් වැය කර තිබුණද අදාළ ඉඩම් නිෂ්කාර්යව පැවතීම හේතුවෙන් වෙනත් ආයතන විසින් එම ඉඩම් නැවත අත්පත් කර ගැනීමට කටයුතු කරමින් පැවතියද කාර්යාංශය විසින් ගෙවන ලද අත්තිකාරම් මුදල නැවත අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හෝමාගම මාහේන්වත්ත ඉඩම2010 පෙබරවාරි 26 දින වසර 50ක කාලයකට බදු පදනම මත ලබාගෙන අදාළ දිනට ඇස්තමේන්තුගත බදු වටිනාකම වූ රුපියල් මිලියන 52න් රුපියල් මිලියන 26ක මුදලක් ගෙවා තිබුණු අතර පසුව එහි බදු වටිනාකම මිලියන 64 කි.<br>මේ වන තෙක් කාර්යාංශය විසින් එහි කිසිදු සංවර්ධන කටයුත්තක් සිදුකර නොමැති වීමට හේතු පහතින් දක්වා ඇත.<br>• මුදල් ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය විසින් අංක BD/CBP/01/01/03-2019න් යුතු අය වැය චක්‍රලේඛ අංක 07/2019හා |

2019/12/04 දිනැති චක්‍රලේඛ වලට අනුව ගොඩනැගිලි පහසුකම් ආදිය වෙනුවෙන් කෙරෙන වියදම් ඇතුළු සියලුම අත්‍යවශ්‍ය නොවන වියදම් කපා හැරීම.

- එසේම මුදල් අමාත්‍යාංශය චක්‍රලේඛ අංක BD/CBP/01/01/06-2020 යුතුව ජාතික අය වැය චක්‍රලේඛ 05/2020 හා 2020/09/03 දිනැති චක්‍රලේඛ අනුව රාජ්‍ය ආයතන සඳහා නව ගොඩනැගිලි ඉදිකිරීම වසර 02 කින් කල් දැමීමට කටයුතු කල යුතු බවට.
- රට තුළ පැවැති කොවිඩ් 19 වසංගත තත්ත්වය හා සංචරණ සීමා.
- කාර්යාංශයේ 2020 වර්ෂයේ පැවති අයහපත් මූල්‍යමය තත්ත්වය.

වැනි කරුණු නිසා කාර්යාංශයට මෙම ඉඩමේ සංවර්ධන කටයුත්තක් ආරම්භ කිරීමට නොහැකි වී ඇත.

නමුත් මේ වන විට කාර්යාංශයේ මූල්‍යමය තත්ත්වය යහපත් බැවින් හෝමාගම ඉඩමේ ඉදිකිරීම් සඳහා ව්‍යාපෘති යෝජනාව පරීක්ෂා කර තවදුරටත් විමසිය යුතු කරුණු පිළිබඳව 2023.06.07 දින අමාත්‍යාංශ ලේකම්තුමාගෙන් විමසා ඇත. ඒ අනුව, සංශෝධනය කරන ලද ව්‍යාපෘති යෝජනාව 2023.09.14 දිනැතිව අමාත්‍යාංශ ලේකම්තුමා වෙත යොමු කරන ලදි. නැවතත් අදාළ සංශෝධනයන් සිදුකර එම ව්‍යාපෘති යෝජනාව 2023.10.17 දින කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයට හා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත්කර ඇත.

මේ සම්බන්ධයෙන් 2023 මාර්තු 17 දින හෝමාගම පොලිසියේ පැමිණිල්ලක් ගොනු කර ඇති බව සත්‍ය වන අතර එම පැමිණිල්ල ගොනු කර ඇත්තේ අනවසර වැටක් ඉදිකිරීම සම්බන්ධයෙනි.

නාගරික සංවර්ධන අධිකාරියත් සමඟ 2023.05.04 වන දින සිදුකරන ලද සාකච්ඡාවේදී අදාළ ඉඩම විදුලි බල මණ්ඩලයට ලබාදීමට එකඟවිය

| | |
|---|---|
| | හැක්කේ එම ඉඩම් කොටස වෙනුවට බත්තරමුල්ල හෝ මාළඹේ අවටින් කාර්යාල පරිසරයක් සඳහා සුදුසු ඉඩම් කොටසක් වෙනස් වන බදු වටිනාකම් ගෙවීමට යටත්ව ලබාදීමට කටයුතු කිරීමෙන් අනතුරුව බව හෝමාගම පොලිස් ස්ථානාධිපතිතුමා වෙත සහ නාගරික සංවර්ධන අධිකාරිය වෙත දන්වා ඇත.<br>කහගොල්ල ඉඩම සඳහා අත්තිකාරම් ලෙස රුපියල් මිලියන 20ක් ගෙවීම්කර ඇති අතර භුක්තිය කාර්යාංශය සතුවේ. 2018/02/01 දිනැති ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ ලිපිය පරිදි මෙම ඉඩම තාවකාලිකව කොවිඩ් ප්‍රතිකාර මධ්‍යස්ථානයක් පිහිටු වීමට ශ්‍රී ලංකා යුධ හමුදාවේ 06 වන කාරක ඉංජිනේරු රෙජිමේන්තුව වෙත ලබාගෙන ඇති අතර ගෙවන ලද අත්තිකාරම් මුදල ඉඩම පවරා දීමට ප්‍රථම ප්‍රතිපූර්ණය කර ලබාදෙන ලෙස රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාව වෙත දන්වන ලෙස ලේකම්, විදුලි සංදේශ, විදේශ රැකියා හා ක්‍රීඩා අමාත්‍යාංශය වෙත 2019/03/01 දින දන්වා යවා ඇත. මේ වන විට අවස්ථා කිහිපයකදීම මෙම මුදල කාර්යාංශය වෙත ලබාදී ඉඩම පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කඩිනමින් සිදුකරන ලෙස දැනුම් දී ඇති අතර 2022.10.26 දිනැතිවදආරක්ෂක සේනා මූලස්ථානය වෙත දැනුම් දී ඇතත් මේ දක්වා අදාළ මුදල ලැබී නොමැත. |
| (ඌ) තංගල්ල හා මතුගම විගමණික සම්පත් මධ්‍යස්ථාන වල ගොඩනැගිලි ඉදිකිරීම සඳහා පිළිවෙලින් රු. 302,112,904 ක් හා රු. 153,686,495 ක් වැයකර තිබුණද ඉඩම්වල අයිතිය නීත්‍යානුකූලව පවරා ගැනීමට කාර්යාංශ අපොසත් වී තිබුණි. | තංගල්ල විගමණික සම්පත් මධ්‍යස්ථානය පිහිටා ඇති ඉඩම සඳහා අදාළ මිනුම් කටයුතු සිදුකර එහි පිඹුර සකසා 2023.10.04 වන දින හම්බන්තොට ප්‍රාදේශීය දිස්ත්‍රික් මිනින්දෝරු අධිකාරිය වෙත භාරදී ඇත.<br>මතුගම විගමණික සම්පත් මධ්‍යස්ථානය ඉදිකර ඇති ඉඩම රජයේ ඉඩමක් වන අතර එය මතුගම ප්‍රාදේශීය ලේකම් විසින් කාර්යාංශය වෙත රජයේ දෙපාර්තමේන්තුවලටඉඩම් ලබාදීම පිළිබඳ සහතිකයක් මගින් |

| | |
|---|---|
| | පවරා ඇත. |
| (එ) අබුඩාබි තානාපති කාර්යාලයේ කම්කරු සුභසාධන අංශයේකාර්ය මණ්ඩල සාමාජිකයෙකු විසින් සිදුකරන ලද රු.1,149,258ක මුදල් අක්‍රමිකතාව සහ | අබුඩාබි හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ රැකියා හා සුභසාධන අංශයේ සේවය කල කාර්යය මණ්ඩල සාමාජිකයෙකු විසින් සිදු කරන ලද මුදල් අක්‍රමිකතාවයක් සම්බන්ධයෙන් අදාල අයට විරුද්ධව අධි චෝදනා පත්‍ර සකස් කර එම ගොනුව කොළඹ මහේස්ත්‍රාත් අධිකරණය වෙත යොමු කර ඇත.<br>මෙම ගොනුවට අදාලව රජයේ නීතිඥ ලක්මිණි ගිරිහාගම මහත්මිය සමග 2023.07.20 වන දින කරන ලද සාකච්ඡා වලට අනුව ප්‍රියංකර මනෝජ් බණ්ඩාර සහ එච්. කේ. ආර්. නිශාමනි සිල්වා යන අයට විරුද්ධව අධිචෝදනා පත්‍ර සකස් කිරීමෙන් පසු එය කොළඹ මහාධිකරණයේ අංක 01 වෙත යොමු කර ඇති බව හා එයට අදාල නඩු අංකයක් නොලැබුණු බව මෙම සිද්ධියට අදාලව කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ අංක B/1977/15 යටතේ කරණු වාර්තා කර ඇති අතර එහිදී අනාවරණය වී ඇති පරිදි අංක 39/3, වෙඩිකන්ද, රත්මලාන ලිපිනයේ පදිංචි එච්.කේ. ආර්. නිශාමනි සිල්වා යන සැකකාරිය 2019.09.05 වන දින ඩුබායි බලා විදේශ ගත වී ඇති බවත් මෙතෙක් දිවයිනට පැමිණ නොමැති බවට ආගමන විගමන දෙපාර්තමේන්තුව වාර්තා කර ඇත.<br>අනෙක් සැකකරු වන ප්‍රියංකර මනෝජ් බණ්ඩාර යන අය 2021.10.28 වන දින කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුව කැඳවූ අවස්ථාවේදී විත්තියේ නීතීඥ කරණු සලකා බලා සැකකරු ඇප මත මුදා හැර ඇත.<br>ප්‍රියංකර මනෝජ් බණ්ඩාර යන අයගේ විදේශ ගතවීම N2966004 යටතේ තහනම් කර ඇති බවටත් වැඩිදුරටත් කරුණු දන්වා ඇත.<br>එච්. කේ. ආර්. නිශාමනි සිල්වා යන අය අත්අඩංගුවට ගැනීමෙන් අනතුරුව කරන ලද ප්‍රකාශද සමග රජයේ නීතීඥවරයා වෙත කරුණු |

| | |
|---|---|
| කාර්යාංශයේ කළමනාකරුවෙකු විසින් සිදු කරන ලද රු.3,638,368ක් මුදල් අවභාවිතය සිදු කර වසර 9 ක් ගත වී ඇතත් මෙතෙක් එය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරිපත් කරන ලෙස අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත උපදෙස් ලබා දී ඇති බවට රජයේ නීතීඥවරිය වැඩි දුරටත් දන්වා ඇත.<br>**කාර්යාංශයේකළමනාකරුවෙකුවිසින්සිදුකරනලදරු.3,638,368ක්මුදල්අවභාවිතය**<br>1. එස්. සුරේෂ් කුමාර් මහතාට විරුද්ධව පැවති විධිමත් විනය පරීක්ෂණය අවසන් වීමෙන් පසු කාර්යාංශයේ විනය බලධාරී විසින් එකී පරීක්ෂණ වාර්තාවේ නිර්දේශ සැලකිල්ලට ගනිමින් 2022.01.10 දිනැති ලිපිය මගින් එම මහතා කාර්යාංශ සේවයෙන් පහ කර ඇත.<br>2. 2022.01.10දිනැති ලිපිය මඟින් කාර්යාංශ සේවයෙන් පහ කර ඇති සුරේෂ් කුමාර් මහතාගෙන් කාර්යාංශයට පහත සඳහන් පරිදි මුදල් අයවීමට තිබිණි.<br>ආපදා ණය - රු. 278,762.00<br>වාහන ණය - රු. 40,000.00<br>වැටුප් රහිත නිවාඩු 2 ½ ක් වෙනුවෙන් - රු. 4569.02<br>දුරකථන බිල්පත් වෙනුවෙන් අයවිය යුතු මුදල - රු. 552.08<br>නිරවුල් නොකළ අත්තිකාරම්<br>2015.01.01 – 03/W/15 - රු. 2,236,000.00<br>2015.01.07 – 08/W/15 - රු. 1,726,350.00<br>**මුළු මුදල - රු. 4,286,233.10**<br>==========<br>3.සුරේෂ් කුමාර් මහතා විසින් නිරවුල් නොකළ අත්තිකාරමින් රු. 647,865/- ක මුදලක් ඔහුට හිමි පාරිතෝෂික දීමනාවෙන් අඩුකර ගැනීමට කටයුතු කරන ලදී.<br>ඒ අනුව, මොහුගෙන් තවදුරටත් රු. 3,638,368.10 ක මුදලක් අයවීමට ඇති බැවින් එම මුදල අයකර ගැනීම සඳහා නීතිමය පියවර ගැනීමට 2023.02.23 වන දින නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර, ඒ |

| | |
|---|---|
| | සම්බන්ධයෙන් අදාළ නීතිමය පියවර ගනිමින් සිටියි. |
| (ඒ) ඕමාන් තානාපති කාර්යාලයේ කම්කරු සුභසාධන අංශයේ තුන්වන ලේකම් ලෙස කටයුතු කළ නිලධාරියා විසින් සිදු කරන ලද අක්‍රමිකතා හේතුවෙන් සේවය අත්හිටුවා 2022 නොවැම්බර් 29දින ලංකාවට පැමිණීමෙන් පසුව සුදුසුකම් සපුරන ලද තුන්වන ලේකම්වරයෙකු 2023 ජුනි 20 දින දක්වා පත්කර නොතිබුණි.<br>තවද එම තානාපති කාර්යාලයේ චෝදනාවලට ලක්වී සිටින සුරැකුම් නිවාස පාලිකාව විසින් සුරැකුම් නිවාසයට අදාළ ලිපිලේඛන නඩත්තු කර නොමැති බව 2023 ජනවාරි 31 දින තානාපතිතුමා විසින් සභාපති වෙත දන්වා කිබුණද ඒ වෙනුවෙන් වෙනත් නිලධාරියෙකු පත් කිරීමට කඩිනමින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඕමාන්හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ රැකියා හා සුභසාධන අංශයේ සේවයේ නියුතුව සිටි තෙවන ලේකම් වරයා නැවත ශ්‍රී ලංකාවට ගෙන්වීමෙන් අනතුරුව එම තානාපති කාර්යාලයේ රාජ්‍ය තාන්ත්‍රික මට්ටමේ පුරප්පාඩු ලෙස පැවැති උපදේශක තනතුර සඳහා 2023.06.17 දින කාර්යාංශ නිලධාරිණියක් පත්කර යවා ඇත.<br>එමෙන්ම චෝදනාවලට ලක්වී සිටින සුරක්ෂා නිවාස පාලිකා නිලධාරිනිය කාර්යාංශයේ ක්‍රියාත්මක වන අනුමත බඳවාගැනීම් පටිපාටියෙහි ඇතුලත් සුදුසුකම් අනුව 2020 වර්ෂයේදී පැවැත් වූ සම්මුඛ පරීක්ෂණය මඟින් බඳවාගෙන ඇත.තවද එම චෝදනා අනුව ඇයව ආපසු ශ්‍රී ලංකාවට ගෙන්වීමට තානාපතිතුමාගේ නිර්දේශය ලැබීමෙන් පසු 2022.12.19 දින එම නිලධාරිණිය වෙනුවට අනුප්‍රාප්තික නිලධාරිණියක් පත් කර යැවීම සඳහා නාම යෝජනා රේඛීයඅමාත්‍යාංශය හරහා විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. නාමයෝජනායොමු කිරීමෙන් අනතුරුව පොලිස් නිශ්කාශන වාර්තා, වෛද්‍ය වාර්තා හා වීසා බලපත්‍ර ලබා ගැනීම වැනි මූලික රාජකාරී කටයුතු සඳහා ඒවා නිකුත් කරන ආයතන විසින් සැලකිය යුතු කාලයක් ගත වී ඇත.<br>කෙසේවෙතත් එම නිලධාරිණිය වෙනුවට නව සුරක්ෂා පාලිකා නිලධාරිණියක් 2023.07.01 දින ඕමාන් ශ්‍රී ලංකා තානාපති කාර්යාලය වෙත පිටත්කර යවා ඇත. |
| (ඔ)2012 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාළව කාර්යාංශයේ විශේෂ විමර්ශන ඒකකයට ලැබෙන පැමිණිලි විමර්ශනයෙන් පසුව පැමිණිලිකරුවන් වෙත ගෙවීම සඳහා මුදල් වංචා කළ පුද්ගලයින්ගෙන් හා | 2012 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලපරිවේදයට ආදාලව 2023.06.30 දින වන විට පවත්නා ශේෂය රු.21,943,935ක් වේ. මෙම මුදල් අදාළ පැමිණිලිකරුවන්ගේ පැමිණිලි නිරාකරණය වූ පසු ගෙවිය |

| | |
|---|---|
| රැකියා නියෝජිත ආයතනවලින් අයකරගත් රු.21,649,779ක මුදලක් පැමිණිලිකරුවන් වෙත නොගෙවා කාර්යාංශ ගිණුමේ රඳවාගෙන තිබුණු අතර ඉන් වසර 2 ත් වසර 09 ත් අතර කාලයක සිට පැවත එන රු.20,079,603ක් ශේෂයන් පැවතුණි. මෙම මුදල් ලැබුණු බවට පැමිණිලිකරුවන් දැනුවත් කිරීමකින් තොරව පැමිණිලි කටයුතු අවසන් කර ලිපිගොනුව වසා දැමීම මෙයට හේතුව ලෙස විගණනයේදී අනාවරණය විය. | යුතු ශේෂයක් ලෙස ගිණුම් තබා ඇත. ඉහත ශේෂයන් අතුරින් 2018 වර්ෂය දක්වා නිරාකරනය නොවූ ශේෂයන් 2023 වර්ෂයේ ආදායමට ගැනීමට අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඇත. ඉහත අනුමැතිය ලබා දී ඇත්තේ අදාල ශේෂයන් ගෙවීම් කිරීම සඳහා කිසියම් ඉල්ලීමක් කළහොත් ලේඛන පරීක්ෂා කර බලා නිරවද්‍යතාවය තහවුරු කර ගනිමින් ගෙවීමේ පදනම මතයි. නමුත් එම ශේෂයන් මේ වන විට වෙනස්වී ඇති බැවින් (Exchange rate running through the software/තවදුරටත් ශේෂයන්හි තිබූ සාක්ෂි අනුව නිවැරදි කල) නැවත සභාපතිඅනුමැතිය ලබාගැනීමට කටයුතු සිදුකරමින් පවතී.<br>අනෙකුත් ශේෂයන් නිරවුල් කිරීමට විමර්ශන අංශය සමඟ තවදුරටත් අදාළ ශේෂයන් තහවුරු කිරීම සඳහා කාල විශ්ලේෂණයක් සිදුකරමින් පවති. |
| (ඕ) 2016 වර්ෂයේසිට 2022 වර්ෂයදක්වාමියගියවිගමණිකශ්‍රමිකයින් 157ක්වෙතමරණවන්දිවෙනුවෙන් ශ්‍රීලංකාරක්ෂණසංස්ථාවෙන්ලැබීතිබූරු.47,995,092ක්ඔවුන්වෙතගෙවීම් නොකර ගෙවිය යුතු ලෙස සුභසාධන අරමුදලේ දක්වා තිබුණි. තවද ගිණුම් අංශය සහ සුභසාධන අංශය අතර සම්බන්ධීකරණයක් නොතිබීම හේතුවෙන් 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාළව ගිණුම් අංශ වෙත ලැබී තිබුණු හිමිකම් ඉල්ලිම් 81ක් රු.22,539,765කට අදාළව තොරතුරු සුභසාධන අංශයේ නොතිබුණු අතර සුභසාධන අංශය වෙත ලැබී තිබුණු මරණ වන්දි 9ක් වෙනුවෙන් රු.4,282,435කට අදාළ තොරතුරු ගිණුම් අංශයේ නොතිබුණි. | 2016 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා ලිපිගොනු 157 ක් පිළිබඳව එමවිගණනවාර්තාවෙහි තොරතුරු දක්වා ඇතත් එහි නිවැරදි සංඛ්‍යාව හිමිකම් 146ක් හා එහි වටිනාකම රු.44,541,837.90ක් විය යුතු වේ.අදාළ හිමිකම් පිළිබඳව වර්තමාන තත්වය ඇතුළත් කර 2023.08.28 දින දක්වා සකස් කරන ලද සංක්ෂිප්ත වාර්තාව මේ සමඟ අමුණා ඇත. **(ඇමුණුම 01)** එහි පහත කරුණු අඩංගු වේ.<br>• ප්‍රතිලාභීන් වෙත ගෙවා ඇති හිමිකම් පිළිබඳව 06 වන තීරුවේ දක්වා ඇත.<br>• කාර්යාංශ ගිණුමට බැර විය යුතු මුදල් පිළිබඳව 07 වන තීරුවේ දක්වා ඇත.<br>• නීත්‍යානුකූල හිමිකරුවන් සොයාගත නොහැකි මරණ වන්දි හිමිකම් 13 ක් සඳහා 2023.08.27 දින පුවත්පත් දැන්වීම් පළ කරන ලද හිමිකම් |

පිළිබඳව 08 වන තීරුවේ දක්වා ඇත.

- වෙනත් නමක් යටතේ සකස් කළ විදේශ ගමන් බලපත්‍රයකින් විදේශ ගත වී ඇති බව නිරීක්ෂණය වී ඇති හිමිකම් 04 ක් පිළිබඳව 09 වන තීරුවේ දක්වා ඇති අතර, ඉහත පුවත් පත් දැන්වීමෙහි එම හිමිකම් 04 දඇතුළත් කර ඇත.
- ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි පුද්ගලික සමාගම සතුව පවතින හිමිකම් 21 ක් ද ඉහත පුවත් පත් දැන්වීම සඳහා ඇතුළත් කර ඇත.
- හිමිකම් සඳහා ඉදිරිපත් කළ යුතු ලේඛන ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇති පුද්ගලයින්ට අදාළ වන්දි පිළිබඳව 10 වන තීරුවේ දක්වා ඇත.

එම හිමිකම් සම්බන්ධව ගෙන ඇති ක්‍රියාමාර්ගයන් පහත පරිදි වේ.

අදාළ නීත්‍යානුකූල උරුමකරුවන් සොයා ගත නොහැකි මරණ වන්දි හිමිකම් 38 ක් සඳහා උරුමකරුවන් සොයා ගැනීම සඳහා පුවත්පත් දැන්වීමක් සිංහල හා දෙමළ මාධ්‍යයෙන් (2023.08.27 දින) සති අන්ත පුවත්පත් වල (ලංකාදීප හා වීරකේසරී) පළ කර ඇත.

- උරුමකරුවන් සිටින නමුත් හිමිකම් ලබා දීම සඳහා නීත්‍යානුකූලභාවය තහවුරු කර ගැනීමට නොහැකිව පැවති ලිපිගොනු නැවත පරීක්ෂා කර නීති උපදෙස් ලබා ගැනීම සඳහා නීති අංශයට යොමු කරන ලද අතර, නීති උපදෙස් පරිදි උරුමකරුගේ නීත්‍යානුකූලභාවය පිළිබඳව තහවුරු කර ගැනීම සඳහා දිසා අධිකරණයේ විශේෂ නඩු පවරා අදාළ නඩු තීන්දුව ගොණුව වෙත ලබා දීමට කටයුතු කරන ලෙස ලියාපදිංචි තැපෑල මගින් අදාළ පාර්ශවයන් වෙත ලිපි යොමු කර ඇත.
- කාර්යාංශයට අය විය යුතු බවට තහවුරු කරගෙන ඇති මුදල් කාර්යාංශ ගිණුමට බැර කර ගැනීමට කටයුතු කර ඇත.

| | |
|---|---|
| | • ඉහත සඳහන් සියළු ක්‍රියාමාර්ග ගැනීමෙන් පසුව ගෙවීමට නොහැකි (2009 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා) වන්දි මුදල්, 2023.02.23 දින ලබා ගත් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට අනුව ජර්නල් අංක JRE-23-10-0015මඟින් කාර්යාංශ ආදායමට එකතු කිරීමට කටයුතු කර ඇති අතර, ඉදිරි කාලයේදී යම් පාර්ශවයක් හිමිකම් ලබා ගැනීම සඳහා ඉදිරිපත් වූ අවස්ථාවක ගෙවීම් කිරීමට කටයුතු කරනු ලැබේ.<br>මරණ වන්දි 09 කට අදාළ තොරතුරු සුභසාධන අංශයේ තිබූ බවත්, ඒ පිළිබඳව තොරතුරු මුදල් අංශයේ නොතිබූ බවත් විගණන වාර්තාවේ දක්වා ඇති නමුත්, ඊට අදාළව ජාතික විගණන කාර්යාලය විසින් ඉදිරිපත් කර ඇති ලේඛනයෙහි සඳහන්ව ඇත්තේ වන්දි හිමිකම් 05 ක තොරතුරු පමණි.<br>එම වන්දි හිමිකම් 05 ට අදාළ තොරතුරු කාර්යාංශයේ මුදල් අංශයේ නොතිබීමට හේතුව වී ඇත්තේ ඊට අදාළ වන්දි මුදල් ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි ආයතනය භාරයේ තිබීමයි. එම මුදල් කාර්යාංශ ගිණුමට බැර කරන ලෙස දන්වන ලද 2023.07.20 දිනැති ලිපියට අනුව,ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි ආයතනය විසින් කාර්යාංශය මගින් දන්වා ඇති රු. 5,889,989.49 ක වටිනාකමින් යුත් රක්ෂණ වන්දි ශේෂය මුළු රක්ෂණ වන්දි ශේෂය සමග ගලපා නිවැරදි ශේෂය 2023 නොවැම්බර් මස මුල් සතිය තුළ පියවා අවසන් කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. |
| (ක) සුරුකුම් නිවාස වලට ශ්‍රමිකයින් භාර ගන්නා අවස්ථාවේ ඔවුන් සතු හා ඔවුන් සේවය කළ නිවැසියාගෙන් ලැබෙන මුදල් ආරක්ෂිත ගිණුමේ (Safe Account Deposit) තැන්පත් කර ලංකාට පැමිණීමෙන් පසු ගෙවිය යුතු වුවත් 2022 දෙසැම්බර් 31 දිනට එසේ රු. 81,728,897 ක ශේෂයක් නොගෙවා ගිණුමේ රඳවාගෙන තිබුණි. | 2022.12.31 වන දිනට ගෙවිය යුතු ශේෂය ලෙස විගණන විමසුමෙහි දක්වා ඇති රු.81,728,897.00 මුදල අවසන් ගිණුම් සමඟ එකඟ වේ. විගණනය විසින් දක්වා ඇති පරිදි මෙහි අඩුවෙන් ගිණුම්ගත කිරීමක් සිදු කර නොමැත. |

| | |
|---|---|
| (ග) 2013 ජනවාරි 24 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ පරිදි ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය සමඟ ඒකාබද්ධව රටවිරුවෝ නිවාස ණය වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා වසර 05 කට අවබෝධතා ගිවිසුමක් අත්සන් කර කාර්යාංශය විසින් 2013 මාර්තු 08 දින සමෘද්ධි අධිකාරිය වෙත ගිණුමට රු.100,000,000ක මුදලක් ගෙවා තිබූ අතර එම මුදල සමෘද්ධි අධිකාරිය නමින් ස්ථාවර තැන්පතුවක තැන්පත් කර තිබුණි. අවබෝධතා ගිවිසුමේවලංගු කාලය 2018 මාර්තු 07 දිනෙන් අවසන් වී ඇතත් ව්‍යාපෘතියට අනුව ණය ලබා දීම පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවූ අතර 2014 වර්ෂයේ සිට මේ දක්වා පොළී ආදායම ලැබී නොතිබුණි | ➢ 2013.03.07 දිනැති ඉංග්‍රීසි භාෂාවෙන් ලියූ අවබෝධතා ගිවිසුමේ A 10. ප්‍රකාරව සිදුවිය යුත්තේ, රුපියල් මිලියන 100 ක මුදලක් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය නමින් සමෘද්ධි බැංකුවේ තැන්පත් කිරීම වුවද, සිදු වී ඇත්තේ එම මිලියන 100 ක මුදල කැබිනට් අනුමැතියට සහ අවබෝධතා ගිවිසුමට පටහැනිව සමෘද්ධි අධිකාරිය විසින් ස්වකීය නමින් ලංකා බැංකුව බත්තරමුල්ල ශාඛාවේ තැන්පත් කිරීමයි. අදාල තැන්පතු සහතිකය 2013.03.11 දින නිකුත් කර ඇත. ඊට අදාලව 2014 වර්ෂයේදී රු.11,153,425ක පොළී මුදලක් ලැබී ඇත. කාර්යාංශතැන්පතුවට අදාලව ශේෂ තහවුරු කිරීමේ ලිපි සෑම වසරකදීම කාර්යංශය වෙත ලබා දී ඇත.<br>➢ ව්‍යාපෘතිය අවසන් වුවද, කාර්යාංශය විසින් සමෘද්ධි අධිකාරිය වෙත ලබා දී ඇති රුපියල් මිලියන 100ක තැන්පතුව මෙතෙක් කාර්යාංශය වෙත ආපසු නොලැබීම හේතුවෙන්, එම මුදල ලබා ගැනීම අරමුණු කරගෙන 2023.07.25 දින ගරු සමාජ සවිබල ගැන්වීමේ රාජ්‍ය අමාත්‍ය අනූප පැස්කුවල් මහතාගේ ප්‍රධානත්වයෙන් සමෘද්ධි සංවර්ධන දෙපාර්තුමේන්තුවේදී ප.ව. 2.00ට සාකච්ඡාවක් පවත්වාඇත.<br>➢ එහිදී සාකච්ඡා කරගත් පරිදි රටවිරු නිවාස ණය ලබාගත් පුද්ගලයින්ගේ නාම ලේඛන සහ අනෙකුත් තොරතුරු සමෘද්ධි අධිකාරිය විසින් 2023.07.26 දින විද්‍යුත් තැපැල් මගින් කාර්යාංශය වෙත එවා ඇත.<br>➢ එසේ වුවද, එවා ඇති ලේඛන වල අඩංගු තොරතුරු, මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා ප්‍රමාණවත් නොවන බැවින්, වැඩිදුරටත් නිරවුල් වූ තොරතුරු විමසා අධ්‍යක්ෂ ජෙනරාල් සමෘද්ධි අධිකාරිය වෙත 2023.08.23 දින කාර්යාංශය විසින් ලිපියක් |

| | |
|---|---|
| | යොමු කර ඇත.<br>➢ ඒ සඳහා පිළිතුරු ලබා ගැනීම පිණිස පසු විපරම් සිදු කලද, මෙතෙක් පිළිතුරු ලබා දී නොමැත. එබැවින් මේ පිළිබඳ උපදෙස් පතා අමාත්‍යාංශ ලේකම් වෙත 2023.09.25 දින කාර්යාංශ සාමාන්‍යාධිකාරීගේ අත්සනින් ලිපියක් යොමු කර ඇත. |
| (ව) දකුණු කොරියාවේදී අනතුරකට ලක්වී සිටි ශ්‍රමිකයෙකු නැවත ලංකාවට ගෙන්වා ගැනීම සඳහා 2019 නොවැම්බර් 08 වන දින කාර්යාංශය වෙත තැන්පත් කරන ලද මුදලින් වැය නොවී ඉතිරි වී තිබූ රු.1,451,490 ක් නැවත ඔවුන් වෙත ගෙවිය යුතු වුවද වසර 3 ක් ඉකුත් වී තිබුණද එම මුදල ගෙවීමට කටයුතු කර නොතිබුණි. | හසිඳුදිනුකමහතා ලංකාවට ගෙන්වා ගැනීම සඳහා 2019.11.08 වෙනි දින ඔහුගේ සහෝදරයා විසින් කොරියානු වොන් (KRW)9,851,200 මුදලක්(රු.1,532,846.72)කාර්යාංශ ගිණුමෙහි තැන්පත් කර ඇත. තැන්පත් කරන ලද මුදලින් රු.1,434,059.34 ක මුදලක් මෙම හසිඳු දිනුක මහතා මෙරටට ගෙන්වීමේ කටයුතු සඳහා වියදම් කර ඇත. කාර්යාංශ ගිණුමෙහි ඉතිරිව ඇති රු.98,786.66 ක මුදල හසිඳු දිනුක මහතාගේ සම්පත් බැංකු, මාතර ශාඛාවේඅංක 101057883449 දරණ ගිණුම වෙත තැන්පත් කර ඇත. |

**ඒ.ඒ.එම්. හිල්මි**
**සභාපති**

**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය**

අංක 234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල.

දුර.- +94 11 286 4101/ +94 11 288 0500 ඊමේල්- info@slbfe.lk

වෙබ්- www.slbfe.lk ක්ෂණික ඇමතුම්- 1989